# ළමා ආරක්ෂාව පිළිබඳ අත්පොත

## (ළමයින්ට අදාළ නීතිය, ළමයින්ගේ ආරක්ෂාව හා ඔබේ වගකීම)



# දරුවන් අපේ

ජනාධිපති කාර්යාලය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

*දරුවන් අපේ எமது சிறுவர்கள் Children are ours*

# ළමා ආරක්ෂාව පිළිබඳ අත්පොත

**(ළමයින්ට අදාළ නීතිය, ළමයින්ගේ ආරක්ෂාව හා ඔබේ වගකීම)**

**"දරුවන් සුරකිමු" ජනාධිපති විශේෂ ව්‍යාපෘතිය සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රකාශනයකි.**

“දරුවන් සුරකිමු” ජනාධිපති විශේෂ ව්‍යාපෘතියේ මූල්‍ය
අනුග්‍රාහකත්වයෙන්
හා
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින්
ප්‍රකාශයට පත් කරන ලදි.

**2019**



## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්ගේ පණිවිඩය

සමස්ත ශ්‍රී ලාංකේය දරුවන්ගේ ආරක්ෂාව උපරිමයෙන් තහවුරු කරමින් ඔවුන්ට වඩා සුරක්ෂිත සමාජ වටපිටාවක් ගොඩනැගීම රටක් ලෙස අද දවසේ අප මුහුණ දෙන දැවැන්ත ම අභියෝගයකි. අපි රජයක් ලෙස එකී අභියෝගය ජයග්‍රහණය කිරීමේ අසීරු ගමන් මගේ ගමන් කරමින් සිටිමු. ජාතික සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම, රට තුළ ජාතික සමගිය සහ සංහිඳියාව ගොඩගැනීම ආදී අභිමතාර්ථයන් වඩා යථාර්ථවාදී වන්නේ එම සංවර්ධිත ලෝකය තුළ නිදහස්ව, නිවහල්ව සහ නිර්මාණශීලීව හැදෙන්නට වැඩෙන්නට සෑම දරුවකුට ම ඉඩකඩ විවරව පැවතීම මත බව මගේ විශ්වාසය යි. එහෙත් අද දවසේ ශ්‍රී ලංකාව පුරා ඇතැම් දරුවන්ට මුහුණදීමට සිදුව ඇති අතිශය ඛේදජනක තත්වයන් අපට පසක් කර දෙන්නේ ළමා ආරක්ෂාව සැලසීම පිළිබඳ බරපතල රික්තයක් පවතින බවයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කොට ඇති "ජනපවුර" ජාතික වැඩසටහන ඉහත කී රික්තය පිරවීම සඳහා වූ නිර්මාණශීලී හා යථාර්ථවාදි ප්‍රවේශයක් වනු ඇති බව මගේ විශ්වාසය යි. එකී සංකල්පය රට තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා දිගුකාලීන දැක්මක් සහිතව නිර්මාණය වූවක් ය යන්න එය අධ්‍යයනය කිරීමෙන් මා හට අවබෝධ කරගත හැකි විය. ජනතාවගේ අදහස් මත ගොඩනැගෙන, ජනතාවගේ ශක්තියෙන් හා ධෛර්යයෙන් නිර්මාණය වන, ජනතාව විසින් පාලනය කරනු ලබන හා ස්වකීය අත්දැකීම් මත ජනතාව විසින් ම වැඩිදියුණු කරනු ලබන ජනපවුර නිසැකව ම සෑම දරුවකුගේ ම ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා ශක්තිමත් ආරම්භයක් වනු ඇත. ශ්‍රී ලංකාවේ සෑම ගමක ම දරුවන්ගේ ආරක්ෂාව එම ගමේ ම ප්‍රජාවේ වගකීමක් බවට පත්කරගැනීම සැබැවින් ම නව්‍ය අත්දැකීමක්

වනු ඇති අතර, එය ශ්‍රී ලංකාව තුළ සෑම දරුවකුගේ ම ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා වූ නිර්මාණශීලී ප්‍රවේශයක් ද වනු ඇත.

සමස්ත ශ්‍රී ලාංකේය දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික අපේක්ෂාව උදෙසා ගොඩනැගුණු ජනපවුර සංකල්පය මේ බිමේ යථාර්ථයක් වනු දැකීම ඔබ සැමගේ මෙන් ම මාගේ ද අපේක්ෂාව බව ද සිහිපත් කරමි. එමෙන් ම සුවහසක් දරුවන්ගේ ආරක්ෂාව උදෙසා ජනපවුර හා අත්වැල් බැඳගන්නා සියලු ම ස්වේච්ඡා ප්‍රජා සාමාජිකයන් වෙත මාගේ ස්තුතිය ද පුද කොට කොට සිටින අතර, ජනපවුර වැඩසටහන සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි. ජනපවුර වැඩසටහනට සමගාමීව දැයේ දරුවන්ගේ ආරක්ෂාව උදෙසා මෙවැනි අත්පොතක් නිර්මාණය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ''දරුවන් සුරකිමු'' ජාතික වැඩසටහන හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ගනු ලැබූ මෙම උත්සාහය ද අතිශයින් අගය කරමි.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
2018-08-13



## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ පණිවිඩය

රටක ජාතික සමගිය සහ සංහිඳියාව, තිරසර සංවර්ධනය ආදී සියලු අභිමතාර්ථයන් වඩා යථාර්ථවාදී වන්නේ එම සංවර්ධිත ලෝකය තුළ නිදහස්ව, නිවහල්ව, ආරක්ෂාකාරීව සහ නිර්මාණශීලීව හැදෙන්නට වැඩෙන්නට සෑම දරුවකුටම ඉඩකඩ විවරව පැවතීම මතයි.

පැරකුම් යුගයේදී ස්වයංපෝෂිත දේශයක් බවට පත්ව තිබූ අප රට තුළ වර්තමානයේදී සමස්ත ශ්‍රී ලාංකේය දරුවන්ගේ ආරක්ෂාව උපරිමයෙන් තහවුරු කරමින් ඔවුන්ට වඩා සුරක්ෂිත සමාජ වටපිටාවක් ගොඩනැගීම අප මුහුණ දෙන දැවැන්ත ම අභියෝගයක් බවට පත්ව ඇති අතර, අපි රජයක් ලෙස එකී අභියෝගය ජයග්‍රහණය කිරීම සඳහා ඇපකැප වී කටයුතු සිදු කරන්නෙමු.

මෙම ගමන් මගේ දී ජනතාව ළමා ආරක්ෂාව වෙනුවෙන් බලගැන්වීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් දීප ව්‍යාප්තව දියත් කරන්නාවූ **''ජන පවුර''** වැඩසටහන සඳහා ලබා දෙන්නාවූ ළමා ආරක්ෂක අත්පොත සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි. රට තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නිර්මාණය වූ මෙම වැඩසටහන ඉතා සාර්ථක හා ඵලදායී වැඩසටහනක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ගම් මට්ටමින් සිදු වෙන්නාවූ අපයෝජනයන් සඳහා නීතිය ක්‍රියාත්මක වීම අත්‍යාවශයෙන්ම සිදු විය යුතු කරුණකි. ගමේ සිටින්නාවූ මිනිසුන් අතරින්ම ගම බලාත්මක කිරීම මගින් හා මිනිසුන් තුළ ළමයා කෙරෙහි සුබවාදී ආකල්පයන් ඇති කර එකී අදහස් සමාජගත කිරීම මගින් ද ළමා ආරක්ෂාව සඳහා නව

ප්‍රවේශයක් ලබාගත හැකිවේ යැයි මම සිතමි. ඒ සඳහා ''ජන පවුර'' යෝධ ශක්තියක් වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි. මෙම වැඩසටහන මගින් දිවයිනේ සෑම ප්‍රදේශයක් තුළම ළමා ආරක්ෂාව වෙනුවෙන් කඩිනමින් මැදිහත් විය හැකි, වහා ක්‍රියාත්මක වන සිවිල් ජනතා එකමුතුමකින් සමන්විත ජාලයක් නිර්මාණය වේ. මේ මගින් ළමා අපයෝජනයන් සිදු වීමට ප්‍රථම එයට අවශ්‍ය මැදිහත්වීම ප්‍රජාව තුළින්ම සිදු වීම ඉතා වැදගත්වේ.

දැයේ දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ක්‍රියාත්මක කරණු ලබන මෙම ''ජන පවුර'' වැඩසටහන සඳහා ගම්මට්ටමින් සහභාගී වන්නාවූ සියලු ස්වෙච්ඡා සාමාජිකයින් හට මාගේ ගෞරවය හා හෘදයාංගම ස්තුතිය පුද කර සිටින අතර, මෙම භාරධූර කර්තව්‍ය ඉටු කිරීම සඳහා කටයුතු කරනු ලබන ජාතික ළමා ආරක්ෂක අධිකාරියට මෙන්ම අනෙකුත් සියලුම පාර්ශවයන්ට මාගේ සුභාශිංශනය පිරිනමා සිටිමි.

රනිල් වික්‍රමසිංහ<br>
අග්‍රාමාත්‍ය<br>
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය



## කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍යතුමියගේ පණිවිඩය

ළමයින් සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන් හා නොසලකා හැරීමට ලක්කිරීම පිටු දැකීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් කරන්නා වූ කාර්යභාරය අගය කරමි.

මෙම ගමන් මගේ දී ජනතාව ළමා ආරක්ෂාව වෙනුවෙන් බලගැන්වීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් දීප ව්‍යාප්තව දියත් කරන්නාවූ **“ජන පවුර”** වැඩසටහන සඳහා ලබා දෙන්නාවූ ළමා ආරක්ෂක අත්පොත සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

වර්තමානයේ දී තාක්ෂණය දියුණු වීමත් සමඟ ළමා අපයෝජන වාර්තාවීමේ ප්‍රවනතාවය වැඩි වී ඇත. මෙහිදී ගම් මට්ටමින් සිදු වෙන්නාවූ අපයෝජනයන් සඳහා නීතිය ක්‍රියාත්මක වීම අත්‍යාවශයෙන්ම සිදු විය යුතු කරුණකි. ගමේ සිටින්නාවූ මිනිසුන් අතරින් ගම බලාත්මක කිරීම මඟින් නීතිය වෙත යොමු වෙන්නාවූ පිරිස මෙන්ම මිනිසුන් තුල ළමයා කෙරෙහි ඇති කර හැකි සුබවාදී ආකල්පයන් සමාජගත කිරීම සිදු කළ හැකි යැයි මම සිතමි. ඒ සඳහා **“ජන පවුර”** යෝධ ශක්තියක් වනු ඇත.

විෂය භාර අමාත්‍යවරිය ලෙස රටේ සියලුම ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අභියෝගාත්මක භාරධුර වගකීම ඉටු කිරීමේ දී නිරන්තරයෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නව වැඩසටහන් හඳුන්වා දෙමින් ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ඉටු කරන්නාවූ කාර්යභාර්යය අගය කරමි.

**“ජන පවුර”** වැඩසටහන සඳහා ගම්මට්ටමින් සහභාගී වන්නාවූ සියලු ස්වෙච්ඡා සාමාජිකයින් හට මාගේ ආදරය හා ගෞරවය පුද කිරීමට මා මේ අවස්ථාවක් කර

ගනිමි. එසේම මෙම භාරධූර කර්තව්‍ය ඉටු කිරීම සඳහා කටයුතු කරනු ලබන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති ඇතුළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිටින නිලධාරීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයේ සිටින සියලුම කාර්යය මණ්ඩලයන් වෙත මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා මම සුභාශිංශනය කරමි.

චන්ද්‍රානි බණ්ඩාර
කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය



## කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමියගේ පණිවුඩය

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ මෙන්ම සමස්ථ ලෝකය පුරාම දරුවන් හට හිමි වන්නේ ඉතා සුවිශේෂී ස්ථානයකි. ඊට හේතුව වන්නේ, රටක අනාගතය තීරණය කිරීමෙහිලා ඉතාමත් වැදගත් හා ප්‍රබලතම සාධකය බවට පත් වන්නේ දරුවන් වීමයි. එබැවින් දරුවන් හට කායික, මානසික, ලිංගික හා නොසලකා හැරීම් යන හිංසනයන්ගෙන් තොර සුරක්ෂිත වටපිටාවක් උරුම කර දීම සෑම වැඩිහිටියෙකුගේම යුතුකම මෙන්ම වගකීම ද වන්නේය.

ඕනෑම රටක, ජන සමාජයක අනාගතය වන ළමා පරපුරෙහි ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයේදී අන් සෑම බලයකටම වඩා ඉතාමත් ප්‍රබල හා ප්‍රමුඛතම බලය ලෙස සැලකිය හැක්කේ ජන බලයයි. ඒ අනුව, වර්තමානයේදී දරුවන් සුරක්ෂිත කිරීමේ උතුම් කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළද, ගම් මට්ටමේ සිට මහජනතාවගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේත්, සමස්ථ සමාජයම එකිනෙකා හා බැඳුනු එකම ජන පවුරක් ලෙසින් කටයුතු කිරීමේත් අවශ්‍යතාවය පැන නැගී ඇති බව පෙනේ.

එකී අවශ්‍යතාවය ඉටු කර ගැනීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ''ජන පවුර'' නම් වූ ජාතික වැඩසටහන ඉතාමත් හොඳ ප්‍රායෝගික වැඩසටහනක් ලෙස හැඳින්විය හැකිය.

''ජන පවුර'' නම් වූ සුවිශේෂී වැඩසටහන මගින් දිවයිනේ සෑම ප්‍රදේශයක් තුළම ළමා ආරක්ෂාව වෙනුවෙන් කඩිනමින් මැදිහත් විය හැකි, වහා ක්‍රියාත්මක වන සිවිල් ජනතා එකමුතුවකින් සමන්විත ජාලයක් නිර්මාණ කිරීම සිදුවේ. එමගින්

ළමා අපයෝජනයන් සිදු වීමට ප්‍රථම, එකී අපයෝජනයන්ගෙන් දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන මැදිහත්කරණයන් සිදුවීම අපේක්ෂා කෙරේ. එනම්, ළමා අපයෝජන අවම කර ගැනීම සඳහා ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම මෙමගින් අපේක්ෂා කරනු ලබන අතර, එය ඉතාමත් කාලෝචිත හා ප්‍රායෝගික ක්‍රියාවක් බව ඉතා සතුටින් යුතුව ප්‍රකාශ කළ හැකිය.

අපේ රටේ අනාගතය වන දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ උතුම් චේතනාවෙන් යුක්තව එක්රැස් වන සියලුදෙනාගේ පරිශීලනය සඳහා නිර්මාණය වන මෙම අත්පොත ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලුදෙනා සඳහාම ඉතා වැදගත් මාර්ගෝපදේශයක් බවට පත්වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

එබැවින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් නිර්මාණය කරනු ලබන මෙම අත්පොත සඳහා මාගේ ප්‍රශංසාව පල කොට සිටින අතර, ''ජන පවුර'' නම් වූ ජාතික වැඩසටහන හරහා ළමා ආරක්ෂාව සඳහා මහජනතාවගේ දායකත්වය හා මැදිහත්වීම නොඅඩුව ලැබීම තුළින්, දැයේ දරුවන් හට සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් තොර, සුරක්ෂිත වටපිටාවක් උරුම වේවායි ප්‍රාර්ථනා කරමි.

දර්ශනා සේනානායක<br>
ලේකම්<br>
කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය



## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපතිතුමන්ගේ පණිවිඩය

### "දරුවන් අපේ - අපේ වගකීම"

මානව සමාජයේ ආරම්භයේ සිට මේ දක්වාම, එහි වැඩිහිටි සාමාජිකයින් දරුවන් පිළිබඳව දක්වන්නේ ඉමහත් වූ සැලකිල්ලකි. එය මානව සමාජයෙන් ඔබ්බට ගිය ද, සත්ව සමාජය තුළ ද සදාකල් අඛන්ඩව ක්‍රියාත්මක වන, මූලික පොදු ධර්මතාවයකි. මන්ද, දරුවාට වැඩිහිටි සහයෙන් තොරව, මිනිසෙකු දක්වා වර්ධනය විය නොහැක.

ඕනෑම සමාජයක වැඩිහිටියන් දරුවන් පිළිබඳව දැක්විය යුතු, සැලකිල්ලේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තත්වයන්ගේ අඩු වැඩිකම්, ඍජුව එම සමාජයේ දරුවන් වෙත ද ගලායයි. ඕනෑම සමාජයක හෙට දවසේ හෝ අනාගතයේ, එම රටේ ඉරණම තීන්දුකරන එකම හා ප්‍රබලම සාධකය ද වන්නේ, එම රටේ අද වෙසෙන දරු පරම්පරාවයි.

මේ බව අප වැඩිහිටියන් ලෙස වහ වහා තේරුම්ගත යුතුය. තේරුම් ගැනීම ම පමණක් ප්‍රමාණවත් නැත. දරුවන් වෙනුවෙන් එම සාධනීය තේරුම් ගැනීම භාවිතයේ යථාර්තයට එක් කළ යුතුය. එසේ නොකළහොත් එහි අනිටු ප්‍රතිඵලයන් වල කටුක හා දුක්ඛදායක වූ අත්දැකීම්, කොතරම් අකමැති වුවත්, අප අත්දැකිය යුතුමය. එම අත්දැකීමෙන් දුරස්වීම සඳහා අපි එක්ව සහ වෙන් වෙන්ව, වැඩිහිටියන් ලෙස, දරුවන් කෙරේ ඉටු කළ යුතු කාර්යන් සඳහා කොන්දේසි

විරහිතව ඉදිරිපත් විය යුතුය. අපි මතක තබා ගත යුතු සරල හා ගැඹුරු සත්‍ය වන්නේ අපේ අද දවස දරුවන්ගේ හෙට දවස වන වගයි.

දරුවන්ගේ හෙට දවසේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට මෙන්ම යහපත් හෝ අයහපත් භාවයන්ට සෘජුව බලපාන හේතු රාශියක් පවතින බව, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට සරලව තේරුම්ගත හැකිය. ඒවා අතර, ප්‍රබල කාරණා ලෙස, දේශපාලන කරුණු, ආර්ථික කරුණු, සමාජමය කරුණු, තාක්ෂණික කරුණු සහ නීතිමය කරුණු සෘජුවම බලපානු ලබයි.

සම්ප්‍රදායික ග්‍රාමීය ස්වයංපෝෂිත ජීවන රටාවක සිට සීඝ්‍රයෙන් වෙනස් වන, තරඟකාරී, පෞද්ගලිකත්වයක් ඉස්මතුවන, මුදල ප්‍රධාන තීන්දුකාරක සාධකය වන අපි "අපේ" යන සංකල්පය, මම "මගේ" යන තැනට ලඝුවන සමාජ වටපිටාවක් විවෘත ආර්ථිකයේ හා ප්‍රතිපත්ති රහිත දේශපාලනයේ මෙන්ම ප්‍රමිතියකින් හෝ පාලනයකින් තොරව, ඉබාගාතේ සහ අත්තනෝමතිකව සීමා මායිම් රහිතව ගලාගෙන එන අධි තාක්ෂණය විසින් ලාංකේය සාමාජය හා එහි දරුවන් ආකාරුණික ලෙස ග්‍රහණය කර ගෙන ඇති සැටි බුද්ධිමත් විමර්ශනයක් තුළ මනාවට පසක් කරගත හැකිය.

විස්තීර්ණ පවුල් ක්‍රමයක සිට, න්‍යෂ්ටික පවුල් දක්වා ලඝුව ඇති පවුල් ක්‍රමය තුළ දැඩිව ස්ථාපිතව ඇති ආත්මාර්ථයේ බැම්පවුරු වලින් නිර්මාණය කර ඇත්තේ "මගේ දරුවා" යන පටු මතවාදයයි. එම මතවාදය විසින් "දරුවන් අපේ" යන විශිෂ්ට හා අපූර්ව චින්තනය ලාංකේය සමාජයෙන් බැහැර කරමින් සිටින බව පෙනෙන්නට තිබේ.

මුදලට ගිජුවූ සමාජයක, ප්‍රතිපත්ති තීන්දුකාරකයන්ගේ සිට මව්වරුන්, පියවරුන් පවා සිය දරුවන් පිළිබඳව සිතිය යුතු ප්‍රමුඛ සිතුවිල්ල දෙවැනි තැනට තල්ලුකර ඇති අයුරු, මැද පෙරදිග ගෘහසේවයට යන මව්වරුන්ගේ සංඛ්‍යාත්මක අගය මනාවට හෙළිපෙහෙලි කරයි. එවැනි අවස්ථාවක සිය දියණියගේ අපයෝජකයා ඇයගේම පියා හෝ ආරක්ෂාව තහවුරු කළ යුතු ආරක්ෂකයාම වී තිබීම කොයිතරම් වූ සමාජ ඛේදවාචකයක් ද? සමාජ නිර්මාපයකයන්ගේ තෝතැන්නක් විය යුතු, පාසල, ආගමික මධ්‍යස්ථාන, දරුවා රැකබලාගැනීමට කටයුතු කළ යුතු

නිවහන් ආදී ස්ථාන පවා අද ළමා අපයෝජන මධ්‍යස්ථාන දක්වා අප සමාජය තුළ වර්ධනය වෙමින් පවතින බව අප පිළිගැනීමට මැලිවෙන කටුක නීරස යථාර්ථය වෙමින් පවතී.

මත්ද්‍රව්‍ය භාවිතයේ සීඝ්‍ර ව්‍යාප්තිය විසින් සනිටුහන් කරන්නේ දරුවන්ගේ අවිනිශ්චිත හා අනාරක්ෂිත වූ සමාජ වටපිටාවයි දේශ සීමා රහිත, පාලනයෙන් තොරව, සදාචාරාත්මක වටිනාකම් සෘජුව ප්‍රතික්ෂේප කරන අධි තාක්ෂණය, දිවයිනේ අස්සක් මුල්ලක් නැර ව්‍යාප්ත වී හමාරය.

බහුතරයක් අපයෝජකයින් නියෝජනය කරන්නේ, සමාජයේ ඔවුන් සතු කරගෙන ඇති කිනම් හෝ බල මූලාශ්‍රයකින් ලබාගත් බලය හා අකාරුණික හෝ අසාධාරණ ලෙස මහන්සියකින් තොරව ලබාගත් ධනයේ ශක්තියයි.

අනෙක් අතට වින්දිතයින් වන්නේ බලය හා ධනය මෙන්ම දැනුම හා හැකියාවන්ද ශේෂ වූ සමාජයේ පීඩිත හා තැළුනු කණ්ඩායමයි.

මාධ්‍ය භාවිතය විසින් උළුප්පාලනු ලබන, අකාරුණික හා අවිචාරමත්, සිහිසුන් වැඩසටහන් දරුවන්ගේ මානසික අපයෝජනයේ දැවැන්තම වැඩකොටස රිසිසේ බාධාවකින් තොරව ඉටුකරමින් සිටියි.

අධ්‍යාපනයේ, ආර්ථිකයේ, සමාජ පැවැත්මේ සිට සරලම කරුණු දක්වා වූ දේ සඳහා ද තරඟකාරීත්වයේ, අභිබවායාම අඩුවැඩි වශයෙන් ප්‍රදර්ශනය වෙමින් පවතී.

ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ඇවතුම් පැවතුම්, සිතුම් පැතුම්, අගයන් හා හරයන් මෙන්ම සමාජ ආකල්පයන් ද දරුවන්ගේ නිදහස් සුරක්ෂිත හෙට දවසක බලාපොරොත්තුව බොඳ කරමින් සිටියි.

නීතියේ ක්‍රියාකාරීත්වයේ හා එහි ධාරිතාව පිළිබඳ ප්‍රශ්න විසින් පොදු ජන චින්තනයේ නීතිය පිළිබඳව උදාසීන බලාපොරොත්තුව හා විනිශ්චයන් ලබාගැනීමේ ඉක්මන් අපේක්ෂාවන් පිළිබඳ සැක සංකා පිළිසිඳෙමින් පවතී.

බලවත් අපයෝජකයා අභියස හුදෙකලා වන වින්දිත අහිංසකයන් වෙත සමාජ අපවාදය පවා ගලා ඒමට සලස්වන අක්මුල් සිඳී ගිය සමාජ වටපිටාවක් නිර්මාණය වෙමින් පවතී.

පාසලේ බිත්තියේ පවා ''මේ මගේ දරුවාගේ පාසලයි'' යන්න ලේබල්ගත කර ඇති සැටි අපූරුවට දැකිය හැකිය. එය මේ අපේ දරුවන්ගේ පාසලයි යන සදාචාරාත්මක ප්‍රකාශනය දක්වා වෙනස්විය යුතුය.

ඉතා සරලව, ඉතාම සංක්ෂිප්තව අද අපේ ලාංකේය සමාජයේ හරස් කඩක් මෙසේ නොවන බව කාටනම් කිව හැකිද?

මෙම සමාජ ක්‍රමය විසින් හෙට දවසේ ගැඹුරු දරුවෙකු නිර්මාණය කරයිද? අපේ දරුවන්ට වැඩිහිටියන්ගේ ආදරය මුසු වූ, නිදහස් හා සුරක්ෂිත පරිසරයක් නිර්මාණය වන්නේ දැයි ඔබ සිතන්නේද? නැත. එය නොවනු ඇත. එහෙත්, අපේ රටේ හෙට දවස, දරුවන් වෙනුවෙන් වැඩිහිටියන් ලෙස අප නිර්මාණය කළ යුතුය යන කරුණ කොන්දේසි විරහිතව අප පිළිගත යුතුය. ඒ සඳහා ජනපවුර වැඩසටහන සමඟ එක්වන මෙන් අතිශය ගෞරවයෙන්, බලාපොරොත්තුවෙන් ඔබට මම ආයාචනය කරන්නෙමි.

***''විශිෂ්ට සංස්කෘතීන් විසින් ශ්‍රේෂ්ඨ මිනිසුන් නිර්මාණය කරයි.''***

නීතීඥ. එච්.එම්. අබයරත්න
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# පටුන


| | පිටුව |
|---|---|
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | 1 |
| මහජන පැමිණිලි භාරගැනීම - 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය | 3 |
| ළමා ආරක්ෂාව උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීම | 4 |
| ළමා අපයෝජන වළක්වා ගැනීම උදෙසා ක්‍රියාත්මක වීම | 5 |
| වින්දිත ළමයින්ගේ රැකවරණය තහවුරු කිරීම | 6 |
| ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | 7 |
| ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම සහ මහජනතාව වෙත තොරතුරු සැපයීම | 8 |
| ළමා ආරක්ෂාව උදෙසා අපගේ ඉදිරි ගමන් මඟ | 9 |
| "ජන පවුර" | 9 - 26 |
| **ළමා ආරක්ෂණයේ සංකල්පීය පැතිකඩ** | **28** |
| ළමයා යනු | 29 |
| ළමා ආරක්ෂාව (Child Protection) | 29 |
| ළමා අපයෝජන (Child Abuse) | 30 |
| ළමා අපයෝජනයට එරෙහි විය යුත්තේ ඇයි | 31 |
| ළමා අපයෝජන වර්ග | 32 - 44 |
| අපයෝජනයට ලක්විය හැකි අවධානම්කාරී ළමයින් | 45 - 51 |
| ළමා අපයෝජනයේ අවධානම් සාධක (Risk Factor) | 52 |
| ළමා ආරක්ෂාව හා බැඳි වෙනත් සංකල්ප | 53 - 57 |
| **ළමයාගේ අයිතිය** | **60** |
| ළමයා යනු | 60 |
| ළමයාගේ භාරකරු කවුරුන්ද? | 61 |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර නීතිය | 61 |

| | |
|---|---|
| ළමා අයිතිවාසිකම් පිළිබඳ දේශීය නීතිය | 75 |
| ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ | 77 - 142 |
| **ළමයින් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය** | 145 - 163 |
| ළමයින් හික්මවීම ලෙහෙසි දෙයක් නොවේ. | 155 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශය | 163 |
| **ළමා අපයෝජනවලින් ළමයින් ආරක්ෂා කිරීම උදෙසා අවැසි ආයතනික සම්බන්ධීකරණය** | 166 - 181 |
| ළමා අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කිරීම හා ආයතන සතු වගකීම | 171 |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන් හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ දුරකථන හා ෆැක්ස් අංක** | 183 - 231 |
| **ඔබට අත්‍යවශ්‍ය විය හැකි වෙනත් දුරකථන අංක දැනුවත් කළ යුතු ආයතන** | 232 - 234 |
| **1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත** | 236 - 258 |
| **2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත** | 259 - 289 |
| **2005 අංක 34 දරන ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත** | 290 - 305 |
| **1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත** | 306 - 311 |
| **සටහන්** | 313 |
| **ආකෘති පත්‍රය 01** | 335 |
| **ආකෘති පත්‍රය 02** | 337 |

***චීෆ් සියැටල්***

*රතු ඉන්දියානු ගෝත්‍රික නායකයෙකු වන මෙතුමන් විසින් 1854 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද “සියැටල් ප්‍රකාශයෙන්” උපුටාගන්නා ලදි.*

***(Chief Seattle's Treaty Oration 1854)***



“අප ආදරය කළාක් මෙන්,
මේ පොළොවට ඔබත් ආදරය කරන්න.
අප එය ආරක්ෂා කළා මෙන්,
ඔබ ද එය ආරක්ෂා කරන්න.
ඔබ මේ භූමිය අපගෙන් මිල දී ගන්නා විට,
එය තිබූ ආකාරය ගැන මතකයේ තබා ගන්න.
ඔබේ මුළු හදින් ම, මුළු ශක්තියෙන්ම,
**ඔබේ ළමයින් වෙනුවෙන්,**
**මේ මහ පොළොව ආරක්ෂා කර ගන්න....”**

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ළමයින්ට වඩාත් සුරක්ෂිත සමාජ වටපිටාවක් ගොඩනැගීම අද දවසේ සමස්ත ලෝකය ම මුහුණ දෙන අභියෝගයකි. ශ්‍රී ලංකාව ද ඉතා දීර්ඝ කාලයක පටන් එකී අභියෝගයට මුහුණ දෙමින් සිටී. රටක් ලෙස එම අභියෝගය ජයගැනීමට, එනම් ළමා ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය විසින් පසුගිය දශක කිහිපය පුරාවටම මැදිහත්කරණයන් බොහොමයක් සිදු කරනු ලැබ තිබේ. ළමා ආරක්ෂාව උදෙසා වූ විවිධ ක්‍රියාමාර්ග අතර, 1998 අංක 50 දරණ පාර්ලිමේන්තු පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටවනු ලැබීම ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වූ සුවිශේෂී පියවරක් ලෙස හඳුනාගත හැකිය.

ළමා ආරක්ෂාව, නීතිය, සමාජ සුබසාධනය, අධ්‍යාපනය. සෞඛ්‍ය හා මනෝ විද්‍යා ක්ෂේත්‍රය ආදී ළමයින්ට සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන විද්වතුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත රට තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධ වගකීම් රැසක් සුවිශේෂී බලතල සහිත පනතක් මගින් පවරා ඇත. ළමා අපයෝජනයන් වළක්වා ගැනීම, අපයෝජනයට ලක්වූ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ ළමා අපයෝජනය හේතු කොට වින්දිත වූ නැතහොත් පීඩාවට පත් වූ ළමයින් සඳහා ප්‍රතිකාර කිරීම හා නැවත සමාජගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය මට්ටමින් මැදිහත්වීම ඇතුළුව සියලු ම ආකාරයේ ළමා අපයෝජනයන්ට එරෙහිව වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය සහ නියාමනය කිරීම මෙන්ම, ඒ හා සම්බන්ධ අවශේෂ කරුණු පිළිබඳ වගකීම් රැසක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත.

වඩා පුළුල් ලෙස "ළමයින් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත නිදහස් පරිසරයක් ගොඩනැගීම" යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක ජාතික ළමා

ආරක්ෂක අධිකාරියේ මෙහෙවර වන්නේ “ළමයින් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම”සඳහා වන සියලුම ක්‍රියාදාමයන් සමස්ථ සමාජය තුළ දැනුම, හැකියාව හා ආකල්පමය වෙනසක් මත නව දැක්මක් සහිතව යන්නයි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා වර්තමානය වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රදේශීය ලෙස සේවය කරන්නා වූ ස්ථිර කාර්ය මණ්ඩලයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතුය. ඒ හැරුණු විට විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මක වන අතර, එම ඒකකය සමස්ත දිවයින ම ආවරණය වන පරිදි විමර්ශන කටයුතු සිදු කරමින් වින්දිත ළමයින්ට නීතියේ රැකවරණය සැලසීම උදෙසා ක්‍රියාත්මක වෙමින් සිටී. විශේෂයෙන් ම බිම් මට්ටමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැදගත්කම හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමස්ත දිවයින ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් රාජකාරියේ යෙදී සිටී.

අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකත්වයෙන් හා මගපෙන්වීමෙන් ක්‍රියාත්මක සුවිශේෂී ව්‍යාපෘතියක් වන “දරුවන් සුරැකීමේ ” වැඩසටහන සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ක්‍රියාත්මක වේ.

# මහජන පැමිණිලි භාරගැනීම - 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය

ළමා අපයෝජනයන් පිලිබඳ මහජන පැමිණිලි භාරගැනීම පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇති කාර්යභාරයකි. මෙම කාර්යභාරය වඩා පුළුල් ලෙස ඉටු කිරීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ 1929 නමින් පැය 24 පුරා දින 365ම සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා ත්‍රිත්වයෙන් කිසිම ගාස්තු අය කිරීමකින් තොරව ක්‍රියාත්මක වන නොමිලේ ළමා උපකාරක දුරකථන සේවයක්ද තිබේ. දරුවන් සම්බන්ධ වන ඕනෑම පැමිණිල්ලක් මෙම දුරකථන සේවය වෙත ඔබට ඉතා පහසුවෙන් දැනුම් දිය හැකිය.

දිවයිනේ ඕනෑම තැනක සිට ඕනෑම දුරකථන ජාලයකින් නොමිලයේ ඇමතුම් ලබා ගැනීමේ හැකියාව මෙම දුරකථන සේවය මගින් පහසුකම් ලබා දී ඇත. ඕනෑම පුද්ගලයකුට ළමා අපයෝජන පිළිබඳ ඕනෑම තොරතුරක් ඉතා විශ්වසනීයත්වයෙන් යුක්තව ලබා දිය හැකි අතර, අදාළ තොරතුරු ලබාදෙන්නන්ගේ රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කිරීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු යොදා ඇත. එසේ ම තමන්ගේ අනන්‍යතාව හෙළි නොකර නිර්ණාමිකව වුවද දෙනු ලබන සත්‍ය තොරතුරු සම්බන්ධයෙන් අධිකාරිය සිය මැදිහත්කරණයන් සිදු කරනු ලබයි.

මෙහිදී ළමයින්ට එරෙහිව සිදු වන අපරාධ, ළමා අයිතිවාසිකම් කඩවීම, ළමයින්ව නොසලකා හැරීම, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන් හා සූරාකෑම සම්බන්ධවන්නා වූ ඕනෑ ම අවස්ථාවක් හෝ සිද්ධියක් 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය වෙත පැමිණිලි ලෙස ඉදිරිපත් කළ හැක. විශේෂයෙන් ම ඕනෑම ළමයෙකු මුහුණදෙන අපයෝජනයක් පිළිබඳ මොනම ආකාරයේ හෝ ගැටළුවකට සවන්දීම සඳහා සහ ළමයාගේ

උපරිම යහපත තහවුරු කිරීම සඳහා වූ පියවර ගැනීමට මේ ඔස්සේ සුදුසු හා උචිත මැදිහත්කරණයන් කරනු ලබයි.

## ළමා ආරක්ෂාව උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීම

ළමා අපයෝජනයන් සම්බන්ධයෙන් නිසි පරිදි නීතිය ක්‍රියාත්මක කිරීම, ඒ හේතුකොට වින්දිත ළමයාට, එනම් එකී අපයෝජන තත්වයන්ට මුහුණ දුන්නා වූ ළමයාට හෝ ළමයින්ට නීතියේ රැකවරණය සැලසීම සඳහා අතිශය වැදගත් කාරණයකි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් රට තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ශක්තිමත් රාමුවක් ගොඩනැගීම උදෙසා කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකාව තුළ වාර්තා වන ඇතැම් සුවිශේෂී ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය සෘජුව ම මැදිහත් වන අතර, අනෙකුත් ළමා අපයෝජන සිදුවීම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ සම්බන්ධීකරණය ඔස්සේ විමර්ශන කටයුතු සඳහා ආදාළ පොලිස් ස්ථාන වෙත යොමු කරනු ලබයි. මෙම සියලු ම පැමිණිලි පිළිබඳ පසු විපරම් කටයුතු කිරීම සහ නඩු පැවරීමේ කටයුතු පිළිබඳ නියාමනය කිරීම ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා විශේෂ පොලිස් විමර්ශන ඒකකය, නීති අංශය සහ නීතිය බලාත්මක කිරීමේ අංශය ජාතික ළමා අරක්ෂක අධිකාරිය තුළ ස්ථාපිතව ක්‍රියාත්මක වේ.

වින්දිත ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කරමින් නීතිය ක්‍රියාත්මක කිරීම සහ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය තුළ ළමයින් ද්විතීක වින්දිතභාවයට ලක්වීම වැළැක්වීම උදෙසා **වින්දිත ළමයින්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ වැඩපිළිවෙළක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ සතුව ඇත. මෙහි දී ළමයින් මුල් සාක්ෂිය ලබා දීම සඳහා අධිකරණයට ඉදිරිපත්**

**නොකොට ඔහුගේ හෝ ඇයගේ සාක්ෂිය කිසිදු බලපෑමකින් තොරව නිදහස් පරිසරයක් තුළ ළමා ආරක්ෂක අධිකාරිය තුළ දී වීඩියෝ පටිගත කොට අවශ්‍ය අවස්ථාවේ දී එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.** එමගින් ළමයින් අධිකරණ කටයුතු සඳහා යොමු වන අවස්ථා අවම කිරීම මූලික අපේක්ෂාව හා බලාපොරොත්තුවයි.

## ළමා අපයෝජන වළක්වා ගැනීම උදෙසා ක්‍රියාත්මක වීම

ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ සමස්ත ක්‍රියාවලිය **තුළ ළමා අපයෝජන සිදුවීමට පෙර ඒවා වළක්වා ගැනීමට කටයුතු කිරීම** කෙරෙහි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ අවධානය යොමුව ඇත.

ඒ සඳහා **ජාතික මට්ටමින් ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ සහ බලගතු කිරීමේ කාර්යය ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිදු කරමින් සිටින අතර, "ජනපවුර" එහි ප්‍රධානත ම වැඩසටහනක් ලෙස නිර්මාණය වී ඇත.** ඒ හැරුණු විට අධ්‍යාපන අමාත්‍යංශය හා එක්ව ක්‍රියාත්මක කරන **"පාසල් ළමා ආරක්ෂක කමිටු"** පිහිටුවීමේ වැඩසටහනක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. පාසල් පද්ධතිය වඩා ළමා හිතකාමී සහ සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් තොර ස්ථානයක් බවට පත් කිරීමත්, ළමයින්ගේ සියලු ආකාර ගැටලු වලට යෝග්‍ය විසඳුම් සොයා කඩිනමින් සදාගැනීමට සියලු පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගැනීමත් මෙමගින් අපේක්ෂා කෙරේ.

මේ හැරුණු විට ළමයින් සමඟ සම්බන්ධ වී **විවිධ ආකාරයේ රාජ්‍ය ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම, ළමා ආරක්ෂාවට ඍජුව ම සම්බන්ධ වන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම, අධ්‍යාපන විද්‍යාපීඨ ගුරුවරුන් දැනුවත් කිරීම, සිවිල් ජනතාව දැනුවත් කිරීම හා බලගැන්වීම**

ආදී වැඩසටහන් තුළින් ළමා අපයෝජන වළක්වා ගැනීම සහ අපයෝජනයක දී වඩා සාධනීය ප්‍රතිචාර දැක්වීම උදෙසා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අදාළ වෘත්තිකයන් දැනුවත් කිරීම සඳහා ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරමින් සිටී.

එසේම ප්‍රජාපාදක (ජනතාව මුලික කොට ගත්) විශේෂ වැඩසටහන් ලෙස වතු ආශ්‍රිත ළමයින්, වෙරළ ආශ්‍රිත ළමයින්, වීථි ආශ්‍රිතව ජීවත් වන ළමයින්, ළමා රැකවරණ මධ්‍යස්ථාන ආශ්‍රිතව සිටින ළමයින් සම්බන්ධව පවතින අභියෝග තත්වයන් හඳුනා ගනිමින් ඔවුන්ගේ අවදානම හා අනාරක්ෂිත බව අවම කරමින් ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

## වින්දිත ළමයින්ගේ රැකවරණය තහවුරු කිරීම

අපයෝජනයට ගොදුරු වූ ළමයින්ට නීතියේ රැකවරණය සැලසීම මෙන් ම ඔවුන් සඳහා අවශ්‍ය මනෝ සමාජ රැකවරණය ලබා දෙමින් එම ළමයින් නැවත සමාජගත කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ළමයාට සහ පවුලට අවශ්‍ය උපදේශනය ලබා දීම, විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණය ගොඩනගා දීම, ළමයින් නැවත පාසල් ගත කිරීම ආදී ක්‍රියාමාර්ග ඔස්සේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඒ සඳහා කටයුතු කරමින් සිටී.

ළමයින් සඳහා මනෝසමාජීය මැදිහත්කරණ ලබාදීමේ දී පාසල්වල උපදේශනය සම්බන්ධ ගුරුවරුන් සමඟ සක්‍රියව සමීපව සම්බන්ධ වී ළමයින් ධනාත්මක ක්‍රම භාවිතා කරමින් සාමාන්‍ය තත්වයට පත් කිරීමත් පාසල්තුළ ළමයින්ට හිතකාමී පරිසරයක් ගොඩනැඟීම මෙන්ම ළමයින් ක්‍රීඩා, සමිති සමාගම් සහ බාහිර ක්‍රියාකාරකම් වල යෙදවීමෙන් ශාරීරිකව මෙන්ම මානසිකව සමබරතාවයක්, නායකත්වයක් හා පිරිපුන් පෞර්ෂයකින් හෙබි යෞවනයන් බවට පත් කිරීමට අවශ්‍ය

මාර්ගෝපදේශනය ලබා දීමත් සිදු කරමින් සිටී. මෙවැනි වැඩසටහන් තුළින් ළමයින් අපයෝජන වලින් වැළැක්වීම අපේක්ෂා කෙරේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශයේ සම්බන්ධීකරණය යටතේ දිවයින පුරා විසිරී සිටින ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමා ආරක්ෂක නිලධාරීන් සහ මනෝසමාජීය නිලධාරීන් විසින් මෙම කාර්යභාරයන් සිදු කරනු ලබයි.

## ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම

ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිමය මට්ටමින් මැදිහත්වීමට මෙන් ම ළමා අපයෝජන සම්බන්ධයෙන් නිසි පරිදි අදාළ පියවර විද්‍යාත්මක මට්ටමින් ගැනීම උදෙසා ළමා අපයෝජන පිළිබඳ ජාතික මට්ටමේ දත්ත පැවතීම අත්‍යාවශ්‍ය වේ. ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරයක් ලෙස ද ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත තුළ දක්වා ඇත. ඒ අනුව වඩා පුළුල් ලෙස ළමා අපයෝජන පිළිබඳ දත්ත ද ඇතුළත් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික මට්ටමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම කෙරෙහි ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඉදිරියේදී කඩිනමින් කටයුතු කරනු ඇත. ඒ සඳහා ජනපවුර සාමාජිකයින් සෘජුව දායක කර ගැනීමට අපේක්ෂිතය.

ජනපවුර වැඩසටහන ඔස්සේ ග්‍රාමසේවක කොට්ඨාස මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් ළමා ආරක්ෂාව පිළිබඳ දත්ත එක්රැස් කොට අවසන් වශයෙන් ජාතික මට්ටමේ දත්ත පද්ධතියක් ගොඩනැගීම සඳහා මේ වන විට කටයුතු සැලසුම් කරමින් පවතී. අනාරක්ෂිත, අවදානම් හා ආන්තික ළමයින් සිටිනා ප්‍රදේශයන් හඳුනා ගනිමින් ඔවුනට අවශ්‍ය පහසුකරණයන් සැලැස්වීම සඳහා මෙම

දත්ත පද්ධතිය උපයෝගී වනු ඇත. ඒ සඳහා ප්‍රජා දායකත්වය මත මෙම දත්ත එක්රැස් කිරීම ඔස්සේ වඩා නිවැරදි තොරතුරු ලබාගැනීමට හැකිවනු ඇත. **මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමෙන් පසු ළමා ආරක්ෂාව පිළිබඳ පූර්ණ දත්ත පද්ධතියක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතු වන අතර, ළමා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාත්මක පාර්ශවයන්ට තම කටයුතු සඳහා මෙම දත්ත භාවිත කිරීමට හැකිවනු ඇත.**

## ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම සහ මහජනතාව වෙත තොරතුරු සැපයීම

ළමා ආරක්ෂාව පිළිබඳ රට තුළ විද්‍යාත්මක පර්යේෂණයන් සිදු කිරීම ළමා ආරක්ෂාවෙහි විවිධ පැතිකඩ හා ප්‍රවණතාවන් හඳුනාගැනීමට ඉවහල් වනු ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එම කරුණ කෙරෙහි ද අවධානය යොමු කොට ඇති අතර, එම පර්යේෂණයන්ගේ අනාවරණයන් සහ නිර්දේශ වඩා සාර්ථක ළමා ආරක්ෂක පද්ධතියක් රට තුළ ගොඩනැගීම සඳහා භාවිත කරනු ලබයි. එසේ ම ළමයින් ද ඇතුළුව මහජනතාව වෙත අවශ්‍ය තොරතුරු සැපයීම ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සලසනු ලබන තවත් සේවාවකි.

අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය අංශය විසින් විවිධ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය භාවිත කරමින් මහජනතාව වෙත ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම ලබා දෙමින් සිටී. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය අංශය වෙත පැමිණීමෙන්, දුරකථන මාර්ග ඔස්සේ විමසීමෙන්, තැපැල් මාර්ගයෙන් ඉල්ලීම් කිරීමෙන් ඕනෑම අයෙකුට ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ අධිකාරියේ ප්‍රකාශන නොමිලේ ලබා ගැනීමට හැකියාව පවතී.

එසේම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන www.childprotection.gov.lk යන අධිකාරියේ නිල වෙබ් අඩවිය සහ

youthink.lk ළමා ආරක්ෂක තොරතුරු වෙබ් අඩවි වෙත පිවිසීමෙන් ඔබට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම කළ හැක.

## ළමා ආරක්ෂාව උදෙසා අපගේ ඉදිරි ගමන් මඟ

ඉහත සඳහන් පරිදි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමස්ත ශ්‍රී ලාංකීය ළමා පරපුරට අවශ්‍ය රැකවරණය සැලසීමේ ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ සඳහා පුළුල් බලතල ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. එසේ නමුත් සක්‍රීය ප්‍රජා සහභාගීත්වයකින් තොරව කවරාකාර වූ හෝ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාමාර්ගයක් සාර්ථක නොවන බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශ්වාසය යි.

## "ජන පවුර"

***ග්‍රාමීයව, ප්‍රාදේශීයව, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බලපෑම් කළ හැකි අවදියෙන් සිටින ප්‍රජා එකමුතුවක් ගොඩ නැගීම.***

ලෝකය ම ළමයින් පිළිබඳව කථා කරන්නේ වඩාත් ආදරයෙනි. ඒ මිනිසා ජීවත් කරවන බලවේගය ළමයින් නිසා ය. ළමයින්ට එරෙහිව සිදුවන අපයෝජන හා හිංසනයන් දවසින් දවස ඉහළ යන බවක් පෙනෙන්නට ඇත. එය රටක් වශයෙන් ඇති ප්‍රබල ගැටළුවකි. සියලු ළමයින්ගේ උපරීම යහපත උදා කිරිමේ ප්‍රමුඛ අරමුණින් ක්‍රියාත්මක වන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පසුගිය වර්ෂයන් කිහිපයේ දිස්ත්‍රික් මට්ටමින් ළමයින්ට සිදුවන විවිධාකාරයේ අයිතිවාසිකම් කඩවීම් හා අපයෝජන පිළිබඳ ළමා උපකාරක දුරකථන සේවය වන 1929 වෙත විශාල වශයෙන් තොරතුරු වාර්තා වී ඇත.

වාර්තාකරණය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී අපේ රටේ තවමත් විවිධ හේතු නිසා ළමා අපයෝජන වාර්තා වන්නේ ඉතා අඩු ප්‍රමාණයක් බව විද්වතුන්ගේ අදහස යි. එය ලංකාවේ මෙන්ම ලෝකයේම දැකිය හැකි පොදු තත්වයකි. මෙම වාර්තාකරණය අඩුවීම උදෙසා බලපා ඇති හේතු වශයෙන් දැකිය හැකි කරුණු කිහිපයකි.

1. ළමයින්ට සිදුවන අපයෝජනයන් සාමාන්‍ය දෙයක් ලෙස වැඩිහිටියන් සැළකීම.
2. ළමා අපයෝජන මොනවාදැයි ප්‍රජාවේ බොහෝ දෙනෙකු නොදැන සිටීම.
3. ළමයින් ද එය නොදැන සිටීම නිසාම හෙළි නොකර සිටීම.
4. අපයෝජකයාගේ බලපෑම නිසා ඇතිවන භය නිසා, සඟවා තබා ගැනීම.
5. නීතිය ක්‍රියාත්මක වීමේ දී මුහුණපෑමට සිදුවන විවිධ දුෂ්කරතා නිසා හෙළි වන තෙක් සිටීම.
6. නීතියේ සාධාරණය සම්බන්ධයෙන් මිනිසුන් අතර පවතින වැරදි වැටහීම් නිසා ඉදිරිපත් වීමට ඇති මන්දෝත්සාහී බව.
7. පවතින නඩුවල තීන්දු ලබා දීමට / දඬුවම් ලබා දීමට දිගු කාලයක් ගත වීම.
8. අපයෝජනයට හා අපචාරවලට ලක් වූ ළමයින් එම ක්‍රියාවන් වලට ක්‍රමිකව ඇබ්බැහිවීම නිසා හෙළි නොකර සිටීම.
9. ළමයාට සිය අපයෝජනය පිළිබඳව පැවැසීමට කෙනෙකු හෝ අවස්ථාවක් නොමැතිකම.
10. රැකබලා ගන්නන් විසින් සිදුකරන අවස්ථාවල දී හඬක් නැගීමට අවස්ථාවක් නොමැතිකම නිසා ඉවසා සිටීම.
11. සමාජ බලපෑම් වලින් මිදීම සඳහා සඟවා ගැනීම.
12. භාරකරුවන් විසින් දැන දැන ම ළමයින් අපයෝජන ක්‍රියාවන් වලට යෙදවීම හා ආදායම් මාර්ගයක් වශයෙන් එය පවත්වාගෙන යාම.

වැනි කරුණු සමඟ තවත් අඩු වැඩි වශයෙන් බලපාන කරුණු ද ඇතුළත්ය. මේ හේතු මත ළමා අපයෝජනයන් තව දුරටත් වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිර්මාණය වී තිබේ. මේ හේතුව නිසා අපයෝජකයන් විසින් දිගින් දිගටම ළමයින්ගේ අනාගතය අඳුරු කරවීම සඳහා බලපෑම් කරනු දැකිය හැකිය. ඒ ඔස්සේ පෞරුෂ ගැටළු සහිත ළමා පරපුරක් බිහිවීම වළක්වාලීම ඉතා ම දුෂ්කර කාර්යයක් වී ඇත. එමෙන් ම ළමයින් සම්බන්ධයෙන් වන සියළු ම ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනයක් ද නිරන්තරව සිදුවන බව නිරීක්ෂණය කළ හැකිය.

ළමයින්ට එරෙහිව සිදුවන විවිධාකාරයේ අපයෝජනවලට බලපාන සාධක රාශියක් ද හඳුනාගෙන ඇත. ඒ අතර,

1. වැඩිහිටියන්ගේ සහ පාසල් දරුවන් අතර පවතින මත්ද්‍රව්‍ය භාවිතය
2. දිළිඳුකම හා බැඳුණු ජීවත් විමේ ආර්ථික අපහසුතා
3. බිඳුණු පවුල් පරිසරයක ළමයින් ජීවත්වීම
4. රැකවරණයක් නොමැති පවුලක ළමයින් ජීවත්වීම
5. මාධ්‍ය හා සමාජ ජාල වෙබ් අඩවි භාවිතය සම්බන්ධයෙන් ඇති නොදැනුවත්කම (තාක්ෂණය අවභාවිතය) හා මෙවලම් සුලබ වීම.
6. ළමයින් පිළිබඳ ව ඇති සමාජ ආකල්ප (තමන්ගේ ළමයා පිළිබඳ පමණක් සිතීම)
7. ළමා අපයෝජන, ඒවා වළක්වා ගැනීම සම්බන්ධයෙන් පවතින නොදන්නාකම හා උදාසීනත්වය මෙන්ම අපයෝජකයන්ගේ බලය හා ධනයට ඇති භය.
8. නීතිය පිළිබඳ නොදැනුවත්කම සහ ආයතන වල ඒ සම්බන්ධ කටයුතු සිදු කරන ආකාරයත් පිළිබඳ ඇති නොසතුට
9. වගකීමෙන් තොරව මව්වරුන් විදේශගත වීම
10. තරඟකාරී විභාග රටාව තුළ ළමයින්ගේ මනස තුළ වර්ධනය වන දැරිය නොහැකි පීඩනය යනාදිය ඒ අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී.
11. වගකීමෙන් තොර මාධ්‍ය භාවිතය.

මෙම සාධක සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී පසක් වන්නේ බොහෝ ළමා අපයෝජන ගැටළුවලට මූලික බීජයන් වන්නේ ද මෙම සාධක ම බවයි. එබැවින් මෙම සාධක වෙනස් කිරීම රටක ඉදිරි ගමන් මඟ තීරණය කිරීමට සෘජුවම බලපායි. එම වෙනස් කිරීමේ ප්‍රබලම සාධකය වන්නේද ජනතාවයි.

වත්මන් සමාජයේ ළමයින් අපයෝජනයට පත්වීමෙන් පසුව ඉන් සුළු කොටසක් නීති ක්‍රියාවලියට යොමු වේ. අනෙක් පිරිස එම ශෝචනීය අත්දැකීමත් සමඟම ජීවිතය ඉදිරියට ගෙන යයි. නීති ක්‍රියාවලියට යොමු වූ ළමයින් බොහෝ අවස්ථාවල දී ද්විතීක වින්දිතභාවයට පත්වෙමින් දිගු කාලයක් සාධාරණය වෙනුවෙන් බලා හිඳී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ළමයින් මානසික රෝගී තත්වයන්ට භාජනය වනවා සේ ම විවිධ පෞරුෂ දුර්වලතාවයන්ට ද ගොදුරු වේ. එමෙන් ම දිගුකාලීනව කේන්තියෙන් හා අසතුටින් කාලය ගත කරන නොසන්සුන් මෙන් ම අතෘප්තිමත් ළමයෙකු බවට ද පත්විය හැක. අපයෝජනයට පත් ළමයින් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගයන්ට ගොදුරුවීමේ ඉඩකඩ පවතිනවා සේම මෙම අත්දැකීම් හේතුවෙන් කෘෘර හැසිරීම් සඳහා ඔවුන්ගේ නැඹුරුව මෙන් ම සියදිවි නසා ගැනීමේ අවදානම ද ළමයින් තුළ ගොඩනැගී ඇත. එමෙන් ම අපයෝජනයට පත්වූ ළමයෙකු කෙරෙන් දිස්වන භයානක අවසන් ප්‍රතිඵලය වශයෙන් විද්වතුන් පෙන්වා දෙන්නේ ඔවුන් ද අනාගතයේ අපයෝජකයින් බවට පත්වීමේ නැඹුරුතාවයක් පවතින බවයි. එය විෂම චක්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වන බවත් එයට අනුව නැවත නැවතත් ළමා පරපුර හිංසාවට හා පීඩාවට බඳුන් වන අයුරුත් පෙන්වා දිය හැකිය.

රටක් වශයෙන් සලකා බැලීමේ දී මෙවැනි අපයෝජනයට ලක්වූ ළමයින් වෙනුවෙන් ප්‍රතිකාර කිරීම, පුනරුත්තාපනය සහ නීති ප්‍රතිපාදන සැලසීම වෙනුවෙන් විශාල මුදලක් මෙන්ම මිනිස් ශ්‍රමයක් ද වැය කිරීමට සිදු වේ. එමෙන් ම රටේ අනාගතය භාර ගැනීම පිණිස ගොඩනැගිය යුතු ළමයින්

බිඳුණු පෞරුෂයකින් යුක්ත පරපුරක් වීම හේතුවෙන් රටේ දියුණුව අඩපණ විය හැක. එබැවින් සෞභාග්‍යමත් ශ්‍රී ලාංකීක ළමයින්ගේ අයිතීන් සුරකිමින් යහපත් පරිසරයක ඔවුන්ට ජීවත් වීමට ඇති අයිතිය ලබාදීම රජයේ ප්‍රමුඛ හා අත් හළ නොහැකි වගකීමකි. ශ්‍රී ලංකාව 1991 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ පාර්ශවකරුවෙකු බවට පත්විය. එම ප්‍රඥප්තියේ අඩංගු කරුණු ඉටු කිරීම පිණිස වගකීමෙන් බැඳී සිටින ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018 වර්ෂයේ සිට ජාතික වැඩසටහනක් ලෙස ජනපවුර වැඩසටහන ක්‍රියාත්මක කරයි.

**ග්‍රාමීයව, ප්‍රාදේශීයව, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බලපෑම් කළ හැකි සිවිල් සමාජ පුරවැසියන්ගෙන් සැදුම් ලත් වහා ක්‍රියාත්මක වන අවධියෙන් සිටින ස්වෙච්ඡා ජනතා සංවිධානයක් ගොඩ නැගීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.**

- **සෙසු අරමුණු -**

1. <u>ප්‍රජාව බල ගැන්වීම.</u>
   ගම් මට්ටමින් සලකා බලන විට එම ගමෙහි ළමයින් ආරක්ෂා කිරීම එම ගමෙහි සියළු දෙනාගේම සාමූහික වගකීමකි. එබැවින් ඔවුන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහා ගම් මට්ටමින් ක්‍රියාත්මක වන යෞවන සමාජ, අවමංගල්‍යාධාර සමිති, සමථ මණ්ඩල හා කාන්තා සමිති වැනි සිවිල් ක්‍රියාකාරී සංවිධාන වල සමාජිකයින්ගේ එකමුතුකම, දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම තුළින් ඔවුන් විසින් සිදුකරන ක්‍රියාකාරකම් වලට වටිනාකමක් ලබා දීමත් එම ක්‍රියාකාරකම් දියුණු කරගැනීම සඳහා ඔවුන් බලගැන්වීමත් මෙහි ප්‍රධාන අරමුණකි. (වඩාත් ප්‍රතිඵලදායී ප්‍රවේශ වෙත යොමු කරවීම)

2. <u>ළමුන් සම්බන්ධයෙන් ජාතික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම</u>

3. <u>ගම් මට්ටමින් අපයෝජන මැඩ පැවැත්වීමේ යාන්ත්‍රණයක් ගොඩ නැගීම.</u>
ළමයින්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහා ගම් මට්ටමින් තොරතුරු රැස්කිරීම හා අන්තර් සබඳතා ගොඩනැගීම ඉතා අවශ්‍ය සාධකයකි. ඒ සඳහා නිශ්චිත යාන්ත්‍රණයක් ගම තුළ ස්ථාපිත කළ යුතුය.

4. <u>විදේශ ගත වූ දෙමාපියන්ගේ ළමයින් ආරක්ෂා කිරීම උදෙසා වැඩදායී හා පොදු වැඩ පිළිවෙලක් ප්‍රජාව සමඟ එක්ව නිර්මාණය කර පවත්වාගෙන යාම.</u>
ගම් මට්ටමින් ළමා අපයෝජන, අපචාර වැළැක්වීම මෙන්ම ගම තුළ සිටින විගමනික (විදේශගත) දෙමාපියන්ගේ ළමයින් ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර ගැනීම.

5. <u>ළමා ආරක්ෂක වැඩසටහන් ගම් මට්ටමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.</u>
ගම් මට්ටමින් ළමයින්ගේ සුරක්ෂිතතාවය වැඩි කිරීම සඳහා උචිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මෙම පිරිසගේ සහාය හා අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම.

6. <u>ජාතික මට්ටමින් ඒ ඒ ප්‍රදේශවල ළමයින්ගේ සහ වින්දිත ළමයින්ගේ යහපැවැත්ම උදෙසා රජය විසින් ගත යුතු පියවර, නීති සංශෝධන, ප්‍රතිපත්ති ආදීය පිළිබඳ ව රජයට කරුණු ඉදිරිපත් කිරීමට බිම් මට්ටමේ සිට තොරතුරු ගලා ඒමේ යාන්ත්‍රණයක් සකස්කිරීම.</u>

## වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵලය

"ජන පවුර" දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් ග්‍රාම නිලධාරී වසම් 14021 සඳහා සාමාජිකයින් 80,000ක් පමණ ඒකරාශී කර ඇති කරන ජාතික වැඩසටහන මගින් ළමයින් සියළු අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට මෙන්ම 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා විහිදෙන ජාලයක් ගොඩනගා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහි අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ.....

1. ජාතික මට්ටමින් ග්‍රාමීය මට්ටමින් යෞවන සමාජ, අවමංගල්‍යාධාර සමිති, සමථ මණ්ඩල හා කාන්තා සමිති වැනි ක්‍රියාකාරී සිවිල් සංවිධාන සාමාජිකයින් නියෝජනය කරමින්, ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා බලපෑම් කළ හැකි ඒ සම්බන්ධයෙන් ආකල්ප, දැනුම හා කුසලතාවයන් ලබාගත් 80,000ක සිවිල් ජනතා බලමුළුවක් නිර්මාණය කිරීම.
2. ළමයින් සම්බන්ධයෙන් වන තොරතුරු ඇතුළත් ජාතික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා එම ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම. ඒ සඳහා ජන පවුර සාමාජිකයින්ගේ සහය ලබා ගැනීම.
3. උචිත පියවර ගැනීම සඳහා ගම් මට්ටමින් ළමා අපයෝජන, අපචාර වැළැක්වීම මෙන්ම ගම තුළ සිටින විගමනික (විදේශගත) දෙමව්පියන්ගේ ළමයින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී උචිත පියවර ගැනීම සඳහා ගම් මට්ටමින් ළමා ආරක්ෂාව සහතික කෙරෙන ජනතා සහභාගීත්වයෙන් යුත් විධිමත් යාන්ත්‍රණයක් ගොඩ නැගීම.

4. දැනටමත් අපයෝජනයට පත්වූ ළමයින්ට ගම තුළ සුරක්ෂිතව හා අභිමානයෙන් ජීවත්වීමට අවශ්‍ය සහාය ලබාදීමේ වැඩ පිළිවෙලක් ගම් තුළ ස්ථාපිත කිරීම.
5. ජාතික මට්ටමින් ඒ ඒ ප්‍රදේශවල ළමයින්ගේ සහ වින්දිත ළමයින්ගේ යහපැවැත්ම උදෙසා රජය විසින් ගත යුතු පියවර, නීති සංශෝධන, ප්‍රතිපත්ති ආදීය පිළිබඳ ව රජයට කරුණු ඉදිරිපත් කිරීමට බිම් මට්ටමේ සිට තොරතුරු ගලා ඒමේ යාන්ත්‍රණයක් සකස්කිරීම.
6. මේ වන විටත් රටක් වශයෙන් රටේ ළමයින්ගේ ආරක්ෂාව හා ගැටළුවලට මුහුණ දුන් ළමයින් වෙනුවෙන් නීති සේවා හා සුබ සාධන සේවාවන් සඳහා වැයවන මුදල් අවම කරමින් ඔවුන් වෙත ඉහළ සේවාවක් ලබා දීම.
7. රටේ අනාගතය බාර ගැනීමට සිටින ළමයින් ආරක්ෂා කරමින් සහ ඔවුන් ඉහළ සංවර්ධන මට්ටමකට පත් කරමින් රටට සම්පතක් වන අභිමානවත් ළමා පරපුරක් පිරිසක් බිහි කිරීම මගින් මව්බිම අනාතයේ දී ලෝකයේ ඉහළ මට්ටමකට ඔසවා තැබීම.

මෙම සටහනට අනුව රටේ ළමයින් සුරක්ෂිත කරමින් ඔවුන් වැඩෙන පරිසරයේ සාරධර්ම සංවර්ධනය කිරීම උදෙසා සක්‍රීය යාන්ත්‍රණයක අවශ්‍යතාවය ප්‍රබල ලෙස දැනේ. මේ ආකාරයට ගම් මට්ටමෙන් මෙම හේතු සාධක නිවැරදිව වෙනස් කිරීම උදෙසා සිවිල් සමාජ කණ්ඩායම් සජීවීකරණ ක්‍රියාවලියට යොමු කරවීම සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය ප්‍රජා සජීවිකරණ වැඩසටහන්වල දී ලෝකයේ ඵලදායී ප්‍රවේශයක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018 වර්ෂයේ දී ගම් මට්ටමින් ළමා ආරක්ෂාව දැඩි කිරීම සම්බන්ධයෙන් ප්‍රජාව ශක්තිමත් කිරීම තුළින් ළමා අපයෝජන වැළැක්වීමේ බලපෑම් කණ්ඩායම් ඒකාබද්ධ ව "ජන පවුර" ගොඩ නගනු ඇත. ළමා අපයෝජන වාර්තාකරණය කඩිනම් කිරීම හා තොරතුරු සැපයෙන ජාලයක් එතුළින් නිර්මාණය කිරීම ද අනෙක් උප ප්‍රධාන කාර්යයකි.

විශේෂයෙන් ම රට පුරා දැනටමත් ඉතා ක්‍රියාකාරී සංවිධාන ලෙස ගොඩනැගී ඇති අවමංගල්‍යාධාර සමිති, සමථ මණ්ඩල, කාන්තා සමිති, පාසල් සංවර්ධන සමිති සහ යෞවන සමාජ ප්‍රජා සංරක්ෂක කමිටු, පාසල් ආදී ශිෂ්‍ය සංගම් වැනි ක්‍රියාකාරී සිවිල් සංවිධාන ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ශක්තිමත් කිරීම පළමු අදියරයේ දී ඉලක්කය බවට පත් කිරීම මෙහි පළමුවෙන් අපේක්ෂා කර ඇත. මෙම ජාලය හඳුනා ගැනීමේ දී පෙනී ගිය විශේෂ කාරණයක් වන්නේ ඒවා ශක්තිමත්ව ගම් මට්ටමෙන් ක්‍රියාත්මක වන බවයි. එබැවින් මෙම වැඩසටහන් සඳහා ද එම ජාලය තෝරා ගැනීමට තීරණය කරන ලදී. මීට අමතර ව මෙම කටයුත්ත සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සුදුසු ඕනෑම පුද්ගලයින් හා සංවිධානයන් ද ඇතුළත් වනු ඇත.

කෙසේ නමුත්, ගම් මට්ටමින් සිටින බොහෝ පුද්ගලයින්ට ළමයින්ට සිදුවන අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් උවමනාවක් පැවතියත් ඒ වෙනුවෙන් ඉදිරිපත් වීමට පසු බසී. ඊට ප්‍රධාන හේතුවක් වන්නේ ඒ වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයා අපයෝජකයින්ගේ විවිධ තර්ජනවලට හා හිංසනවලට ඉලක්ක වීමයි. කෙසේ නමුත් ඔවුන් හට ශක්තියක් ලබාදෙමින් එම සාමාජිකයින් අතර එකමුතුවක් පවතී නම් එය ශක්තිමත් ජාලයක් බවට පත්වේ. එවිට ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ තනි තනි පුද්ගලයින් වශයෙන් නොවන නිසා ඉදිරිපත් වීමේ ගැටළුව අවම වේ. එමෙන්ම ගමේ එවැනි යාන්ත්‍රණයක් පවතින්නේ නම් අපයෝජකයින්ගේ ක්‍රියාකාරකම් දිනෙන් දින අවම වීමට එය ප්‍රබල පිටුවහලක් වනු ඇත.

දැනටමත් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ස්වේච්ඡා සාමාජිකයින් විවිධාකාරයේ දැනුම් හා අවබෝධ මට්ටම්වල සිටින අතර ඔවුන්ට විධිමත් හා ඵලදායී ප්‍රවේශයන් සම්බන්ධයෙන් අවබෝධයන් ලබා දිය යුතුව පවතී. එවිට ඔවුන් කරන කටයුතුවලට විධිමත් ප්‍රවේශයන් හඳුන්වා දීමෙන් ඉලක්ක ගත ප්‍රතිඵල කරා යාමේ හැකියාව ඇති වේ. එමෙන්ම විවිධ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා උදාකරදීම මගින් නව

ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට අවස්ථාව සැලසේ. ඒ අතර ම ඔවුන්ගේ මැදිහත් වීම් ඇගයුමකට ලක්වන අතර ඒ තුළින් තව තවත් මෙවන් ක්‍රියාකාරකම්වල නියැළීමේ උනන්දුව ඔවුන් තුළ ඇති වේ. පුද්ගල සංවර්ධනය පිණිස ද මෙය මහෝපකාරී වනු ඇතැයි අපේක්ෂා කරයි. තවද විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ගම් මට්ටමින් දිගුකාලීන ව නොපවතින නමුත් ඔවුන් අතර ජාලයක් ගොඩනැගීම තුළින් ස්ථිරසාර දිගුකාලීන යාන්ත්‍රණයන් ළමා ආරක්ෂාව සඳහා ක්‍රියාත්මක වනු ඇත.

## සංවිධාන ව්‍යුහය

i. “ජන පවුර” සාමාජිකයින් වශයෙන් සෑම ග්‍රාම සේවා නිලධාරී වසමකට ම අවම වශයෙන් සක්‍රීය සාමාජිකයින් 05 දෙනෙකු තෝරා ගැනීම. (ග්‍රාම සේවා කොට්ඨාශයක ඇති එක් ගමකට අවම වශයෙන් එක් “ජන පවුර” සාමාජිකයකු වශයෙන්)

| | |
|---|---|
| අවමංගල්‍යාධාර සමිති සාමාජිකයින් | 01 |
| සමථ මණ්ඩල සාමාජිකයින් | 01 |
| කාන්තා සමිති සාමාජිකයින් | 01 |
| පාසල් සංවර්ධන සමිති සාමාජිකයින් | 01 |
| යෞවන සමාජ සාමාජිකයින් | 01 |
| මීට අමතරව වෙනත් ඕනෑම හා සුදුසු ස්වෙච්ඡා සංවිධාන හා තැනැත්තන්ට ද ඇතුළත් විය හැකිය | |
| **එකතුව** | **05** |

මීට අමතර ව රාජකාරි මට්ටම ඉක්මවා ගිය ස්වෙච්ඡාවෙන් සම්බන්ධවීමට කැමති පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය, තරුණ සේවා නිලධාරී, ග්‍රාම සේවා නිලධාරී, වසම භාර පොලිස් නිලධාරී හා

අනෙක් රාජ්‍ය නිලධාරීන් හා ස්වේච්ඡා සංවිධාන නිලධාරීන් ද මෙහි සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ඇත.

ii. ඒ අනුව ග්‍රාම සේවා වසමකින් ක්‍රියාකාරී ස්වේච්ඡා සංවිධාන නියෝජනය කරමින් සාමාජිකයින් 05 දෙනෙකු සහ ස්වේච්ඡාවෙන් ජන පවුර සාමාජිකත්වය ලබා ගන්නා සාමාජිකයින් සමඟ ග්‍රාම නිලධාරී වසම් 14021 නියෝජනය කරමින් සාමාජිකයින් 80000 ක ප්‍රමාණයක් අවම වශයෙන් ජන පවුරේ නියෝජතයින් බවට පත් වේ.

iii. ග්‍රාම සේවා නිලධාරී වසම් මට්ටමින් තෝරා ගන්නා පිරිස් අතුරෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ එකකින් 03 දෙනා බැගින් තෝරාගෙන "දිස්ත්‍රික් ජන පවුර" ගොඩ නැගීම. (උදා: කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාමාජිකයින්- 3 බැගින් x ප්‍රා.ලේ.30 සඳහා = 90 දෙනෙකු)

iv. එක් දිස්ත්‍රික්කයකින් නියෝජිතයින් දෙදෙනෙකු බැගින් දිස්ත්‍රික්ක 25 සඳහා සාමාජිකටන් 50 දෙනෙකු සහ ළමා ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන රජයේ නිලධාරීන්ගෙන් ජාතික ජන පවුර සමන්විත වේ.

v. දේශපාලන, ජාතිවාදී, ආගම්වාදී, භාෂාව වැනි කරුණු පදනම් කර ගත් පටු පරමාර්ථ සහිත සංවිධාන හා තැනැත්තන්ට ජන පවුර සාමාජිකත්වය ලබා ගත නොහැකිය. එසේම ළමා අපයෝජකයන්ටද, ළමා හිංසනයන්ට දායකවූවන්ටද මෙම ජනපවුරේ සාමාජිකත්වය ලබා ගැනීමට කිසිදු ඉඩක් නොමැත.

## සංවිධාන ව්‍යුහය

උදාහරණය - කොළඹ දිස්ත්‍රික්කය

| ප්‍රා. ලේ. කො. | ග්‍රා. සේ. වසම් | “ජන පවුර” සාමාජිකයින් |
|---|---|---|
| 13 | 557 | 2785 (557 x සාමාජිකයන් 05) |




ක්‍රියාකාරී සිවිල් සංවිධාන සාමාජිකයින්
+
ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන රාජ්‍ය නිලධාරින්
ස්වේච්ඡාවෙන් සම්බන්ධවන්නන්
"ජන පවුර" ව්‍යුහය
නිලධාරී ව්‍යුහය
ජාතික ජන පවුර - සාමාජිකයින් 50
(දිස්ත්‍රික්කයකින් 02 අයෙකු බැගින් දිස්ත්‍රික් 25 සඳහා 50 දෙනෙකු සහ ළමා විෂයේ ප්‍රවීණයන් 25) දෙනා බැගින් සඳහා)
+
1 විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්
2 විෂයට අදාල ලේකම්වරුන්
3 පොලිස්පති
4 පරිවාස කොමසාරිස්
5 වෛද්‍ය විශේෂඥයින්
6 සමාජ විද්‍යාඥයන්
7 මනෝ විද්‍යාඥයන්
8 මනෝ චිකිත්සකවරු
9 ළමා විෂයට අදාළ අනෙකුත් ජාතික මට්ටමේ නිලධාරීන්
10 රාජ්‍ය නොවන සංවිධාන
02
දිස්ත්‍රික් ජන පවුර - සාමාජිකයින් 993
(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් 03 දෙනා බැගින් ප්‍රා ලේ කො 331 සඳහා)
+
1 දිස්ත්‍රික් ලේකම්
2 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
3 වෛද්‍ය විශේෂඥයින්
4 අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
5 ළමා විෂයට අදාළ අනෙකුත් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්
6 රාජ්‍ය නොවන සංවිධාන
03
ග්‍රාමීය ජන පවුර - සාමාජිකයින් 993
(එක් ග්‍රාමසේවා වසමකින් ස්වේච්ඡා සංවිධාන වලින් 5 දෙනෙකු සහ ස්වේච්ඡාවෙන් ජන පවුර සාමාජිකත්වය ලබා ගන්නා සාමාජිකයින් සමග ග්‍රාමසේවා වසම් 14021 සඳහා )
+
1 ළමා ආරක්ෂක නිලධාරී
2 පරිපාලන ග්‍රාම නිලධාරී
3 පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී
4 සමෘද්ධි සංවර්ධන නිලධාරී
5 තරුණ සේවා නිලධාරී
6 විදේශ රැකියා ප්‍රවර්ධන නිලධාරී
05
පළමු ගම 1
ග්‍රාම සේවා වසම
දෙවන ගම 2
තෙවන ගම 3
+
1 ග්‍රාම නිලධාරී
2 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී
3 සමෘද්ධි නිලධාරී
4 ආර්ථික සංවර්ධන නිලධාරී
5 තරුණ සේවා නිලධාරී
6 ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අය

## වැඩ සැලැස්ම

1. මේ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සාමාජික ඉල්ලුම්පත්‍රයක් සපයන අතර, එය සම්පූර්ණ කොට ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී වෙත භාරදිය යුතුය. (උදා: වසම් 30ක් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක සාමාජිකයින් - 5 x 20 = 100 දෙනෙකු)

2. එමෙන්ම මේ සඳහා ස්වේච්ඡාවෙන් දායකවීමට කැමැත්තක් දක්වන ඕනෑම අයෙකුට සෘජුවම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ඉල්ලුම්පතක් යොමු කරමින් ජන පවුරේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීමට දායක විය හැකියි. මේ සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීමක් 2018.08.05 දින ලංකාදීප පුවත්පතේ පළ කොට ඇත.

3. මෙලෙස ග්‍රාම සේවා නිලධාරී වසම් මට්ටමින් තෝරාගන්නා සාමාජිකයින් කණ්ඩායම් වශයෙන් මූලික පුහුණුවක් එම ප්‍රදේශවලදී ම ලබාදීම. මෙම පුහුණුව ලබාදීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන් ඇතුළු ප්‍රධාන කාර්යාලයේ ද නිලධාරීන් 120කගෙන් සමන්විත පුහුණුකරුවන් පුහුණු කිරීමේ කණ්ඩායමක් කටයුතු කරනු ඇත.

4. සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය මට්ටමේ ජන පවුර පුහුණු සැසියට පළමුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් සමඟ දින එකක වැඩමුළුවක් පැවැත්වීම.

5. පුහුණුව ලද පුහුණුකරුවන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජන පවුර සාමාජිකයින් උදෙසා එක්දින පුහුණු සැසියක් පැවැත්වීම. මෙම පුහුණුව වෙත සහභාගීවන සියළුම ජන පවුර සාමාජිකයින් වෙත ළමා ආරක්ෂාව, ඊට අදාළ නීතිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ තොරතුරු, ජාතික ළමා ආරක්ෂක

අධිකාරියේ නිලධාරීන් පිළිබඳ තොරතුරු, ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන්, ජන පවුර පිළිබඳ තොරතුරු, සටහන් තබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන ආදිය ඇතුළත් කර ඇති ළමා ආරක්ෂක අත්පොතක් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.

6. පුහුණුව අවසානයේ ජන පවුර සාමාජිකයින් විසින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා සිය ග්‍රාමසේවා වසමකට එක් ව්‍යාපෘතියක් සැලසුම් කිරීම හා ජන පවුර සාමාජිකයින් විසින් ජාතික දත්ත පද්ධතියට දත්ත ලබා ගැනීම සඳහා සකස් කළ ආකෘති පත්‍රය ග්‍රාම සේවා වසම් මට්ටමින් සම්පූර්ණ කිරීම.

7. එම දත්ත ජාතික දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී වෙත භාර දීම. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී විසින් දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීම.

8. ග්‍රාම සේවා නිලධාරී වසම් මට්ටමින් තෝරා ගන්නා පිරිස් අතුරෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ එකකින් 03 දෙනා බැගින් තෝරාගෙන "දිස්ත්‍රික් ජන පවුර" ගොඩ නැගීම. (උදා: කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාමාජිකයින් - 3 බැගින් x ප්‍රා.ලේ.30 සඳහා = 90 දෙනෙකු)

9. එම කණ්ඩායමෙන් අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකි 02 බැගින් බැගින් ජාතික මට්ටමේ ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන විශේෂඥ කණ්ඩායමකින් ද වන 75 දෙනෙකුගෙන් සමන්විත "ජාතික ජන පවුර" ගොඩ නැගීම.

## "ජන පවුර" සාමාජිකයින්ගේ ප්‍රධාන වගකීම්

1. ග්‍රාමීය මට්ටමින් ළමයින්ගේ ආරක්ෂාව තහවුරු නොවන අවස්ථා, අපයෝජන, අයිතිවාසිකම් කඩවීම පිළිබඳ ග්‍රාමීය මට්ටමින් ගැටළුකාරී අවස්ථාවල දී ඒ පිළිබඳ ව ඒකරාශී වී දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම් හෝ අදාළ නිලධාරීන් හෝ ආයතන වෙත බලපෑම් කරන කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් කඩිනමින් ළමයින්ට උපරිම යහපත උදා කිරීම.

2. ග්‍රාමීය මට්ටමින් ළමයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු වන සේ අවධි කණ්ඩායමක් ලෙස සංවිධානය වී ස්වෙච්ඡාවෙන් සම්බන්ධ වන ග්‍රාම නිලධාරී, ළමා ආරක්ෂක, පරිවාස නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී හෝ වෙනත් රාජ්‍ය නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීම.

3. ග්‍රාමීය මට්ටමින් ළමයින්ගේ විශේෂ අවශ්‍යතා, ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති අවධානම් තත්ව පිළිබඳ අවදානයෙන් සිටීම, ඒවා වැළැක්වීම හා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධ ප්‍රජාව දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම.

4. ග්‍රාමීය මට්ටමින් ළමයින් සම්බන්ධ තොරතුරු එක්රැස් කර දත්ත පද්ධතියක් ඇති කිරීමට සහය වීම. ළමයින් පිළිබඳ සංගණනයක් සිදු කිරීම හා එය යාවත්කාලීන කිරීම.

5. ජාතික මට්ටමින් ඒ ඒ ප්‍රදේශවල ළමයින්ගේ සහ වින්දිත ළමයින්ගේ යහපැවැත්ම උදෙසා රජය විසින් ගත යුතු පියවර, නීති සංශෝධන, ප්‍රතිපත්ති ආදීය පිළිබඳ ව රජයට කරුණු ඉදිරිපත් කිරීමට සහය වීම.

## "ජන පවුර" ජාලයේ සාමාජිකත්වය ලබා ගැනීම

මෙහි සාමාජිකත්වය සම්පූර්ණයෙන් ම සිවිල් ජනතාවට මෙන්ම රාජ්‍ය නිලධාරීන්ටද ස්වේච්ඡාවෙන්ම විය යුතුය. සාමාජිකයින් සඳහා සාමාජික කාඩ්පතක් සහ අනන්‍යතාවය තහවුරු කළ හැකි ආයතනික ලියවිල්ලක් නිකුත් කරනු ඇත. එහෙත් කිසිම විටෙක දේශපාලන හෝ වෙනත් පටු පරමාර්ථ සහිත සංවිධාන හෝ පුද්ගලයින්ට සාමාජිකත්වය හිමි නොවනු ඇත.

- සාමාජිකත්වය ලබාදීමේ හෝ අවසාන කිරීමේ බලය අදාළ ජන පවුර කණ්ඩායමේ බහුතර කැමැත්ත මත තීරණය කරනු ලැබේ.
- සාමාජිකත්වය සියළුම ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර අයවලුන් වනු ඇති බවට ජන පවුරේ විශ්වාසයයි.
- සාමාජිකත්වය ළමා අපයෝජයන්ට, ළමා අපයෝජකයන් යැයි සැකකරුවන්වූ හා ළමා හිංසනයන්ට දායකවූවන්ට කිසිදු ආකාරයකින් හිමි නොවනු ඇත.

## ව්‍යාපෘතියේ තිරසාර බව

මෙම ව්‍යාපෘතියේ තිරසාර බව රඳා පවත්වා ගැනීම උදෙසා සපුරා ගත යුතු ඉලක්ක කීපයකි. එනම්,

1. ළමුන් සියළුම අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සමිති සාමාජිකයින්ගේ ආකල්ප, දැනුම හා කුසලතා වර්ධනය කිරීම සහ ඔවුන් සංවිධාන ගත කර සවිබල ගැන්වීම.

2. ළමුන්ට හිතකාමී පරිසරයක් ගොඩනැගීම ගමේ ප්‍රජාවගේ වගකීමක් බවට පත්වීම. ඒ අනුව වර්ෂ දෙකක් අවසන් වන විට ළමා ආරක්ෂාව උදෙසා ජන පවුර වැඩසටහන ප්‍රජාව සතු වැඩසටහනක් වශයෙන් ස්ථාපිතවීම.

3. සමිති සමාජිකයින් හා ළමා ආරක්ෂක නිලධාරීන් මෙන්ම ස්වෙච්ඡා රාජ්‍ය නිලධාරීන් අතර සමීප හා විශ්වාසනීය සබඳතාවයක් ගොඩනැගීම තුළින් ගමේ ළමුන්ට අවදානම් තත්වයන්වලට මැදිහත්විමට ඉදිරිපත් විම.

4. අපයෝජනයක් වීමට පළමුව එය වළක්වාලීමේ යාන්ත්‍රණය ගම තුළ ගොඩනැගීම හේතුවෙන් රටේ සංවර්ධනයට අවශ්‍ය සුරක්ෂිත ළමා පරපුරක් බිහිවිම.

5. ඉදිරියේ දී ග්‍රාමීය මට්ටමින් වැඩසටහන් සංවිධානය කිරීමේ දී මෙම පිරිසගේ සහාය ලබා ගැනීමට හැකිවීම තුළින් සාර්ථක ප්‍රජා පාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවීම.

6. ජාතියේ ජීවනාලිය වන ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා යෝජනා රැගෙන යාමේ යාන්ත්‍රණයක් ස්ථාපිතවීම තුළින් රටක ප්‍රතිපත්ති හා සැලසුම් විධිමත් ආකාරයෙන් සකස්වීම.

## මහගමසේකර

මෙතුමා ශ්‍රී ලාංකික කවියෙක්, ගීත රචකයෙක්, නාට්‍ය රචකයෙක්, නවකතාකරුවෙක්, කලාකරුවෙක්, පරිවර්තකයෙකු සහ චිත්‍රපට නිෂ්පාදකයෙකි.
ප්‍රතිභා සම්පන්න ජනතාවාදී කලාකරුවෙකි.



"සිහින දැක දැක ඉන්න
කාලයක් තවත් නැත,
අවදි වන්න,
දොරගුළු හෙට දවසට.
ණය නැති
බිය නැති
නිවහල් යුගයක
පුංචි පුතා රජකරනු පෙනේ,
ඔබ හට ලෝකය ඉදි කර දී මිස,
යා නොහැකිය මට පුංචි පුතේ....."

## ළමා ආරක්ෂණයේ සංකල්පීය පැතිකඩ

ලෝකය සුන්දර වනුයේ, සුන්දර මිනිසුන් මතිනි. වර්තමානය නිර්මාණය වී ඇත්තේ අතීතයේ අප කළ කී දෑ වල ප්‍රතිඵලයක් ලෙසයි. ලෝක ඉතිහාසය ඉතා ප්‍රවේසමෙන් ගවේෂණය කිරිමේදි ළමයින් අත්විඳි කටුක, අමිහිරි අතීතය අප කම්පනයට පත් කරනවා සේම ඊට එරෙහිව නැගී සිටි සියලු බලවේගවල ක්‍රියාකාරීත්වයන් නිරන්තරවම අප ධෛර්යමත් කරනු ඇත.

අතීතයේ සුන්දර මිනිසුන් කළ කී දෑ වල ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ළමයින් යම් නිදහසක්, ආදරයක්, ආරක්ෂාවක් භුක්ති විඳින්නේ නම් එහි ගෞරවය ඔවුන් වෙත පිරිනැමිය යුතුමය. ඉදින් අද දවසේ අප ඉදිරියේ ඇති ළමා ආරක්ෂාවේ අභියෝග ජය ගැනීමට නම් එදා සිට අද දක්වා මානව පරපුරක් ලෙස අත්පත් කරගනු ලැබූ දැනුම් පද්ධතිය මත පිහිටා ප්‍රායෝගිකව කටයුතු කළ යුතුය.

ළමයින්ට එරෙහි කිසිදු ප්‍රචණ්ඩත්වයක් සාධාරනිකරණය කළ නොහැකිය. කිසිදු ළමා අපයෝජනයක් අහඹු සිදුවිමක්ද නොවනු ඇත. එබැවින් එය සිදු වන ආකාරය පිළිබඳ කල්තියා දැනගත හැකි බැවින් එය වළක්වා ගැනීමටද හැකිය. මේ සඳහා අවශ්‍ය වනුයේ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීමට සමත් දැනුම ආකල්ප හා කුසලතාව වැඩි දියුණු කර ගැනීමයි. ළමා ආරක්ෂාවට අත්පොත් තබන සැමට මෙකී සංකල්පිය පසුබිම මහඟු පිටුවහලක් වනු ඇත.

## ළමයා යනු

අවුරුදු 18 අඩු සෑම පුද්ගයෙකුම ළමයෙකු වන බව 1989 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ පළමු වන ව්‍යවස්ථාව තුළින් නිර්වචනයකර ඇත. ඒ අනුව එකී පනතේ ඇති සියලු අයිතිවාසිකම් අවුරුදු 18 අඩු සෑම පුද්ගලයෙකුටම භුක්තිවිදීමට සැලැස්වීමත් ළමයාගේ ආරක්ෂාව, සංවර්ධනය, පැවැත්ම හා සහභාගීත්වය තහවුරුකර ලබා දීමත් සියලු වැඩිහිටියන්ගේ වගකීමක් වේ. පොදු ජාත්‍යන්තර මතය මෙය වුවත් ශ්‍රී ලංකාවේ නීතියෙන්, නීතියට වරදේ ස්වභාවය මත ළමයා යන්න නිර්වචනය වීමේ වයස් සීමාවන් වෙනස් වේ. එය එසේ වුවත්, පොදු පිළිගැනීම හා ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 40 වන වගන්තියේ ළමයා යන්නෙන් වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකු අදහස් කළ යුතු බව දක්වා ඇත.

## ළමා ආරක්ෂාව (Child Protection)

ළමයින්ට විරුද්ධව සිදුවන ප්‍රචණ්ඩත්වයන් සූරාකෑම් හා අපයෝජනයන් වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය ළමා ආරක්ෂාව යටතේ සාකච්ඡා කරයි. (UNICEF) මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් “ප්‍රචණ්ඩත්වය, සූරාකෑම, නොසලකා හැරී ළමා අයිතිවාසිකම් උදුරා ගැනීම සහ සියලු ආකාරයේ අපයෝජනයන්ට එරෙහිව ප්‍රතිචාර දැක්වීමට, ප්‍රතිකාර කිරීමට හා ඒවා වැළැක්වීමට නිර්මිත සඵලදායී ක්‍රියාපටිපාටීන් හා ව්‍යුහයන් ඇතුළත් ක්‍රියාවලියක් ලෙස පැහැදිලි කළ හැකිය.

ළමයින් ආරක්ෂා කර ගැනීම උදෙසා විවිධ වැළැක්වීමේ ක්‍රියාවලීන්ට අවතීර්ණ වීමත්, එවැනි තත්වයකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියත් ළමා ආරක්ෂාවේදී ප්‍රමුඛතම කාර්යයන් වනු ඇත. ඒ අනුව, ළමයාගේ ආරක්ෂාව ගිළිහෙන,

- ළමා අපයෝජන හා නොසළකා හැරීම්,

- ප්‍රචණ්ඩත්වයෙන්,
- සූරාකෑම්,

ළමයා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සංකල්පීය පැතිකඩ පිළිබඳ විග්‍රහ කර බැලීම අත්‍යාවශ්‍ය කරුණකි.

## ළමා අපයෝජන (Child Abuse)

**ළමා අපයෝජනය යන වචනයේ සරල අර්ථය විග්‍රහකර බැලුව හොත් එකී වචනය "අප + යෝජනය" යන වචන දෙකේ එකතුවකින් සැකසී ඇති බව පැහැදිළිය. "අප" යන්නෙහි අර්ථය වනුයේ වැරදි යන තේරුමයි. "යෝජනය" යනු යෙදවීම යන්නයි. ඒ අනුව අපයෝජනය යනු, වැරදි යෙදවීම යන වචනාර්ථය ගනී.** අවුරුදු 18 අඩු ඕනෑම පුද්ගලයෙකු වැරදි ආකාරයේ යම් ක්‍රියාවකට යොදවා ගනිමින් හෝ යහපත් ක්‍රියාවක් නොකර හැරීමට සැළැස්වීමක් යම් පුද්ගලයෙකු විසින් සිදු කරයි නම් ඒ තුළ ළමා අපයෝජනයක් සිදු වන බව අර්ථගන්වනු ලබන බව සරලව පැහැදිළි කළ හැකිය. එහෙත් මේ පිළිබඳවූ පහත නිර්වචනයන් දෙස බලන විට අපයෝජනය යන්න වඩාත් ගැඹුරින් තේරුම් ගත හැකිය.

**"සියලු ආකාරයේ කායික, මානසික, අඩු සැලකීම හෝ අනිසි ලෙස සැලකීම, ලිංගික අපයෝජනය. නොසලකා හැරීම හෝ වානිජ හෝ වෙනත් ආකාරයේ සූරාකෑමක් නිසා පැවැත්ම, සංවර්ධනය, ගෞරවය පිළිබඳ වගකීම විශ්වාසය හෝ බලයට බලපානු ලබන්නා වූ සත්‍ය හෝ විය හැකි තත්ත්වයකි. දෙමාපියන් හෝ වෙනත් රැකබලාගන්නන් විසින් කරනු ලබන ඕනෑම ආකාරයේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මේ සඳහා අදාළ වන අතර, ළමා නිවාසයක දී වෙනත් ආයතනයක දී ජාලයක දී හෝ ළමයින් ගැවසෙන ප්‍රජාවක දී ළමා අපයෝජන සිදු විය හැකිය (ලෝක සෞඛ්‍ය සංවිධානය)."**

# ළමා අපයෝජනවලට එරෙහි විය යුත්තේ ඇයි

ළමා අපයෝජනය නිසා හුදෙක් එකී වින්දිත ළමයාට සිදු වන පුද්ගල බලපෑමට එහා ගිය සමාජ ආර්ථික පිරිවැයක් දැරීමට සිදු වනු ඇත. එක් පසකින් වින්දිත ළමයින් තුළ හටගන්නා කායික, මානසික, සමාජීය, අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි ඇති කරනු ලබන ඍණාත්මක හා වේදනාකාරී බලපෑම සුළු පටු නොවේ. ළමයා තුළ හටගනු ලබන කායික තුවාල, වර්ධනය සීමා වීම, ඉගෙනුම් ආබාධ, චර්යාත්මක අක්‍රමතා, සායනික ගැටළු, විෂාදය, පශ්චාත් කම්පන ආතතිය, ඇබ්බැහිය, සියදිවි නසා ගැනීම, සෞඛ්‍ය ගැටළු ආදී තත්ත්වයන් රැසක් නිර්මාණය විය හැකි අතර, එය ජීවිත කාලය පුරා අපයෝජනයට පත්වූ ළමයා කම්පනයට පත් කිරීම බරපතල තත්ත්වයක් විය හැකිය. අනෙක් පසින් සමාජ සංස්කෘතික පැවැත්මට සිදු වන හානිය මෙන්ම මෙකී තත්ත්වයන් පාලනය කිරීම උදෙසා සමාජය විසින් දරන්නා වූ ආර්ථික හා මානව පිරිවැය ද සුළු පටු නොවනු ඇත.

**පිරිවැය**

- අපයෝජන අත්දැකීම් සහිත පුද්ගලයෙකු අපයෝජන අත්දැකීම් නොමැති පුද්ගලයෙකු හා සැසඳීමේදී,
  - දුම්පානය කිරීමේ අවධානම 103% කි.
  - තරබාරු වීමේ අවධානම 95% කි.
  - මත්පැන් භාවිත කිරීමේ අවධානම 103%කි.
  - මත්පැන් වලට අබ්බැහි වීමේ අවධානම 192%කි.
  - සියදිවි නසා ගැනීමේ අවධානම 43% කි.
  - (National Safety Council – 2003)
- ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව හා සංවර්ධනය වෙනුවෙන් 2018 වර්ෂයේ රුපියල් 1.6 බිලියන වෙන් කර ඇත. එය වක්‍රාකාරව ළමා අපයෝජනයේ ආර්ථික පිරිවැයකි.
- ළමා අපයෝජනය නිසා පිළිකා රෝග, පෙනහලු රෝග, බඩවැල් රෝග, හදවත් රෝග, අක්මා රෝග, ප්‍රජනන සෞඛ්‍ය ගැටලු වැනි සෞඛ්‍ය ගැටලු වලට නතුවීමේ ඇති අවධානම ඉහළය. (Pinheiro – 2006)
- ප්‍රජා පාදක පෝෂක රැකබලාගැනීමේ පිරිවැයට වඩා 0 – 100 ගුණයකින් ආයතනික රැකබලා ගැනීමේ පිරිවැය ඉහළය. (Pinheiro – 2007)
- කායික හෝ ලිංගික හෝ උග්‍ර නොසලකා හැරීමට ලක් වූවන්ගෙන් ¼ සිට $^{1}/_{3}$ දක්වා ප්‍රමාණයක් එම අපයෝජනයන්ට තම දරුවන්ටද ලක් කරති. (Pears & Capaldi 2001)
- වැඩිහිටි සියදිවි හානි කර ගැනීමේ උත්සාහ වලින් 9.2%ක් ළමා ලිංගික අපයෝජන නිසා සිදුවන බව (Culler 2003)

## ළමා අපයෝජන වර්ග

ළමා අපයෝජනය ප්‍රධාන වර්ගීකරණයන් හතරක් ඔස්සේ විග්‍රහ කළ හැකිය. එනම්,

1. කායික අපයෝජනය
2. මානසික අපයෝජනය
3. ලිංගික අපයෝජනය
4. නොසලකා හැරීම යන්නයි

## කායික අපයෝජනය (Physical Abuse)

විශ්වාසය තැබිය යුතු හෝ බලසම්පන්න තත්ත්වයක සිටින පුද්ගලයෙකු හිතාමතාම ළමයෙකුට හෝ යෞවනයෙකුට රිදවීම, තුවාල කිරීම හෝ තුවාල කිරීමට තර්ජනය කිරීමක් කායික අපයෝජනය ලෙස පැහැදිළි කළ හැකිය.

සත්‍ය වශයෙන්ම කායික හානියක් සිදු කරන හෝ සිදු කිරීමේ විභවතාවයක් පවත්නා රැකබලා ගන්නන් සතු බල පැවරුම මත කෙරෙන ක්‍රියාවන් කායික අපයෝජනය වේ. (ලෝක සෞඛ්‍ය සංවිධානය 2002) ඒ අනුව යම් ළමයෙකු වෙත සිදු කරනු ලබන,

- පහරදීම්,
- පිලිස්සීම්,
- කැපීම්,
- සෙලවීම්,
- වසදීම්,
- හුස්මහිර කිරීම් හෝ

වෙනත් ඕනෑම ආකාරයේ ශරීරයට සිදු කරනු ලබන හානිදායක තත්ත්වයන් මෙන්ම බලය යෙදවීමක් හෝ අවහිර කිරීමක් ද ඇතුළත් වේ.

කායික අපයෝජනයට පත් වූ ළමයින්ගේ ශරීරයට සිදු වන හානියට අමතරව ළමයාගේ විශ්වාසය බිඳවැටීම, ශරීර ස්පර්ශයට බිය වීම, බයාදු තිගැස්සෙන සුළු බව, අතිශය ආචාරශීලි බව, බොරු කීම, සොරකම් කිරීම, පහත් ආත්ම අභිමානය, ආක්‍රමණශීලි බව, වැඩිහිටියන්ගෙන් දුරස්වීම, ඉගෙනුම් දුර්වලතා, පාසල ප්‍රතික්ෂේප කිරීම, ගර්භණී සමයේ මවුවරුන් විසින් මත්පැන් භාවිත කිරීම නිසා හටගනු ලබන Fetal Alcohol Syndrome, ළමයින් අධික වේගයෙන් සෙලවීම නිසා හටගනු ලබන Shaken Baby Syndrome මෙන්ම රෝගී තත්ත්වයන් බලෙන් පවරා ගනිමින් ළමයාට හිතාමතාම රෝගී ලක්ෂණ නිර්මාණය කර දීම ඇතුළත් Munchausen Syndrome by Proxy වැනි රෝගී තත්ත්වයන්ට ද ළමයින් නතු විය හැකිය.

මෙවන් හානිකර තත්ත්වයන් හමුවේ කායික අපයෝජනය අවම කිරීම උදෙසා දැනුවත් භාවය වැදගත් වන අතරම කායික අපයෝජනයට පත් වූ ළමයින් හඳුනා ගැනීමට අවශ්‍ය දැනුම හා හැකියාවද ඉතා වැදගත් වනු ඇත.

කායික අපයෝජනයට පත් ළමයෙකුගේ ශරීරයේ තැලීම්, සිරීම්, තුවාල වීම් හට ගත හැකිය. නමුත් ළමයෙකු ස්වභාවිකව වැටීම, පෙරළීම, අනතුරකට භාජනය වීම නිසා ද තැලීම්, සිරීම්, තුවාල වීම් හෝ කැපීම් ඇති විය හැකිය. ළමයෙකු වැටීම හෝ පෙරළීම හෝ හදිසි අනතුරකට ලක් වීම නිසා බොහෝ විට උක්ත ලක්ෂණ දැකිය හැකි වනුයේ නළල, වැලමිට, දනිස්ස, නිකට, උරහිස වැනි ප්‍රදේශ වලය. මන්ද ළමයෙකු එවන් තත්ත්වයක දී ඉන් මිදීමට උත්සාහ දරන අතර, ඉතා කලාතුරකින් අනිකුත් ස්ථාන තුළටද හානි සිදු විය හැකිය. නමුත් බාහිර පාර්ශවයක් විසින් සිදු

කරනු ලබන යම් හිංසන තත්ත්වයක දී බොහෝ විට මුහුණ, කන, නාසය,තොල්, හිසේ පැත්ත, කළවා ප්‍රදේශය, ලිංගික ප්‍රදේශ, කොන්ද මැද්ද, පාදයේ පහළ කොටස, තට්ටම් ප්‍රදේශය වැනි ස්ථාන ඉලක්ක ගත වේ. මෙවන් අපයෝජනයන් හඳුනා ගැනීමේ දී සාමාන්‍ය තුවාල හා සැකකටයුතු තුවාල මොනවාද යන්න හඳුනා ගැනීමට මෙම නිර්ණායක ඉතා වැදගත් වනු ඇත.




**2.1** රූපය **- සීරීම්, තැලීම්, තුවාලවීම් පිළිබඳ කායික ලක්ෂණ**

## මානසික අපයෝජනය /චිත්තවේගික අපයෝජනය (Mental Abuse & Emotional Abuse)

බලය සහිත තනතුරක සිටින අධිකාරීත්වය හෝ භාරකාරීත්වය ඇති පුද්ගලයෙකු විසින් ළමයා,

- ප්‍රතික්ෂේප කිරීමෙන්,
- අවමන් කිරීමෙන්,
- හුදකලා කිරීමෙන්,
- බිය වැද්දවීමෙන්,
- නරක් කිරීමෙන්,
- සැලකිල්ලක් නොදැක්වීමෙන් හෝ වැඩිහිටිකරණයට ලක් කිරීමෙන්,

වාචික හෝ වාචික නොවන ආකාරයෙන් ළමයාගේ ආත්ම අභිමානයට දිගින් දිගටම ප්‍රහාර එල්ල කිරීම චිත්තවේගීය අපයෝජනය නම් වේ.

නමුත් චිත්තවේගී අපයෝජනය හා මානසික අපයෝජනය යනු දෙකක් බවත් එකී සංකල්ප දෙකම එකවිට සිදු විය හැකි බවත් ඕ' හේගන් (O' Hegan) පෙන්වා දීඇත. ඔහුට අනුව චිත්තවේගී අපයෝජනය යනු ළමයාගේ චිත්තවේග ප්‍රකාශන හා ඒ සමඟ ප්‍රකාශ වන චර්යාව කෙරෙහි දක්වන කල්පවත්නා නැවත නැවත සිදු කරන අයෝග්‍ය චිත්තවේගී ප්‍රතිචාර නම් වේ (O' Hegan 1993).

මානසික අපයෝජනය යනු ළමයෙකුගේ මානසික හැකියාවන්වලට හා බුද්ධිය, මතකය, හඳුනා ගැනීම, සංජානනය, අවධානය, භාෂාව හා සදාචාරාත්මක සංවර්ධනය ඇතුලු මානසික ක්‍රියාවලියට තීරණාත්මක වැදගත් කමක් ඇති ළමයාගේ නිර්මාණාත්මක හා සංවර්ධන විභවතාවලට හානි පමුණුවන හෝ ඒවා සැහෙන ප්‍රමාණයක් අඩුකරන දිගටම පවත්නා

හා නැවත නැවත සිදුවන අයෝග්‍ය චර්යාව ලෙස හඳුන්වයි (O' Hegan 1993).

ඒ අනුව චිත්තවේගී සංවර්ධනය අඩාල කරනු ලබන යම් ක්‍රියාවක් ළමයාට සිදු වන්නේ නම් එය චිත්තවේගී අපයෝජනය වන අතර අවධානය හෝ ළමයාගේ මානසික සෞඛ්‍යට බලපාන ක්‍රියාවන් සිදු වන්නේ නම් එය මානසික අපයෝජනය ට අදාළ වනු ඇත.

මෙකී අපයෝජනය ද ළමයාගේ සංවර්ධනයට හානිදායක ලෙස බලපෑම් සිදු කරන අතර ළමයා තුළ කථන ආබාධ, ආහාර ගැනීමේ ගැටළු, නින්ද සම්බන්ධ අක්‍රමතා, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිය, වර්ධන ඌනතා, පහත් ආත්ම අභිමානය, ප්‍රචණ්ඩත්වය, විශ්වාසය බිඳ වැටීම, සබඳතා දුර්වල වීම, ස්වයං හානිකර ගැනීම, වයසට නොගැලපෙන චර්යා, හුදකලා වීම, වැරදි පුරුදු, සමාජ විරෝධී චර්යා, විෂාදය, පශ්චාත් කම්පන ආතතිය, සියදිවි නසා ගැනීම් වැනි තත්ත්වයන් වර්ධනය විය හැකිය.



## ලිංගික අපයෝජනය (Sexual Abuse)

වැඩිහිටියෙකු හෝ නව යෞවනයෙකු හෝ වයසින් වඩාත් වැඩි හෝ බලසම්පන්න හෝ ළමයෙකු විසින් ඊට වඩා බාල හෝ බලයෙන් අඩු පුද්ගලයෙකුව තම ලිංගික තෘප්තිය සඳහා යොදවා ගත් කළ ලිංගික අපයෝජනය සිදු වනු ඇත. මෙහි දී සලකා බලනු ලබන විශේෂිත කරුණු රැසක් අතර, **ළමයා කැමැත්ත දිය හැකි වයසක සිටීද යන්න සුවිශේෂී වේ.** එහි දී වැඩිහිටියා හා සමාන බලයක්, සමාන දැනුමක්, සමාන සහය පද්ධතියක් ළමයින් සතුව නොමැති බැවින් ඔවුන්ට කැමැත්ත ලබා දිය නොහැකිය. යම් හෙයකින් එවන් ළමයෙකු කැමැත්ත ලබා දුන්නද එය වලංගු කැමැත්තක් ලෙස අපේ අධිකරණය පිළි නොගනී.



ඒ අනුව සිදු වන ළමා ලිංගික අපයෝජනය ස්පර්ශය ඇතිව හෝ ස්පර්ශය නැතිව සිදු විය හැකිය.

| ස්පර්ශ සහිත ලිංගික අපයොජන | ස්පර්ශ රහිත ලිංගික අපයෝජන |
|---|---|
| • **ලිංගික අවයව ඇල්ලීම**<br>• **තවකෙකුගේ ලිංගික අවයව ඇල්ලීමට බල කිරීම**<br>• **කවර හෝ වස්තුවක් භාවිත කරමින් ලිංගික ක්‍රියාවක නිරත වීම** | • ලිංගික පින්තූර හෝ විඩියෝ පෙන්වීම<br>• ලිංගික ක්‍රියා දෙස බලා සිටීමට සැලැස්වීම<br>• ලිංගික කථා බහට සවන්දීමට සැලැස්වීම<br>• ලිංගික ඡායාරූප හෝ විඩියෝ පටවල හෝ පෙනී සිටීමට සැලැස්වීම<br>• ලිංගික ක්‍රියා දෙස බලාසිටීමට බල කිරීම<br>• අපහසුතාවයට පත් වන ආකාරයෙන් ලිංගික අවයව දෙස බලා සිටීම<br>• ලිංගික අවයව වලට විහිළු කිරීම |

- ලිංගික අවයව ලෙස නිර්වචනය කරනු ලබනුයේ **මුඛය, දෙතන, තට්ටම්, අදෝ මුඛය, ප්‍රජනන ප්‍රදේශය, යෝනි මුඛය, යෝනි මාර්ගය, ශිෂ්ණය, අණ්ඩ කෝෂය** යන කොටස්ය.(ජුඩ් ෆෙයාර්හෝල්ට් - 2010)

ලිංගික අපයෝජන තුලින් ද ළමයින්ට සිදු වන බලපෑම සුලු පටු නොවනු ඇත. ඒ අතර,

- ආත්ම අභිමානය බිඳ වැටීම,
- විශ්වාසය පලුදු වීම,
- සිය ළමා විය අහිමි වීම,
- අධ්‍යාපනය බිඳ වැටීම,
- ශරීරය පිළිබඳ පාලනය ගිලිහීයාම, වර්ධනය අඩපණ වීම,
- ලිංගික බෙලහීන බව,
- ලිංගිකකරණය (අපයෝජනයට පත් වූ ළමයින් වයසට නොගැළපෙන ලිංගික කටයුතු ඉගෙනීම හා අඛණ්ඩ යෙදීම.)
- සමාජ විරෝධී චර්යාවලට යොමු වීම,
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම,
- විෂාදය (මානසික අවපීඩනය )
- පශ්චාත් ක්ලමතය, (අපයෝජනය නිසා ඇති වූ ත්‍රාසය, නැවත නැවත මතකයට නැගෙමින් (flash backs) ළමා මනස පීඩනයට පත් කිරීමකි)
- වරදකාරී හැඟීම,
- සියදිවි නසා ගැනීම

වැනි බලපෑම් රැසක් මතු වීමට ඉඩ කඩ තිබේ.

**ළමයින්ට සිදු වන ලිංගික අපයෝජනයෙන් 90% ක් ම සිදු වනුයේ ළමයා හොඳින් දන්නා හඳුනන ළමයා සමඟ කුමන හෝ බැඳීමක් පවත්නා පුද්ගලයෙකු විසිනි.** ළමයා කිසිසේත් නොදන්නා පුද්ගලයින් විසින් ළමයින් ලිංගික අපයෝජනයට ලක් කරනුයේ 10% ක ප්‍රතිශතයකි (whealin – 2017) ළමා අපයෝජන මැඩලීමේ බරපතලම අභියෝගය වනුයේ මෙයයි.




**2.2 රූපය - ළමා අපයෝජන ක්‍රියාවලිය**

ඉහත 2.2 රූපය මගින් පැහැදිලි කරනුයේ ළමයා දන්නා හඳුනන ළමයාට ඉතාම සමීප පුද්ගලයෙකු විසින් ළමා ලිංගික අපයෝජනයක් සිදු කරනු ලබන ක්‍රියාවලියේ දී පසු කළ යුතු අවස්ථාවන්ය. ඒ අනුව යම් පුද්ගලයෙකු තුළ ළමයෙකු අපයෝජනය කිරීමේ යම් සිතිවිල්ලක් ඇති වුව හොත් මූලිකවම ඔහු තුළ දැඩි බියක් සමඟ වරදකාරී ස්වභාවයක් මතු වීම ස්වභාවිකය. නමුත් එම වරදකාරී බව ළමයා අපයෝජනය කිරීමේ තම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට දැඩි බාධාවක් වන හෙයින් විවිධ උපක්‍රම මාර්ගයෙන් මෙම වරදකාරී බව අඩු කර ගනු ඇත. එහි දී විශේෂයෙන්ම සිදුවනුයේ ළමයාට තෑගි බෝග ලබා දෙමින් වර්ණනා කරමින් මානසික හා භෞතික අල්ලස් ලබා දීමයි. ඒ තුළින් ළමයාගේ විශ්වාසය හා හිත දිනා ගැනීමට කටයුතු කරන මොවුන් අනතුරුව පවුලට අවශ්‍ය උදවු උපකාර කරමින් පවුලේ විශ්වාසය දිනා ගැනීමට ද කටයුතු කරයි. ප්‍රතිරෝධය අඩුකර ගැනීමට සමත් මෙම ක්‍රියාවන්ගෙන් පසු ළමයාට සිදු කරනු ලබන කිසිදු ලිංගික ක්‍රියාවක් තවත් කෙනෙකුට ප්‍රකාශ නොකරනු ඇතැයි යන විශ්වාසය සමඟ ළමයා කැමැති වෙතැයි යන විශ්වාසය අපයෝජකයා තුළ ඇති වූ කල් හී ළමයාට ලිංගික හිංසනය සිදු කිරීමට පෙළඹෙනු ඇත. එකී විශ්වාසය ඇති වූ සැනින් ළමයා අන් අයගෙන් තනිකර සුදුසු අවස්ථාවක් උදාකර ගනිමින් මේ සඳහා යොමු වන මොවුන් ඉතා කුළුපඟු ආදරණීය ස්පර්ශයේ සිට අතපතගෑම් හරහා පූර්ණ ලිංගික එක්වීම දක්වා ගමන් කරයි. මේ සඳහා ඇතැම් විට සතියක් දෙකක් හෝ මාසයක් දෙකක් හෝ වසරක් දෙකක් වුවද මෙම ක්‍රියාවලිය තුළ එවැන්නෙකු නිරත වනු ඇත.

ලිංගික අපයෝජනයක් සිදු කිරීමට අපයෝජකයෙකු විසින් සපුරා ගත යුතු කරුණු කිහිපයක් පිළිබඳව තවදුරටත් පැහැදිලි කළ හැකිය. මෙය ලිංගික අපයෝජන සමීකරණය ලෙස හඳුන්වමු. එහිදී,

1. ළමයෙකු ලිංගික අපයෝජනයට පොළඹවන අපයෝජකයෙකු සිටිය යුතුය

2. එම අපයෝජකයා විසින් ඔහුගේ අභ්‍යන්තර නිශේධන (සිත තුළ පවත්නා භිය / වරදකාරී හැඟීම) මැඩගත යුතුය
3. එම අපයෝජකයා විසින් අපයෝජනයට එරෙහි බාහිර නිශේධන (බාහිර සමාජයෙන් එල්ල වන බලපෑම්) මැඩගත යුතුය
4. අපයෝජනය සඳහා වූ ළමයාගේ ප්‍රතිරෝධය (ළමයාගේ තිබෙන අකමැත්ත) මැඩගත යුතුය.

මෙකී කරුණු හතරම සාර්ථක වුව හොත් පමණක් ලිංගික අපයෝජනයක් සිදු වනු ඇත.




**2.3 රූපය - ලිංගික අපයෝජන සමීකරණය**

ලිංගික අපයෝජනවලට විරුද්ධව සටන් කරනු ලබන සෑම පුද්ගලයෙකුම මෙකී සමීකරණයට බාධා එල්ලකළ යුතුය. අප මෙහි දී ලෙහෙසි හා පහසු තැනින් ආරම්භ කිරීම සූක්ෂම විය යුතුය. එහි දී පළමු වන හා දෙවන කරුණු දෙකට විරුද්ධව සටන් කිරීමට වඩා තුන් වන හා හතර වන කරුණු දෙකට විරුද්ධව සටන් කිරීම පහසු හා ඉක්මන් ප්‍රතිඵලදායකය.

ඒ අනුව, ළමා ලිංගික අපයෝජනය සඳහා ළමයින්ගේ ප්‍රතිරෝධය ඉහළ දැමීම හෙවත් අයුතු ලිංගික ක්‍රියාවකට කැමැත්ත ලබා නොදීමට සමත් බලවත් මානසිකත්වයක් ළමයා තුළ වර්ධනය කළ හැකිය.

ඒ සඳහා ඉතා වැදගත් වනුයේ ළමයා,

- **ඉතා හොඳින් දැනුවත් කර තැබීමත්,**
- **එවන් පුද්ගලයින් කල් තියා හඳුනා ගැනීමට සමත් ඉඟි ළමයාට හඳුන්වා දී තිබීමත්,**
- **එවන් තත්ත්වයකට මුහුණ දිය යුත්තේ කෙසේද යන්න පිළිබඳව ළමයා ශක්තිමත් කර තැබීමත්,**
- **මෙම හිංසනයේ ඇති ප්‍රතිවිපාක හා ආදීනව පිළිබඳව කියා දී තිබීමත් ඇතුළු,**

ළමයින් ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාකාරකම් සිදු කිරීමත් ඉතා වැදගත් වේ.

අපයෝජනයට එරෙහි බාහිර නිශේධන මැඩපැවැත්වීමට එරෙහිව බාහිර නිශේධන වැඩි කිරීමට අවශ්‍ය කටයුතුවල නිරත වීම ඊළගට යොමු විය හැකි ලෙහෙසි හා පහසු ප්‍රවේශයයි.
එනම් ළමයා,

- සමාජයේ හෝ පරිසරයේ තනිවීම, හුදකලා වීම අවම කිරීම,
- පාලු හුදකලා අනාරක්ෂිත ස්ථාන අවම කිරීම,
- ලිංගික අපයෝජන පිළිබඳව සමාජය දැනුවත් කිරීම,
- එයට විරුද්ධව සටන් කිරීමට සුදුසු සමාජයක් ගොඩ නැගීම, (ජන පවුර වැනි)

ආදී පරිසරික හා සමාජීය අනාරක්ෂිත බව විනාශ කිරීම මෙහිදී සිදු කළ හැකිය. විවිධ ක්‍රමවේද හරහා අපයෝජකයින්ගේ සිත් තුළ වරදකාරී බව, භය නිශේධනය වන්නට ඉඩ නොදීම මේ යටතේ සිදු කළ හැකි අතර මෙකී සියලු උපක්‍රම හරහා සමාජය තුළ ළමා අපයෝජනයට ඉඩ කඩ අසුරාලීම තුලින් ළමා අපයෝජන අවම කරලීමට උදවු වේ.

ලිංගික අපයෝජන තුළින් ළමයින් ආරක්ෂා කිරීමට දැනුම සැපයීමේ දී විවිධ ක්‍රමශිල්ප යොදා ගත හැකි අතර, යහපත් ස්පර්ශ හා අයහපත් ස්පර්ශ හා සැකකටයුතු හෝ ප්‍රශ්න සහගත ස්පර්ශ මොනවාද යන්න පිළිබඳව ළමයින්ට අවබෝධය ලබා දිම ඉතා වැදගත්ය. එසේම ලිංගික අපයෝජනයක් සිදු කිරීමට උත්සාහ දැරීමක දී ඒ ඒ තත්වයට ගැලපෙන ආකාරයෙන් ඊට ප්‍රතිචාර දැක්වීමට ද ළමයා හුරු කළ හැකිය.

## නොසලකා හැරීම (Neglect)

**ළමයෙකුට අවශ්‍ය කරන්නා වූ ආහාර, ඇඳුම් පැළඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි ළමයාගේ මූලික හා ද්විතියික අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරා දීමට නොහැකි වීම කායික නොසලකා හැරීමකි.** ළමයාට අවශ්‍ය කරන්නා වූ ආදරය, දයාව, පිළිගැනීම, ආරක්ෂාව, ඇගයීම සිතාමතාම ප්‍රමාණවත් ලෙස ලබා නොදේ නම් එය චිත්තවේගාත්මක නොසලකා හැරීම ලෙස හඳුන්වයි (Health Caida 2001). මේ ආකාරයෙන් වූ ළමයාට බලපානු ලබන කායික හා චිත්තවේගී නොසලා හැරීම තුළින් මෙකී නොසලකා හැරීම යන අපයොජනය නිර්මාණය වේ.

<u>අපයෝජනය</u>

- දෙමාපියන්ගෙන් 70%ක් තම දරුවන්ට මහ හඬින් කෑ ගසයි. දෙමාපියන්ගෙන් 20%ක් තම දරුවන් අතහැර දමන බවට තර්ජනය කරයි. (World Safe as cited by Kvng – 2002)
- ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගෙන් 60%ක් පවුල් ප්‍රචණ්ඩත්වයට ලක්වන බව වාර්තා කරයි. (Wijayatilake – 2004)
- දකුණු ආසියාව තුළ ළමයින් මිලියන 40.7 සිට මිලියන 88ත් අතර, ප්‍රමාණයක් පවුල් ප්‍රචණ්ඩත්වයට ලක්වෙයි. (Pinheiro – 2007)
- ලොවපුරා ළමයින් මිලියන 275ක ප්‍රමාණයක් පවුල තුළ ප්‍රචණ්ඩත්වය දකිති. (Unisef 2005)
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තාවන පැමිණිලි වලින් වැඩිම ප්‍රතිශතය ලෙස ළමයින් කෘරත්වයට පත් කිරීම් වාර්තා වේ. එය 2017 වර්ෂයේ 2144ක අගයක් ගෙන ඇත.
- ශ්‍රී ලංකාවේ පිරිමි ළමයින්ගෙන් 20%ක්ද ගැහැණු ළමයින්ගෙන් 10%ක් ද ලිංගික අපයෝජනයට ලක් වේ. (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

ළමා අපයෝජනයට අදාළ සියලු නිර්වචන දෙස ඉතා සුපරික්ෂාකාරීව විමසා බැලීමේ දී හැඟී යනුයේ දෙමාපියන් හෝ රැකබලා ගන්නන් හෝ

යම් බලයක් සහිත ඕනෑම පුද්ගයෙකු හෝ කණ්ඩායමක් විසින් නිවසේ දී ළමා නිවාසයක දී, ආයතනයක දී, ජාලයක දී, වැඩසටහනක දී, පද්ධතියක දී හෝ පාසලකදී, ආගමික ස්ථානයකදී ළමයින් ගැවසෙන ඕනෑම ස්ථානය දී සිදු කරනු ලබන හෝ නැවත නැවත සිදු වන කායික, මානසික, ලිංගික හෝ නොසලකා හැරීමක් නිසා ළමයාගේ / ළමයින්ගේ පැවැත්ම, සංවර්ධනය, ආරක්ෂාව සහ සහභාගීත්වය හෝ යහපතට හානිදායක ලෙස බලපානු ලබන සත්‍ය හෝ විය හැකි තත්ත්වයක් ළමා අපයෝජනයක් ලෙස හඳුනාගත හැකි බවකි.

## අපයෝජනයට ලක්විය හැකි අවධානම්කාරී ළමයින්

නොවැඩුනු බව, සිය ක්‍රියාවන් වල අවසන් ප්‍රතිඵලය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට නොහැකි බව, ඔවුන්ගේ වයස, සමාජ අත්දැකීම් මද බව, ශක්තිය, නොදැනුවත් බව, යැපීම, සමාජයේ ස්වභාවය, ආර්ථික මට්ටම ආදී තත්ත්වයන් මත ඕනෑම ළමයෙකු අපයෝජනයට ලක්වීමේ ඉඩකඩක් පවතී.

අපයෝජනයේ දැඩි අවධානමක සිටින ළමයින් පිළිබඳව විශේෂයෙන් හඳුනා ගැනීම මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ඉතා වැදගත් වනු ඇත. ඒ අතර,

**අවධානම් ළමයි**

- ලොව පුරා මිලියන අටක්ම පමණ ළමයි ප්‍රමාණයක් නේවාසික ආයතන තුළ රැකවරණය ලබයි. (Pinheiro – 2007)
- ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ වීදියේ ජීවත්වන හෝ වීදියේ වැඩකරන ළමයින් 2000ක් පමණ සිටිති. කොළඹ නගරයෙන් පිටත 2500ක් පමණ සිටිති. (Global March Against Child Labour 2002)
- ශ්‍රී ලංකාවේ ළමා ගෘහ සේවකයින් 10,000 සිටින බව. (Global March Against Child Labour 2002)
- 2004 ඉන්දියන් සාගරයේ සුනාමි ව්‍යසනය තුළ ලිංගික අඩත්තේටම් බහුලව වාර්තා විය. සුනාමියට පසුවද ඉහළ යාමක් වාර්තා විය. (ජාත්‍යන්තර රතු කුරුස හා රතු සම්මේලනය 2007)

සෑම වසරක් පාසාම ආපදා සහ සන්නද්ධ අරගල නිසා මිලියන 70කට පමණ ළමයින්ගේ ජීවිත කඩාකප්පල් වේ. (Plan International 2003)

## ආයතන ගත ළමයින්

ලොව වෙසෙන ළමයින් කුමන හෝ ආයතනයකට සම්බන්ධ විය හැකිය. එහෙත් ඒ අතරින් අපයෝජනයට ලක් විය හැකි වැඩි අවධානමක් සහිත ආයතන කිහිපයකි. අධ්‍යාපන ආයතන, ආගමික ආයතන, ළමා නිවාස/රැඳවුම් නිවාස/බන්ධනාගාර, අවතැන් කඳවුරු වල සිටින ළමයින් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

ශ්‍රී ලංකාවේ අනාථ, අසරණ, අත්හල ළමයින් නිවාස ගත වීම සැළකිව යුතු මට්ටමකින් සිදු වේ. මෙම ආයතනගත ළමයින් අපයොජනය වීම දෙස බලන විට කායික, මානසික, ලිංගික හා නොසලකා හැරීම හැරුණු විට එකී ආයතනය තුළ පවත්නා ප්‍රමිතියෙන් තොර වැඩසටහන් මෙන්ම ආයතනයේ අසංවිධානාත්මක බව, ප්‍රතිපත්ති නොමැති වීම, සම්පත් මද බව, නිවාස ගත නොකළ යුතු ළමයින් නිවාස ගත කිරීම ආදී කරුණු හරහාද ළමයින් අපයෝජනයට පත් වනු දැකිය හැකිය.

## විශේෂ අවශ්‍යතා සහිත ළමයින්

කායික, මානසික, සංවර්ධනාත්මක, සංවේදී හෝ ඉගෙනුම් නොහැකියාව මත ළමයින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින් බවට පත්විය හැකිය. දකුණු ආසියාවේ සෑම රටකම ළමයින්ගෙන් 10% ක් විශේෂ අවශ්‍යතා සහිත වන බව ලෝක බැංකු වාර්තා (2007) පැහැදිළි කරයි. මෙම ළමයින් ආමන්ත්‍රණය කරනු ලබන ස්වභාවයේ සිට එකී ළමයින් පිළිබඳ සමාජ ආකල්පයේ සිට ඔවුන් වෙනුවෙන් ලබා දෙන පහසුකම් දක්වා ශ්‍රී ලංකාව තුළ සුභදායී තත්ත්වයක් වර්ධනය කළ යුතුය. එකී රැකවරණය නොමැති වීම මත විශේෂ අවශ්‍යතා සහිත ළමයින් අපයෝජනයට ලක්වීමේ හැකියාව ඉතා ඉහළ යනු ඇත.

## විදේශගත දෙමාපියන්ගේ ළමයින්

**මව හෝ පියා විදේශගත වීම හෝ දෙදෙනාම විදේශගත වීමෙන් ළමයින්ගේ රැකවරණය අඩාල වීම මත ළමා අපයෝජන සඳහා ඉතා අවධානම්කාරී පරිසරයක් පවුල තුළ ගොඩනැගෙයි.** මෙවන් පරිසරයක් තුළ ළමයින් විශාල ප්‍රමාණයක් විවිධ අපයෝජනයන්ට ලක් වෙමින් වෙනත් භාරකරුවන්ගේ යටතට පත් වෙමින් හෝ නිවාසගත වෙමින් අනාරක්ෂිත තත්ත්වයට පත් වන ස්වභායක් දක්නට ලැබේ. විශේෂයෙන්ම මව විදේශගත වීම නිසා ශ්‍රී ලංකාවේ ළමයින්ට සිදු වන හානිය ඉහළ යන බවට සමාජීය කථිකාවතක් නිර්මාණය ඇත. බොහෝ විට මෙම ළමයින්,

- කායික දණ්ඩනයට නතු වීම,
- පාසල් අධ්‍යාපනය අඩාල වීම,
- සිය නිවසේ රාජකාරී ළමයින් මත පැටවීම,
- ඇතැම් විට පියාගේ ලිංගික අවශ්‍යතා ඉටු කර ගැනීමට ළමයින් භාවිත කිරීම,
- නිසි පෝෂණය හා රැකවරණය නොලැබීම

යන තත්වයන් නිතර වාර්තා වේ.

## වීදි ළමයින්

නිවහනක් නොමැති කම නිසා හෝ නිවසේ සිටීමට ඇති අකමැත්ත නිසා හෝ පවුලක් නොමැති නිසා හෝ නිවසින් පැන යාම නිසි අධීක්ෂණයක් නොමැති වීම වැනි හේතු මත ළමයින් වැඩි වශයෙන් වීදිවල ජීවත් වනු දැකිය හැකිය. මෙකී ළමයින් අධ්‍යාපනය නොලැබීමෙන්, නිසි පෝෂණය නොලැබීමෙන්, නිසි රැකවරණයක් නොලැබීමෙන්, සනීපාරක්ෂක පහසුකම් මද බවින් විවිධ අපයෝජනයන්ට ලක් වීමට වැඩි ඉඩකඩක් දක්නට ලැබේ.

## ළමා ශ්‍රමිකයින්

ළමා ශ්‍රමිකයෙකු බවට පත්වීමම අපයෝජනයකි. ශ්‍රී ලංකාවේ නීතිය අනුව අවුරුදු 14 අඩු කිසිදු ළමයෙකු කිසිදු සේවයක නිරත කිරීමට නොහැකි අතර අවුරුදු 14 වැඩි ළමයින් සේවයේ නිතර කළ හැකි වුවද අනතුරුදායී රැකියාවන් තුළ නිරත කළ නොහැකිය. එබැවින් මොවුන්ගේ අධ්‍යාපන අයිතිය අහිමි වීමෙන් කායික, මානසික අඩත්තේට්ටම්වලට ලක් වීමෙන් ළමා කාලය අහිමි කිරීමෙන් වැඩිහිටිකරණයට ලක් වීමෙන් වැනි හේතු කාරණා රැසක් මත අපයෝජන අවදානම ඉහළ යයි.

## සන්නද්ධ අරගලවලට මුහුණ දෙන ළමයින්

සෑම යුධ සංග්‍රාමයක්ම ළමයින්ට එරෙහිව සිදු වන බවට 1919 දී එග්ලන්ටයින් ජෙබ් මැතිණිය (Save the Children ආයතනයේ නිර්මාතෘ) ප්‍රකාශ කරන ලදී. එය ලොව පුරා වූ සෑම සංග්‍රාමයක් අවසානයේ දීම අනාථ වූ, අතුරුදහන් වූ, මරණයට හෝ ආබාධිත තත්ත්වයට හෝ මානසික බලපෑමට ලක් වූ ළමයින් ප්‍රමාණයෙන් සනාථ වේ. මෙවන් අවස්ථාවල දී ළමයින්ගේ ආරක්ෂාව රැකවරණය බිඳවැටීම ඉතා වේගයෙන් සිදු වන අතර, ළමා සොල්දාදුවන්, ඔත්තුකරුවන්, කම්කරුවන්, පැහැරගන්නන්, ලිංගික වහලුන්, මෙන්ම යුධ පලිහක් ලෙසද ළමයින් යොදවා ගැනීම සිදු විය හැකිය. එබැවින් මෙකී ළමයින් අපයෝජනයට ලක්වීමේ අවධානම් සාධක සීග්‍රලෙස ඉහළ යනු දැකිය හැකියි.

## ස්වාභාවික ව්‍යවසන හා හදිසි අවස්ථාවලට මුහුණ දුන් ළමයින්

ස්වභාව ධර්මය විසින් ඇති වන ගංවතුර, නායයාම්, සුනාමි, සුළිසුළං, භූමි කම්පා, ගිණි කඳු වැනි ස්වාභාවික විපත් මෙන්ම මිනිසා විසින් ඇති කරනු

ලබන ව්‍යවසනයන්ද මෙකී ව්‍යවසනයන්ට අන්තර්ගතය. මෙකී තත්ත්වයක් තුළ දී පැවති සමාජ ආරක්ෂණ පද්ධතිය ක්ෂණිකව බිඳවැටෙන අතරම ළමයින් තනිවීම, හුදකලාවීම, මඟහැරීම, සිය ආරක්ෂාව ගිලිහීයාම තුළින් අනතුරු අවධානම ඉහළ යනු ඇත. ශ්‍රී ලංකාවේ ඇති වූ සුනාමි ව්‍යවසනය මෙහි දී කදිම උදාහරණයක් වන අතර, එකී ව්‍යවසනයෙන් පසුව පවුලේ පීඩනය, සමාජයේ පීඩනය මෙන්ම සහන පද්ධති අඩු වීම නිසා හෝ වැඩි වීම නිසා අපයෝජන ඉහළයාම ද වාර්තා වනු ඇත.

උදාහරණයක් ලෙස සුනාමි සහන කණ්ඩායමක් ලෙස 2004 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රංශ ජාතිකයෙකු වසර කිහිපයක් මුහුදු බඩ ප්‍රදේශවල ළමයින් වෙනුවෙන් සේවය කිරීමෙන් පසු 2012 වර්ෂයෙ දී ශ්‍රී ලංකාව හැර යනු ලැබීය. එසේ යාමෙන් පසු ප්‍රංශ සයිබර් අපරාධ සඳහා වූ පොලීසියට අන්තර්ජාලයේ ළමයින්ගේ අසභ්‍ය පිංතූර හා වීඩියෝ රැසක් දැක ගත හැකි වූ අතර, ඒ පිළිබඳ විමර්ශන ආරම්භ කරන ලදී. ළමයින්ට අදාළ අසභ්‍ය පිංතූර හා වීඩියෝ රැසක් එහි දී අත්පත්කර ගැනීමට හැකි වුවද සැකකරුවෙකු සොයා ගැනීමට අසීරු විය. ඒ අනුව මෙම සියලු පිංතූර විශ්ලේෂණය කර බැලූ ප්‍රංශ පොලීසිය එම ළමයින් බහුතරය ආසියාතික ළමයින් බවට අනුමාන කරමින් ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ සහය ඉල්ලා සිටින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ තුළ ලංකාවේ ළමයින් විශාල ප්‍රමාණයක් හඳුනා ගැනීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබුනි. එම විමර්ශනය අවසානයේ දී එකී සියලු ළමයින් අපයෝජකයින් හා තැරැවුකරුවන් මෙන්ම පරිශ්‍රයන් සපයන ලද සියලු දෙනාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ හැකි වූ අතර, මෙම අපයෝජනය සිදු කර ඇත්තේ ව්‍යවසනයට අවශ්‍ය සහන සලසන මුවාවෙන් බවද අනාවරණය විය.

# අන්තර්ජාලයේ සැරිසරන ළමයි

**සයිබර අපරාධ**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2017 වර්ෂයේ ලැබුණු සයිබර් පැමිණිලි විශ්ලේෂණය අනුව,

- සමස්ථ පැමිණිලි වලින් සයිබර් පැමිණිලි 01%කි.
- සයිබර් පැමිණිලි වලින් 73% වාර්තා වනුයේ බස්නාහිර පළාතෙනි.
- අවුරුදු 10ට අඩු ළමයින්ට එරෙහිව පැමිණිලි 15.9%කි. අවුරුදු 11 – 15 අතර, ළමයින්ට සිදු වූ පැමිණිලි 36.5%කි. අවුරුදු 16ට වැඩි ළමයින්ට සිදුවූ පැමිණිලි 47.6%කි.
- යොමු වූ පැමිණිලි වලින් 73%ක් ගැහැණු ළමයින්ට සිදු වූ පැමිණිලි අපරාධ සම්බන්ධවයි.
- යොමු වූ සයිබර් පැමිණිලි වලින් 63.5%ක් සිදු වී ඇති බව වාර්තා වූයේ ෆේස්බුක් මඟිනි.
-

ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අන්තර්ජාල භාවිතය පිළිබඳව යුනිසෙෆ් සංවිධානය 2017 වර්ෂයේ එළිදක්වන ලද වාර්තාවට අනුව,

- අවුරුදු 11 – 18 අතර, ළමයින්ගෙන් 53%ක් අන්තර්ජාලය භාවිත කරයි.
- ළමයින්ගේ අන්තර්ජාල භාවිතය ඉහළම පළාත වනුයේ දකුණු පළාතයි.
- ළමයින්ගේ ජනප්‍රියම සමාජ මාධ්‍යය වනුයේ ෆේස්බුක්ය. අන්තර්ජාලය භාවිත කරන්නන්ගෙන් 61.7% ෆේස්බුක් භාවිත කරයි.
- අන්තර්ජාලය භාවිත කරන ඉහළම ප්‍රමාණය උසස් අධ්‍යාපනය හදාරනු ලබන ළමා ප්‍රජාවය. එම ප්‍රමාණය 70.5%කි.
- ජාතීන් අනුව බලන විට අන්තර්ජාලය භාවිත කරනු ලබන වැඩිම ප්‍රමාණය මුස්ලිම් ජාතික ළමයින්ගින් වේ. එය 66%කි.
- නිගරික, ග්‍රාමීය, වතු ලෙස සලකා බැලීමේ දී නාගරික ළමයින්ගෙන් 67.8%ක් අන්තර්ජාලයට පිවිසේ.

වර්තමානයේ දැනුම උකහා ගැනීමේ ප්‍රධානතම මාධ්‍යක් බවට අන්තර්ජාලය පත්ව ඇත. අධ්‍යාපන මෙවලමක් ලෙස අන්තර්ජාලය භාවිත කිරීම අනාරක්ෂිත වන්නේ නැත. නමුත් ළමයා අන්තර්ජාලය භාවිත කරනු ලබන ආකාරය අනුව ළමයින්ට අන්තර්ජාලය අනාරක්ෂිත විය හැකියි. මන්ද යත් **ළමා අපයොජකයින් ළමයින්ව ගොදුරුකර ගැනීමේ ප්‍රධාන මාධ්‍යයක් බවට අන්තර්ජාලය වර්තමානයේ උපයෝගී කර ගෙන ඇති බැවිනි.** ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අන්තර්ජාල භාවිතය දෙස බලන විට අවුරුදු 11ත් 18 අතර, ළමයින්ගෙන් 53%ක් අන්තර්ජාලය භාවිත කරයි. 40% ළමයින් අන්තර්ජාලයට නො-පිවිසෙන්නේ මුත් තොරතුරු තාක්ෂණිය ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළ නිරත වනු ඇත. මෙකී ළමයින්ගෙන් 7 % ක් පමණක් කිසිදු භාවිතයක නිරත වන්නේ නැත. (UNICEF 2017).

ඒ අනුව ඉන් ගම්‍ය වනුයේ ශ්‍රී ලංකාවේ ළමයින්ගෙන් 93% ක් පමණ අන්තර්ජාලය හෝ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත කුමන හෝ ක්‍රියාකාරකමක නිරත වන බවකි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2017 වර්ෂයේ අධිකාරියට යොමු වූ අන්තර්ජාලය ආශ්‍රිත පැමිණිලි පිළිබඳව සිදු කළ විශ්ලේෂණයට අනුව අධිකාරියට වාර්තා වූ සමස්ත ළමා අපයොජනවලින් 1% වාර්තා වනුයේ ළමයින්ට එරෙහි සයිබර් අපරාධවලිනි. මෙකී විශ්ලේෂණය අනුව අවුරුදු 14 වැඩි ළමයින් සම්බන්ධ වාර්තා වීම් වැඩි අතර, වැඩිම පැමිණිලි වාර්තා වීම බස්නාහිර පලාත තුලින් දැකිය හැකියි. නමුත් යුනිසෙෆ් සමීක්ෂණයෙන් ළමයින්ගේ අන්තර්ජාල භාවිතය වැඩිම පලාත ලෙස සොයාගෙන ඇත්තේ දකුණු පලාතයි. කෙසේ වෙතත් ළමයින්ගේ ප්‍රගමනයට අන්තර්ජාලය පිටුවහලක් වනු ලැබුවත් එය නිවැරදි අධීක්ෂණයකින් මගපෙන්වීමකින් කාලසටහනකට අනුව භාවිත කිරීමට ළමයින්ට ඉඩකඩ සැලසීමක් සිදු නොවු හොත් මේ හරහා ළමයින් අපයෝජනය වන්නට ඇති ඉඩ කඩ ඉහළය යනු ඇත.

මීට අමතරව **මව හෝ පියා මිය යාම, දෙදෙනාම මිය යාම, මව හෝ පියා පවුල හැරයාම, දික්කසාද වීම, පවුලේ මත්ද්‍රව්‍ය භාවිතය, දරිද්‍රතාවය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, බිඳුනු පවුල් ඒකක තුළ වෙසෙන ළමයින් වීම මත අපයෝජනයට නතු විය හැකි අවධානම්කාරී ළමයින් ලෙස වැඩි අවධානයක් යොමු කළ යුතුය.**

## ළමා අපයෝජනයේ අවධානම් සාධක (Risk Factor)

ළමයින් අපයෝජනය වීම සඳහා විවිධාකාර හේතූන් බලපෑම් කළ හැකිය. එකී හේතු සාධක මට්ටම් හතරක් ඔස්සේ හඳුනා ගත හැකි අතර,

1. පුද්ගල මට්ටම (Individual Level)
2. සමීප සබඳතා මට්ටම (Relationship Level)
3. ප්‍රජා මට්ටම (Community Level)
4. සමාජ / සංස්කෘතික මට්ටම වේ. (Social and Cultural Level)

එම අවධානම් සාධක පහත පාරිසරික ආකෘතිය මගින් ඉතා කෙටියෙන් ඉදිරිපත් කරයි. **එකී අවධානම් සාධක ආරක්ෂිත සාධක බවට පත් කිරීම ළමා අපයෝජනය අවම කිරීම උදෙසා මැදිහත්කරණය සිදු කරන්නන් හෝ වළක්වන්නන් විසින් සිදු කළ හැකිය.**




**2.4** රූපය - ළමා අපයෝජනයට බලපාන සාධක
(පාරිසරික විද්‍යාත්මක ආකෘතිය ඇසුරෙන්)

# ළමා ආරක්ෂණය හා බැඳි වෙනත් සංකල්ප

ළමා අපචාර, ළමා ආරක්ෂාව, ළමා ආරක්ෂණය, ළමා හිංසනය, හිරිහැර කිරීම, වෙනස් ලෙස සැලකීම, සූරා කෑම, සයිබර් අපරාධ, ළමා කාමුක දර්ශන, සයිබර් බුලීන්, සයිබර් ස්ටෝකින්, කාමුක පණිවුඩ, අයුතු ප්‍රයෝජන වෙනුවෙන් යහලු වීම වැනි තත්වයන් ද ඉතා කෙටියෙන් විමසා බලමු.

## ළමා අපචාර
## (Juvenile Delinquency)

ළමා අපචාර යන වචනයේ සරල අර්ථය දෙස බලන විට එකී වචනය **"අප + චාර"** යන ලෙස වෙන් කර ගත හැකිය. "අප" යනු වැරදි යන අදහස වන අතර "චාර" යනු හැසිරීම යන අර්ථය ලබා දේ. ඒ අනුව, ළමා අපචාරයක් වනුයේ ළමයින් විසින් සිදු කරනු ලබන ළමයින් වෙත සිදු කරනු ලබන වැරදි හැසිරීමකි. "සමාජය විසින් වැරදි යයි සලකනු ලබන සමාජ ධර්මතා බාලවයස්කරුවකු විසින් බිඳ හෙලීම" (රත්නපාල, නන්දසේන 2003) ළමා අපචාර ලෙස හඳුන්වා ඇත.

අපචාර සිදු කරන ලද ළමයින් නීතිය සමඟ ගැටීමේදී එකී වයස් සීමාවන් රටින් රටට වෙනස් වන අතර, ශ්‍රී ලංකාවේ 1939 අංක 48 දරණ ළමා හා යෞවන ආඥා පනත ප්‍රකාරව ළමයා යනුවෙන් අවුරුදු 14ට අඩුවෙන් හා යෞවනයා යනුවෙන් අවුරුදු 16ට අඩු තැනැත්තන් නිර්වචනය කරන හෙයින් ළමා අපචාර ද ඒ අනුව අර්ථකථනය කරගත යුතුයි.

ගෙදරින් පැනයාම, මත්පැන් මිළට ගැනීම හෝ විකිණීම හෝ පානය, හොරකම් කිරීම, අයාලේ යාම, ගෙවල් බිඳීම, සූදුව, පාසල් නොයාම, චර්යා විරෝධී හැසිරීම් (ලිංගික වැරදි) ආදී ක්‍රියාවන් ළමා අපචාර නිර්මාණය කරයි.

## ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය
## (Violence against Children)

පුද්ගලයෙකු සතු බලය තමාට හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩයමකට එරෙහිව යොදාගැනීමෙන් ප්‍රචණ්ඩත්වය නිර්මාණය වනු ඇත. කායිකව හෝ මානසිකව හෝ වයසින් හෝ ශක්තියෙන් හෝ ආර්ථික හැකියාවෙන් හෝ කුමණ ආකාරයෙන් හෝ බලයක් මෙහිදී භාවිත කරයි. එකී බලය ළමයාට එරෙහිව යොදාගැනීමෙන් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිර්මාණය වේ. ඒ අනුව ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යනු ලිංගික අපයෝජනය ඇතුළත්ව සියලුම ආකාරයේ මානසික හා කායික, ප්‍රචණ්ඩත්වය, තුවාල කිරීම සහ අපයෝජනය, නොසලකා හැරීම, නිගරු ලෙස සැලකීම, අනිසි ලෙස සැලකීම හෝ සූරාකෑම යන්නයි. (Pinheiro – 2006 සහ එක්සත් ජාතීන්ගේ නිර්වචනය)

## ළමා අයිතිවාසිකම්
## (Child Rights)

ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය හා සහභාගීත්වය යන අංශ ඔස්සේ අවුරුදු 18 අඩු පුද්ගලයෙකු සතු අයිවාසිකම් මේ යටතේ සාකච්ජා කෙරේ.

## ළමා හිංසනය
## (Bulling)

අවුරුදු 12 අඩු ළමයින් අතර සිදු වන වේදනාකාරී හා හිංසාකාරී හැසිරීම් මේ යටතේ අවධාරණය කරයි. තවද මානව හිමිකම් හා ළමා ආරක්ෂක නීති මගින් ආවරණය නොවන යෞවනයින් හා වැඩිහිටියන් අතර, පවත්නා නිගරු කිරීම්ද මේ යටතේ සලකා බැලේ.

## හිරිහැර හෝ අතවර කිරීම
## (Harressment)

නින්දා කිරීම, අපහාස කිරීම, ආත්ම ගෞරවය කෙලෙසීම, දුෂ්ටකම් කිරීම, ආක්‍රමණය කිරීම වැනි හැසිරීම් මේ යටතේ අන්තර්ගත වේ.

## වෙනස් ලෙස සැලකීම
## (Discrimination)

වයස, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ බව, ජාතිය, ආගම, කුලය, වාර්ගිකත්වය, ආර්ථික හා සමේ වර්ණය වැනි තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් වෙනස් හා සෘණාත්මක ලෙස සැලකීමකි.

## සූරා කෑම
## (Exploitation)

වැඩි බලයක් සහිත පුද්ගලයෙකුගේ ප්‍රතිලාභ උදෙසා ඔහු/ඇය ට සිදු වන හානි ගැන නොතකා හරිමින් ළමයින් හා යෞවනයින් යොදා ගැනීමකි.

## සයිබර් අපරාධ
## (Cyber Crime)

පරිගණකයක් හා ජාලයක් සම්බන්ධ ඕනෑම අපරාධයකි. සමහර අවස්ථාවලදී අපරාධ කිරීම සඳහා පරිගණක භාවිත කළ හැකි අතර, වෙනත් අවස්ථාවල දී පරිගණකය අපරාධයේ ඉලක්කය විය හැකිය.

## ළමා අසභ්‍ය දර්ශන
## (Child Phonography)

ළමයෙකුගේ ලිංගික ආකර්ශනය හුවා දක්වමින් කාමුකත්වය විදහා දක්වමින් නිර්මාණය කරනු ලබන සෑම දෘශ්‍යමය මාධ්‍යයක්ම මේ යටතේ ආවරණය කරයි. මේ සඳහා ළමා අපයෝජන රූප හා විඩියෝ (Child Abuse Videos and Images) යන පදය වර්තමානයේ භාවිතයට ගැනේ.

## ප්‍රතිරූපක මිත්‍රත්වය
## (Grooming)

ළමයෙකුගෙන් අයුතු ප්‍රයෝජනයක් ගැනීම සඳහා ළමයා සමඟ යහළු මිත්‍ර කමක් පැවැත්වීමේ ක්‍රියාවලිය හෙවත් ළමයා අපයෝජනයට සූදානම් කිරීමේ ක්‍රියාවලියයි. ළමා ලිංගික අපයෝජනයදීත් සයිබර් අපයෝජනයන්හිදීත් මෙය බහුලව ක්‍රියාත්මක වේ.

## සයිබර් බුලින් හා සයිබර්ස්ටොල්කින්
## (Cyber Bulling and Cyberstalking)

අන්තර්ජාලය ඔස්සේ සිදු කරනු ලබන හිංසනයක දී එහි හිංසකයා ළමයෙකු නම් එය සයිබර් බුලීන් ලෙස ද එහි හිංසකයා වැඩිහිටියෙකු නම් එය සයිබර්ස්ටොල්කින් ලෙස ද හඳුන්වයි.

## කාමුක පණිවුඩ යැවීම
## (Sexting)

කුමන හෝ ඉලෙක්ට්‍රෝනික උපකරණයක් භාවිත කරමින් ලිංගික උද්දීපනයක් ඇති වන ආකාරයේ පණිවුඩ ලිඛිත හෝ ශබ්ද හෝ රූප හෝ විඩියෝ ලෙස යොමු කිරීමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ඉලංගකෝන්, කාඤ්චන (2016) ආරක්ෂාකාරී ලෙස අන්තර්ජලය භාවිතයට උපදෙස්, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.
2. ජූඩ් ෆෙයාර්හෝල්ට්, වෛද්‍යසිංහ වික්‍රමසේකර, ගුර්වින්දර්සිං, ළමයින්ට හා යෞවනයින්ට සුරක්ෂිත පරිසරය නිර්මාණය කිරීම සඳහා පියවර දහයක් (2010), කැනේඩියානු රතු කුරුස සමාජය.
3. මාරසිංහ, චාරිකා. (2012) කාන්තා සහ ගැහැණු දරුවා ආරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා නීති නාමාවලිය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
4. රත්නපාල, නන්දවෙන (2003), අපරාධ විද්‍යාවේ මූලධර්ම (1) ආරිය ප්‍රකාශකයෝ, වරකපොළ.
5. අපි සුරකිමු - ප්‍රධාන පුහුණුකරුවන්ගේ අත්පොත - ජූඩ් ෆෙයාර්හෝල්ට් ආර්. එන්., ගුර්වින්දර් සිං එම්. ආර්., 2008, කැනේඩියානු රතු කුරුස සමාජය.
6. ඵලදායී හා ආරක්ෂාකාරී ඩිජිටල් තාක්ෂණයේ භාවිතය තුළින් සුරක්ෂිත පාසල් අධ්‍යාපයත්, පුහුණු අත්පොත (2017)
7. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, කොළඹ විශ්ව විද්‍යාලයීය, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (ශ්‍රී ලංවිවි මුද්‍රණාලය.)
8. ළමා සවිය (2002), ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය, කොළඹ 05.

9. 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
10. දණ්ඩ නීති සංග්‍රහය 19 වන අධිකාරිය,රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

11. Barnett, O. Miller, P. and Perrin, R. (1997) Family Violence Accorss the Life Span. Thousand Oaks, California: SAGE Publications (P.44)
12. Garbarino, J. Guttman, E. and Seeley, J (1987) The Psychologically Battered Child – San Francisco – Bass.
13. O' Hagan, K (1995) Emotional and Psychological Abuse: Problem of Definition, Child Abuse and Neglect.
14. Thibanlt, D. (2001) Fetal Alcohol Syndrome / Fetal Alochol Effects Training for Foster Parents. Canada's Children, Child Welfare Leagns of Canada.
15. Gabarino, J. (1997) The Human Ecology of Child Maltreatment Journal of Marriage and The Family.
16. World Heath Organization (2000) World Report of Violence and Health, Genewa: WHO Kruget al'
17. Active Living Alliance (2004) Active Living Alliance for Canadians with a disability retrieved from http://www.ala.ca/content/home.asp.
18. Pinheiro, P. S. (2006) World report on violence against children New York: United Nationans.
19. National Safety Conncil (2003) No Title. Family Safety and Heath (Publication of the National Safety Conncil. Illionis)

## *අබ්දුල් කලාම්*

මෙතුමන් ඉන්දියාවේ 11 වැනි ජනාධිපති ලෙස 2002 සිට 2007 වර්ෂය දක්වා කටයුතු කළ ඔහු ලොව පිළිගත් ඉන්දියානු විද්‍යාඥයෙක් ද වේ.



"අපි අපේ අද දවස කැපකිරීමෙන්
ළමයින්ට වඩාත් හොඳ
හෙට දවසක් ලැබෙනු ඇත....."

## ළමයාගේ අයිතිය

මිනිස් සමාජයේ කුඩා ම ඒකකය පවුල වන අතර එය විවිධාකාර ස්වරූප ගනී. පවුල තුළ මූලික කොටස් බන්ධනය කිරීමේදී පළමුව ළමයින්ද, දෙවනුව කාන්තාවන් හා පුරුෂයන්ද, තෙවනුව වැඩිහිටියන්ද වශයෙන් හඳුනා ගනී. ඒ අනුව පවුල තුළ ළමයින්ට ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ නීතියේ රැකවරණය ලැබිය යුතු පළමු කොටස්ශය **ළමයින්** වන නිසාය.

### ළමයා යනු

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අනුව ළමයා යනු, නීතිය මගින් අඩු වයසක දී පූර්ණත්වය ලබන්නේ නම් මිස, වයස අවුරුදු 18 ට අඩු සියලුම මනුෂ්‍යයින්ය.

ජාත්‍යන්තර නීතියට අනුව මෙන්ම දේශීය නීතිය අනුවද සාමාන්‍ය පිළිගැනීම වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු ළමයින් බව වුවත්, අප රටේ ළමයින්ට බලපාන විවිධ නීතින් තුළ ළමයා යන්න විවිධාකාරයෙන් හඳුනා ගෙන ඇත.

| පනත / මූලාශ්‍රය | වයස (අවුරුදු) |
|---|---|
| ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත | 14 |
| 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 14 |
| සාප්පු හා කාර්යාල සේවක ආඥා පනත | 14 |
| අයාල ආඥා පනත | 16 |
| 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත | 18 |
| 2005 අංක 16 දරණ සුනාමි ( විශේෂ විධිවිධාන)පනත | 18 |
| 1999 අංක 32 දරණ සාක්ෂි ( විශේෂ විධිවිධාන)පනත | 18 |

| | |
|---|---|
| 2005 අංක 34 දරණ ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත | 18 |
| නඩත්තු ආඥා පනත | 18 |
| කුලවැද්දීමේ ආඥා පනත | 18 |
| 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත | 18 |

## ළමයාගේ භාරකරු කවුරුන්ද?

ළමයාගේ වැඩීම හා වර්ධනය පිළිබඳ දෙමාපියන් දෙදෙනා ම සමසේ වගකීම දැරිය යුතුය. ඔවුන් සැමවිටම **ළමයාගේ උපරිම යහපත** උදෙසා ක්‍රියා කළ යුතු වන්නේය. මව හා පියා ළමයාගේ ස්වභාවික භාරකරුවන් වන නමුත් ළමයින්ගේ ඉහළම භාරකරුවා වනුයේ දිසා අධිකරණයයි.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (4) අනු ව්‍යවස්ථාව අනුව ද ළමයින්ගේ ප්‍රගතිය උදෙසා විශේෂිත නීති සම්පාදනය කිරීමේ වගකීම රජයට පවරා ඇත.

කෙසේ නමුදු, ළමා අයිතිවාසිකම් වලට ගරු කිරීම හා ළමයා සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම දෙමාපියන්ගේ, රජයේ මෙන්ම සමස්ත සමාජයේම යුතුකමක් වන්නේය.

## ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර නීතිය

- **<u>එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (United Nations Convention on the Rights of the Child)</u>**

  මානව අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සාමය හා සංවර්ධනය තහවුරු කිරීම සඳහා දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජාතීන්ගේ

සංවිධානය බිහි විය. 1989 වර්ෂයේ නොවැම්බර් මස 20 දින එක්සත් ජාතීන් විසින් ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය අත්සන් කරන ලදි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය 1990 සැප්තැම්බර් 22 වන දා සිට ක්‍රියාත්මක විය. වගන්ති 54කින් යුත් මෙම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය ශ්‍රී ලංකාව විසින්, 1991 ජනවාරි මස 26 වන දා අත්සන් කරන ලද අතර, 1991 ජුලි 12 වනදා සිට ක්‍රියාත්මක කරන ලදී. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් ලොව පුරා සිටින ළමයින් උදෙසා අයිතිවාසිකම් හඳුන්වා දෙන ලදි. එහි දී ළමයින්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය හා සමාජ ආරක්ෂාව මූලික අවශ්‍යතා වශයෙන් හඳුන්වා දෙමින් ළමයින් හට ක්‍රීඩා කිරීමට, තම අදහස් ප්‍රකාශ කිරීමට හා විනෝදයෙන් සිටීමට ඇති අවශ්‍යතාව ද සඳහන් කරන ලදී.

**01 වගන්තිය - ළමයා පිළිබඳ නිර්වචනය**

- වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙකු ම ළමයෙකු ලෙස සැලකේ.

**02 වගන්තිය - වෙනස් කොට නොසැළකීමේ අයිතිය**

- ළමයින් කවුරුන් වුවද, කුමන වයසක වුවද, කිසියම් අබාධයක් සහිත වුවද, කුමන වර්ණයකින් යුක්ත වුවද, කුමන ජාතියකට අයත්වුවද, කුමන භාෂාවකින් කතා කළද ඒ සෑමටම කිසිදු ආකාරයේ වෙනසකින් තොරව මෙම අයිතීන් හිමි විය යුතුය.

**03 වගන්තිය - ළමයාගේ උපරිම යහපත**

- ළමයින් සම්බන්ධව ක්‍රියාකරන විටදී සහ ඔවුන් පිළිබඳ ගන්නා තීරණ වලදී ළමයාගේ උපරිම යහපත සලසා ක්‍රියා කළ යුතුය.

**04 වගන්තිය - ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**

- ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති සියලු ම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට රජය විසින් හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

**05 වගන්තිය - දෙමව්පියන්ගේ මාර්ගෝපදේශකත්වය**

- ළමයාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැලසීමෙහි ලා පවුල සතු වගකීමට ද දෙමව්පියන්ගේ අයිතිවාසිකම් හා වගකීම්වලට ද රජය ගරු කළ යුතුය.

**06 වන වගන්තිය - පැවැත්ම සහ සංවර්ධනය**

- සෑම ළමයෙකුටම ජීවත්වීම සඳහා අයිතියක් ඇත.
- රාජ්‍යයන් විසින් ළමයාගේ පැවැත්ම හා සංවර්ධනය උදෙසා හැකි සෑම අයුරින්ම උපකාර කළ යුතුය.

**07 වන වගන්තිය - නම සහ ජාතිකත්වය**

- උපතේ සිට නමක් සහ ජාතියක් ලැබීමට සෑම ළමයෙකුටම අයිතියක් ඇත. එනම් ඉපදුන විට ළමයාගේ විස්තර සහිතව උපත ලියාපදිංචි කළ යුතුය.

**08 වන වගන්තිය - අනන්‍යතාවය ආරක්ෂා කිරීම**

- කිසියම් ළමයෙකුගේ අනන්‍යතාවය අහිමි නොකළ යුතුයි. එසේ වී නම් එය යළි ස්ථාපනය කිරීමට ද රජය බැඳී සිටී.

**09 වන වගන්තිය - දෙමව්පියන්ගෙන් වෙන් කර තැබීම**

- ළමයා දෙමාපියන් ගෙන් වෙන් නොකළ යුතුය. දෙමාපියන් වෙන් වුවත් ළමයාට දෙදෙනාම සමඟ සම්බන්ධතා සඳහා අවස්ථාව ලබා දිය යුතුය.

**10 වන වගන්තිය - පවුලක් ලෙස නැවත එක් වීම**

- ළමයාගේ දෙමව්පියන් වෙන් වෙන් රටවල ජීවත් වන්නේනම්, යළිත් එක්වී වෙනම තැනක ජීවත්වීමේ අයිතියක් ළමයා සතුව ඇත.

**11 වන වගන්තිය - ළමුන් පැහැරගෙන යාම**

- දෙමාපියෙක් හෝ වෙනත් අයෙකු ළමයින් අන් රටකට පැහැරගෙන යාම වැළැක්වීම සහ එම ළමයින් නැවත ලබා ගැනීම රජයේ වගකීමකි. ළමයාගේ හෝ දෙමව්පියන්ගේ කැමැත්තට පටහැනිව ළමයාව පිටරට යැවීම හා නැවත ගෙන්වීම නොකළ යුතුය.

**12 වන වගන්තිය - ළමයාගේ මතය**

- ළමයා පිළිබඳ තීරණ ගැනීමේදී, ළමයාගේ අදහස්වලට සැලකිල්ලක් දක්වා අවස්ථාව ලබා දිය යුතුය.

**13 වන වගන්තිය - නිදහස් ලෙස අදහස ප්‍රකාශ කිරීම**

- තොරතුරු රැස්කර ගැනීමටත් ඒ පිළිබඳව විවිධ ක්‍රම මගින් අදහස් ප්‍රකාශ කිරීමටත් ළමයාට අවස්ථාව ලැබිය යුතුය.

**14 වන වගන්තිය - නිදහස්ව සිතීම සහ ආගම ඇදහීම**

- දෙමාපියන්ගේ මඟ පෙන්වීම යටතේ ළමයාට කැමති දේ සිතීම හා කැමති ආගමක් ඇදහීමට අයිතියක් ඇත.

**15 වන වගන්තිය - ඇසුරු කිරීමේ නිදහස**

- අන් අයගේ ආගම් සාරධර්ම වලට පහර, හෝ අගෞරව නොවන ලෙස සමාජ හිතකාමී සහ ජාතික අභිවෘද්ධිය සැලසෙන සමිති සමාගම් පිහිටුවීමේ අයිතිය ළමුන්ට ඇත.

## 16 වන වගන්තිය - පෞද්ගලිකත්වයේ අයිතිය

- තම ගරුත්වයට හෝ කීර්තියට හානි කරනු ලැබීම් වලින් ළමයින්ව ආරක්‍ෂා කරනු ලැබිය යුතුය. තම පෞද්ගලික ජීවිතය, පවුල හෝ නිවස සම්බන්ධව අන් අයගේ මැදිහත්වීම් වලින් තොරව කටයුතු කිරීමට අයිතිය ඇත.

## 17 වන වගන්තිය - තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

- සෑම රාජ්‍යයක් විසින්ම දේශිය හා විදේශිය තොරතුරු මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට ළමයින්ට අයිතිය ලබා දිය යුතුය.
- එහෙත් ගැලපෙන තොරතුරු පමණක් ලබාදීම වැඩිහිටියන්ගේ වගකීමකි.

## 18 වගන්තිය - දෙමව්පියන්ගේ මාර්ගෝපදේශකත්වය

- මව්පියන් දෙදෙනාම ළමයාගේ වැඩීම හා වර්ධනය පිළිබඳ සමසේ වගකීම දැරිය යුතුය. ඔවුන් සැමවිට ළමයාගේ යහපත උදෙසා ක්‍රියා කළ යුතු අතර මේ සඳහා රජය ඔවුන්ට සහය විය යුතුය.

## 19 වගන්තිය - අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීම

- අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂාවීමට ළමයින්ට අයිතියක් ඇත. දෙමව්පියන් හා රැකබලා ගන්නන්ට ළමයින්ට හිංසා කිරීමට කිසිම අයිතියක් නැත. අපයෝජනයට ලක්වීමෙන් ළමයින් ආරක්ෂා කර ගැනීමටත්, එසේ අපයෝජනයට ලක් වූ ළමයින් පුනරුත්ථාපනය කිරීමත් රජයේ වගකීමයි.

**20 වගන්තිය - පවුලක් නොමැති ළමයින්ට රැකවරණය**

- ළමයාගේ දෙමව්පියන් නොමැත්තේ නම් සහ දෙමව්පියන් සමඟ සිටීම අනාරක්ෂිත නම් ළමයාට විශේෂ ආරක්ෂාව සහ ආධාර ලබා ගැනීමට අයිතියත් ඇත.

**21 වගන්තිය - දරුකමට හදා ගැනීම**

- ළමයෙකු දරුකමට හදාගන්නේ නම්, රටේ පවතින නීතිමය පටිපාටියට අනුකූලව අදාළ බලයලත් ආයතන තුළින් එය සිදුකළ යුතුය. කැපකරු මා පිය භාරයක රැඳවීම ඉස්ලාම් දර්ශනයෙහි කෆාලා ක්‍රමවේදය හෝ දරුකමට හදාගැනීමක් හරහා හෝ විය හැකිය. ළමයාගේ මව් රට තුළ දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් උපකාර කළ නොහැකි අවස්ථා වලදී රාජ්‍යයන් අතර (inter country) වැඩපිළිවෙලවල් හරහා දරුවාට උපකාර කළ යුතුය.

**22 වන වගන්තිය - සරණාගත තත්වයේ ළමයින්**

- දෙමාපියන් සමඟ හෝ දෙමාපියන් නොමැතිව තම මව් රට අතහැර යාමට සිදු වූ ළමයින්ට අනෙකුත් රාජ්‍යයන්ගේ විශේෂ ආරක්ෂාව හා සහය ලබා දිය යුතුය.
- නැවතත් පවුල් ඒකකය ප්‍රතිසංවිධානය කිරීම සඳහා රාජ්‍යයන් විසින් ප්‍රයත්න දැරිය යුතුය. නොමැතිනම් ජීවත් වීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනගා දිය යුතුය.

**23 වන වගන්තිය - ආබාධ සහිත ළමයින්ගේ අයිතීන්**

- ශාරීරිකව හෝ මානසිකව ආබාධ සහිත ළමයින් හට ගරුත්වය සහිත පූර්ණ ජීවිතයක් ගත කිරීමට අයිතිය ඇත. ඔවුන්ට ආත්ම විශ්වාසයෙන් යුතුව සමාජ සහභාගීත්වය ලබා ගැනීමට අවශ්‍ය බව පිළිගත යුතුය.

- සෑම රාජ්‍යයක් ම ආබාධ සහිත ළමයින් සඳහා විශේෂ රැකවරණයන් හැකිතාක් නොමිලේ ලබා දීමට කටයුතු කළ යුතුය.
- මෙම රැකවරණයන් අධ්‍යාපන, පුහුණු සෞඛ්‍ය හා රක්ෂණ සේවා, පුනරුත්ථාපන කටයුතු, සේවා නියුක්තිය සඳහා සුදානම් කිරීමට හෝ විනෝද කටයුතු යන විෂයන් උදෙසා විය හැකිය.
- කායික හෝ මානසික ආබාධ සහිත විශේෂ රැකවරණය අවශ්‍ය ළමයින් ස්ථානගත කර ඇති ආයතනයන් හා ළමයින් පිළිබඳව රාජ්‍යයන් විසින් අධීක්ෂණය කළ යුතුය.

## 24 වන වගන්තිය - සෞඛ්‍ය හා සෞඛ්‍ය සේවා

- සෑම ළමයෙකුටම තමන්ට ලබාගත හැකි ඉහළම සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට අයිතිය ඇත.
- සෑම රාජ්‍යක්ම පාහේ:

  ළදරු හා ළමා මරණ සංඛ්‍යාව අඩු කිරීමට, ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂාව වර්ධනය කිරීමට, රෝග හා පෝෂණ ඌණතාවන් මර්ධනය කිරීමට, පූර්ව ප්‍රසව හා පශ්චාත් ප්‍රසව සෞඛ්‍යාරක්ෂාව මව්වරුන් හට ලබා දීම සහතික කිරිමට, දෙමාපියන් හට නිවාරණ සෞඛ්‍යරක්ෂාව හා පවුල් සැලසුම් මාර්ගෝපදේශ ලබා දීමේ වැඩපිළිවෙලවල් වර්ධනය කිරීමට, සෞඛ්‍ය පිළිබඳ ඇති මිත්‍යා මතවාද ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
- ළමයාගේ රැකවරණය, ආරක්ෂාව හා ප්‍රතිකාර සඳහා ඔහු/ඇය යම් ස්ථානයක රදවා තිබේනම් ඒ සම්බන්ධව සියලූ කාරණා සෑම රාජ්‍යයක් විසින්ම නිරන්තරව අධීක්ෂණය කළ යුතුය.

**25 වන වගන්තිය - ආයතනගත කර ඇති ළමයින් පිළිබඳ අධීක්ෂණය**

- රජය විසින් ළමයා ආයතනගත කරන්නේ නම් අදාළ ස්ථානය පිළිබඳව නිරන්තරව සොයා බැලීම රජයේ වගකීමකි.

**26 වන වගන්තිය - සමාජ ආරක්ෂණයේ අයිතිය**

- සෑම ළමයෙකුටම සමාජ ආරක්ෂණයේ අයිතිය හිමි වේ.
- සෑම ළමයෙකුටම සමාජ සුරක්ෂිතභාවයේ ප්‍රතිඵල ලැබීමට අයිතිය ඇත.
- මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීම පිණිස අවශ්‍ය පහසුකම් රාජ්‍යයන් විසින් හෝ දෙමාපියන් විසින් ළමයින් හට ලබා දිය යුතුය.

**27 වන වගන්තිය - ජීවන තත්වය**

- රටේ පවතින විවිධ සමාජ ප්‍රතිලාභ ලබා ගැනීමට ළමයාට අයිතියක් ඇත.

**28 වන වගන්තිය - අධ්‍යාපනයට ඇති අයිතිය**

- සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමට අයිතිය ඇත.
- රාජ්‍යයන් විසින්, සෑම දෙනාටම මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමට හා එය නොමිලයේ ලබා දීමට කටයුතු කළ යුතුය, විවිධාකාරයේ ද්විතීයික අධ්‍යාපන තත්වයන් වර්ධනය කළ යුතුය, සෑම දෙනාටම උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශයන් සකස් කළ යුතුය, අධ්‍යාපන හා වෘත්තිය මාර්ගෝපදේශයන් ලබා දිය යුතුය, ළමයින්ගේ පාසල් පැමිණීම උනන්දු කළ යුතුය, පාසල් විනය, ළමයාගේ පෞර්ෂ වර්ධනයට අනුකූල වන ආකාරයට පවතින බවට වගබලාගත යුතුය.

**29 වන වගන්තිය - අධ්‍යාපනයේ අරමුණු**

- ළමයින් හට ලබා දෙන අධ්‍යාපනය තුළින්, ළමයාගේ හැකියාවන් හා දක්ෂතාවන් වැඩිදියුණු කළ යුතුයි, මානව අයිතිවාසිකම් වලට ගරු කරමින් ජීවත් වීමට සූදානම් කළ යුතුය.

**30 වන වගන්තිය - සුළු ජන කොටස්වලට අයත් ළමයින්**

- ළමයා සුළු ජනකොටසකට අයත් වුවත් තම සංස්කෘතිය භුක්ති විදීම, තමන්ගේ ආගම ඇදහීමට ද, තමන්ගේ භාෂාව ව්‍යවහාර කිරීමට ද, අයිතියක් තිබිය යුතුය.

**31 වන වගන්තිය - ක්‍රීඩා, විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු**

- සෑම ළමයෙකුටම විවේක සුවය ලැබීමටත්, විනෝද කටයුතු වල නිරත වීමටත් අයිතියක් ඇත.
- සෑම ළමයෙකුටම සංස්කෘතික, කලාත්මක, විනෝදාත්මක හා විවේකීය කටයුතු සඳහා සමාන අවස්ථාවන් හිමිවිය යුතුය.
- සෑම ආකාරයකම ශාරීරික, මානසික හෝ අධ්‍යාත්මික වර්ධනයට හානිකර වූ ක්‍රියාවන්ගෙන් ළමයා ආරක්ෂා කළ යුතුය.

**32 වන වගන්තිය - ළමා ශ්‍රමිකත්වයේ නිදහස**

- කිසිම ළමයෙකුට ඔහුගේ/ඇයගේ අධ්‍යාපනය කෙරෙහි බාධා වන ආකාරයේ රැකියාවන් හි නිරත වීම සඳහා බළ නොකළ යුතුය.
- සෑම රාජ්‍යයන් විසින්ම.
- සේවා නියුක්තිය සඳහා අවශ්‍ය වයස් මට්ටම් පිළිබඳ විධි විධානයන්,

- සේවයේ යෙදීමේ පැය ගණන හා අනෙකුත් සුදුසු විධිවිධානයන්, සකස් කළ යුතුය.

**33 වන වගන්තිය - වෙනත් ආකාරයේ අපයෝජන**

- රජය විසින් පැනවූ ළමා ශ්‍රමික අවම වයස් සපිරූ ළමුන්ට වුවද, අධ්‍යාපනය හා සෞඛ්‍යයට බාධා වන කටයුතු හා සූරාකෑමෙන් ආරක්ෂා වීමට අයිතියක් ඇත.

**34 වන වගන්තිය - ලිංගික අපයෝජනය**

- ළමයින් කිසිදු ලිංගික ක්‍රියාවකට යෙදවීම හෝ පෙළඹවීම නොකර ආරක්ෂා කළ යුතුය.

**35 වන වගන්තිය - විකිණීම හා පැහැරගෙන යාම**

- ළමුන් පැහැරගෙන යාමට, වෙළඳාම් කිරීමට හෝ විකිණීමට, කිසිවකුට අවසරයක් නැත. එවැන්නක් සිදුවීම වැළැක්වීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

**36 වගන්ති - ළමා ජාවාරම් සහ ළමයින්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීම් වලින් නිදහස**

- මත්ද්‍රව්‍ය භාවිතයෙන් සෑම ළමයෙකුම ආරක්ෂා කළ යුතුය.
- එවැනි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා හා බෙදා හැරීම සඳහා ළමයින් යොදාගැනීම වැළැක්වීමට නිසි පියවර ගත යුතුය.
- සෑම ළමයෙකුම :
- ලිංගික සූරාකෑම් හා අපයෝජනයන්ගෙන්
- ගණිකා වෘත්තියෙහි යෙදවීමෙන්

- ළමා අසභ්‍ය ප්‍රකාශන හා ද්‍රව්‍යවලින් මෙන්ම අනෙකුත් අනීතික ලිංගික ක්‍රියා වලින් ආරක්‍ෂා කළ යුතුය.
- සෑම රාජ්‍යයන් විසින්ම :
- අපහරණයන් හා
- ළමා ජාවාරම් හෝ විකිණීම් වැනි ළමයාගේ යහපතට හානිදායක වන ක්‍රියාවන්ගෙන් ළමයා ආරක්‍ෂා කිරීමට දායක විය යුතුය.

## 37 වන වගන්තිය - වධහිංසා කිරීම හා නිදහස අහිමි කිරීම

- කිසිම ළමයෙකු, වධහිංසාවකට, කෲර අමානුෂික හා වද හිංසාවකට ලක්නොකළ යුතුය.
- මරණීය දණ්ඩනයට ලක් කිරීම හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කිරීම මගින් කිසිම ළමයෙකුගේ ස්වාධීනත්වය අනීතික ලෙස හෝ අත්තනෝමතික ලෙස අහිමි නොකළ යුතුය.
- තම ස්වාධීනත්වය අහිමි කරනු ලැබූ සෑම ළමයෙකුටම නෛතික හෝ වෙනත් සුදුසු ආධාර ලබා ගැනීම සඳහා ප්‍රවේශයට අයිතිය ඇත.
- එමෙන්ම තම පවුලේ සාමාජිකයන් හා සබඳතා පවත්වාගෙන යාමට අවසර ලබා දිය යුතුය.

## 38 වන වගන්තිය - සන්නද්ධ අරගල

- සන්නද්ධ අරගල පවතින අවස්ථාවන්හිදී ළමයින්ට ආරක්‍ෂාව ලබාදිය යුතුය.
- ළමයින් සම්බන්ධ වන සන්නද්ධ අරගල වේ නම්, සෑම රාජ්‍යයක්ම ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරු කරමින් කටයුතු කළ යුතුය.

- යුද්ධයෙන් පීඩාවට ලක්වූ ළමයින්ට රජය විසින් ආරක්ෂාව හා රැකවරණය සලසා දිය යුතුය.

**39 වන වගන්තිය - පුනරුත්තාපන රැකවරණය**

- කිසියම් ළමයෙකු
- නොසලකා හැරීමකට, අයුතු ප්‍රයෝජනයට යොදා ගැනීමකට, අපයෝජනයකට හෝ වධහිංසාවකට භාජනය වී ඇති හෝ වෙනයම් ආකාරයක කෲර අමානුෂික හෝ වෙනස් කොට සැලකීමට හෝ
- සන්නද්ධ ගැටුමකට මැදිවී සිටින විටදී එම ළමයාගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය සඳහා උචිත පියවර ගැනීම.

**40 වන වගන්තිය - ළමයා හා නීතිය**

- ළමයෙකු යම් නිතීයක් කඩ කර ඇති විට දී, ඊට අදාළව කටයුතු කරන ආයතන දරුවාගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කළ යුතුවේ.
- එවැනි අවස්ථාවලදී: නීතිය ඉදිරියේ වරදකරු වනතුරු එම ළමයා නිවැරදිකරුවෙකු ලෙස සලකනු ලැබිය යුතුය.
- ළමයෙකුට එරෙහිව පවතින චෝදනාව දැනුම් දිය යුතුය. එවැනි කරුණකදී දරුවාගේ පවුලේ අයට විත්තිවාචකය සූදානම් කිරීමට හැකිවනු ඇත.
- ළමයින්ට ආදාල නඩු කටයුතු නිසි බලය සහිත අධිකරණයක් මගින් කඩිනමින් සිදු කළ යුතුය.
- ළමයින්ට සාක්ෂි ලබා දීම සඳහා හෝ පාපොච්චාරණය කිරීම සඳහා බලපෑම් නොකළ යුතුය.
- ළමයාට අධිකරණයේ භාවිතවන භාෂාව තේරුම් ගත නොහැකි විටදී භාෂා පරිවර්තකයෙකුගේ සහය ලබා දිය යුතුය.

**41 වන වගන්තිය - පවත්නා ඉහළ නීති තත්වයන් රැකගැනීම**

- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ඇති මට්ටමට වඩා ඉහල මට්ටමකින් රටේ ළමා අයිතිවාසිකම් රැකේ නම්, ඉහළ මට්ටම් පවත්වා ගත යුතුය.

**42 හා 54 වන වගන්තිය - පවත්නා නීති ක්‍රියාත්මක**

- සියළුම වැඩිහිටියන් ප්‍රඥප්තිය ගැන දැන ගත යුතුය. තමන්ගේ අයිතිවාසිකම් ගැන දැන ගැනීමට ළමුන්ටද අයිතියක් ඇත.
- මෙම ප්‍රඥප්තියේ වගන්ති 54 කි. වගන්ති 42 සිට 45 දක්වා, ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයට වාර්තා කිරීම පිළිබඳ රාජ්‍යයන් සතු වගකීම විස්තර කෙරේ.
- වගන්ති 46 – 54 දක්වා ප්‍රඥප්තියට ඇතුලත් වීම සඳහා රාජ්‍යයන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දැක්වේ.

- **ළමයින් විකිණීම, ගණිකා වෘත්තියේ යෙදවීම සහ අසභ්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගැනීම පිළිබඳව ළමා අයිතිවාසිකම් සම්මුතියට කරන ලද වෛකල්පික ගිවිසුම ( Optional Protocol to the Convention on the Rights of the Child on the sale of children, child prostitution and child pornography)**

  මෙම සම්මුතියට අනුව ළමයින් විකිණීමෙන්, ගණිකා වෘත්තියෙහි යෙදවීමෙන් හා අසභ්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරවීමෙන් ඔවුන් ආරක්ෂා කරන බවට සහතික වීමේ වගකීම රාජ්‍ය පාර්ශවයන් විසින් දැරිය යුතුය. ( 2002 ජනවාරි 18 දින සිට මෙය ක්‍රියාත්මකව ඇත)

- **ළමයින් සන්නද්ධ අරගලවලට හවුල් කරගැනීම පිළබදව ළමා අයිතිවාසිකම් සම්මුතියට කරන ලද වෛකල්පික ගිවිසුම (Optional**

Protocol to the Convention on the Rights of the Child on the involvement of children in armed conflict)

මෙම සම්මුතියේ පහත කරුණු මූලිකව සඳහන් කර ඇත.

- සන්නද්ධ අරගලවලට ළමයින් යොදවා ගැනීම වැළැක්වීමෙන් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙන් හඳුනා ගන්නා අයිතිවාසිකම් සුරැකීම තවදුරටත් ශක්තිමත් කිරීම.
- වයස අවුරුදු 18 ට අඩු ළමයින් යුධ කටයුතුවලට යොදවා ගැනීම වැළැක්වීම සඳහා හැකි සෑම පියවරක්ම ගැනීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ට වගකීමක් උද්ගත වේ.
- මේ අනුව සන්නද්ධ අරගල සඳහා ළමයින් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ යොදා ගැනීම නොකළ යුතුය.
  ( 2002 පෙබරවාරි 12 දින සිට මෙය ක්‍රියාත්මකව ඇත)

## ළමා අයිතිවාසිකම් පිළිබඳ දේශීය නීතිය

### ❖ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 12 (4) ව්‍යවස්ථාව

රටක මූලික හා උත්තරීතර නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (4) මගින් ළමයින්ගේ අයිතිවාසිකම් රැක ගැනීම හා ආරක්ෂා කිරීම සඳහා විශේෂිත විධිවිධාන සලසමින් නීති සම්පාදනය කිරීමට රජයට බලය පවරා ඇත.

### ❖ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 12 (13) ව්‍යවස්ථාව

ළමයින් හා යෞවනයන් කායික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සාමාජික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් හා වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකි වන පරිදි රජය ඔවුන් කෙරේ විශේෂ අවධානයක් හා වැඩපිළිවෙලක් තහවුරු කරනු ඇතැයි මෙහි සඳහන් වේ.

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් නීතිය මගින් බලාත්මක කර ඇති ළමා අයිතිවාසිකම්</u>

| ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන |
|---|---|
| 02 වගන්තිය - වෙනස්කොට නොසැළකීම | 12 (2) ව්‍යවස්ථාව - වෙනස්කොට නොසැළකීම |
| 12 හා 13 වගන්ති - අදහස් ප්‍රකාශ කිරිම සඳහා ඇති අයිතිය | 14(1) (අ) - භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස |
| 14 වගන්තිය - සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස | 10 ව්‍යවස්ථාව - සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස |
| 15 වගන්තිය - ඇසුරු කිරීමේ නිදහස | 14(1) (ඇ)ව්‍යවස්ථාව - සමාගමයේ නිදහස |
| 36 වගන්තිය - වධහිංසාවලින් මිදීමේ නිදහය | 11 ව්‍යවස්ථාව - වධහිංසාවලින් මිදීමේ නිදහය |

## ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ

ළමයින්ට සිදුවන අපරාධ හා හිංසන වැලැක්වීමේ ප්‍රතිපාදන ප්‍රථමවරට අන්තර්ගත කරන ලද්දේ 1883 **දණ්ඩ නීති සංග්‍රහය** තුළය. විවිධාකාර වැරදි අර්ථ දක්වා ඊට ලැබිය යුතු දණ්ඩන නියමයන් පිළිබඳ විස්තර දැක්වීම දණ්ඩ නීති සංග්‍රහයට අයත් මූලික කාර්යභාරයයි. දණ්ඩ නීති සංග්‍රහය වරින්වර සංශෝධනය කරමින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පුළුල් ප්‍රතිපාදන ගෙන එන ලදී.

<u>**දණ්ඩ නීති සංග්‍රහය පනත තුළ ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ ලෙස හඳුනා ගෙන ඇති ක්‍රියා නම්;**</u>

- ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන අසභ්‍ය පළ කිරීම්/ ප්‍රදර්ශනය (ද.නී.ස. 286 අ. 1)
- ළමයින් සිඟමනෙහි යෙදවීම (ද.නී.ස.288)
- සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම ( ද.නී.ස.288 ආ)
- ගබ්සා කිරීම (ද.නී.ස. 303)
- ළමයින් කෲර වධහිංසා වලට භාජනය කිරීම (ද.නී.ස.308)
- පහර දීම හා තුවාල සිදු කිරීම ( ද.නී.ස.314)
- බරපතල තුවාල සිදු කිරීම ( ද.නී.ස.316)
- ලිංගික අතවර සිදු කිරීම (ද.නී.ස.345)
- පැහැරගෙන යාම (ද.නී.ස.353)
- අපහරණය (ද.නී.ස.354)
- බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩ ගැනීම (ද.නී.ස.358)
- කුට්ටනය (ද.නී.ස.360 අ.)
- ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම (ද.නී.ස.360 ආ.)
- තැනැත්තන් වෙළඳාම් කිරීම (ද.නී.ස.360 ඇ.)

- දරුකමට හදාගැනීමට අදාළ වැරදි (දැ.නී.ස.360 ඈ.)
- ලිංගික අපයෝජනය සඳහා ළමයෙකුට ඇවිටිලි කිරීම (දැ.නී.ස.360 ඉ.)
- ස්ත්‍රී දූෂණය (දැ.නී.ස.363)
- ව්‍යභිචාරය (දැ.නී.ස.364 අ.)
- අස්භාවික වැරදි (දැ.නී.ස.365)
- තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා (දැ.නී.ස.365 අ.)
- බරපතල ලිංගික අපයෝජනය (දැ.නී.ස.365 ආ.)

**ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශනය. (දැ.නී.ස. 286 අ.1) (1995/22)**

පහත ක්‍රියා සිදු කරනු ලබන ළමයාගේ භාරකරුවන් ඇතුළු ඕනෑම අයෙකු මේ යටතේ වරදකරුවකු බවට පත් වේ.

- අසභ්‍ය හෝ අශ්ශීල පොතක්, පත්‍රයක්, චිත්‍රයක්, ඡායාරූපයක්, චිත්‍රපටයක නිරූපනයක් කිරීම සඳහා ළමයකු පෙළඹවීම.
- එවැන්නක් විකිණීම හෝ සන්තකයේ තබා ගැනීම.
- එවැන්නක නියැලීමට ළමයාට ඉඩ සැලැස්වීම.
- එවන් ඡායාරූප බෙදාහැරීම හෝ ප්‍රචාරක කටයුතුවල නිරත වීම.

<u>**දඬුවම - අවුරුදු 2 - 10 සිරදඬුවමක් සහ දඩයක්**</u>

1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය මගින් 286 අ. වගන්තියට පහත පුද්ගලයන්ද ඇතුලත් කොට ඇත.

ඉහත ආකාරයේ ඡායාරූප, චිත්‍රපට මුද්‍රණය කරන පුද්ගලයින්ද, අදාළ වරද සිදු කරන අතර වසර 2ක සිරදඬුවමක් සහ දඩයකින් දඬුවම් කළ හැක.

කාලීන අවශ්‍යතාවයන් මත 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත මගින් නව ප්‍රතිපාදන හඳුන්වා දී ඇත.

- පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තෙකු විසින්, ළමයෙකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා තම පරිගණක පහසුකම් භාවිතා නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතුය.
- ඉහත තොරතුරක් දන්නේ නම් වහාම ළඟම ඇති පොලිස් ස්ථානයට එකී නිළධාරියා තමන් දන්නා සියලු තොරතුරු දැනුම් දිය යුතුය.

**දඬුවම - එවැනි දැනුම් දීමක් පැහැර හැරීමේ වරදට වරදකරු වන පුද්ගලයෙකුට අවුරුදු 2කට නොවැඩි සිරදඬුවමක් නියම කළ හැක.**

**ළමා අපයෝජනයක් සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කිරීම.**
**(ද.නී.ස. 286 ඇ.) (2006/16)**

ළමා අපයෝජනයක් සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරන බවට දැන ගැනීමට ලැබුනහොත් එහි භාරකරුවකු, රැකවරණය සපයන්නෙකු, පාලකයෙකු, සන්තකය දරන්නෙක් විසින් ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත දැනුම් දිය යුතුය.

**දඬුවම - එවැනි දැනුම් දීමක් පැහැර හරින්නෙකුට අවුරුදු 2කට නොවැඩි බන්ධනාගාරගත කිරීමක් දඩයක් හෝ එම බන්ධනාගාරගත කිරිම හා දඩය යන දෙකටම යටත් කළ හැකිය.**

**ළමයින් සිඟමනෙහි යෙදවීම.**
**(දැ.නී.ස. 288 1.) ( 1998/29)**

සිඟාකෑමට, දන් ලැබීමට හෝ ඒ සඳහා පෙළඹවීමට (සිංදු කීමේ, නැටීමේ, රූඟුම් දැක්වීමේ යම් දෙයක් අලෙවි කිරීමේ හෝ වෙනත් ආකාරයේ ව්‍යාජයක් ඇතත් නැතත්) කිසියම් වීදියක, ස්ථානයක හෝ භූමි භාගයක සිටීමට ළමයකුට ඉඩසලස්වන හෝ ඒ සඳහා ළමයකු සැපයීම වරදකි.

<u>**දඬුවම - බරපතල වැඩ ඇතිව හෝ නැතිව අවුරුදු 5 ට නොවැඩි සිරදඬුවමක් හා දඩයක්**</u>

**ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම.**
**(දැ.නී.ස. 288 අ.) (1998/29)**

නීති විරෝධී ලිංගික සංසර්ගය සඳහා දැන දැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවන, පොළඹවන හෝ එම ළමයාට බලකරන කවර හෝ වරදකරුවකුට අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු පහකට නොවැඩි සිරදඬුවමක් හා දඩයක් නියම කළ හැකිය.

**සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම.**
**(දැ.නී.ස. 288 ආ.1.) (1998/29)**

යම් සීමිත භාණ්ඩයක් (විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනතින් එයට දී ඇති අර්ථය ම ඇත) ජාවාරම් කිරීමට දැන දැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවා ගන්නා, පොලඹවන, යොදවන හෝ එම ළමයාට බලකරන කවර හෝ තැනැත්තෙක් වරද සිදු කරයි.

**<u>දඬුවම - අවුරුදු 5 කට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩයක්</u>**

**ළමයින් කෲරත්වයට භාජනය කිරීම.**
**(ද.නී.ස. 308 අ.) (1995/22)**

අවුරුදු දහඅටකට අඩු ළමයකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂාව දරන යම් තැනැත්තකු එවැනි ළමයකුගේ ශරීරයට වේදනා දිය හැකි, සෞඛ්‍යයට හානි විය හැකි, මානසිකත්වය ව්‍යාකූල විය හැකි ක්‍රියාවක් කිරීම, ළමයා නොසලකා හැරීම හෝ අතරමං කිරීම හෝ එවැන්නකට ඉඩදීම සිදු කරන කවර හෝ තැනැත්තෙක් ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරයි.

**<u>දඬුවම - අවුරුදු 2 කට නොඅඩු සහ අවුරුදු10 නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හා දඩයක්</u>**

**ලිංගික අතවර සිදු කිරීම.**
**(ද.නී.ස. 345) (1995/22)**

අඩත්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තකු ලිංගික අතවර සිදු කිරීමේ වරද සිදු කරනු ලබයි.

**<u>දඬුවම - අවුරුදු 5 ක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකම</u>**

**තවද ඒ වරදට ගොදුරු වූ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන වන්දි මුදලක් ගෙවන ලෙසට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකිය.**

**අපහරණය සහ පැහැරගෙන යාම.**
**(දැ.නී.ස. 351, 352, 353, 354) (1995/22)**

අපහරණය - යම් තැනැත්තකුගේ කැමැත්ත නොමැතිව හෝ නීත්‍යනුකූල භාරකරුගේ අනුමැතිය නොමැතිව ළමයෙකු ශ්‍රී ලංකාවෙන් පිට කිරීම හෝ වයස අවුරුදු 16ට අඩු දැරියක හෝ 14ට අඩු පිරිමි ළමයෙකු ඉහත කී නීත්‍යානුකූල භාරකාරත්වයේ කැමැත්ත නැතිව භාරකාරත්වයෙන් රැගෙනයාම හෝ ඉවත් කිරීම අපහරණය නම් වේ.

පැහැරගෙන යාම - යම් තැනැත්තෙකු එක් ස්ථානයකින් තවත් ස්ථානයකට යාමට බලකිරීමෙන් හෝ බලහත්කාරයෙන් හෝ වංචා සහගතව රැගෙන යාම සහ එසේ කිරීමට පෙළඹවීම.

**දඬුවම - අවුරුදු 7 දක්වා සිරදඬුවමක් සහ දඩයක් සහ අධිකරණය තීරණය කරනු ලබන වන්දියක්**

**ණය බැදුම්කරය, දාසභාවය, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩ ගැනීම, වහල්කම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.**
**(දැ.නී.ස. 358 අ.) ( 2006/16)**

358 අ. අ.) යම් තැනැත්තෙකු ණය බැදුම්කරයකට හෝ දාසභාවයට පත් කරවන හෝ එසේ පත් කිරීමට සලස්වන,

ආ) යම් තැනැත්තෙකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩගැනීමට යටත් කරවන හෝ එසේ යටත් කිරීමට සලස්වන,

ඇ) යම් තැනැත්තෙකු වහල්කමට භාජනය කරවන හෝ එසේ භාජනය කිරීමට සලස්වන,

ඈ) සන්නද්ධ අරගලයකදී යෙදවීම සඳහා යම් ළමයකු යොදා ගන්නා හෝ බඳවා ගන්නා තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේය.

**<u>දඬුවම - ඉහත (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ වරදකරු වූ විට අවුරුදු 20ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරිමකට සහ දඩයකට (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ ළමයකුට අදාළව හෝ (ඈ) ඡේදය යටතේ වරදක් සිදු කරනු ලබන විටක අවුරුදු 30 ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට යටත් විය යුතුය.</u>**

**කුට්ටනය.**
**(දැ.නී.ස. 360 අ.) (1995/22)**

360 අ. 1. යම් තැනැත්තෙකු (කැමැත්ත ඇතිව හෝ නැතිව ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත ගණිකා වෘත්තියේ යෙදවීම හෝ සැපයීම

2. ශ්‍රී ලංකාවෙන් පිටත සිටින පුද්ගලයෙකු සමඟ අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම සඳහා ශ්‍රී ලංකාව හැරයාමට හෝ

3. යම් තැනැත්තෙකු වෙනත් රටක ගණිකා නිවාසයක නේවාසිකයෙකු හෝ නිතර ගැවසෙන්නෙකු බවට පත් කිරීමේ චේතනාවෙන් ඒ

තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතුව ශ්‍රී ලංකාවෙන් පිටව යාමට පොළඹවන හෝ

4. අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම සඳහා වයස අවුරුදු 16 ට අඩු තැනැත්තෙකු ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ගෙන ඒමට තැත් කරන

5. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගණිකා නිවාසයක හෝ නිතර ගැවසෙන්නෙකු බවට පත් කිරීමේ චේතනාවෙන් යම් තැනැත්තෙකුගේ සුපුරුදු වාසස්ථානය අතහැර යාමට පොළඹවන හෝ

6. යම් තැනැත්තෙකු අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදවීමේ හෝ අපචාරයට පාත්‍ර කිරීමේ අරමුණ ඇතිව ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ස්ථානයක රඳවා තබාගන්නා හෝ පුද්ගලයෙකු කුට්ටනය කිරීමේ වරද සිදු කරයි.

**දඬුවම - අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නාවූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්**

**ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම.**
**(දැ.නී.ස. 360 ආ.) (1995/22)**

යම් ළමයෙකු ලිංගික අපයෝජනයකට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයෙකු සහභාගි කරවා ගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩදෙන,

ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයෙකු කුට්ටනය කරන්නකු වශයෙන් ක්‍රියා කරන,

මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයෙකු හෝ සේවාදායකයෙකු වීමට, යම් තැනැත්තෙකු පොළඹවන,

ළමයෙකු කෙරෙහි තමා දරන වගකීම බලපෑම හෝ ළමයෙකු විෂයෙහි තමාට ඇති ඥාති සම්බන්ධකම ඒ ළමයා ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුවද අකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා,

කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන යම් ළමයෙකු ලිංගික සංසර්ගයෙහි යෙදවීමේ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමාපියන්ට මුදලින් ප්‍රතිෂ්ඨාවක් භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදෙන කවර හෝ තැනැත්තෙකු ළමයින්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීමේ වරද සිදු කරයි.

**දඬුවම - අවුරුදු 5 කට නොඅඩු වූද අවුරුදු 20 ක් නොඉක්මවන්නා වූද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්**

**තැනැත්තන් වෙළඳාම් කිරීම.**
**(දැ.නී.ස. 360 ඇ.) වගන්තිය (2006 / 16)**

2006/16 දරණ දැ.නි.ස. සංශෝධනයට පෙර මෙය ගැහැණු ළමයින්ට එරෙහිව සිදු වන වරදක් වූ අතර, මේ වන විට 360 (ඇ) වගන්තිය මගින් වයස අවු 18 ට අඩු ගැහැණු සහ පිරිමි ළමයින් යන දෙපක්ෂයම ආවරණය කරයි.

අ.) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් තැනැත්තෙකු මිලදී ගන්නා විකුණන හෝ හුවමාරු කරන නැතහොත් ඒ සඳහා පෙළඹවීම, ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම හෝ පෙළඹවීමට යම් දෙයක් කරන,

ආ.) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබා ගැනීම, වහල්භාවය, පරවශ්‍යතාවය, ශරීර අංග ඉවත් කිරීම, වෛශ්‍යා වෘත්තියේ යෙදවීම, අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම හෝ නීති විරෝධී ක්‍රියාවකට යොදා ගැනීමට තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්,පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තෙකුගේ පීඩාකාරී තත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තෙකු බඳවා ගන්නා, ප්‍රවාහනය කරන, ස්ථාන මාරු කරන, ආරක්ෂාව සලසා දෙන භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන,

ඇ.) යම් ළමයෙකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම, සේවය ලබා ගැනීම, එම ළමයා වහල්භාවය, පරවශ්‍යතාවය, ශරීර අංග ඉවත් කිරීම, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ නීති විරෝධී ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ

නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා, ප්‍රවාහනය කරන, මාරු කරන, එම ළමයාට ආරක්ෂාව සලසා දෙන, ළමයා භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන,

කවර හෝ තැනැත්තෙකු තැනැත්තන් වෙළඳාම් කිරීමේ වරදට වරදකරු වන්නේය.

**<u>දඬුවම - අවුරුදු 2 කට නොඅඩු සහ අවුරුදු 20ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්.</u>**
**<u>ළමයෙකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලැබූ විටක, අවුරුදු 03 කට නොඅඩු සහ අවුරුදු 20ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්.</u>**

**නීති විරෝධී දරුකමට හදා ගැනීම.**
**(ද.නී.ස. 360 ඇ.) වගන්තිය (2006/ 16)**

මුදලට හෝ වෙනත් ප්‍රතිලාභයක් මත පහත සඳහන් ක්‍රියාවක් හෝ ක්‍රියා සිදු කරන අය මෙම වරදට වරදකරුවන් වේ.

1. යම් තැනැත්තකුගේ දෙමාපියන්ගෙන් කෙනෙකුගේ හෝ නෛතික භාරකරුගේ කැමැත්ත නොමැතිව යම් විදේශ රටකට යාම සඳහා එම ළමයාට කටයුතු සලසා දෙන හෝ ආධාර කරන

2. යම් ගර්භණී කාන්තාවකගේ නූපන් දරුවා දරුකමට හදාගැනීම සඳහා එම මවගෙන් ලිඛිත හෝ වාචික කැමැත්ත ලබා ගැනීම

3. ළමයින් දැරීමේ කාර්යය සඳහා කාන්තාවක් හෝ අඹුසැමි යුවලක් බඳවා ගැනීම
4. උපත් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ තැනැත්තෙකු උපත් ලියාපදිංචිය සම්බන්ධයෙන් වංචා සිදු කිරිම, ව්‍යාජ ලේඛන සැකසීම
5. රෝහලකින් හෝ කාන්තාවන් සහ ළමයින් සිටින කුමන හෝ ආයතනයකින් ළමයාගේ මවට හෝ වෙනත් තැනැත්තෙකුට තර්ජනය කොට ළමයා කුට්ටනය කිරීම.
6. ළමයාගේ මව ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටීම හෝ එසේ ව්‍යාජ ලෙස පෙනී සිටීමට උපකාරී වීම.

**දඬුවම - අවුරුදු 20ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙයාකාරයෙන්ම දඬුවම් කරනු ලැබිය යුතුය.**

### ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම.
### (දැ.නී.ස. 360 ඉ.) (2006/16)

ළමයෙකු ලිංගික අපයෝජනය කිරීමේ කාර්යය සඳහා, වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු හෝ එවැනි තැනැත්තෙකු යැයි විශ්වාස කරනු ලබන තැනැත්තෙක් ශ්‍රී ලංකාව තුළදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිට කවර හෝ ආකාරයකින් පොළඹවා ගැනීමට ඇවිටිලි කරන කවර හෝ තැනැත්තෙකු ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීමේ වරද සිදු කරයි.

**දඬුවම - අවුරුදු 10 කට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම හෝ දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.**

## ස්ත්‍රී දූෂණය.
## (ද.නී.ස. 363) (1995/22)

යම් මිනිසෙක් පහත අවස්ථාවන් අතරින් යම් අවස්ථාවකට අයත් වන පරිදි ස්ත්‍රියක සමඟ මෛථුනයෙහි යෙදේ නම් ඔහු "ස්ත්‍රී දූෂණය" සිදු කළේ යැයි කියනු ලැබේ.

- යම් ස්ත්‍රියක තමාගේ භාර්යාව වන අවස්ථාවක වුවද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටිය දි ඇගේ කැමැත්ත නොමැතිව,
- බලහත්කාරයෙන් / බියවද්දා / තර්ජනය කොට නීති විරෝධී ලෙස රඳවාගෙන සිට ලබා ගත් කැමැත්ත මත,
- ඇය සිහිවිකල්ව සිටියදී හෝ ඒ පුරුෂයා විසින් නැතහොත් වෙනත් යම් තැනැත්තෙකු විසින් ඇයට ලබා දෙන මධ්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක සිටියදී, ඇගේ කැමැත්ත මත,
- ඇගේ ස්වාමි පුරුෂයා යැයි සිතා වංචනිකව ලබා ගත් කැමැත්ත මත,
- වයස අවුරුදු 16 ට අඩු තැනැත්තියකගේ කැමැත්ත ඇතිව හෝ නැතිව,

ඉහත පැහැදිලි කිරීම -

- ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට අවශ්‍ය මෛථුනය සංයුක්ත වීම සඳහා ප්‍රවේශය පමණක් ප්‍රමාණවත් වේ.
- ශරීරයට සිදුව ඇති ශාරීරික තුවාල වැනි ප්‍රතිරෝධය පෑම පිළිබඳ සාක්ෂි, මෛථුනය සිදුකර ඇත්තේ කැමැත්ත නොමැතිව බව ඔප්පු කිරීම සඳහා අත්‍යවශ්‍යය නොවේ.

**<u>දඬුවම - අවුරුදු 7 - 20 දක්වා බරපතල වැඩ ඇතිව සිරදඬුවම් හා රුපියල් 20,000ක් නොඉක්මවන දඩයකටද, අධිකරණය නිශ්චය කරනු ලබන වන්දියකටද යටත් විය යුතුය.</u>**

- ✓ කවර හෝ තැනැත්තෙකු,
  රජයේ නිලධරයෙකුව හෝ බලය ඇති තත්වයක් දරණ තැනැත්තකුව සිටිමින් තමාගේ නිල බලය ප්‍රයෝජනයට ගනිමින් නිල රැකවරණය යටතේ සිටින ස්ත්‍රියක දූෂණය කිරීම
- රක්ෂණ නිවාසයක හෝ අත්අඩංගුවේ සිටින ස්ත්‍රියක එම ආයතනයේ කළමනාකරු හෝ කාර්ය මණ්ඩලයේ අයෙකු විසින් දූෂණය කිරීම
- රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ රෝහලේ යම් ස්ත්‍රියක දූෂණය කිරීම
- යම් ස්ත්‍රියක ගර්භණී බව දැන දැනම දූෂණය කිරීම
- වයස අවුරුදු 18 ට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම
- මානසික හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක දූෂණය කිරීම
- රංචු ගැසී ස්ත්‍රී දූෂණය කිරීම

<u>**දඬුවම - අවුරුදු 10 - 20 බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමක්, දඩයක් සහ අධිකරණය තීරණය කරනු ලබන වන්දියක්,**</u>

එසේ වුවද,

වයස අවුරුදු 16 ට අඩු තැනැත්තෙකු සම්බන්ධයෙන් ඒ වරද සිදු කොට ඇති අවස්ථාවක, වරද සිදු කළ තැනැත්තා වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු වන විට සහ සංසර්ගය සිදු කොට ඇත්තේ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව වන අවස්ථාවක, අවුරුදු 10 කට කාලයකට බන්ධනාගාරගත කිරිමේ දඬුවමක් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

**වෘභිචාරය**
**(ද.නී.ස. 364 අ.) (1995/22)**

පූර්ණ හෝ අර්ධ ලේ නෑකම් ඇති තැනැත්තන්, නැතිනම් දරුකමට හදාවඩාගත් තැනැත්තන් (දෙමාපියන්, ළමයින්, සහෝදර සහෝදරියන්, වෙනත් ඥාතීන්) සමඟ ලිංගික සංසර්ගයේ යෙදීම මෙයින් අදහස් වේ.

**<u>දඬුවම - අවුරුදු 7 - 20 බරපතල වැඩ ඇතිව සිරදඬුවමක් සහ දඩයක් සහ අධිකරණය තීරණය කරනු ලබන වන්දියක්</u>**

**අස්වාභාවික වැරදි**
**(ද.නී.ස. 365) (1995 / 22)**

යම් පුරුෂයකු, ස්ත්‍රියක සතකු සමඟ ස්වභාවධර්මයට විරුද්ධව කැමැත්තෙන්ම කාමුක සංසර්ගයේ යෙදීම මෙයින් අදහස් වේ.

**<u>දඬුවම - අවුරුදු 10 - 20 දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්</u>**

**තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා**
**(ද.නී.ස. 365 අ.) (1995 /22)**

ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තෙකු සමඟ යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශවකරුවකු වන හෝ එවැනි යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් කරනු ලැබීමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තකු වරදට වරදකරු වේ.

**<u>දඬුවම - අවුරුදු 2 ක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක්</u>**
**<u>තවද එම වරද වයස අවුරුදු 18ට වැඩි අයෙකු විසින් අවුරුදු 16ට අඩු අයෙකු සම්බන්ධයෙන් සිදු කරන විටක, අවුරුදු 10 – 20 කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීම හා දඩයක් හා අධිකරණය නිශ්චය කරන වන්දියක්</u>**

**බරපතල ලිංගික අපයෝජනය**
**(ද.නී.ස. 365 ආ.) (1995 /22)**

ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් භාවිතා කිරීමෙන්,

- ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත නොමැතිව,
- බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් ඒ අනෙක් තැනැත්තාට මරණ බිය හෝ තුවාල සිදු කිරීමේ බිය ඇති කිරීමෙන් හෝ අනෙක් තැනැත්තා නීති විරෝධී ලෙස රඳවාගෙන සිටියදී කැමැත්ත ලබා ගෙන ඇති අවස්ථාවක එසේ ලබා ගත් කැමැත්ත ඇතිව,
- අනෙක් තැනැත්තා සිහිවිකල්ව සිටිය දී හෝ මත්ද්‍රව්‍ය / මද්‍යසාර මගින් ඇතිකරන ලද මත් අවස්ථාවක සිටිය දී ලබාගත් කැමැත්ත ඇතිව,

ඉහත සඳහන් කරන ලද ස්ත්‍රී දූෂණය (363), සංයුක්ත නොවන යම් ක්‍රියාවක් කරන තැනැත්තෙක් බරපතල ලිංගික අපයෝජනය සිදු කරන්නේය.

**<u>දඬුවම - අවුරුදු 7- 20 බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩයක්</u>**

**<u>අවුරුදු 18 ට අඩු තැනැත්තකු සමඟ බරපතල ලිංගික අපයෝජනය සිදු කරන තැනැත්තකුට අවුරුදු 10 – 20 දක්වා කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමක් සහ දඩයක් අධිකරණය නිශ්චය කරන වන්දියක්</u>**

**ලිංගික අපයෝජන පළ කිරිම**
**(දැ.නී.ස. 365ඇ.) (1995 /22)**

ලිංගික අපයෝජනයන් සම්බන්ධයෙන් වින්දිත තැනැත්තාගේ නම, ගම හෝ අනන්‍යතාවය හෙළිවන ආකාරයෙන් මුද්‍රණය කිරීමක් හෝ කිසිදු පළ කිරීමක් සිදු කළ නොහැකිය.

එහෙත්,

- විමර්ශන නිළධාරියාට විමර්ශන කටයුත්ත සඳහා සද්භාවයෙන් පළ කළ හැකිය.
- වින්දිත තැනැත්තාගේ ලිඛිත අවසරය මත හෝ වින්දිත තැනැත්තා මිය ගොස් ඇත්නම් ආසන්නතම ඥාතියකුගේ ලිඛිත අවසරය මත හෝ වින්දිත තැනැත්තා බාලවයස්කරුවකු වන විට හෝ සිහිවිකල තැනැත්තකු වන විට භාරකරුවන්ගේ ලිඛිත අවසරය මත පල කළ හැකිය.

**<u>දඬුවම - අවුරුදු 2 දක්වා දීර්ඝ විය හැකි කාලයකට සිරදඬුවමක් සහ දඩයක් හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙයාකාරයෙන්ම දඬුවම් කළ හැකිය.</u>**

## ගබ්සා කිරිම (දැ.නී.ස. 303)

ගබ්සාවක් යනු සති 28 ක් සම්පූර්ණය වීමට පෙර කළලයට තර්ජනයක් වන හෝ කළල කොටස් ගර්භාෂයෙන් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් පිට කිරීමට හේතු වූවකි.

- ❖ ස්ත්‍රියකගේ ජීවිතය බේරා ගැනීමේ අරමුණින් සද්භාවයෙන් කරනු ලබන ගබ්සාවක් නොවන ගබ්සා කිරීමක්, ගැබ්ගත් ස්ත්‍රියකට කැමැත්තෙන්ම සිදු කිරීම වරදක් වේ. (තමාම ගබ්සාකරගනු ලබන ස්ත්‍රියකද මෙයට අයත් වේ.)

<u>**දඬුවම - අවුරුදු 3 ක් දක්වා සිරදඬුවමක් හා දඩයක්, දරු ප්‍රසූතියට ආසන්නව සිටියදී නම් අවුරුදු 7 ක් දක්වා සිරදඬුවමක් හා දඩයක්**</u>

- ❖ ස්ත්‍රියකගේ කැමැත්ත නොමැතිව ගබ්සා කිරීම
  <u>**දඬුවම - අවුරුදු 20 ක් දක්වා සිරදඬුවමක් හා දඩයක්**</u>
- ❖ දරුවකු පණ ඇතිව ඉපදීම වැළැක්වීම හෝ ඉපදුන පසු මරණය සිදු කිරීම ( මවගේ ජීවිතය ගැලවීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද්දක් නොවේ නම්)
  <u>**දඬුවම - අවුරුදු 10 ක් දක්වා සිරදඬුවමක් හා, හෝ දඩයක්**</u>

# 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත හා දණ්ඩ නීති සංග්‍රහය

| අංකය | නීතිය | වරද | වරෙන්තුව | ඇප දීම |
|---|---|---|---|---|
| 286 (අ) | ද.නී.ස.(සංශෝධන) පනත | ළමයින්ට අදාළව කරණු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශනය ආදිය | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | හැකිය |
| 286 (ආ) | ද.නී.ස.(සංශෝධන) පනත | ළමයකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම, පරිගණකය මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය බව | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | හැකිය |
| 286 (ඇ) | ද.නී.ස.(සංශෝධන) පනත | ළමයකු අපයෝජනය සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කිරීම ගැන දැනුම් දීම පැහැර හැරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | හැකිය |
| 288 | ද.නී.ස.(සංශෝධන) පනත | ළමයින් සිඟමනෙහි යෙදවීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |

| | | | | |
|---|---|---|---|---|
| 288 (අ) | ද.නී.ස.(සංශෝධන) පනත | ලිංගික සංසර්ගය සඳහා ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |
| 288 (ආ) | ද.නී.ස.(සංශෝධන) පනත | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |
| 303 | ද.නී.ස. පනත | ගබ්සා කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය | හැකිය |
| 304 | ද.නී.ස. පනත | ස්ත්‍රියගේ කැමැත්ත නොමැතිව ගබ්සා කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය | නොහැකිය |
| 308 (අ) | ද.නී.ස. පනත | ළමයින් කෲරත්වයට භාජනය කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | හැකිය |
| 345 | ද.නී.ස.(සංශෝධන) පනත | ලිංගික අතවර කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | හැකිය |

| | | | | |
|---|---|---|---|---|
| 354 | ද.නී.ස.(සංශෝධන) පනත | අපහරණය | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |
| 358 (අ) | ද.නී.ස.(සංශෝධන) පනත | ණය බැදුම්කරය, දාසභාවය, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම, වහල්කම හා යුද්ධයේ යෙදවීම සඳහා බඳවා ගැනීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |
| 360 (අ) | ද.නී.ස.(සංශෝධන) පනත | කුට්ටනය කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය | නොහැකිය |
| 360 (ආ) | ද.නී.ස.(සංශෝධන) පනත | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනිම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය | නොහැකිය |
| 360 (ඇ) | ද.නී.ස.(සංශෝධන) පනත | තැනැත්තන් වෙළඳාම් කිරීම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |
| 360 (ඈ) | ද.නී.ස.(සංශෝධන) පනත | නීති විරෝධී දරුකමට හදා ගැනිම | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය | නොහැකිය |

| | | | | |
|---|---|---|---|---|
| 360 (ඉ) | **ද.නී.ස.(සංශෝධන) පනත** | **ලිංගික අපයෝජනය සඳහා ළමයකුට ඇවිටිලි කිරීම** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 363 | **ද.නී.ස. පනත** | **ස්ත්‍රී දූෂණය** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 364(අ) | **ද.නී.ස.(සංශෝධන) පනත** | **ව්‍යභිචාරය** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 365 | **ද.නී.ස.(සංශෝධන) පනත** | **අස්භාවික වැරදි** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 365 (අ) | **ද.නී.ස.(සංශෝධන) පනත** | **තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 365 (ආ) | **ද.නී.ස.(සංශෝධන) පනත** | **බරපතල ලිංගික අපයෝජනය** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකිය** | **නොහැකිය** |
| 365 (ඇ) | **ද.නී.ස.(සංශෝධන) පනත** | **ඇතැම් වැරදිවලට අදාළ පළකිරීම්** | **වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය** | **හැකිය** |

## 1841 අංක 04 දරණ අයාල ආඥා පනත

ගැහැණු ළමයෙකු ඇයගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ඔවුන්ගේ දැනීම මත ගණිකා ජීවිතයක් ගත කරයි නම් හෝ ඔවුන් විසින් ළමයා රවටා ලිංගික කාර්යයන් සඳහා යොදවා ඇත්නම්, දෙමව්පියෝ හෝ භාරකරුවෝ වරදකරුවන් වෙති.
(අවුරුදු 16 ට අඩු අයෙකු ළමයෙකු බව මෙහි හඳුන්වා ඇත.)

## 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත

වයස අවුරුදු 21 ට අඩු තැනැත්තන් සඳහා දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර කිසිවක් අලෙවි කිරීම, අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒවා අලෙවි කිරීම සඳහා ඉඩ දීම හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතුය (31 වගන්තිය).

## 1999 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

ස්ත්‍රී දූෂණයට ලක් වූ වයස අවුරුදු 16ට අඩු ළමයෙකු සම්බන්ධ නඩු කටයුතුවලට අදාළ ලඝු නොවන පරීක්ෂණ මහේස්ත්‍රාත් අධිකරණයේ නොපවත්වා කෙළින්ම මහාධිකරණයේ විභාග කිරීම සඳහා ප්‍රතිපාදන හඳුන්වා දී ඇත.

මෙමගින් දරුවා අධිකරණය තුළ කිහිපවතාවක් අපහසුතාවට ලක්වීම වළක්වා ඇත.

## 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

මෙම පනත අනුව සාක්ෂි ආඥා පනතින් නියමිත පරිදි ළමයෙකු යම් නඩු කටයුත්තකදී සාක්ෂි දීමට සමත් වුව ද එහෙත් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක ස්වභාවය තේරුම් ගැනීමට අසමත් වන බවට අධිකරණයක් සෑහීමකට පත් වූ අවස්ථාවක දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා දීමෙන් තොරව දෙන ලද සාක්ෂියක්, එය දිවුරුම හෝ ප්‍රතිඥාව නොදීමේ හේතුව නිසා ම පමණක් අනාවේශ්‍ය (අවශ්‍ය නොවන බව) නොවන ලෙස සැලකිය යුතුය.

මෙම පනතේ 163 (අ) අනුව ළමා අපචාර (දණ්ඩ නීති සංග්‍රහයේ 286 අ, 308 අ, 360 ආ, 360 ඇ, 363, 364 අ, 365, 365 අ හෝ 365 ආ වගන්ති ) හා සම්බන්ධ යම් නඩු කටයුත්තකදී වැඩිහිටියෙකු අතර පැවැත්වෙන හා ඒ නඩු කටයුත්තේ විවාදාභිමුඛ යම් කාරණයකට අදාළ මූලික සම්මුඛ සාකච්ඡාවක වීඩියෝ පටිගත කිරීමක් වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුනද අධිකරණයේ අවසරය ඇතිව අධිකරණය විසින් බැහැර කරනු ලැබ නොමැති තාක් දුරට සාක්ෂි වශයෙන් දෙනු ලැබිය හැකිය.

ළමයින් දිවුරුම් පිට සාක්ෂි දීමේ අවශ්‍යතාවයක් මේ නිසා ඇති නොවන අතර ඔවුන් අධිකරණය තුළ අපහසුතාවට පත් වීමද වැළකේ.

## ළමා වරදකරුවන්

- ✓ ළමයින් යම් අපරාධයක සැකකරුවන් වන විට සාමාන්‍ය නීති රෙගුලාසි අනුගමනය නොකර, ළමයා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 2 වන වගන්තිය මගින් ළමා අධිකරණය පිහිටුවා ඇත.

නීතියට අනුව ළමයින්ගේ නඩු ඇසිය යුත්තේ ඔවුන්ට හිතකර වටපිටාවක් තුළ ළමයින් වෙනුවෙන් ක්‍රියා කරන පළපුරුදු නිලධාරීන් සමඟය.

- ✓ ළමයෙකු බන්ධනාගාරගත කිරීමේ දී එය නීතියට අනුව සිදු කළ යුතු අතර නඩුව අවසන් වන තුරු හෝ ඇප ලබා දෙන තුරු ළමයා සුදුසු ස්ථානයක රඳවා තැබිය යුතු වේ.

- ✓ ළමා වරදකරුවන් බන්ධනාගාරය තුළ සිටින වැඩිහිටි රැඳවියන්ගෙන් වෙන් කොට තැබිය යුතුය.

- ✓ ළමයෙකුට මරණ දඬුවම නියම වූ විට එය ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් තෙක් දක්වා අඩු කරනු ලැබේ.

- ✓ දණ්ඩ නීති සංග්‍රහයේ 75 වගන්තියට අනුව වයස අවුරුදු 12ට අඩු ළමයෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. (2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත)

- ✓ දණ්ඩ නීති සංග්‍රහයේ 76 වගන්තියට අනුව, ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොමැති වයස අවුරුදු 12ට වැඩි, 14ට අඩු ළමයෙකුගේ ක්‍රියා වරදක් නොවේ. (2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත)

- ✓ සාක්ෂි ආඥා පනතේ 113 වගන්තියට අනුව වයස අවුරුදු 12 ට අඩු ළමයෙකු විසින් ස්ත්‍රී දූෂණයක් සිදු කළ නොහැකි බව දැක්වේ.

## 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර (අයි.සී.සී.පී.ආර්.) පනත

මෙම පනත සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මෙරට නෛතිකව බලාත්මක කිරීම උදෙසා සම්මත කර ගන්නා ලදී.

**5 වන වගන්තිය**

සෑම ළමයෙකුටම පහත සඳහන් අයිතිවාසිකම් හිමි වේ.

1. උපත ලියාපදිංචි කරවා ගැනීමට සහ උපන් දින සිට නමක් දැරීමට,
2. ජාතිකත්වය ලබා ගැනීමට,
3. හිංසා කරනු ලැබීමෙන්, නොසලකා හරිනු ලැබීමෙන්, අපයෝජනය කරනු ලැබීමෙන් හෝ අවමන් කරනු ලැබීමෙන් ආරක්ෂාව ලැබීමට,
4. නීති ආධාර නොමැති වීම නිසා ළමයාට බලපාන අපරාධ නඩු කටයුතු වලදී ළමයාට සැලකිය යුතු අසාධාරණයක් විය හැකි අවස්ථා වලදී, රජය විසින් සපයනු ලබන නීති ආධාර ලබා ගැනීමට.

## දරුවෙකු දරුකමට හදා ගැනීම. (කුලවද්දා ගැනීම)

යම් තැනැත්තෙකු දරුවෙකුගේ ස්වභාවික මව හෝ පියා නොවන අවස්ථාවක, සුජාත දරුවකු මෙන් දරුවකු හදා වඩා ගැනීම, කුලවද්දා ගැනීම යනුවෙන් සරලව හඳුනාගත හැකිය.

**1941 අංක 24 දරණ ළමයින් කුලවද්දා ගැනීමේ ආඥා පනත** හා එහි සංශෝධනයන් කුලවද්දා ගැනීම සම්බන්ධයෙන් අදාළ වන අතර **1992 අංක 15 දරණ සංශෝධනය** ඉන් මුල් තැනක් ගනී.

**කුලවැද්දුම් නියෝගයක් ලබා ගැනීම සඳහා;**

දරුවෙකු කුලවද්දා ගැනීම සඳහා පරිවාස කොමසාරිස්වරයාත්, අදාළ දරුවාත්, රෙජිස්ටර් ජෙනරාල්වරයාත්, වගඋත්තරකරුවන් කරමින් නිසි ලෙස සකසන ලද අයදුම්පත්‍රයක් නීතිඥවරයෙකු මාර්ගයෙන් තමන් පදිංචි ප්‍රදේශයේ දිසා අධිකරණයට යොමු කළ යුතුය.

කුලවද්දා ගැනීමේ නඩුකරයකදී අධිකරණයේ වැඩි අවධානයක් යොමු වන්නේ **දරුවාගේ උපරිම යහපත** සම්බන්ධයෙනි.

**කුලවද්දා ගැනීමේ නියෝගයක් ලබා ගැනීමට ඉල්ලුම්කරු සම්පූර්ණ කළ යුතු කරුණු,**

- ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 25 ඉක්මවා තිබිය යුතුය.
- වෛවාහක යුවලක් නම් දෙදෙනාගේම කැමැත්ත අත්‍යවශ්‍ය වේ.
- ඉල්ලුම්කරු හා ළමයා අතර වයස අවුරුදු 21 පරතරයක් තිබිය යුතුය.

නමුත් පහත සඳහන් අවස්ථා වලදී අවුරුදු 21 පරතරය අධිකරණයේ අභිමතය මත නොසලකා හැරිය හැකිය.

- ළමයා එම අයදුම්කරුගේ ඍජු අනුප්‍රාප්තිකයකු වන විට.
- ළමයා අයදුම්කරුගේ පූර්ණ හෝ අර්ධ සහෝදරයා හෝ සහෝදරියවන විට.
- එක් සැමියෙකුට හෝ බිරිඳකට වෙනත් පුරුෂයෙකුට හෝ කාන්තාවකට දාව උපත ලද දරුවෙක් සම්බන්ධයෙන් වන විට

- දරුවාගේ වයස අවුරුදු 10 ට වැඩි නම් දරුවාගේ කැමැත්ත විමසා බැලිය යුතුය.

- ➢ දරුකමට හදා ගන්නා දරුවාගේ වයස අවුරුදු 14ට අඩු විය යුතුය.
- ➢ තනි පිරිමි පුද්ගලයෙකුට දැරියක කුලවද්දා ගත නොහැකි අතර වසර 2 කට වැඩි කාලයක් දැරියක තනි පිරිමියෙකු විසින් හදා වඩා ගෙන ඇත්නම් අධිකරණයේ අභිමතය මත එවැනි තැනැත්තෙකුට කුලවැද්දීමේ නියෝගයක් ලබා දිය හැකිය.
- ➢ ළමයාගේ දෙමව්පියන්ගේ/ භාරකරුගේ කැමැත්ත තිබිය යුතුය.

**කුලවැද්දුම් නියෝගයක් නිකුත් කිරීමට පෙර අධිකරණය සැලකිලිමත් වන කරුණු**

- ✓ කුලවද්දා ගැනීමේ ස්වභාවය, එහි ප්‍රතිවිපාකයන් සහ ස්ථිර වශයෙන් සිය දෙමාපිය අයිතිවාසිකම් අහෝසි වන බවට ස්වභාවික දෙමාපියන් අවබෝධ කරගෙන ඇති බව
- ✓ ළමයාගේ වයස සැලකිල්ලට ගනිමින් කුලවද්දා ගැනීම මගින් ළමයාගේ උපරිම සුභ සිද්ධිය සඳහා සිදුවන්නක් බව
- ✓ කිසිදු මුදල් ගනුදෙනුවක් මෙම කුලවද්දා ගැනීම වෙනුවෙන් සිදුව නොමැති බවට අධිකරණය විසින් සෑහීමකට පත් විය යුතුය.

කුලවැද්දුම් නියෝගයක් ලබා ගත් පසුව දරුවාගේ නම වෙනස් කොට, කුලවද්දා ගත් පවුලේ වාසගම එම දරුවාගේ නමට එකතු කිරීමට සහ මවගේ පියාගේ නම වෙනස් කරමින් කුලවද්දා ගත් දෙමාපියන්ගේ නාමයන් මව සහ පියා යන ස්ථානයන්හි සඳහන් කරමින් මුල් උප්පැන්න සහතිකය වෙනස් කොට නව උප්පැන්න සහතිකයක් ලබා ගැනීම සඳහා අධිකරණයෙන් නියෝගයක් ලබා ගත හැකිය.

දිසා අධිකරණය මගින් දෙනු ලබන නියෝගය රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය.

## 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත

2004 දෙසැම්බර් මස 26 වන දින ඇති වූ සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ළමයින්ට විශේෂ ආරක්ෂාවක් ලබා දීම සඳහා මෙම පනත හරහා නව නීතීන් හඳුන්වා දී ඇත.

සුනාමි විපතින් පීඩාවට පත් ළමයින් හා යෞවනයින් පහත පරිදි වර්ග වේ.

1. සුනාමි විපතින් දෙමාපියන් දෙදෙනාම අහිමි වූ ළමයින් හා යෞවනයන්,
2. දෙමාපියන් දෙදෙනාගෙන් එක් අයෙකු අහිමි වූ සහ ජීවත් වන පාර්ශවයට රැකබලා ගැනීමට හැකියාවක් නොමැති ළමයින්,
3. දෙමාපියන් දෙදෙනාගෙන් එක් අයෙකු අහිමි වූ සහ රැකවරණය හා ආරක්ෂාව සැපයීමට ජීවත්ව සිටින මවට හෝ පියාට හැකියාවක් නොමැති යෞවනයන්.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සුනාමි විපතින් පීඩාවට පත් ළමයින්ගේ භාරකාරිත්වය දැරීම.**

සුනාමි විපතින් අනාථ භාවයට පත් සෑම ළමයෙකුගේම සහ මාපියන් විසින් කැපකරු මාපිය රැකවරණය යටතේ තැබූ සෑම ළමයෙකුගේම භාරකාරත්වය අධිකරණයේ පරම භාරකාරත්වයට යටත්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත.

සුනාමි විපතින් අනාථ වූ ළමයින් සහ යෞවනයින්ගේ කැපකරු මාපියකු වීම සඳහා ඉල්ලීමක් අදාළ මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කළ යුතු අතර එහි පිටපතක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු කළ යුතුය.

අධිකාරිය විසින් එම ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ළමයින් සම්බන්ධයෙන් වන විද්වත් මණ්ඩලයකට යොමු කෙරේ. පසුව එම මණ්ඩලයේ තීරණය අධිකාරිය මගින් අදාළ අධිකරණය වෙත යොමු කෙරේ. දරුවාගේ උපරිම සුභසාධනය සම්බන්ධයෙන් තීරණය කිරීමේදී මණ්ඩලයේ වාර්තාද සැලකිල්ලට ගනිමින් එම කැපකරු මාපිය නියෝගය අධිකරණය විසින් ලබා දෙයි.

එම මණ්ඩලයේ නිර්දේශය ලැබෙන තෙක් අධිකරණය විසින් ද කිසිඳු ඉල්ලීමකට නියෝගයක් ලබා නොදෙයි.

## කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩලය සඳහා:

1. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති හෝ නියෝජිතයෙකු
2. ශ්‍රී ලංකා ළමා රෝග වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන තැනැත්තෙකු
3. අදාළ පලාත් පරිවාස කොමසාරිස්වරයා හෝ නියෝජිතයෙකු
4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් යෝජිත මනෝ විද්‍යාඥයෙකු
5. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් යෝජිත මනෝ වෛද්‍යවරයෙකු
6. අදාළ පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂක හෝ ඔහුගේ නියෝජිතයෙකු
7. අදාළ පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා හෝ නියෝජිතයෙකු

## කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩලයේ කාර්යභාර්ය

කැපකරු මාපියකුගේ අයදුම් පත්‍රය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මණ්ඩලය වෙත යොමු කෙරේ. එහිදී එම මණ්ඩලය ඉල්ලුම්කරු හා දරුවා

සම්බන්ධයෙන් කැඳවන ලද පරිසර වාර්තාව සාකච්ඡාවට ගනු ලබයි. එහි දී ළමයාගේ උපරිම යහපත සලසනු උදෙසා ඉල්ලුම්කාර පාර්ශවය ළමයාගේ භාරකාරත්වය දැරීමට උචිත වේද යන්න පිළිබඳ තීරණය කරයි.

පාර්ශවකරුවන් කිහිපදෙනෙකු ඉල්ලුම් කරයි නම් එයින් වඩාත් උචිත භාරකරු කවුරුන්ද යන්න තෝරා ගනු ලබයි. කැපකරු මාපිය යෝග්‍යතාව පිළිබඳ වාර්තාව ඉහත පරිදි සාකච්ඡා කොට සති දෙකක කාල සීමාවක් ඇතුළත නැවත ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු කළ යුතුය.

## කැපකරු මාපියකුගේ කාර්යභාර්ය

1. ස්වභාවික මව්පියන් ලෙස ක්‍රියා කළ යුතුය.
2. ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලබා දිය යුතුය.
3. නිසි ආරක්ෂාවක් සැපයිය යුතුය.
4. සියලු පාලන කටයුතු ඉටු කළ යුතුය.
5. සියලු වගකීම් ඉටු කළ යුතුය.

## සමීක්ෂණ නිලධරයකු පත් කිරීම

කැපකරු මාපිය භාරකාරත්වය ලැබූවකු විසින් ඉහත කී වගකීම් ඉටු කරන්නේ ද යන්න සම්බන්ධව හා ළමයාගේ තත්වය පිළිබඳ පරීක්ෂා කර මාස 3 කට වරක් වාර්තා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පහත සඳහන් නිලධරයන් අතරින් තැනැත්තකු සමීක්ෂණ නිලධාරියා වශයෙන් පත් කෙරේ.

1. පරිවාස නිලධරයන්
2. ළමා හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ නිලධරයන්
3. විදුහල්පතිවරයන්

4. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරියෙකු

**සමීක්ෂණ නිලධාරියා**

- කැපකරු මාපියන් වීමට අපේක්ෂිත තැනැත්තන් හා දරුවා සම්බන්ධව පරිසර වාර්තාවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු කළ යුතුය. එම පරිසර වාර්තාව තුළ ඉල්ලුම්කරුගේ මානසික තත්වය, ආර්ථික පසුබිම, ආගමික හා සාමාජීය පසුබිම හා කැපකරු මාපියන් වීමේ යෝග්‍යතාව පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු කර තිබිය යුතුය.
- ළමයාට හෝ යෞවනයාට කැපකරු මාපියන්ගෙන් උපරිම සුභසාධනයක් ඉටු වේද යන්න අධීක්ෂණය කළ යුතුය.
- සමීක්ෂණ නිලධාරියාගේ කාර්යය ඉටු කිරීම සඳහා බාධා කිරීම, ප්‍රතිරෝධය පෑම, ළමයා සඟවාගෙන සිටීම, අසත්‍ය තොරතුරු ලබා දීම වැනි ක්‍රියාවන් යම් කැපකරු මාපියෙකු විසින් සිදු කරයි නම් එය අවුරුදු 2 ක් දක්වා බරපතල වැඩ ඇතිව හෝ නැතිව බන්ධනාගාරගත කිරීමට හේතුවන වරදක් වේ.

# 2005 අංක 34 දරණ ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත

පීඩාවට පත් තැනැත්තා සහ පීඩාව සිදු කරන තැනැත්තා අතර ඇති පෞද්ගලික ස්වභාවයේ සම්බන්ධතාවයක ප්‍රතිඵලයක් ලෙස යම් තැනැත්තෙකු ශාරීරික වශයෙන් හෝ මානසික වශයෙන් පීඩාවට ලක් කිරීම ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියාවක් යන්නෙන් අදහස් වේ.

## ශාරීරික වශයෙන් පීඩාවට ලක් කිරීම

මේ සඳහා පීඩාවට ලක් වන පුද්ගලයාගේ ශරීරය ඉලක්ක කර ගනිමින් සිදු කරන පහත ක්‍රියාවන් අදාළ වේ.

- දණ්ඩ නීති සංග්‍රහයේ 16 වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 293 වගන්තිය | - | සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය. |
| 294 වගන්තිය | - | මිනී මැරීම. |
| 299 වගන්තිය | - | සිය පණ හානි කර ගැනීමට අනුබල දීම. |
| 303 වගන්තිය | - | ගබ්සා කිරීම. |
| 304 වගන්තිය | - | ස්ත්‍රියගේ කැමැත්ත නොමැතිව ගබ්සා කිරීම. |
| 305 වගන්තිය | - | ගබ්සා කිරීමේ අදහසින් කරනු ලැබූ ක්‍රියාවකින් මරණය සිදු කිරීම. |
| 308 වගන්තිය | - | ළමයින් කෘරත්වයට භාජනය කිරීම. |
| 310 වගන්තිය | - | තුවාල සිදු කිරීම. |
| 311 වගන්තිය | - | බරපතල තුවාල සිදු කිරීම. |
| 330 වගන්තිය | - | අයුතු අවහිරය. |
| 331 වගන්තිය | - | අයුතු සිරකර තැබීම |
| 340 වගන්තිය | - | බලහත්කාරය. |

| | | |
|---|---|---|
| 341 වගන්තිය | - | සාපරාධී බලහත්කාරය. |
| 342 වගන්තිය | - | අඩත්තේට්ටම් කිරීම. |
| 345 වගන්තිය | - | ලිංගික අතවර කිරීම. |
| 350 වගන්තිය | - | අපහරණය. |
| 351 වගන්තිය | - | පැහැරගෙන යාම. |
| 360 අ. වගන්තිය | - | කුට්ටනය. |
| 360 ආ.වගන්තිය | - | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම. |
| 360 ඇ.වගන්තිය | - | තැනැත්තන් වෙළඳාම් කිරීම. |
| 363 වගන්තිය | - | ස්ත්‍රී දූෂණය |
| 364 අ. වගන්තිය | - | ව්‍යභිචාරය |
| 365 වගන්තිය | - | අස්වාභාවික වැරදි. |
| 365 ආ. වගන්තිය | - | බරපතල ලිංගික අපයෝජනය. |
| 483 වගන්තිය | - | සාපරාධී බිය ගැන්වීම. |

## මානසික පීඩාවට ලක් කිරීම

ගෘහස්ත හිංසනය යන්නට ශාරීරික වශයෙන් කරන්නා වූ පීඩා පමණක් නොව මානසික වශයෙන් හිංසනයට ලක් කිරීම ද අයත් වේ. පනතේ දක්වා ඇති පරිදි යම් උද්වේගශීලි බැණ වැදීමක් යන්න ද මෙකී මානසික පීඩනයට අයත් වේ. යම් අයෙකු පීඩාවට පත් කරමින් බරපතල ස්වභාවයේ නින්දා කිරීම් හා අපහාස කිරීම් මෙයට ඇතුළත් වේ.

## ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීම සඳහා නඩු පැවරීම

මෙම පනත යටතේ නිවස තුළ කාන්තාවන්, ළමයින් හෝ වෙනත් ඕනෑම තැනැත්තෙකු කායිකව හෝ මානසික ප්‍රචණ්ඩත්වයට පත් වන විට ඒ ඕනෑම අයෙකුට තම පලාතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැකිය.

## අධිකරණ බල සීමාව තීරණය කිරීම

- පීඩාවට පත් තැනැත්තාගේ තාවකාලික හෝ ස්ථිර පදිංචි ස්ථානය අයත් වන මහේස්ත්‍රාත් අධිකරණය
- පීඩාව සිදු කරන වගඋත්තරකරුගේ තාවකාලික හෝ ස්ථිර පදිංචි ස්ථානය අයත් වන මහේස්ත්‍රාත් අධිකරණය
- ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියාව සිදු කරනුයේ සිදු කිරීමට ඉඩ ඇත්තේ හෝ සිදු වූයේ කිනම් අධිකරණ කලාපයකද එකී මහේස්ත්‍රාත් අධිකරණය

**<u>මෙම පනත යටතේ ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැක්කේ,</u>**

- පීඩාවට පත් තැනැත්තා වැඩිහිටියකු වන විට
  - පීඩාවට පත් තැනැත්තා විසින්
  - පොලිස් නිලධාරියෙකු විසින්
- පීඩාවට පත් තැනැත්තා වයස අවුරුදු 18 ට අඩු අයෙකු වන විට එම ළමයාගේ ආරක්ෂාව වෙනුවෙන්
  - ළමයාගේ දෙමාපියන්ගෙන් කෙනෙකු විසින්
  - භාරකරුවකු විසින්
  - ළමයා පදිංචි ව සිටින ස්ථානයේ පදිංචි තැනැත්තකු විසින්
  - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින්
  - පොලිස් නිලධාරියෙකු විසින්

**<u>පීඩාවට පත් තැනැත්තා විසින් මෙම පනත යටතේ සහන ඉල්ලා සිටීමේ දී,</u>**
මෙම පනතේ අදාළත්වයට ස්ත්‍රී පුරුෂ භේදයක්, වයස් භේදයක් හෝ විවාහක අවිවාහක භේදයක් නොමැත. පහත ඥාති සබඳතාවලට අයත්වන

අය එකී සබඳතාවය උපයෝගි කර ගෙන එක් පාර්ශවයක් අනෙක් පාර්ශවය වෙත ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරයි නම් ඒ අයට විරුද්ධව නඩු පැවරිය හැකිය.

- සැමියා හෝ බිරිඳට
- පෙර විවාහයේ බිරිඳ හෝ සැමියා
- තමා සමඟ එකට ජීවත් වන සහකරු හෝ සහකාරිය
- පියා, මව, සීයා, ආච්චි, සුළු මව, සුළු පියා
- පුතා, දුව, මුණුපුරා, මිණිබිරිය, සුළු පුතා, සුළු දියණිය
- සහෝදරයා, සහෝදරිය, අර්ධ සහෝදරයා, අර්ධ සහෝදරිය
- දෙමාපියන්ගේ සහෝදර සහෝදරියන් (නැන්දා, මාමා, බාප්පා)
- සහෝදරයෙකුගේ හෝ සහෝදරියකගේ ළමයා

ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියාවක්, සිදු කර ඇති විට (අතීත), සිදු කරමින් සිටින විට (වර්තමාන), සිදු කිරීමට ආසන්න අවස්ථාවකදී (අනාගත) යන කාල තුනේදීම මෙකී ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැක.

ආරක්ෂක නියෝගයන් බලාත්මක කාලය මාස 12 කි.

- **ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලැබූ වගඋත්තරකරුවකු එයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විටක,**

රුපියල් දස දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එක අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

# 1939 අංක 48 දරණ ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත

මෙම පනත යටතේ අවුරුදු 14 ට අඩු අය **'ළමයින්'** ලෙසත්, අවුරුදු 14 සහ 16 අතර අය **'යෞවනයන්'** ලෙසත් හඳුන්වයි. (88 වගන්තිය)

## ළමයින් හා යෞවනයන් සම්බන්ධ නඩු විභාග කිරීමේ අධිකරණ බලය

මෙම පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ චෝදනා ලත් ළමයෙකු හෝ රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු සම්බන්ධයෙන් කටයුතු කිරීමට පිහිටුවා ඇති මහේස්ත්‍රාත් අධිකරණයක් ළමා අධිකරණයක් වේ.

එහෙත් පහත දැක්වෙන අපරාධ වැරදි සම්බන්ධව කටයුතු කිරීමට ළමා අධිකරණයකට බලය නැත.

1. මිනි මැරීම (294 වගන්තිය)
2. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය (293 වගන්තිය)
3. මිනී මැරීමට තැත් කිරීම (300 වගන්තිය)
4. සාපරාදී මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම (301 වගන්තිය)
5. මරණය හෝ බරපතල තුවාල සිදු කිරීමට තැත් කිරීමත් සමඟ කොල්ලකෑම (383 වගන්තිය)

## ළමා උසාවි කාර්ය පටිපාටිය

- සාමාන්‍යයෙන් ළමා උසාවියක් මහේස්ත්‍රාත් උසාවි ගොඩනැගිල්ල තුළ හෝ මහේස්ත්‍රාත්තුමාගේ නිල කාමරයේ පැවැත්වේ. ළමා උසාවි කටයුතු මහජනයාට විවෘත නොවේ.

- ළමා උසාවියේ නඩුවක් විභාග කරන විට අධිකරණය තුළ රැඳී සිටීමට අවසර ඇත්තේ උසාවියේ නිලධාරීන්ට හා එම නඩුවට සෘජුවම සම්බන්ධ පුද්ගලයන්ට පමණි.

- ළමයාට විරුද්ධව ඇති චෝදනාව ඉතා ලිහිල් භාෂාවකින් අධිකරණය විසින් ළමයාට තේරුම් කර දිය යුතුය.

- වයස අවුරුදු 14 - 16 අතර ළමයින් සිදු කරන ඇතැම් වැරදි සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය ළමා උසාවියට හෝ මහේස්ත්‍රාත් උසාවියට ඇත. ළමා උසාවි විසින් එවැනි නඩුවකදී, තමා කැමති එම නඩුව මහේස්ත්‍රාත් උසාවිය විසින් විභාග කරනවාට ද නැතහොත් ළමා උසාවිය විසින් විභාග කරනවාට දැයි, ළමයාගේ දෙමාපියන් හෝ භාරකරු ඉදිරිපිට, ළමයාගෙන් විමසයි.

- ළමයා තමන් වරද කළ බව පිළිගතහොත්, අධිකරණය ළමයාගේ භාරය ආරක්ෂාව හා පුනරුත්තාපනය සඳහා වඩාම සුදුසු නියෝගය සිදු කරයි.

- ළමයා වරද නොපිළිගන්නේ නම්, අධිකරණය දෙපාර්ශවයම විමසා නඩුව තීන්දු කරයි.

- ළමයා වෙනුවෙන් නීතීඥයෙකු පෙනී නොසිටින විට සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න ඇසීමට ළමයාට/ ඔහුගේ දෙමාපියන්ට/ භාරකරුට ඉඩ දෙනු ලැබේ. ළමයාට අධිකරණය හමුවේ තම නිදහසට කරුණු කියා සිටිය හැකිය.

❖ ළමයා වරද පිළිගත හොත් හෝ වරද සිදු කර ඇති බව අධිකරණය තීන්දු කළහොත්, දඬුවම් ලිහිල් කිරීම සඳහා කරුණු දැක්වීමට ළමයාට අවස්ථාවක් දෙනු ලැබේ. දඬුවම නියම කිරීමට පෙර ළමයාගේ සමාජ පසුබිම හා පෙර හැසිරීම පිළිබඳ පරිවාස නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවීමට උසාවියට හැකිය.

**ළමා උසාවියකට පැනවිය හැකි දඬුවම්**

- ➢ මසකට නොවැඩි කාලයක් රැඳවුම් නිවාසයක රඳවා තැබීම.
- ➢ අනුමත කළ පාසලකට හෝ සහතික කළ පාසලකට යැවීම. (වයස අවුරුදු 12 ට වැඩි ළමයින්ට පමණයි)
- ➢ වසරක කාලයක් යහපත් කල් ක්‍රියාවෙන් විසීමේ කොන්දේසිය මත දෙමාපියන්ට හෝ භාරකරුට භාර දීම.
- ➢ අවුරුදු 3කට නොවැඩි කාලයක් සඳහා ළමයා භාර ගැනීමට කැමති සුදුසු පුද්ගලයෙකුගේ රැකවරණය යටතේ ළමයා තැබීම.
- ➢ කොන්දේසිවලට යටත්ව ළමයා මුදා හැරීම.
- ➢ පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තැබීම.
- ➢ ළමයා වෙනුවෙන් දඩයක් ගෙවන ලෙසට දෙමාපියන්ට හෝ භාරකරුට නියම කිරීම.
- ➢ කායික දණ්ඩනය පැනවීම.(පිරිමි ළමයෙකුට සැහැල්ලු වේවැලකින් පහරවල් 6ක් ගැසීමට නියම කළ හැකිය.)
- ➢ අවවාද කොට මුදා හැරීම.

## නඩු විභාගයකට අදාළ පොදු විධිවිධාන

- ✓ පොලිස් ස්ථානය තුළ, උසාවිය ඇතුළත හෝ ඉන් බැහැර සහ උසාවියට ගෙන එන යන අතරතුර යන මේ සියලු අවස්ථාවන්හිදී ළමයින් වැඩිහිටියන් ඇසුරු කිරීමට / ගැවසීමට ළමයා හට ඉඩ නොදිය යුතුය.

- ✓ චූදිතයා ගැහැණු ළමයෙක් නම් සෑම විටකදීම ඇය කාන්තාවක් භාරයේ තැබිය යුතුය.

- ✓ වරෙන්තුවක් මත හෝ නැතිව වයස අවුරුදු 16 ට අඩු අයෙකු පොලීසිය අත්අඩංගුවට ගත් විට වහාම අධිකරණයට ගෙන ඒමට නොහැකි නම් ඔහුව ළඟම ඇති පොලීසියට ගෙන යා යුතු අතර, පොලිස් ස්ථානාධිපති සිද්ධිය විමසා ළමයා අධිකරණයට පැමිණෙන බවට වගබලා ගැනීම සඳහා ඇපකරුවන් ඇතිව හෝ නැතිව ඔහුගේ ම හෝ ඔහුගේ දෙමාපියන්/ භාරකරුවන්ගේ බැඳුම්කරයකට යටත් කර ඔහු මුදා හල යුතුය.

- ✓ ළමා අධිකරණය විසින් රිමාන්ඩ් කරනු ලබන හෝ නඩු විභාගයකට යටත් කරන ළමයා/ යෞවනයා ඇප මත නිදහස් නොකරන විට ඔහුව බන්ධනාගාරගත කිරීම වෙනුවට නියමිත කාලය සඳහා රැඳවුම් නිවාසයකට හෝ සුදුසු පුද්ගලයෙකුගේ භාරයේ ස්වෙච්ඡා නිවාසයක තැබිය හැකිය.

එහෙත් එම යෞවනයා දඩබ්බර නම්, ඔහු පාලනය කළ නොහැකි නම් ඒ බවට අධිකරණය සහතික කළ විට එසේ රිමාන්ඩ් නිවාසයක තැබීමේ හෝ සුදුසු පුද්ගලයෙකුගේ නිවසක තැබීමේ අවශ්‍යතාවයක් පැන නොනඟියි.

## අධිකරණ කටයුතු වලට අදාළ සාමාන්‍ය විධිවිධාන

- නඩුවේ සාක්ෂිකරුවෙකු නොවන ළමයෙකුට වෙනත් කිසියම් නඩුවක් විභාග වන අවස්ථාවේදී අධිකරණය තුළ රැඳී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

- ළමයෙකු ළමා අපයෝජන නඩුවක සාක්ෂි දෙන විට එම නඩුවට කෙලින්ම සම්බන්ධයක් නැති සියලු පුද්ගලයන් අධිකරණ ශාලාවෙන් ඉවත් කිරීමට අධිකරණයට හැකිය.

- අවුරුදු 14ට අඩු ළමයෙකු වරදක් සම්බන්ධයෙන් හෝ දඩයක් ගෙවීමට නොහැකි වීම සම්බන්ධයෙන් සිර ගත කළ නොහැකිය.

- ළමා උසාවියක් විසින් ළමයෙකු වරදකරු බවට තීරණයකර ඇත යන කාරණය අධ්‍යාපනික ආයතනයකට හෝ රැකියාවකට ඇතුළත් කර ගැනීමේදී නුසුදුසු කමක් වශයෙන් නොසැලකිය යුතුය.

## රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය ළමයෙකුට හෝ යෞවනයෙකුට අදාළව ළමා අධිකරණය සතු බලතල

- ආරක්ෂාව හෝ රැකවරණය අවශ්‍ය ළමයෙකු ළමා උසාවියක් වෙත
    - පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු
    - පොලිස් නිලධාරියෙකු හෝ
    - වෙනත් බලය සතු නිලධාරියෙකු

විසින් ගෙන ආ විට, ඔහු රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු බවට අධිකරණය සෑහීමකට පත් වේ නම්, ඒ ළමයාගේ ආරක්ෂාව හා රැකවරණය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත හැකිය.

- ආරක්ෂාව හෝ රැකවරණය අවශ්‍ය ළමයි -
  - ✓ නිසි දෙමාපිය රැකවරණයක් නොලැබෙන ළමයෙක්
  - ✓ දෙමාපිය රැකවරණය යටතේ නොසිටින ළමයෙක්
  - ✓ නරක මිතුරන් ඇසුරට වැටුනු ළමයෙක්
  - ✓ කායික හෝ ලිංගික අපයෝජනයකට ලක් වූ ළමයෙක්
  - ✓ අපයෝජනයකට ලක් වීමේ අවධානමට මුහුණපා සිටින ළමයෙක්
  - ✓ ළමා අපයෝජකයෙකුගේ පවුලේ සිටින ළමයෙක්
- කවර හෝ හේතුවක් මත ළමයෙකු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පෙර පොලිස් ස්ථානය භාරව සිටින නිලධාරියා,
  - ✓ ළමයාගේ නම, වයස හා වෙනත් දන්නා තොරතුරු
  - ✓ ළමයා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන දිනය හා වේලාව
  - ✓ ළමයා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට හේතු දැක්වෙන නිවේදනයක් පරිවාස නිලධාරියා වෙත වහාම යැවිය යුතුය.
- එම නිවේදනය ලැබුණු පරිවාස නිලධාරියා ළමයාගේ දෙමාපියන් පදිංචි නිවසට ගොස්
  - ✓ ළමයාගේ නේවාසික පරිසරය
  - ✓ ළමයාගේ සෞඛ්‍ය තත්ත්වය
  - ✓ පරිසර වාර්තාව
  - ✓ ළමයාගේ චරිතය

වැනි අධිකරණයට ප්‍රයෝජනවත් විය හැකි යැයි හැඟෙන තොරතුරු රැස් කර ගත යුතුය.

- රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙකු බවට අධිකරණය සෑහීමකට පත් වේ නම්, රැකවරණ නියෝගයක් නිකුත් කිරීමේ දී අධිකරණයට පහත නියෝගයන්ගෙන් එකක් කළ හැකිය.

අ.) වයස අවුරුදු 12ට වැඩි ළමයෙකු නම්, සහතික කළ පාසලකට හෝ අනුමත කළ පාසලකට යැවීම.

ආ.) ළමයා භාර ගැනීමට කැමති සුදුසු පුද්ගලයෙකුගේ රැකවරණය යටතේ ළමයා තැබීම.

ඇ.) නිසි රැකවරණය පවත්වා ගැනීමේ කොන්දේසිය යටතේ ළමයා ඔහුගේ දෙමව්පියන්ට හෝ භාරකරුට භාර දීම.

ඈ.) අවුරුදු 3කට නොවැඩි කාලයක් සඳහා ළමයා පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට පත් කිරීම.

- ළමයකු පරිවාස භාරයට පත් කර ඇති විට නියමිත කාලයකට වරක් ළමයා බැලීමට ගොස් ළමයාගේ තත්වය හා ප්‍රගතිය පිළිබඳව අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පරිවාස නිළධාරියාගේ වගකීම වෙයි.
- ළමයාගේ ආගමට අයත් සහතික කළ පාසලක් හෝ අනුමත කළ පාසලක් තෝරා ගැනිමට අධිකරණය සැලකිලිමත් විය යුතුය.
- ළමයෙකුගේ රැකවරණය පවරනු ලබන සුදුසු පුද්ගලයා ද ළමයාගේ ආගමට අයත් තැනැත්තෙකු විය යුතු අතර

නැතහොත් ළමයාගේ ආගමට අනුව ළමයා හදා වඩා ගන්නා බවට එම තැනැත්තා එකඟ විය යුතුය.

- ළමයෙකු අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලක රැඳවීමේ නියෝගයක් වසර 3 ක කාලයක් සඳහා වලංගුව පවතී.
- අධිකරණය ළමයෙකු අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලකට යවන විට ළමයාගේ තොරතුරු සහිත වාර්තාවක් ද පාසලේ කළමණාකරු වෙත යැවිය යුතුය.

## රැඳවුම් නිවාස හා සහතික කළ පාසල්

- ළමයින් සඳහා රැඳවුම් නිවාස හා සහතික කළ පාසල් පිහිටුවීමට ළමා හා යෞවන ආඥා පනත මගින් විධිවිධාන සලසා ඇත.

**සහතික කළ පාසල්**

- බාලිකාවන් සඳහා වන රම්මුතුගල සහතික කළ පාසල
- බාලකයන් සඳහා වන හික්කඩුවේ සහතික කළ පාසල

**රැඳවුම් නිවාස**

- පිරිමි ළමයින් සඳහා වන පන්නිපිටියේ රැඳවුම් නිවාසය හා කිතුලම්පිටියේ රැඳවුම් නිවාසය
- ගැහැනු ළමයින් සඳහා වන රම්මුතුගල රැඳවුම් නිවාසය හා බද්දේගම රැඳවුම් නිවාසය

උක්ත සියල්ල පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ රජය මගින් පාලනය කෙරෙන ආයතනයන්ය.

- අධිකරණ නියෝග මත ළමයින් රඳවා තබන ආගමික සංවිධාන මගින් පාලනය කෙරෙන ආයතන දෙකක් තිබේ.
    - ❖ පිරිමි ළමයින් සඳහා වන මග්ගොන පිහිටි අනුමත කළ පාසල
    - ❖ ගැහැණු ළමයින් සඳහා වන කොළඹ ගැලවීමේ හමුදා නිවස්නය

- රැඳවුම් නිවාසයකින් හෝ සහතික කළ හෝ අනුමත කළ පාසලකින් හෝ සුදුසු පුද්ගලයෙකුගේ රැකවරණයෙන් පලා යාම සඳහා ළමයෙකුට උදව් කිරීම හෝ පෙළඹවීම වරදකි. එසේම පලා ගිය ළමයෙකු සැඟවීම හෝ තබා ගැනීම ද වරදකි.

<u>තාවකාලික ආරක්ෂිත ස්ථාන</u>

ළමා හා යෞවන ආඥා පනත යටතේ වන තාවකාලික ආරක්ෂිත ස්ථාන 3 කි. එනම්,

- ❖ කවර හෝ රැඳවුම් නිවාසයක්
- ❖ කවර හෝ රෝහලක්
- ❖ ඇමතිවරයා විසින් නම් කරනු ලැබ ඇති වගකිව යුතු පුද්ගලයෙකුගේ වාසස්ථානයක්

- අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක් ළමයෙක් කෙලින්ම ආරක්ෂිත ස්ථානයකට රැගෙන යාමට උප පොලිස් පරීක්ෂකවරයෙකුට හෝ ඊට ඉහල පොලිස් නිලධාරියෙකුට හැකිය.

ළමයෙකුට වුව ද එබඳු ආරක්ෂිත ස්ථානයක පිහිට පැතිය හැකිය.

## අනිවාර්ය අධ්‍යාපනය

2015 අංක 01 දරණ ළමයින් අනිවාර්යයෙන් පාසල්වලට පැමිණීමේ නියෝග ප්‍රකාරව ( අංක 1963/30 )

"වයස අවුරුදු 5 ට නොඅඩු සහ අවුරුදු 16 ට නොවැඩි සෑම ළමයෙකුගේම දෙමාපියන් විසින්, ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අයුරකින් ප්‍රමාණවත් හා සුදුසු විධිවිධාන සලස්වා ඇත්නම් මිස, නිතිපතා පාසලකට පැමිණ අධ්‍යාපනයක් ලැබීමට ඒ ළමයාට කටයුතු සලස්වා දිය යුතුය."

**මේ සම්බන්ධව වන 1963 / 30 චක්‍රලේකය පිටු අංක 121 සිට 124 මගින් දක්වා ඇත.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1963/30 - 2016 අප්‍රේල් මස 20 වැනි බදාදා - 2016.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 37/53.

අධ්‍යාපන ආඥාපනත (185 වන අධිකාරය)

(185 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතේ 37 වන වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2015 අංක 1 දරන ළමයින් අනිවාර්යයෙන් පාසැල්වලට ඇතුළත් කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අනිවාර්ය අධ්‍යාපන වයස" යනුවෙන් හඳුන්වනු ලබන) වයස අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහසයකට නොවැඩි සෑම ළමයෙකුගේම දෙමාපියන් විසින්, ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අනුමත ප්‍රමාණවත් හා ප්‍රයෝජනවත් විධිවිධාන සලසා ඇත්නම් මිස, නිසියාකාර පාසලකට ඇතුළත් අධ්‍යාපනයක් ලැබීමට ඒ ළමයාට අවශ්‍ය සලස්වා දිය යුතු ය.

3. (1) (i) එක් එක් පාසල් පෝෂක ප්‍රදේශයක් සඳහා, (මෙහි මින්මතු "පාසල් කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාසල් ඇතුළත් කිරීම සඳහා කමිටුවක් ;
(ii) එක් එක් අධ්‍යාපන කොට්ඨාසයක් සඳහා, (මෙහි මින්මතු "අධීක්ෂණ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අනිවාර්යයෙන්ම පාසල් ඇතුළත් කිරීම අධීක්ෂණය කිරීමේ කමිටුවක් ;

පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (i) පාසල් කමිටුවේ සහාය ඇතිව කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්, ආසන්න බව හා අදාළ ප්‍රදේශයෙන් ඇතුළත්වන සිසුන් සංඛ්‍යාව මත පදනම්ව, අදාළ පාසලේ පෝෂක ප්‍රදේශය තීරණය කරනු ලැබිය යුතු ය ;

(ii) කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්, ස්වකීය ප්‍රදේශය යටතට අයත් වන පාසල් පෝෂක ප්‍රදේශය සිතියම් ගත කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මඟින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(iii) මෙම නියෝග ප්‍රසිද්ධ කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත සෑම පාසල් පෝෂක ප්‍රදේශයක් ම තීරණය කර සිතියම් ගත කරනු ලැබිය යුතු ය.

1A - PG 2924 — 1006 (2016/04)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. (1) පාසල් කමිටුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) සභාපතිවරයා විය යුතු පාසලේ විදුහල්පතිවරයා ;
(ii) ප්‍රාථමික සහ ද්විතීයික අංශවල ප්‍රධානීන් (කැනැත්තන් දෙදෙනකු):
එසේ වුව ද, ප්‍රාථමික හෝ ද්විතීයික අංශ නොමැතිවිටදී ගුරුවරුන් දෙදෙනකු පත්කරනු ලැබිය යුතු ය.
(iii) ගුරුවරුන් දෙදෙනකු ;
(iv) ශිෂ්‍ය නායකයන් දෙදෙනකු ; (ප්‍රාථමික පාසල් සම්බන්ධයෙන් වනවිට, ශිෂ්‍ය නායකයන් වෙනුවට ගුරුවරුන් හෝ දෙමාපියන් පත් කරනු ලැබිය හැකි ය ;
(v) දෙමාපියන් දෙදෙනකු ; සහ
(vi) ආදි ශිෂ්‍යයන් දෙදෙනකු.

(2) සභාපතිවරයා හැර පාසල් කමිටුවේ සාමාජිකයන් ස්වකීය පත්කිරීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(3) පාසල් කමිටුව විසින් -

(i) හඳුනාගත් පෝෂක ප්‍රදේශය තුළ පදිංචි, අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින පාසලක් වෙත නිතිපතා පැමිණීම මඟින් අධ්‍යාපනයක් නොලබන ළමයින් පිළිබඳ අදාළ දත්ත රැස්කිරීම සහ ඔවුන් පාසලට පැමිණීම සඳහා පහසුකම් සැළසීම ;
(ii) අඛණ්ඩව පාසල් නොපැමිණෙන හා අතරමග පාසල් හැර යෑමේ අවදානමට ලක් වී ඇති ළමුන් සහ ඒ චර්යාවට හේතු හඳුනා ගැනීම සහ පාසලට පැමිණීම අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පහසුකම් සැළසීම ;
(iii) අනිවාර්ය අධ්‍යාපන වයසේ පසුවන පාසල් නොයන ළමයින් සහ එම වයසේ සිටින පාසල් අධ්‍යාපනය හැර ගිය සිසුන් හඳුනාගැනීම සහ ඔවුන් නැවත පාසල්ගත කිරීම සහ අඛණ්ඩව අධ්‍යාපනය ලබා දීමට කටයුතු කිරීම ;
(iv) පාසල තුළ මිත්‍රශීලී, ප්‍රසන්න සහ පූර්ණ ඉගෙනීමේ පරිසරයක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම ;
(v) අපේක්ෂිත සාධන මට්ටම් පිළිබඳ ළඟාවීමට ශක්තිය නොමැති සිසුන් සඳහා යෝග්‍ය වැඩසටහන් පැවැත්වීම මඟින් සහාය වීම ;
(vi) පාසල් පැමිණීම මඟින් අධ්‍යාපනය ලැබීමේ ප්‍රතිලාභ පිළිබඳ පාසල් පෝෂක ප්‍රදේශය ඇතුළත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ;
(vii) අවශ්‍ය අවස්ථාවලදී පාසල් සංවර්ධන සමිතියේ, පාසල් සංවර්ධන කමිටුවේ සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන සහ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ගුරු උපදේශකවරුන්ගේ සහාය සහ සේවා ලබා ගැනීම ;
(viii) පාසල් නොපැමිණෙන හෝ පාසලට පැමිණීම දුර්වල සිසුන් සම්බන්ධයෙන් වූ අනාවරණය කර ගැනීම් පිළිබඳ අධීක්ෂණ කමිටුව වෙත වාර්තා කිරීම සහ ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය මාසිකව වාර්තා කිරීම.

(4) පාසල් කමිටුව අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් හෝ රැස්විය යුතු ය. පාසල් කමිටු රැස්වීම්වල වාර්තා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මඟින් අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. (1) අධීක්ෂණ කමිටුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) සභාපති විය යුතු අදාළ අධ්‍යාපන කොට්ඨාසයේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(ii) අදාළ අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(iii) අදාළ අධ්‍යාපන කලාපයේ නොවිධිමත් අධ්‍යාපන විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(iv) අදාළ අධ්‍යාපන කොට්ඨාසයේ නොවිධිමත් අධ්‍යාපන භාර ව්‍යාපෘති සහායක නිලධාරියකු ;
(v) ප්‍රාදේශීය ලේකම්වරයා නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ;
(vi) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ළමා රක්ෂක හා මනෝ සමාජීය නිලධාරියකු ;
(vii) ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරී විසින් නම් කරනු ලබන ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරියකු ;
(viii) අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ප්‍රජාමූල සංවිධානවල නියෝජිතයින් දෙදෙනකු.

(2) අධීක්ෂණ කමිටුව විසින් පාසල් කමිටු කාර්යභාරය අධීක්ෂණය කරනු ලැබිය යුතු අතර පාසල් කමිටුව විසින් ස්වකීය කාර්ය නිසි පරිදි ඉටුකිරීම පිළිබඳව සහතික විය යුතු ය. පාසල් කමිටුව ක්‍රියාකාරී නොවන අවස්ථාවකදී, අධීක්ෂණ කමිටුව විසින් එම පාසල් කමිටුව ක්‍රියාකාරී බවට පත් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(3) අධීක්ෂණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් හෝ රැස්විය යුතු අතර, රැස්වීම් වාර්තා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් එක් එක් අධ්‍යාපන කලාපවල බලයලත් නිලධාරියා වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබිය යුතු අතර, බලයලත් නිලධාරියා විසින් -

(i) පාසල් කමිටු පිහිටුවනු ලැබීම සඳහා ;
(ii) අධීක්ෂණ කමිටු ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලැබීම සඳහා ;
(iii) පාසල් කමිටු සහ අධීක්ෂණ කමිටු විසින් හඳුනාගනු ලබන ගැටලු විසඳීම සඳහා ; පියවර ගනු ලැබිය යුතු ය.

7. යම් පාසල් පෝෂක ප්‍රදේශයක ශිෂ්‍ය සංඛ්‍යාව එම පාසලට ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි වූ හෝ පාසල් පෝෂක ප්‍රදේශයට අයත් පාසලෙහි අදාළ ශ්‍රේණි නොමැති විට දී එම පෝෂක ප්‍රදේශයේ සිසුන් ඇතුළත් කිරීම සඳහා සුදුසු පාසලක් ලබාදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කළ යුතු ය.

8. සෑම පාසල් කමිටුවක් විසින්ම එම පාසල් කමිටුව පිහිටුවා ඇති පෝෂක ප්‍රදේශයේ පදිංචිව සිටින සහ පාසල් නොයන ළමයින්ගේ දෙමාපියන් විසින් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් සහ සුදුසු විධිවිධාන සලසා නොමැති හෝ අනිවාර්ය පාසල් වයසේ ළමුන්ගේ ලැයිස්තුවක් ඇතුළත් වාර්තාවක් සකස් කර අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ලැයිස්තුව සකස් කිරීම සඳහා පාසල් කමිටුව වෙත හැකියාව ලැබෙන පරිදි අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් එම ළමුන්ගේ නම, දෙමාපියන්ගේ නම, ලිපිනයන් සහ පදිංචි ස්ථාන පාසල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

9. 8 වන නියෝගයේ සඳහන් වාර්තාව සකස් කිරීමේ කාර්ය සඳහා, දෙමාපියන්ගෙන් වැඩිමනත් තොරතුරු ලබා ගැනීමට හෝ එම කමිටුව පිහිටුවා ඇති පාසල් පෝෂක ප්‍රදේශය තුළ පදිංචිව සිටින දෙමාපියන් හෝ වෙනත් යම් තැනැත්තකු කැඳවීම සඳහා පාසල් කමිටුව වෙත බලය තිබිය යුතු ය.

10. අධීක්ෂණ කමිටුව විසින් තම සටහන් ද සහිත බලයලත් නිලධාරියා වෙත පාසල් කමිටුවෙන් ලැබූ වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව ලැබීමෙන් පසුව බලයලත් නිලධාරියා විසින්, එම නිවේදනය ලැබී සති හතරක කාලයක් ඇතුළත එම ළමුන් පාසල් පැමිණවීමට කටයුතු සළස්වන ලෙස දෙමාපියන් වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය.

11. දන්වීමේ සඳහන් කාලසීමාව තුළ ඒ අනුව ක්‍රියාකිරීම යම් දෙමාපියකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, එම ළමයා පාසලකට නොපැමිණීමට හේතු, බලයලත් නිලධාරියා වෙත දන්වා හෝ නොදන්වා තිබුණේ ද, එසේ පැහැර හැරීමට හේතු පිළිබඳ ළමයින් පාසලට පැමිණීම පරීක්ෂා කිරීමේ බලයලත් නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

12. 11 වන නියෝගය යටතේ වූ යම් පරීක්ෂණයක කාර්ය සඳහා, බලයලත් නිලධාරියා වෙත :-
(i) පරීක්ෂණය සඳහා අදාළ වන්නේ යැයි තමා විසින් සලකනු ලබන යම් තැනැත්තකුගෙන් තොරතුරු ඉල්ලා සිටීම සහ ලබා ගැනීම සඳහා ;
(ii) පරීක්ෂා කිරීම සඳහා තමා ඉදිරියට යම් ළමයකු ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සඳහා ;
(iii) එම ළමුන් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමේ හෝ සහාය කරගැනීමේ කාර්ය සඳහා යම් පරිශ්‍රයක් වෙත ඇතුළු වී පරීක්ෂා කිරීම සඳහා

බලය ඇත්තේ ය.

13. දන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමට හේතු :-
(අ) අසනීපයක්, මානසික හෝ කායික දුබලතාවයක් හෝ වෙනත් වෛද්‍ය හේතූන් නිසා ළමයා පාසලට පැමිණීම වැළකී ඇති බව,
(ආ) අතුරු නියෝගයක් වශයෙන් නොවිධිමත් අධ්‍යාපන සංස්කරණ මධ්‍යස්ථානයකට, උපකාර විශේෂ පාසලකට හෝ තාක්ෂණ විශේෂිත පුහුණු මධ්‍යස්ථානයකට නැතහොත් 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ අර්ථානුකූල වූ පිරිවෙනකට හෝ ළමයා යැවීම බව, හෝ
(ඇ) ඒ ළමයාගේ පැමිණීම කෙරෙහි බලපාන වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බව, පරීක්ෂණයේ දී අනාවරණය වී ඇත්නම්, බලයලත් නිලධාරියා විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව එම කරුණු වාර්තා කළ යුතු ය.

14. 13 වැනි නියෝගයේ සඳහන් නිර්දේශ ලැබීමෙන් පසුව, එම ළමයාගේ අධ්‍යාපනය සඳහා එම ළමයාගේ දෙමාපියන් විසින් ප්‍රමාණවත් සහ යෝග්‍ය විධිවිධාන සලස්වා ඇති බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෑහීමට පත් වේ නම්, එම ළමයා පාසලට පැමිණීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

15. යම් දෙමාපියකු විසින් තම ළමයාගේ අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය විධිවිධාන සැළැස්වීම පිළිබඳ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෑහීමට පත් නොවන අවස්ථාවක දී ඔහු විසින් එම ළමයා පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් තුනයි දශම දෙකක් නොඉක්මවන දුර සීමාවක් තුළ පිහිටි පාසලක් වෙත එම ළමයා ඇතුළත් කිරීම සඳහා කටයුතු සළස්වන ලෙස එම ළමයාගේ දෙමාපියන් වෙත නියම කරනු ලැබිය යුතු අතර, එම ළමයාගේ පාසල් යෑමට අවශ්‍යවන මූලික අවශ්‍යතා සැපයීමට එම ළමයාගේ දෙමාපියන් අසමත්වන බවට සෑහීමකට පත් වන සෑම අවස්ථාවක දී, එම අවශ්‍යතා සපයා දීමට කටයුතු සැළැස්විය යුතු ය.

4 A I කොටස: (I) ඡේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2016.04.20

16. 15 වැනි නියෝගය ප්‍රකාරව එම ළමයා පාසලකට ඇතුළත් කිරීම සඳහා කටයුතු සැළැස්වීමෙන් පසුව එම ළමයා පාසලකට ඇතුළත් කර අධ්‍යාපනය ලබමින් සිටී ද යන්න පිළිබඳව මාස තුනක කාලයකින් පසුව තවදුරටත් වාර්තාවක් පාසල් අධීක්ෂණ කමිටුව විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

17. ළමයා තවදුරටත් පාසල් නොයන බවට ද ළමයා පාසලකට ඇතුළත් කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සපයා සියලු කටයුතු සළස්වා ඇතත් දෙමාපියන් තම ළමයා පාසලකට යැවීමට සැළැස්වීමේ වගකීම පැහැරහැර ඇති බවට ද, වැඩිදුර වාර්තාවෙන් අනාවරණය වන්නේ නම්, අධීක්ෂණ කමිටුව විසින් පාසල් කමිටුව වෙතින් ලිඛිත වාර්තාවක් ලබා ගත යුතු බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් බලයලත් නිලධාරියා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

18. 17 වැනි නියෝගය ප්‍රකාර තම ළමයින් පාසලට යැවීමට අපොහොසත්ව ඇති දෙමාපියන් කැඳවීමට හෝ ඒ දෙමාපියන් හමුවීමට පාසල් කමිටුවේ සාමාජිකයෙකුට ලිඛිතව බලය පැවරීමට හෝ අධීක්ෂණ කමිටුවට බල ඇති අතර, ඒ ළමයින් පාසල් පැමිණෙන බවට වගබලා ගැනීම පිණිස ඒ දෙමාපියන්ට උපදෙස් හා අවවාද දෙනු ලැබිය යුතු ය.

19. 2 වැනි නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන සෑම දෙමාපියකු ම වරදකට වරදකරු විය යුතු ය.

20. සැක දුරුකිරීමේ කාර්ය සඳහා අධ්‍යාපන ආඥාපනතේ 38 වැනි වගන්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මෙම නියෝගවල සඳහන් කිසිවක් මගින් බලපෑමක් නොවිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

21. මෙම නියෝගවල "දෙමාපියන්" යන්නට (185 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතේ එයට පවරා ඇති අර්ථයම තිබිය යුතු ය.

22. 1997 නොවැම්බර් මස 25 වැනි දින අංක 1003/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1997 අංක 1 දරන ළමුන් අනිවාර්යයෙන් පාසල් පැමිණීමේ නියෝග ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති රහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

05 - 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

## පාසල තුළ විනය ආරක්ෂා කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2005/17 (පිටු අංක 126 සිට 129 මගින් දක්වා ඇත.)
- අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2016/12 (පිටු අංක 130 සිට 134 මගින් දක්වා ඇත.)

සිසුන්ට කායික හා මානසික වශයෙන් හිංසාවන්ට ලක් කිරීමෙන් සහ මර්ධනකාරී ක්‍රියාමාර්ග මගින් පාසල් තුළ සිසු විනය පවත්වා ගෙන යාම අසාර්ථක ක්‍රියාවක් වේ. විනයානුකූලව හැසිරීමේ ක්‍රමවේදය හා එහි වැදගත්කම අවබෝධ කරදීම හරහා සිසුන් තුළ මනා හැසිරීම් රටා ඇති කිරීමෙන් පාසල් විනය නිසි ලෙස පවත්වා ගෙන යා හැකිය.

සෑම අවස්ථාවකදීම සිසුන් හට ශාරීරික දඬුවම් දීමෙන් වැලකිය යුතු අතර,

- ❖ ශාරීරික දඬුවම් වෙනුවට අවවාද කිරීම.
- ❖ භාරකාරත්වය දැනුවත් කිරීම.
- ❖ වරද කළ සිසුවා / සිසුන් හට භුක්ති විඳින වරප්‍රසාද සීමා කිරීම.
- ❖ බරපතල විනය විරෝධී ක්‍රියාවක් කළ විට භාරකාරත්වයට දන්වා සති දෙකකට නොවැඩි කාලයකට පන්ති තහනම් කිරීම.
- ❖ ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් කළ අවස්ථාවක දී, එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සති දෙකකට අඩු කාලයක පන්ති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලකට මාරු කිරීම හෝ කළ හැකිය.

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846
ඊමේල්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා සංවර්ධන පාසල් ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/01/04/24

දිනය / திகதி / Date } 2005.05.11

චක්‍රලේඛ අංක 2005/17

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන් වෙත

## පාසල තුළ විනය ආරක්ෂා කිරීම

අනාගත පුරවැසියන් බිහිකරන පාසල එහි ඉගෙන ගන්නා සිසුන්ට දැනුම හා කුසලතා ලබාදෙන අතර ම, සමාජයේ විනය ගරුක ව ජීවත් වීමට අවශ්‍ය වන ආකල්ප හා සාරධර්ම පුහුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගත යුතු වේ.

වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අයහපත් ප්‍රවණතාවක් නම් ළමයා හිංසනයට හා අපයෝජනයට ලක්වීමේ සිද්ධීන් වැඩි වීමය. වර්තමාන සංකීර්ණ සමාජ රටාව තුළ පාසල් වියේ පසුවන ළමයින් පාසල තුළදී ද විවිධාකාර පුද්ගලයන්ගේ හිංසනයන්ට භාජන වෙමින් පවතින බව ඉදිරිපත් වන වාර්තාවලින් පැහැදිලි වේ. එවැනි එක් සිද්ධියක් නිසාවෙන් වුවද ළමයෙකුගේ මුළු ජීවිතයම අඳුරුවීමට ඉඩ තිබේ. මෙම හිංසනයන් සිදුකරන පුද්ගලයන් හා ආයතනයන් අතරට පාසල් පද්ධතිය, එහි සිටින කාර්ය මණ්ඩලය හා සිසුන් ද අන්තර් ගත වන බව අනාවරණය වී ඇත.

පාසල් සිසුන්ට විවිධ ආකාරයෙන් සිදු කරනු ලබන හිංසනයන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට ගුරුවරුන්ට හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විරුද්ධව දෙමාපියන් නීතිමය තත්ත්වයන්ට යොමු වූ අවස්ථා රාශියකි. තව ද ලෝකයේ ළමා හිංසනය වැළැක්වීමත් සමඟම ළමා රැකවරණ කටයුතු හා ළමා අයිතීන් සුරැකීමේ විවිධ පියවර පුළුල් වෙමින් පවතී. එබැවින් පාසල තුළ දී මෙන් ම ඉන් පිටත දී මෙවැනි අවස්ථාවන්ට ළමයින් භාජනවීමට ඉඩ නොතැබිය යුතු අතර, යම් හෙයින් එවැනි අවස්ථාවක් පැනනැගුණු විට ඔබ ආරක්ෂාව සඳහා ගතයුතු පියවර පිළිබඳව ද ළමයින් දැනුවත් කළ යුතු ය. පාසල තුළ සිසුන්ට ආරක්ෂාව සැලසීම හා හිංසන වැළැක්වීම අත්‍යාවශ්‍ය බැවින් මෙමගින් ලබාදෙන උපදෙස් පිළිපැදිය යුතු බව අවධාරණය කරමි.

## 2.00 ශාරීරික දඬුවම්

සෑම අවස්ථාවක දී ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික දඬුවම් දීමෙන් වැළකිය යුතු ය. විදුහල්පතිවරුන්, ගුරුවරුන් විසින් සිසුන් තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් වුව ද ශාරීරික දඬුවම් කිරීම නොකළ යුතු ය. මෙහි දී දඬුවම් දීමක් නොව, කරුණු අවබෝධ කරදීම, ආදර්ශය හා මනා සංවිධානය මගින් අභ්‍යන්තර වශයෙන් ස්වයං විනයක් ඇතිකර ගැනීමට පුහුණු කිරීමෙන්, කෙනෙකු සිය ජීවිතය පුරාම නිර්භීක පුද්ගලයකු වශයෙන් ජීවත්වීමට අවශ්‍ය පුහුණුව ලබාගන්නා බව අමතක නොකළ යුතු ය.

ශ්‍රී ලංකාව විසින් ද අත්සන් කර, ස්ථිරකර ඇති (1989) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28(2) වගන්තිය මගින් ද පාසල් විනය පරිපාලනය ළමයාගේ මානව ගරුත්වයට අනුකූල වන ආකාරයට සිදු කරන බවට වගබලා ගත යුතු බව අවධාරණය කර ඇත.

2.1 ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත්තේ ළමුන් තුළ විනය ගොඩ නැංවීමේ දී දෙන ලද දඬුවම්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී ඇති බවත් පහත සඳහන් අහිතකර තත්වයන් මතුවීමට ඉඩකඩ ඇති බවත් ය.

- I. ශාරීරික දඬුවම් භාවිත කිරීම තුළින් සොරකම් කිරීම, පහරදීම වැනි සමාජ විරෝධී චර්යා රටා සිසුන් තුළ මතුවීම
- II. ළමා අපහරණයට ඇති අවදානම වැඩිවීම
- III. සිසුන් තුළ ආක්‍රමණශීලී චර්යා රටා ඇතිවීම
- IV. ශිෂ්‍යයා හා ගුරුවරයා/ විදුහල්පතිවරයා අතර සම්බන්ධතා ක්‍රමයෙන් විනාශ වී යාම
- V. නිශේධාත්මක සමාජ හා මානසික කැළඹීම් තත්වයකට ළමයා පත්වීම
- VI. ළමයා විසින් සංකල්ප ගොඩනැගීමේ දී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇති වීම

තව ද ශාරීරික දඬුවම් දීමෙන් තොරව විනය පවත්වාගෙන යා නොහැකි නම් එමගින් පිළිබිඹු කරන්නේ ගුරුවරයාගේ අදක්ෂ භාවය බව පැහැදිලි වේ.

2.2 ශාරීරික දඬුවම් වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය.

- I. පාසලේ සිටින සිසුන් විනය විරෝධී ක්‍රියාවන්හි යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීම පිණිස පාසලේ ක්‍රියාකාරීත්වය හා විෂය සමගාමී කටයුතු මනාව සංවිධානය කර තිබීම.
- II. පාසලේ විනය නීති පද්ධතිය පිළිබඳව සියලු දෙනාට ම දැනුවත් කිරීම හා යහපත් ක්‍රියා ප්‍රතිපෝෂණය කිරීම කළ යුතු අතර වැරදි ක්‍රියාවලට අනුබල නොදීම හෝ අනුමත නොකිරීම.
- III. මනා හැසිරීම් රටාවක් ඇති කිරීමටත් පාසල තුළ විනය පවත්වා ගෙන යාමටත් විනයානුකූල හැසිරීමේ වැදගත්කම අවබෝධකරදීම, ආදර්ශමත්වීම හා සිසුන්ට නිසි මාර්ගෝපදේශනය ලබාදීම.
- IV. ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් වරදක් කළ අවස්ථාවක දී ඔහු/ ඇය විසින් කරන ලද වරද අවබෝධ කරදීම.
- V. බරපතල විනය විරෝධී කටයුතු සිදුකළ අවස්ථාවන්හි දී ද, ශාරීරික දඬුවම් දීම වෙනුවට අවවාද කිරීම හා/හෝ දෙමාපියන්ට/ භාරකරුවන්ට දැනුම්දීම.
- VI. වරද කළ ශිෂ්‍යයා/ ශිෂ්‍යයාව භුක්ති විඳින වරප්‍රසාද සීමා කිරීම හෝ අත්හිටුවීම. උදාහරණයක් ලෙස පංති නායක, ශිෂ්‍ය නායකත්වය අහෝසි කිරීම වැනි ක්‍රියාමාර්ගයක් ගත හැකි ය.
- VII. බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකළවිට දෙමාපියන්ට දන්වා සති 02කට නොවැඩිකාලයක් පංති තහනම් කිරීම.

ඉහත VI හා VII යටතේ ක්‍රියාකිරීමේ දී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමගින් සිදුකරනු ලබන නිසි පරීක්ෂණයකින් පසුව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ ක්‍රියා කළ යුතු ය.

VIII. පාසලේ විනය මණ්ඩලය විසින් ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකර ඇති බව තීරණය කරනු ලැබූ අවස්ථාවක දී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇති ව සති 02කට වැඩි කාලයක් පංති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියට ම මාරු කිරීම.

සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ පිළිබඳ වාර්තා ලේඛනගත කළයුතු අතර ඒවා පරීක්ෂාකාරීව විදුහලේ තබා ගැනීමට කටයුතු කළ යුතු යි.

තවද VII හා VIII හි සඳහන් ක්‍රියාමාර්ග ගැනීමේදී විදුහල්පති විසින් ඒ පිළිබඳ ලොග් සටහනක් ද තැබිය යුතු යි. ඉහත සඳහන් පරිදි සිසුන්ගේ මනා හැසිරීම් රටාව ඇති කරලීමේ අරමුණින් ගනු ලබන ක්‍රියා මාර්ග විදුහලේ ප්‍රධාන රැස්වීම හෝ දැන්වීම් පුවරු ආදිය මගින් පාසල තුළ ප්‍රසිද්ධ නොකිරීමට වග බලාගත යුතුයි.

2.3 පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුනට දඬුවම් දීම සිදුකළ හොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ගවලට මුහුණදීමට සිදුවනු ඇත.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi වන පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

II. 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ හා ප්‍රධාන ප්‍රඥප්තියේ 308 (අ) වගන්තිය යටතේ ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද යටතේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

III. අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණවලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

## 3.00 ළමා අපහරණය

3.1 ළමා වියට නොගැළපෙන විවිධ නොයිසි ක්‍රියා සඳහා ළමයින් යොදවා ගැනීම ළමා අපහරණය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වසර ගණනක සිට ළමා අපහරණ සිද්ධීන් ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර වර්තමානයේ විවිධ ආකාරයේ ළමා අපහරණ සිද්ධීන් රාශියක් දිනපතා වාර්තා වන තත්ත්වයකට පත්ව ඇත.

පාසල තුළ ද ළමා අපහරණ සිදුවීම් වාර්තාවීම ඉතා ම කණගාටුදායක තත්වයකි. පාසලේ දී ළමයාගේ සුරක්ෂිතභාවය සහතික කළයුතු විදුහල්පති, ගුරු හා අනෙකුත් කාර්යමණ්ඩල තුළින් ළමයාට අකටයුතුකම් සිදුවීම වඩාත්ම ඛේදනීය තත්ත්වයකි.

3.2 ළමා අපහරණ අතරින් ලිංගික අපහරණයට සිසු/ සිසුවියන් යොදවා ගැනීම ඉතා බරපතල වරදකි. ශ්‍රී ලංකාවේ 80 දශකයේ මැද භාගයේ ළමා හා කායික අපයෝජනය වරදක් බවත් 90 දශකයේ මුල් භාගයේ දී ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවත් හඳුනාගෙන ඇත.

එම නිසා පාසල තුළ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් කිසියම් වූ අපයෝජනයකට ලක්වීම වළක්වා ගැනීම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වගකීම වේ.

පාසල තුළ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ට ලිංගික හෝ වෙනත් අපයෝජනයක් සිදුකර ඇත්නම් එය සත්‍ය බව ඔප්පු වුවහොත් බරපතල දඬුවම්වලට ලක්විය හැකි බව විශේෂයෙන් අවධාරණය කරමි.

3.3 පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද ඇතුළු ව පාසල තුළ සිදුකරනු ලබන සියලු කාර්යයන්වලට බාධා සිදුවන අයුරින් විදුහල් අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් විනය විරෝධී ක්‍රියාවකට සිසුන් පෙළඹවීම කිසිසේත් නොකළ යුතු ය. සිසුන් විනය විරෝධී ක්‍රියාවනට පෙළඹවීමක් එවැනි පිරිස් වෙතින් කර ඇති බවට චෝදනා ඉදිරිපත් ව ඇතිවිටක එම චෝදනා ඔප්පු වුවහොත් සිසුන් පෙළඹවීම සම්බන්ධයෙන් අදාළ කණ්ඩායම් හෝ පුද්ගලයකු වෙත දැඩි දඬුවම් ලබා දිය හැකි ය.

මෙසේ නීතිමය ක්‍රියාමාර්ග පැනීමේ දී ඉහත 2.3, I, II හා III හි සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

4.00 ළමා හිංසනය සම්බන්ධයෙන් සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම ඇතුළු විශේෂ බලතල රාශියක් සහිත ව 1998 අංක 50 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. එම අධිකාරිය මඟින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාසල් ප්‍රධානීන්ගෙන් කිසියම් සහායක් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක දී ඒ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය එම අධිකාරිය වෙත ලබා දෙන ලෙස ද මෙමඟින් උපදෙස් දෙමි.

තව ද අමානුෂික අන්දමින් කායික හෝ මානසික දඬුවම් ලබාදීමෙන් තොර ව පාසල තුළ විනය පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන අතර පාසල තුළ ළමා අපයෝජන ක්‍රියා සිදුනොවන වාතාවරණයක් ඇති කර ගැනීමටත් වගබලා ගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා විදුහල්පතිවරුන් හා ගුරු මහත්ම/ මහත්මීන් කටයුතු කිරීම උද්‍යෝගීමත් අපේක්ෂා කරමි.

පාඨශාලා ශිෂ්‍යයන්ට ශාරීරික දඬුවම් දීම පිළිබඳ අංක 1961/26 හා 1961.07.21 දිනැති චක්‍රලේඛය හා පාසල තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 2001/11 හා 2001.03.30 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු වන බව මෙයින් දන්වා සිටිමි.

වෛද්‍ය ටාරා ද මැල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම ශාඛා ප්‍රධානීන්
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. ජාතික අධ්‍යාපන කොමිසමේ සභාපති

C:\Documents and Settings\Administrator\My Documents\Circulars\discipline 23.doc 4

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍ය / அமைச்சர் / Minister — 2784852, 2784857, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල් / மின்னஞ்சல் / E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. — ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டே, பத்தரமுல்லை
"Isurupaye", Sri Jayawardhanepura Kotte Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. — ED/01/12/09/03/02

දිනය / திகதி / Date — 2016.04.27

චක්‍රලේඛ අංක : 12/2016

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම රජයේ හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

පාසල තුළ විනය ආරක්ෂා කිරීම

සමාජ සංස්ථාවක් ලෙසින් පාසලට පැවරෙන ප්‍රමුඛ කාර්යභාරයක් වන්නේ සිය සමාජයට අයත් සංස්කෘතික දායාදයන් අනාගත පරපුරට හිමිකර දෙමින්, යහපත් පරිසරයක් පවත්වා ගෙන යාම සඳහා වන්මින් ශිෂ්‍ය පරපුර අනාගත ලොවට ඔබින ආකාරයට සකස් කිරීම ය. එහි දී සමාජය තුළ විනය ආරක්ෂා කරමින් සමාජ සහකම්පනයෙන් යුතු ව ජීවත්වන ආකාරයට යෝග්‍ය ආකල්ප හා සාරධර්ම සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ගයන් ගැනීම සිදු කළ යුතු වී ඇත.

වර්තමාන සංකීර්ණ සමාජ තත්ත්වය තුළ විවිධ බලපෑම් හේතුවෙන් පාසල් සිසුන් තුළ මතු වන අයෝග්‍ය හැසිරීම් පාලනය කරලීමේ අරමුණින් සිසුනට සිදු කෙරෙන දඬුවම් තුළින් ශාරීරික ව හිංසනයන් සිදු වන බවට වාර්තා වී ඇති බැවින් එම තත්ත්වයන් අවම කරලීම සඳහා පාසල් තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005.05.11 දිනැති අංක 17/2005 දරන චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛයේ විධි විධාන 2016.05.02 වන දින සිට බලපැවැත්වේ.

එබැවින්, පාසලට පැමිණෙන සිසුන්ගේ ආරක්ෂාව සැලසීමත් ඔවුනට සිදුවන හිංසනයන් වැළැක්වීම සඳහාත් විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙහි සඳහන් උපදෙස් පිළිපදින ලෙස අවධාරණය කරමි.

1.0 පාසල් විනය

1.1 පාසලක විනය ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ එම පාසල හා පාසල් සංස්කෘතිය විසින් පිළිගෙන ඇති ශිෂ්‍ය හා වැඩිහිටි (අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් හා දෙමාපියන්) හැසිරීම් රටාවන් බාධාවකින් තොර ව පවත්වා ගෙන යාම සඳහා සකසා ඇති පාසල් නීති මාලාවන්වලට අනුගත වෙමින් කටයුතු කිරීම යි.

1.2. ඒ අනුව, පාසලක විනය පවත්වා ගෙන යාමේ දී බලපානු ලබන කරුණු සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් විසින් පහත සඳහන් අදහස් ඉදිරිපත් කර ඇත.

(අ) ළමයින් හා මනා සබඳතාවයන් ගොඩ නංවා ගනිමින් ශිෂ්‍යයන්ට තම වගකීම් පිළිබඳ හැඟීම ක්‍රමානුකූල ව ලබා දීම තුළින් සිසුන් තුළ ස්වයං විනයක් ඇති කිරීමට ගුරුවරුන්ට හැකියාවක් පවතින බව.

1

(ඇ) ගුරුවරුන්ට මෙන් ම ශිෂ්‍යයන් ... නම් සිසුන්ට බලපවත්වනු ලබන පෞද්ගලික වූ ගැටලු සහිත ගැටලු එකිනෙකින් වෙන් වී හඳුනා ගැනීමටත්, එසේ හඳුනා ගනු ලබන ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයන් සකසා ගැනීමට හැකි දැනුමක් කුසලතාවයක් ගුරුවරුන් තුළ වර්ධනය කිරීම තුළින් ද ශිෂ්‍ය විනය පවත්වා ගෙන යාමට හැකියාවක් ඇති කිරීම.

(ඈ) පාසල තුළ ශිෂ්‍යයන්ට ගැලපෙන ඉගෙනුම් පරිසරයක් ගොඩ නැංවීම හා එයට සමගාමීව පාසල සඳහා හඳුනා ගත් අධ්‍යාපන දර්ශනයක් සමග ශිෂ්‍ය කුසලතා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම තුළින් ස්වයං විනයකට ශිෂ්‍යයන් යොමු කරවීමට හැකියාව ලැබීම මඟින් ද විනය පවත්වාගෙන යාමේ ඇති හැකියාව වැඩි වීම.

1.3 වර්තමානයේ දී පාසල් තුළ විනය පවත්වා ගෙන යාම සඳහා පාසල විසින් විවිධ ක්‍රියා මාර්ග ගනු ලබයි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශාරීරික දඬුවම් තහනම් කර තිබුණ ද ඇතැම් අවස්ථාවල දී වරදේ ස්වභාවය අනුව ශාරීරික දඬුවම් ලබා දීම සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

2.0 ශාරීරික දඬුවම්

2.1 ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව සැලසීමේ දී දෙමාපියන්ට හා සමාන වගකීමක් ගුරුවරුන්ට ද තිබේ ය, යන සංකල්පය පදනම් කරගත් " in Loco Parentis " යන සංකල්පය පදනම් කර ගෙන පාසල තුළ දී අපේක්ෂිත චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන්ගේ එම අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව වේදනාවක් ඇති වන අන්දමින් කරන දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස හඳුන්වනු ලැබේ.

වෛද්‍යවරුන්, මනෝ විද්‍යාඥයන්, මානව ක්‍රියාකාරීකයන් වැනි කණ්ඩායම් ශාරීරික දඬුවම් පැහැදිලි කරනු ලැබ ඇත්තේ ළමයිනට කායික වශයෙන් පීඩනයක් වන ආකාරයට ලබා දෙනු ලබන දඬුවමක් ලෙස ය. ඔවුන් තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ එය අදාළ සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා, අනාගතයේ දී සමාජ විරෝධී චර්යාවන්ට යොමු වීමට පවතින ඉඩකඩ වැඩිවීම මෙන් ම පශ්චාත්කාලීන ව ඔවුන් තුළ දැඩි මානසික ආතති තත්ත්වයන් ද වර්ධනය විය හැකි බව ය.

එහෙත්, මෙවන් පහරදීම් මඟින් ලැබෙන යහපත් ප්‍රතිඵලයන්ට වඩා අයහපත් ප්‍රතිඵලයන් වැඩි බව අනාවරණය වීමෙන් පසු ව, බොහෝ සංවර්ධිත රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වර්තමානය වන විට ශාරීරික දණ්ඩනය අත්හිටුවීමට පියවර ගෙන ඇත. එමෙන් ම මෙවන් දණ්ඩනයන් මඟින් ශිෂ්‍ය චර්යාවන් පන්ති කාමරය තුළ දී සංවර්ධනය වූ බවට පවතින සාක්ෂි අවම නිසා ශාරීරික දණ්ඩනය ප්‍රයෝජනයක් නොමැති ක්‍රියාවලියක් බව පෙනී ගොස් ඇත. එනිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතු ව වුව ද කිසිදු ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් වැළකී සිටීමට සියලු දෙනා වග බලා ගත යුතු වේ.

2.2 ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ස්ථිර කර ඇති 1989 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28( (2) වගන්තිය මඟින් පාසල තුළ විනය පරිපාලනය සිදු කිරීමේ දී ළමයාගේ මානව ගරුත්වයට අනුකූලව එය සිදු කළ යුතු බවට අවධාරණය කර ඇත.

2.2.1 ශාරීරික දඬුවම සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණයන්ගෙන් අනාවරණය වී ඇත්තේ ද චර්යාව හැඩ ගැස්වීම සම්බන්ධයෙන් ළමුනට ලබා දෙන ලද දඬුවම මඟින් අපේක්ෂිත ප්‍රතිඵලයන් ලැබී නොමැති බවත් ඊටත් අයහපත් ප්‍රතිඵලයන් එමඟින් නිර්මාණය වන බවත් ය. එසේ නිර්මාණය විය හැකි අයහපත් ප්‍රතිඵල නම්,

i. ශාරීරික දඬුවම තුළින් ප්‍රචණ්ඩත්වය, පහරදීම, හොරකම වැනි සමාජ විරෝධී චර්යාවන් සිසුන් තුළ මතු වීම.

ii. ළමා අපහරණයට ඇති අවදානම වැඩිවීම.

iii. සිසුන් තුළ ආක්‍රමණශීලී හා කලහකාරී චර්යා රටා මතුවීම.

iv. ශිෂ්‍යයා, ගුරුවරයා හා විදුහල්පතිවරයා අතර පවත්නා සම්බන්ධතාවය ක්‍රමයෙන් දුරස්ථ වී යාම.

2

v. නිශේධනාත්මක සමාජ හා මානසික හැසිරීම් තත්ත්වයකට ළමයා පත්වීම.

vi. ළමයා විසින් සංකල්ප ගොඩ නගා ගැනීමේ දී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇතිවීම.

vii. පසු කාලීන ව මෙවන් සිසුන් තුළ පරාජිත මානසිකත්වයක් වර්ධනය වීමෙන් සමාජ විරෝධී ආකල්ප ඇත්තෙකු දැයට නිර්මාණය වීමට වැඩි ඉඩකඩක් මතුවීම.

viii. පොදු දේපල විනාශ කරන තැනැත්තෙකු බවට පත් කිරීම.

ix. ශිෂ්‍යයන්ගේ පහළ අධ්‍යාපන සාධන ඇති වීම.

යන ලක්ෂණ හඳුනාගත හැකි ය.

2.2.2 පාසල විසින් පිළිගත් චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන් නිවැරදි චර්යා රටාවන්ට හැඩ ගැස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල් විනය මණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

2.3 විනය මණ්ඩලයේ සංයුතිය :-
පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති, විනය භාර ආචාර්ය, අංශ ප්‍රධානියෙකු ඇතුළු ගුරු මණ්ඩලයේ සාමාජිකයන් ඇතුළත් වන සේ පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාවට ගැලපෙන පරිදි විනය මණ්ඩලයක් පත් කර ගත යුතු වේ.

2.3.1 සිසුන්ගේ අපරාධ හැසිරීම්වලට අදාළ ව විනය මණ්ඩලයේ කාර්යභාරය :-
විනය මණ්ඩලයට පාසල තුළ සිදු කිරීමට ඇති බොහෝ කාර්යභාරයන් අතර අදාළ සිසුන් විසින් කර ඇති අයෝග්‍ය හැසිරීම් පිළිබඳව විමර්ශනය කර ඒ පිළිබඳව ලබා ගන්නා සියලු සාක්ෂි විධිමත් ව ගොනු කර තිබිය යුතු අතර, ඒ පිළිබඳව වෙන ම ලේඛන පවත්වා ගත යුතු ය. එසේ ලබා ගන්නා තොරතුරු පදනම් කර ගෙන පාසල තුළ ශිෂ්‍ය විනය පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත හැක.

2.3.2 ශාරීරික දඬුවම වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

i. පාසලේ සිටින සිසුන් විනය විරෝධී ක්‍රියාවන්හි යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීම පිණිස පාසලේ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් මනාව සංවිධානය කර තිබීම හා සිසුන් විසින් සිදු කරන යහපත් ක්‍රියාවන් විශේෂ ඇගයීමකට ලක් කිරීම.

ii. පාසලේ විනය නීති පද්ධතිය පිළිබඳව සියලු දෙනා ම දැනුවත් කිරීම හා යහපත් ක්‍රියා ප්‍රතිපෝෂණය කිරීම කළ යුතු අතර, වැරදි ක්‍රියාවන් අනුමත නොකිරීම හා ඒ සඳහා කිසිදු ආකාරයක අනුබලයක් ලබා නොදීම.

iii. මනා හැසිරීම් රටාවක් ඇති කිරීමටත්, පාසල තුළ විනය පවත්වා ගෙන යාමටත්, විනයානුකූල ව හැසිරීමේ වැදගත්කම අවබෝධ කර දීම හා සිසුනට නිසි මාර්ගෝපදේශකත්වයක් ලබා දීම.

iv. ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් වරදක් සිදු කරන ලද අවස්ථාවක දී ඔහු/ඇය විසින් කරන ලද වරද අවබෝධ කර දීම.

v. නැවත විනය විරෝධී කටයුතු සිදු කළ අවස්ථාවන්වල දී ද ශාරීරික දඬුවම් දීම වෙනුවට [illegible] කිරීම හා අවස්ථාවෝචිත පරිදි දෙමාපියන් භාරකරුවන් ගෙන්වා ඒ පිළිබඳ පැහැදිලි කර [illegible] දැනුවත් කිරීම. (ශාරීරික හා මානසික පීඩාවට ලක් නොවන පරිදි සිසුන්ගේ මානසික[illegible] සංවර්ධනය කළ හැකි ක්‍රියාමාර්ගයන් සඳහා කටයුතු කිරීම වැදගත් වේ.)

vi. එලෙස නැවත විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇති විටක දී දෙමාපියන් භාරකරුවන් [illegible] අධ්‍යාපන බලධාරීන් ද දැනුම්වත් කර සති 02 කට නොවැඩි කෙටි කාලීන පන්ති තහනම් ක්‍රියාත්මක කිරීම.

vii. වරද සිදු කරන ලද ශිෂ්‍යයා / ශිෂ්‍යාව භුක්ති විඳින ලද වරප්‍රසාද සීමා කිරීම/ අත් හිටුවීම.
(උදා :- ශිෂ්‍ය නායක, පන්ති නායක තනතුරු/ එම ධූරයෙන් ඉවත් කිරීම)

3

vii: පාසලේ විනය මණ්ඩලය විසින් ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවන් සිදු කර ඇති බව නිගමනය කරනු ලැබූ අවස්ථාවක දී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇති ව සති දෙකකට වැඩි කාලයක් පන්ති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියට මාරු කිරීම

ඉහත vi හා vii යටතේ ක්‍රියාකිරීමේ දී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමඟින් සිදු කරනු ලබන නිසි පරීක්ෂණයකින් පසු ව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ ක්‍රියා කළ යුතු ය.
සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ දී ඒ පිළිබඳ වාර්තා ලේඛන ගත කළ යුතු අතර, ඒවා පරීක්ෂාකාරීව විදුහලේ තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

එමෙන් ම ඉහත vii හා viii හි සඳහන් ක්‍රියාමාර්ග ගැනීමේ දී විදුහල්පති විසින් ඒ පිළිබඳව ලොග් සටහනක් ද තැබිය යුතු යි. ඉහත සඳහන් පරිදි සිසුන් තුළ මනා හැසිරීම රටාව ඇති කරලීමේ අරමුණින් ගනු ලබන ක්‍රියාමාර්ග විදුහලේ ප්‍රධාන රැස්වීමේ දී හෝ දැන්වීම් පුවරු ආදිය මඟින් පාසල තුළ ප්‍රසිද්ධ නොකිරීමට වග බලා ගත යුතු ය. එවන් ක්‍රියාමාර්ග ගත යුත්තේ සිසුවාගේ/සිසුවියගේ පෞද්ගලිකත්වය රැකෙන අයුරින් බව අවධාරණය කරමි.

2.4 පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ග වලට මුහුණ දීමට සිදු වනු ඇත.

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

ii. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහයේ 3 වන වගන්තියේ හා ප්‍රධාන ප්‍රඥප්තියේ 308 (අ) වගන්තිය යටතේ ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද යටතේ නඩු නිමිත්තක් උද්ගත විය හැක. ඒ අනුව, එම සිදුවීමට අදාළව ඉදිරිපත් වී ඇති කරුණු විමර්ශනයේ දී ඒ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගත හැකි බවට නීතිපති වාර්තා කරන්නේ නම් අදාළ වරදකරුවන්ට එරෙහි ව නඩු පැවරිය හැක.

iii. අධ්‍යාපනයට අදාළ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණවලින් ශාරීරික දඬුවම් ලබා දී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැක.

## 3.0 ළමා අපහරණය

3.1 ළමා වියට නොගැළපෙන විවිධ අනාචාර ක්‍රියා සඳහා ළමයින් යොදවා ගැනීම ළමා අපහරණය ලෙස හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වසර ගණනක සිට ළමා අපහරණ සිද්ධීන් ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, වර්තමානයේ විවිධ ආකාරයේ ළමා අපහරණ සිද්ධීන් රාශියක් දිනපතා වාර්තා වන තත්ත්වයකට පත් වී ඇත.

3.2 ළමා අපහරණ අතරින් ලිංගික අපහරණයට සිසු/සිසුවියන් යොදවා ගැනීම ඉතා බරපතල වරදකි. ශ්‍රී ලංකාවේ 80 දශකයේ මැද භාගයේ ළමා හා කායික අපයෝජනය වරදක් බවත්, 90 දශකයේ මුල් භාගයේ දී ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවත් හඳුනාගෙන ඇත.

එනිසා, පාසල තුළ සිසු සිසුවියන් කිසියම් වූ අපයෝජනයකට ලක් වීම වළක්වා ගැනීම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වගකීම වේ. පාසල තුළ සිසු සිසුවියන්ට ලිංගික හා වෙනත් අපයෝජනයන් සිදු කර ඇත්නම් එය සත්‍ය බව ඔප්පු වුවහොත් බරපතල දඬුවම්වලට ලක්විය හැකි බව විශේෂයෙන් අවධාරණය කරමි.

3.3 පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද ඇතුළු ව පාසල තුළ සිදු කරනු ලබන සියලු කාර්යයන්වලට බාධා සිදු වන අයුරින් විදුහලේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් විසින් විනය විරෝධී ක්‍රියාවකට සිසුන් පෙළඹවීම කිසිසේත් නොකළ යුතු ය. සිසුන් විනය විරෝධී ක්‍රියාවලට පෙළඹවීමක් එවැනි පිරිස් වෙතින් ඇති කර ඇති බවට චෝදනා ඉදිරිපත් කර ඇති විටක එම චෝදනා ඔප්පු වුවහොත් සිසුන් පෙළඹවීම සම්බන්ධයෙන් අදාළ කණ්ඩායම හෝ පුද්ගලයෙකු වෙත දැඩි දඬුවම් ලබා දිය හැකි ය.

මෙසේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී ඉහත 2.3, I, II හා III හි සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇති බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

4.0 ළමා හිංසනය සම්බන්ධයෙන් සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම ඇතුළු විශේෂ බලතල රාශියක් සහිතව 1998 අංක 50 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. එම අධිකාරිය මඟින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාසල් ප්‍රධානීන්ගේ කිසියම් සහායක් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක දී ඒ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය-එම අධිකාරිය වෙත ලබාදෙන ලෙස ද මෙමඟින් උපදෙස් දෙමි.

තව ද, අමානුෂික අන්දමින් කායික හෝ මානසික දඬුවම් ලබා දීමෙන් තොර ව පාසල තුළ විනය පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන අතර, පාසල තුළ ළමා අපයෝජන ක්‍රියා සිදු නොවන වාතාවරණයක් ඇති කර ගැනීමටත් වග බලා ගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා විදුහල්පතිවරුන් හා ගුරු මහත්ම මහත්මීන් කටයුතු කිරීම උදක් ම අපේක්ෂා කරමි.

ඩබ්ලිව්.එම්.බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

| | | |
|---|---|---|
| 01. ලේකම් | - | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 02. ලේකම් | - | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 03. ලේකම් | - | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| 04. ලේකම් | - | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය |
| 05. අධ්‍යක්ෂ ජනරාල් | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| 06. සභාපති | - | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 07. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් | - | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 08. විභාග කොමසාරිස් ජනරාල් | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| 09. සභාපති | - | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය |
| 10. සියලු ම ශාඛා ප්‍රධානීන් | - | අධ්‍යාපන අමාත්‍යාංශය |

## ළමයින් සේවයේ යෙදවිය හැකිද?

- 1956 අංක 47 දරණ ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත

නීතියට අනුව කිසිදු අයුරකින් අවුරුදු 14ට අඩු ළමයින් රැකියාවක යෙදවිය නොහැක. එලෙස යොදවන පුද්ගලයින්ට එරෙහිව මාස 12ක සිර දඬුවම් ලබාදිය හැකිය.

අවුරුදු 14 ත් 18ත් අතර ළමයින් සමහර අවස්ථාවල සේවයේ යෙදවිය හැකි නමුත් ඔවුන්ගේ ජීවිතයට, සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සදාචාරයට මෙන්ම ශාරීරිකව හෝ මානසිකව හානි ගෙන දෙන අනතුරුදායක රැකියාවල යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

ළමා ශ්‍රමය පිළිබඳ නීති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානතම ආයතනය කම්කරු දෙපාර්තමේන්තුවයි. කම්කරු දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක් තුළ සිදු කරන ලද විද්‍යාත්මක හා විශේෂඥ පර්යේෂණවලින් පසුව රැකියා 51ක් අන්තරායකාරී රැකියා බවට හඳුනා ගෙන ඇත.

### අන්තරායකාරී රැකියා

**<u>මස්/මාළු/ලුණු</u>**

1. සතුන් මැරීම හෝ සතුන්ගේ මස් කැපීම හෝ කුඩා කැබලිවලට කැපීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. ගැඹුරු ජලයේ මසුන් ඇල්ලීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. ලුණු අස්වැන්න නෙලා ගැනීම, ඇසිරීම, පැටවීම හෝ ප්‍රවාහනය කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**පලිබෝධ නාශක /රසායන ද්‍රව්‍ය/ගිණිකෙළි**

1. පලිබෝධ නාශක නිෂ්පාදනය හෝ භාවිතය හා සම්බන්ධ කිසිම වර්ගයක වැඩ;
2. ඊයම්, සින්ක්, ඇස්බැස්ටෝස්, සිමෙන්ති, රසදිය, ක්‍රෝමියම්, නිකල් හෝ කැඩ්මියම් භාවිතා කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය හෝ විකිණීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
4. අනතුරුදායක රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, ප්‍රවාහනය හෝ බැහැර කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
5. විකිරණශීලී ද්‍රව්‍ය භාවිතය හෝ ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
6. ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හෝ විකිණීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**මත්පැන්/දුම්කොළ**

1. මද්‍යසාර නිෂ්පාදනය, ප්‍රවාහනය හෝ විකිණීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. දුම්කොළ අස්වැන්න නෙලා ගැනීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. දුම්කොළ නිෂ්පාදන නිපදවීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
4. සමාජ ශාලාවක, මත්පැන්හලක හෝ කැසිනෝ ස්ථානයක යම් වර්ගයක වැඩ;
5. හෝටල්වල, ආපනශාලාවල හෝ කෑමශාලාවල මත්පැන් සංග්‍රහ කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**රබර්/සම්පදම් කිරීම**

1. සම් පදම් කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. රබර් කිරිවලට රසායනික ද්‍රව්‍ය යෙදීම මගින් රබර් ෂීට් නිෂ්පාදනය කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**යන්ත්‍ර සූත්‍ර/වරාය**

1. ක්‍රියාත්මක වෙමින් පවතින යන්ත්‍රෝපකරණ පිරිසිදු කිරීම හෝ අළුත්වැඩියා කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. යම් වරායක හෝ කුඩා වරායක් ඇතුළත යම් වර්ගයක වැඩ.

**පතල්/ගල් කොරි/වැලි,උළු,ගඩොල්/හුණුගල්**

1. පතල් කැනීම, ගල් කැඩීම හෝ පොළව යට වැඩ කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. කිමිදීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. ගල් කඩන ස්ථානයක සිට හෝ එම ස්ථානය දක්වා ගල් රැගෙන යාම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
4. ගල් කඩන ස්ථානයක් ළඟ හෝ ඒ අසල යම් වර්ගයක වැඩ;
5. වැලි ගොඩ දැමීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
6. යම් වාහනයකට හෝ යාත්‍රාවකට වැලි පැටවීම හෝ එම වාහනයෙන් හෝ යාත්‍රාවෙන් වැලි ගොඩබෑම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
7. හුණුගල් පෝරණුවක යම් වර්ගයක වැඩ;
8. ගඩොල් හෝ උළු නිෂ්පාදනය සඳහා පෝරණුවක් අසල හෝ ඒ අවට යම් වර්ගයක වැඩ;
9. ගල් කැඩීම හෝ රැගෙනයාම සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**වානේ/වීදුරු/ඛනිජ ද්‍රව්‍ය/පිත්තල වැඩ**

1. වානේ උණු කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. වීදුරු නිෂ්පාදනය සඳහා වැලි හැලීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

3. වීදුරු උණු කිරීම හෝ කැපීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
4. ඛනිජ ද්‍රව්‍ය කැනීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
5. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
6. වාත්තු වැඩපලක හෝ වානේ නිෂ්පාදන ස්ථානයක යම් වර්ගයක වැඩ;
7. වීදුරු හෝ වීදුරුවලින් නිෂ්පාදනය කර ඇති භාණ්ඩ ඇතිරීම, පැටවීම හෝ බෑම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

<u>ඉදි කිරීම්/වැඩබිම්</u>

1. මීටර් 1.5කට වඩා උස (සෑම පැත්තකම) වැඩි යම් ස්ථානයක ආරක්ෂාව සඳහා පහසුකම් සලසා නොමැති විට එහි යම් වර්ගයක වැඩ;
2. මීටර් 50කට වඩා වැඩි දුරකට සහ විනාඩි 03ක විවේක කාලයක් නොමැතිව අඛණ්ඩව විනාඩි 10ක කාලයක් සඳහා දිනකට මුළු එකතුව (විවේක කාලයද ඇතුළුව) පැය 4කට වැඩි කාලයක් පිරිමින් සම්බන්ධයෙන් වන විට කිලෝග්‍රෑම් 8 කට වැඩි බර ප්‍රමාණයක්ද, ගැහැණුන් සම්බන්ධයෙන් වන විට කිලෝග්‍රෑම් 5 කට වැඩි බර ප්‍රමාණයක්ද එසවීම, රැගෙනයාම හෝ එහා මෙහා ගෙනයාම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. ගොඩනැඟිලිවල තීන්ත ගෑම හෝ වර්ණයෙදීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
4. මාර්ග ඉදිකිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා මාර්ග මට්ටම් කිරීම, සමතලා කිරීම හෝ තාර දැමීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

<u>ප්‍රවාහන/සංචාරක</u>

1. මගීන් ප්‍රවාහනය කිරීම හෝ බර භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. සංචාරක මාර්ගෝපදේශකයන් වශයෙන් හෝ අන්‍යාකාරයකට සංචාරකයන් සමඟ ගමන් කිරීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

3. රට ඇතුළත හෝ මුහුදු ජලයේ ගමන් කරන යාත්‍රාවක යම් වර්ගයක වැඩ;

**ගස් නැගීම හා කැපීම/දර කැපීම, දර එකතු කිරීම**

1. කැළෑවක දර එකතු කිරීම, පැලීම, ඉරීම, කැබලිවලට කැපීම හෝ ගොඩගැසීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. ගස් කැපීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
3. ගස් නැගීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**සන්නද්ධ ගැටුම්/ ආරක්ෂක සේවා**

1. සන්නද්ධ ගැටුම් හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;
2. පුද්ගලයන් හෝ දේපළවලට ආරක්ෂාව සැපයීම හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**කැලි කසල, මළාපවාහනය**

1. කැලි කසල එකතු කිරීම හෝ බැහැර කිරීම නැතහොත් මළාපවාහනය හෝ කසල ශෝධනය හා සම්බන්ධ යම් වර්ගයක වැඩ;

**රෙදි/නිමි ඇඳුම්**

1. රෙදි නිෂ්පාදනය කිරීමේදී පහත දැක්වෙන කාර්යය සම්බන්ධ යම් වර්ගයක වැඩ;

(අ) නූල් සෑදීම
(ආ) පුළුන් කිරීම;
(ඇ) නූල් ගෙතීම;
(ඈ) විවීම;
(ඉ) ඉටි උණුකිරීම;
(ඊ) ඩයි දැමීම;
(උ) අච්චුවල දැමීම;
(ඌ) ජලය උරා ගැනීමේ යන්ත්‍රවල වැඩ;

2. නිමි ඇඳුම් නිෂ්පාදනය හා සම්බන්ධ පහත දැක්වෙන ක්‍රියාකාරකම්
   (අ) ගොඩ ගැසීම;
   (ආ) පිහියෙන් හෝ අත්පිහියකින් කැපීම;
   (ඇ) නිම කිරීම,තෙරපීම සහ මැදීම;

<u>ක්‍රීඩා</u>

1. කරනම් ගැසීම, වෙනත් භයානක භෞතික ක්‍රියාවක් හෝ සතුන් හා සම්බන්ධ ක්‍රියාවක් ඇතුළත් වන යම් වර්ගයක වැඩ;

<u>රාත්‍රී සේවා</u>

1. රාත්‍රී 8 සිට පෙ.ව 6 දක්වා වූ කාලයක ඇතුළත යම් වර්ගයක වැඩ;

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

01 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
02 අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ
03 ශ්‍රී ලංකා සාක්ෂි ආඥා පනත හා එහි සංශෝධන
04 1841 අංක 04 දරණ අයාල ආඥා පනත
05 1883 ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය හා එහි සංශෝධන
06 1939 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත
07 1941 අංක 24 දරණ ළමයින් කුලවද්දාගැනීමේ ආඥා පනත හා එහි සංශෝධන
08 1956 අංක 47 දරණ ස්ත්‍රීන් හා තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත
09 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
10 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත හා එහි සංශෝධන
11 1997 අංක 30 දරණ ඇප පනත
12 1999 අංක 27 දරණ අධිකරණ සංවිධාන සංශෝධන පනත
13 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත
14 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීවීමේ පනත
15 2006 අංක 27 දරණ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත
16 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර පනත
17 2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනත

*ජෝන් එෆ්. කෙනඩි මයා*

මෙතුමන් ඇමෙරිකා එක්සත් ජනපදයේ 35
වැනි ජනාධිපතිවරයායි.



"ලෝකයේ වඩාත්ම වටිනා මූලාශ්‍රය ළමයින්ය.
අනාගතයේ හොඳම බලාපොරොත්තුවද ඔවුන්ය....."

# ළමයින් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය

රටේ අනාගතය ළමා පරපුරයි. කායික මානසික යහපැවැත්මෙන් යුතු ළමා පරපුර රටක සම්පතකි. ළමයාකු මව්කුස තුළ පිළිසිඳගත් දිනයේ සිට වැඩිහිටියකු වීම දක්වාම ඔහුගේ හෝ ඇයගේ කායික හා මානසික යහපැවැත්මට පවත්නා ගැටලු අවම කරමින් ළමා හිතකාමී සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම අප සැමගේම වගකීමකි.

**"ආරෝග්‍යා පරමාලාභා - සංතුට්ඨීං පරමං ධනං"**
**- බුදුරජාණන් වහන්සේ**

නීරෝගී බව උතුම්ම ලාභයයි සතුට පරම ධනයයි. අපට එදිනෙදා ජීවිතයේදී කටයුතු සිදු කිරීමේදී නීරෝගී බව යන්න ඉතා වැදගත්ය. එය ශාරීරික හා මානසික වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. සාර්ථක ජීවිතයක් සඳහා කායික මෙන්ම මානසික සුවතාවය ද ඉතා වැදගත් වේ.

අපගේ දෛනික කටයුතු වලදී ඇතිවන මානසික පීඩාකාරී හා අභියෝගාත්මක තත්ත්වයන්ට ඉතා හොඳින් මුහුණ දීමට ඇති හැකියාව මානසික යහපැවැත්ම ලෙස සරලව හැඳින්විය හැක. පුද්ගලයකුගේ මානසික හා සමාජීය යහපැවැත්ම ඇති කිරීමට අවශ්‍ය සහායන් ලබාදීම, මැදිහත්කරණයන් හා සුදුසු සම්බන්ධීකරණයන් සිදු කිරීම මනෝසමාජීය මැදිහත්කරණයයි. මෙහිදී අප සාකච්ඡා කරනුයේ නිවසේදී, පාසලේදී මෙන්ම ළමයින් සමඟ කටයුතු කරන ඕනෑම අවස්ථාවක දී ඔවුන්ගේ යහපැවැත්ම උදෙසා මනෝසමාජීය එළෙඹුමක් තුළ පිහිටා අපගේ දායකත්වය ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳවය.

**"ඇඟිලි පහ ඔබේ - නෑනේ එකවගේ**
**ළමයිනුත් වෙනස් - ඇඟිලි පහ වගේ"**

**ආදරණීය වැඩිහිටියනි .....**

සෑම ළමයෙකුම විශේෂයි, ඔවුන්ගේ දක්ෂතා, හැකියාවන්, කුසලතාවන් විවිධාකාරයි. එබැවින් ඔබ ළමයින් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ සුවිශේෂීතාවන් මැනවින් අවබෝධ කර ගනිමින් ඔවුන්ගේ අනාගතයට මඟපෙන්වීම සිදු කළ යුතුවේ.

ළමයෙක් තවත් ළමයෙකු සමඟ සමාන කිරීමට හෝ සංසන්දනය කිරීමට යෑමෙන් මෙන්ම පිරිසක් ඉදිරියේ ළමයින්ගේ වැරදි, අඩුපාඩු කතා කිරීම ඔවුන්ට සමාජය ඉදිරියේ සාර්ථක පුරවැසියකු වීමට ඇති අවස්ථාවන් අඩු කර මානසික රෝගී තත්ත්වයන්ටද මුල පුරයි.

**හිරු මඬල සේ ඇවිත්.....**
**සඳවතට හැඩය දුන්.....**
**විශ්වයට පණ පෙවූ.....**
**මව්වරුණි.... පියවරුණි...**
**දරුකැළගේ හදවතේ මුල් කවිය ඔබම වේ.....**

සෑම අම්මා කෙනෙකුටම තාත්තා කෙනෙකුටම මේ ලෝකය තුළ පවතින වටිනාම වස්තුව ඔවුන්ගේ දරු සම්පතයි. හැම සෙනෙහෙබර අම්මා කෙනෙක් තාත්තා කෙනෙක්ටම තම දරුවා රජ පැටියෙකි. ළමයින්ට තම සෙනෙහබර මව්පියන් තරම් වටිනා වස්තුවක් තවත් මේ ලෝකයෙහි නැත.

ආදරණීය අම්මේ තාත්තේ හැම මොහොතේම ඔබගේ දරුපැටවුන්ට සෙනෙහෙබර අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් වන්නට හැකි නම් එය බොහෝ අගනේය.

**පන්නරය නුඹම විය - මා සිතට දුන් සවිය**
**ජය පරාජය හමුවෙ - නොනිමි පහන්වන්න**

ළමයින්ගේ ශක්තිය ඔබයි, ළමයින්ගේ අනාගතය ද ඔබයි, ළමයින්ගේ ඉරණම ද, ජීවිතයද ඔබයි.

ඔබගේ සෙනෙහෙබර කැදැල්ල තරම් ළමයෙකු ආසාකරන, ලෙන්ගතුකමක් දක්වන, රැකවරණය සැපයෙන් තවත් තැනක් මෙලොව තිබේ දැයි ඔබ මදක් සිතන්න.

පවුල තුළ ඔබ හැසිරෙන ආකාරය, කතාබහ කරන ආකාරය තුළින් ළමයින් බොහෝ දේ උගනී. ඔබගේ ආදරණීය දුවට පුතාට සිනාසී, සතුටින් සැහැල්ලුවෙන් ගත කිරීමට අවකාශය සලසා දීම ඔබගේ පරම යුතුකමකි. ඔබේ දරුවා ඔබෙන් කරන නිහඬ ආයාචනය ද එයයි.

**යෙහෙළියක වී සදා - ඔබ ගැයූ කවි පැදී**
**මුමුණලා සියොලහම - මතක පොත අලුත් වී**
**හදවතට උණුහුමක් ලබා දුන්නේ ඔබයි**
**මා මව්නි.... පියාණනි**

තම මව පියා සුහද, මිත්‍රශීලී වනු අයෙකු වනු දැකීමේ සිහිනයක් සැම ළමයෙකු තුළම පවතී. ඒ සිහිනය සැබෑවක් කරන්නට ඔවුනට සහාය වන්න.

පවුල තුළ ළමයා ලබන සෑම හොඳ සහ නරක අත්දැකීම් සියල්ලක්ම මතකයන් ලෙස අනාගතයට රැගෙන යයි. පවුල තුළ ඔබ ගෙවන සෑම මොහොතකම ඔබේ සෙනෙහස, ආදරය උණුසුම ළමයින්ට දැනෙන්නට

ඉඩහරින්න. ළමයින්ට කතා කරන විට. අහුම්කන්දෙන විට, ඔබගේ අවධානය සම්පූර්ණයෙන් ඔවුන්ට ලබා දෙන්න.
දරුවාට ද ඔබට කියන්නට බොහෝ දේ පවතී. ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඔබේ කාලසටහනින් වෙන් කර ගැනීමට හැකිවන්නේ නම් ළමයින් ඔබට බොහෝ දේ පවසාවි.

අනාගතය සම්බන්ධයෙන් ඔබට මෙන්ම ළමයින්ට ද සිහින පවතී. ඒ සිහින නිදහසේ දැකීමට ඔවුනට ඉඩ ලබා දෙන්න. ඔබ ගිය මාවතේම නොව ඔබටත් වඩා සුබදායී මාවතක ළමයින් ගමන් කරනු දැකීමට පුරුදුවන්න. ඔබගේ අසම්පූර්ණ වූ සිහිනයන් ළමයින්ගේ සිහිනයන්ට බාධාවක් නොවිය යුතුය. සිහිනයන්හි නිදහසේ විකසිත වන්නට ඔවුනට ඉඩහරින්න. එහිදී ඔබ මග පෙන්වන්නෙකු මිස තීරණගන්නෙකු නොවන බව සිත්හි තබාගන්න.

**ඔබ දන්නවාද ........**
**"ළමයින්ගේ මොළය වර්ධනය සිදුවන්නේ මව්කුස තුළ පිළිසිඳගත් දිනයේ සිටම බව..**
**එබැවින් ගර්භනී අවධියේ සිටම ඔබ විසින් සිදු කරන සෑම දෙයක් ම දරුවාගේ වර්ධනයට බලපානු ලබයි"**

- අධ්‍යාපනය හුදෙක් පොතපතින් ලබන දැනුමට පමණක් සීමා කළ නොහැක. එදිනෙදා ජීවිතයේ දී ලබන අත්දැකීම් තුළින් ද ළමයින් ඉගෙන ගනී.
- කුඩා අවධියේ සිටම ළමයින්ට පරිසරය සමඟ කාලය ගත කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඉන් ලබන අත්දැකීම් මගින් ඔබට ඉගැන්විය නොහැකි බොහෝමයක් දේ ඔවුන් ඉගෙන ගනු ඇත.
- යමක් අවබෝධ කරගන්නා ආකාරය ළමයාගෙන් ළමයාට මෙන්ම ඔවුන්ගේ වයස් මට්ටම් අනුව වෙනස් විය හැක. ළමයෙකුට යමක්

ඉගැන්වීමේදී එම සුවිශේෂී තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත්වේ.

- අධ්‍යාපනය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේදී ළමයින්ට නිදහස ලබාදෙන්න. එහිදී ඔබ පහසුකම් සපයන්නෙකු හා මග පෙන්වන්නෙකු ලෙස කටයුතු කරන්නේනම් එය දරුවාට මහත් ශක්තියක් වනු ඇත.
- අධ්‍යාපනයේ දී ඔබට මෙන්ම ළමයින්ට ද සිහින තිබේ. ඔබේ සිහින වලට ළමයින් සීමා නොකරන්න. ඔවුන්ට ඔවුන්ගේ සිහිනය නිදහසේ දකින්නට ඉඩහරින්න.
- අධ්‍යාපනය තුළින් දරුවා ජීවත් වීමට ඉගෙන ගනී. එබැවින් විභාග ප්‍රතිඵලයට හෝ අනාගත රැකියාවකට සීමා නොකරන්න.
- අධ්‍යාපනයට ඇති දරුවාගේ හැකියාව සැම විටම අගය කරන්න ඉදිරියට යෑමට උනන්දු කරවන්න, ආත්ම අභිමානය වැඩිවන ආකාරයට කටයුතු කරන්න.
- සැම විටම දරුවාගේ ලබන ජයග්‍රහනයන් මෙන්ම පරාජයන් ද අභියෝගයන් ලෙස භාර ගැනීමට දරුවා හුරු කරන්න.
- ධෛර්යයමත් කරන්න.
- දරුවාට තමන් සතු වටිනාකම් හඳුනා ගැනීමට ළමයින්ට උදව් කරන්න.

## ළමයෙකුට යම් කරදරයක් සිදුවීමෙන් වළක්වා ගන්නේ කෙසේද?

ළමයෙකු යම් කරදරයකට, හිංසනයකට, ඔවුන්ට නොගැළපෙන ක්‍රියාවකට යොමු කර ගැනීමට හෝ යොමුවීමට පෙර වැදගත් වන්නේ එය වළක්වා ගැනීමයි.

ඒ සඳහා,

- **"ඔබ අයිති ඔබටමයි"** යන්න ළමයින්ට කියා දෙන්න.හොඳ සහ නරක ස්පර්ශයන් පිළිබඳව ළමයින් සමඟ කතා කරන්න එහි වෙනස හඳුනා ගැනීමට උදව් කරන්න




4.1 රූපය - හොඳ ස්පර්ශය හා නරක ස්පර්ශය

- තමන් අපහසුතාවකට පත්වන ආකාරයෙන් කවුරුන් විසින් හෝ අත පතගෑම් සිදු කරන්නේ නම් හෝ එවැනි කාර්යයක් සඳහා පොළඹවා ගැනීමට කවුරුන් හෝ කටයුතු කරන්නේ නම් එවැනි අවස්ථාවක දී,




- ළමයින්ට නිදහස දෙන්න, ඔවුන්ට ආදරය කරන්න එහෙත් ඔවුන් සිදු කරන්නේ කුමක් දැයි අවධානයෙන් සිටින්න.

- එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් ළමයින් සමඟ කතා කිරීමට වේලාවක් වෙන්කර ගන්න.

- තමන් යන එන තැන් තමන් ඇසුරු කරන්නේ කවුද යන්න සම්බන්ධයෙන් දෙමාපියන්ට කීමට දරුවා කුඩා කළ සිටම හුරු කරන්න.

## ළමයින්ට හිරිහැරයක් සිදු වූ විටදී (ළමා අපයෝජනයක දී)

- දරුවාට හොඳින් සවන්දෙන්න
- ඉවසිලිමත් සවන්දෙන්නෙකු වන්න
- තමන්ට සිදු වූ කරදරයට තමන් වගකිවයුතු නැති බව පහදා දෙන්න
- දරුවාව විශ්වාස කරන්න
- තනි නොකරන්න
- සුහදව පිළිගන්න
- දරුවා වැඩි වශයෙන් කිරීමට කැමැති කාර්යයකට යොමු කරවීම තුළින් දරුවාගේ මානසික පීඩනය සමනය කිරීමට කටයුතු කරන්න



## හදිසි ආපදාවකදී ඔබ.....

- ළමයින් පිලිබඳව විමසා බලන්න
- නිරීක්ෂණය කරන්න
- ළමයින්ට හොඳින් සවන් දෙන්න
- දෙමාපියන් අහිමිවූ  හෝ අතරමංවූ ළමයින් සිටිනම් ඒ සම්බන්ධයෙන් අදාළ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්න (දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී, පරිවාස නිලධාරී, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, මුල් ළමා විය සංවර්ධන සහකාර හෝ වෙනත් රජයේ නිලධාරීන්)

- ආපදාවට මුහුණදුන් ළමයින් සුරක්ෂිතව සිටින්නේ දැයි සොයා බලන්න
- රෝගපීඩා ආදියෙන් පෙළෙන ළමයින් සිටී නම් ඔවුන් සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කර සුදුසු ප්‍රතිකාර සඳහා යොමු කරන්න
- ආපදා තත්ත්වය නිසා දැඩිලෙස පීඩාවට පත්ව සිටින ළමයින් සිටීදැයි සොයා බලන්න
- මානසික පීඩාවෙන් මිදීමට ළමයින්ට සහාය වන්න
- එම ළමයින් හුදකලා නොකරන්න
- කඳවුරු අසල අනතුරු දායක තත්ත්වයන් ඇත්තේ නම් එයින් ළමයින් ඉවත් කරන්න
- ළමයින් වටා සිටින පුද්ගලයින් පිළිබඳව දැනුවත් වීම හා අවධානයෙන් සිටින්න
- ළමයින්ගේ සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව සම්බන්ධයෙන් නිරන්තරයෙන් සැලකිලිමත් වන්න.

## ගැටලුවක් පවතින විටෙක ළමයින් තුළින් දැකිය හැකි ලක්ෂණ

- හඬා වැළපීම
- දුකෙන් සිටීම
- අසහනකාරී තත්ත්වයන්
- නොසන්සුන් බව
- අනවශ්‍ය බිය
- ඉක්මනින් කළබල වීම
- නින්ද නොයෑම
- ආහාර අරුචිය
- බිය ජනක සිහින දැකීම



- අන් අය සමඟ සම්බන්ධනොවී තමන්ගේම ලෝකයක ජීවත් වීම
- කිසිසේත්ම කතා නොකිරීම
- සරල තීරණයන් පවා ගැනීමට නොහැකි වීම
- මතකය අහිමි වීම
- පාසල් යාම ප්‍රතික්ෂේප කිරීම
- අසනීපයක් පවතින බව නිරන්තරයෙන් පැවසීම.

**මෙවැනි තත්ත්වයන් දිගින් දිගට පැවතීම තුළින්**

- ප්‍රකෝපකාරී ලෙස හැසිරීම
- ළමයින් දෙමාපියන් ප්‍රතික්ෂේප කිරීම
- නිවස හැර යෑම
- මානසික රෝග වැළඳීමට ඇති ඉඩකඩ වැඩිවීම
- මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම
- සියදිවි නසා ගැනීමට උත්සාහ කිරීම

යනාදී තත්ත්වයන් ළමයින් තුළ ඇති විය හැක.

එබැවින් ඉහත සඳහන් ලක්ෂණ දක්නට ලැබෙන්නේ නම් අවශ්‍ය මනෝසමාජීය ප්‍රතිකාර සිදු කිරීම සඳහා වෘත්තීමය පළපුරුද්ද සහිත



සේවා සපයන්නන් (වෛද්‍යවරුන්, මනෝ වෛද්‍යවරුන් හා මනෝ උපදේශකවරුන්), ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් මනෝ සමාජීට නිලධාරී, හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජයීය අංශය වෙත ළමයා යොමු කිරීමට කටයුතු කරන්න.

## ළමයින් හික්මවීම ලෙහෙසි දෙයක් නොවේ.

ළමයින් හික්මවීම දෙමාපියන් සතු ඉතා වැදගත් කාර්යයකි. තම ළමා කාලයේ මුහුණ දුන් හික්මවීම් අවස්ථා හෝ සමාජයේ වැඩිහිටියන් විසින් අන් ළමයින් හික්මවනු දැකීමෙන් ලබා ගත් අත්දැකීම් හෝ බොහෝ දෙමාපියෝ ක්‍රියාවට නංවති. කෙසේ වුවත් අද හැදෙන ළමයින් ගෙනෙන නව අභියෝග සඳහා ළමයින් හදා වඩා ගැනීමේ පැරණි ක්‍රමවේද සාර්ථක ව භාවිත කිරීම අභියෝගයක් බව බොහෝ දෙමාපියන්ට පෙනී ගොස් ඇත. මේ නිසාම අද අපට බොහෝ විට ඇසෙන කියමනක් වන්නේ "අපි කුඩා කාලේ මේ වගේ දේ කළේ නැහැ" යන්නයි.

1) අපට අවශ්‍ය වන්නේ සමාජයේ හැසිරිය යුතු ක්‍රම ළමයින්ට ඉගැන්වීමට ය.
2) ස්වයං විනයක් ළමයින් තුළ ඇති කිරීමට ය.
3) හික්මවීම යනු ඉගැන්වීම හා මග පෙන්වීම මිස දඬුවම් ලබා දීම නොවේ.
4) දරුවන්ට දඬුවම් කිරීමට අපට අවශ්‍යතාවක් නැත.
5) අපට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ වැරදි චර්යා වෙනස් කිරීමට ය.
6) තම වැරදි චර්යා නුසුදුසු හා නොපිළිගත් ඒවා බව දරුවාට දැන්වීමට ය.
7) අපට ඔවුන්ගේ වැඩෙන සිරුර පලුදු කර කැළැල් ඇති කිරීමට අවශ්‍ය නොවේ.

**<u>ශාරීරික දඬුවම් (පහර දීම, කම්මුලට ගැසීම, වේවැල් පහර දීම සුදුසු ද?)</u>**

1) ශාරීරික දඬුවම් විනය ඇති කිරීම පිණිස කාර්යක්ෂම ක්‍රමයක් නොවේ.
2) අප රට ද ඇතුළු ව ලොව පුරා සාර්ථක ව භාවිත කරන හික්වීමේ ක්‍රමවේද සමුදායක් ඇත.
3) මේවායින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන බව සොයාගෙන ඇත.

## සාර්ථක ව භාවිත කරන හික්මීමේ ක්‍රම මොනවාද?

### 1. ආදර්ශ භූමිකාව: වචනවලට වඩා ක්‍රියාව කැපී පෙනේ.

දරුවන් බොහෝ දේ ඉගෙන ගන්නේ ඔබ කියන දෙයට සවන් දීමෙන් හා ඔබ කරන දේ බලා සිටීමෙනි. තමන් කරන යම් දෙයක් ළමයින් ද එලෙස ම කරන බව බොහෝ වාරවල දෙමාපියන් දැක ඇත. දරුවන්ගෙන් තමා කුමක් බලාපොරොත්තු වන්නේ ද යන්න ආදර්ශය මගින් උගන්වන්න. "ස්තුතියි" යන්න කීම පුහුණු කිරීමට ඔබට අවශ්‍ය නම් ඔබ වෙනුවෙන් යමක් කළ විගස "ස්තුතියි" යයි පවසන්න. එවිට ළමයා ද එසේ කීමට පටන් ගනු ඇත. ඔවුන් විසින් අනුන්ට පහර දෙනු දකින්නට ඔබ අකමැති නම් ඔබ ද ඔවුන්ට පහර නොදෙන්න.

### 2. සීමා නියම කිරීම.

දරුවන්ට සීමා අවශ්‍යයි. ඔවුන්ගේ සංචලන සීමා කළ යුතු හෝ පාලනය කළ යුතු බව ඉන් අදහස් නොවේ. එය දරුවන්ට නිදහසේ හැසිරීම සඳහා සීමාවන් සලසාදීමක් පමණකි. තමන්ගේ සීමාවන් දැනගත් විට ළමුන්ට ආරක්ෂාවක් දැනේ. නිදහසේ හැසිරීමට හැකි තැනක් (කාමරයක් හෝ නිවසේ කිසියම් කොටසක්) ළමයාට වෙන් කර තැබීම හොඳ අදහසකි.

ළදරුවන්ට සහ පියනැගීමට පුරුදු වන දරුවන්ට සීමාවන් පැනවීම කළ හැකි හොඳ ක්‍රමයක් වන්නේ නිවස ළමයින්ට ඔරොත්තු දෙන ස්ථානයක් කිරීමෙනි. ළමයින්ට ළඟා විය නොහැකි වන සේ බඩු තැබීමෙන් සහ වටිනා දේ යතුරු දැමීමෙන් එය කළ හැකිය. කුස්සියට ළමයාගේ පැමිණීම වැළැක්වීම ඔබගේ අභිප්‍රාය නම් ළමයා පැමිණෙන හැම විටක ම එය වළක්වා ඔහු කුස්සියෙන් සෙමින් ඉවත් කරන්න. කුස්සිය ඔහුට අයත් තැනක් නොවන බව ඒත්තු ගැන්වීම සඳහා මෙය ඔබට සන්සුන් ව එහෙත් ස්ථිර ලෙස කීප විටක් කිරීමට සිදු වනු ඇත. සවස 7න් පසු ව රූපවාහිනී යන්ත්‍රය පාවිච්චි කිරීමෙන් වැළකිය යුතු නම් එය ළමයාට සන්සුන් ව සාමාන්‍ය පරිදි දැනුම් දෙන්න. තවත්

වේලාවක් එය නැරඹීමට ළමයා ඔබගෙන් ඉල්ලා සිටිය හොත් රූපවාහිනිය නරඹන කාල සීමාව මතක් කර දී රූපවාහිනිය වසා දමන ලෙස පවසන්න. තව දුරටත් ළමයා කන්නලව් කරමින් හඬමින් ඉල්ලා සිටිය හොත් ඔබම රූපවාහිනී යන්ත්‍රය වසා දමන්න. එහෙත් කෝපයක් හෝ කළකිරීම් ස්වභාවයක් හෝ නොදක්වා එය කළ යුතුයි. සීමා පැනවීමේ දී නියත නොවෙනස් වන ආකාරයකින් එය කළ යුතුයි.

**3. අවධානය සහ නොසලකා හැරීම - සෘණාත්මක අවධානය සහ ධනාත්මක අවධානය.**

මෙය ඉතා සරල ක්‍රමයකි. එහෙත් ඉතා බලසම්පන්න වූවකි. ඔබ කැමති චර්යාවට අවධානය යොමු කරන්න. අකැමැති චර්යාව නොසලකන්න. ලෝකයේ වසන හැම ළමයින්ට ම අවධානය අවශ්‍ය වේ. අවධානය ගෙන දෙන චර්යාව ඔවුන් නැවත නැවතත් කරනු ඇත. එහෙත් දොස් පැවරීමල කෑ ගැසීමල පහර දීම හෝ වේවැලෙන් තැලීම පවා අවධානය යොමු වන චර්යාවන් බව මතක තබා ගත යුතු ය. මෙය සෘණාත්මක අවධානයයි. අවධානය කොහෙත් ම නොලබනවාට වඩා කෑ ගැසීමෙන් මිනිත්තු කීපයක අවධානය ලබා ගැනීමට සමහර විට ළමයි උත්සුක වෙයි.

ඔබ මේ ශිල්පීය ක්‍රමය පටන් ගත් විට සමහර විට ළමයාගේ හැසිරීම මුල දී තවත් නරක අතට හැරෙනු ඇත. වෙළඳසැලේ දී රසකැවිලි ඉල්ලා අඬන ළමයකුගේ හැඬීම ඔබ නොසලකා හැරිය විට එම හැඬීම නැවැත්වීමට පෙර (සමහර විට කිහිප වරක් ම) තව තවත් වැඩිවිය හැකි බව අමතක නොකරන්න. ළමයාට ගැසීමටල බැණ වැදීමටල කෑ ගැසීමට නොයන්න. ළමයාගේ කීමට අවනත නොවන්න. (ඔබ කොතරම් ලජ්ජාවට පත් වුව ද කී දෙනකු බලා සිටිය ද). එසේ කිරීමෙන් ළමයාගේ චර්යාව තවත් නරක අතට හැරවෙන්නේ තදින් හැඬීම ප්‍රතිඵල ගෙන දේ යන පණිවුඩය ළමයාට ඒත්තු ගැනෙන හෙයිනි. එම නිසා මෙම ක්‍රමය ඇරඹීමට පෙර එය ඔබට නිශ්චිතවම අවසානය දක්වා ගෙන යා හැකි බව තහවුරු කරගන්න.

ළමයකුගේ වැරදි චර්යා අමතක කළ නොහැකි අවස්ථා ඇති බව ඇතැම් විට ඔබ පවසන්නට පුළුවන. එය සත්‍යයකි. ළමයකු ගිනි තබත් නම් හෝ පාරට දුවත් නම් හෝ එය නොසලකා සිටිය නොහැකිය. කෙසේ වෙතත් ඕනෑවට වඩා ප්‍රතික්‍රියා නොදැක්වීමට සැලකිලිමත් වන්න. අවධානය ගෙනෙන චර්යාව නැවත කරනු ලබයි යන මූල ධර්මය මතක තබාගන්න.

ඔබගේ ළමයාගේ යහපත් චර්යා පිළිබඳව අවධානය දැක්වීම ඉතා වැදගත් ය. දරුවා නිහඬව පොතක් කියවයි ද ඔහුව වර්ණනා කරන්න. දරුවා සෙල්ලම් බඩුවක් බලෙන් නොගෙන ඉල්ලා සිටී නම් ඇයව ප්‍රශංසා කරන්න. කිසියම් කරදරයක දී ඔබේ තවත් දරුවකුට උදවු කරයි නම් ඒ ගැන ඔබ කොතරම් ආඩම්බර වනවා දැයි පවසන්න. යළිත් මතක තබාගත යුත්තේ අවධානය ගෙන දෙන චර්යාව නැවත නැවතත් කරන බව ය. මෙය ධනාත්මක අවධානය යි.

### 4. සටහන් සහ ත්‍යාග

කුඩා ළමයකුගේ යහපත් ක්‍රියා ඔබ අගය කරන බවට ළමයාට හැඟවීමට හොඳ සාධකයක් වන්නේ සටහන් තබා ගැනීම ය. බොහෝ පාසල් පන්ති කාමරවල මෙබඳු සටහන් තබා ඇති බව ඔබ දකින්නට ඇත. පාසලට කලටවේලාවට පැමිණීමල පිරිසිදුකම හා නිශ්ශබ්දතාව දැක්වීමට පාසල්වල මේවා යොදා තිබේ. ගෙදරදොර කටයුතු සඳහා ද සටහන් තැබීමට හැකිය.

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු

ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අධිකාරියේ අරමුදලින් එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව සිවිල් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**30.** අධිකාරියට විරුද්ධව පවරන ලද කිසිම නඩුවක දී, අධිකාරියේ සාමාජිකයකුට හෝ අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව, පෞද්ගලික වශයෙන් හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම සිවිල් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

අමාත්‍යවරයාට තොරතුරු සැපයීම.

**31.** අධිකාරියේ වැඩ කටයුතු සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක් මත, වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සපයන ලෙස, අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කරනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව.

**32.** අධිකාරිය විසින් වාර්ෂික වාර්තාවක් ඒ වාර්තාව අදාළ වන වර්ෂය ඇතුළත එහි සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබීමට සැලැස්විය යුතු ය. අධිකාරිය විසින් පරීක්ෂා කර බලන ලද යම් විශේෂිත කාරණයක් හෝ කාරණා සම්බන්ධයෙන් සහ ඒ පිළිබඳව ගත් ක්‍රියා මාර්ග සම්බන්ධයෙන්, අමාත්‍යවරයා වෙත වාර්තාවක් සැපයිය යුතු යයි අධිකාරිය සලකන කවර අවස්ථාවක වුවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත වරින් වර හෝ විශේෂ වාර්තා ඉදිරිපත් කළ හැකි ය.

යම් පරිශ්‍රයකට ඇතුළු වී එය පරීක්ෂා කරන ලෙස අධිකාරියේ යම් නිලධරයකුට බලය දීමට අධිකාරියට බලය ඇති බව.

**33.** යම් පරිශ්‍රයක ළමා අපචාර කටයුතු සිදු කෙරෙන බව විශ්වාස කිරීමට අධිකාරියට සාධාරණ හේතු ඇති අවස්ථාවක, සහ සෝදිසි වරෙන්තුවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම ඒ ළමා අපචාරය පිළිබඳ විමර්ශනයට හානිකර විය හැකි බව විශ්වාස කිරීමට අධිකාරියට සාධාරණ හේතු ඇති අවස්ථාවක, එවැනි යම් පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කරන ලෙස, අධිකාරියේ යම් නිලධරයකුට අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි ය. එසේ බලය දෙනු ලැබූ නිලධරයකු මෙහි මින් මතු "බලයලත් නිලධරයා"යනුවෙන් හඳුන්වනු ලැබේ.

පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ බලය.

**34.** (1) කවර හෝ බලයලත් නිලධරයකු විසින්—

(අ) ළමා රැකවරණය සේවා සපයන කවර හෝ ආයතනයක පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි යඃ

(ආ) ළමයින්—

(i) ළමා අපචාර කාර්යයන් සඳහා ;

(ii) වෙනත් යම් නීති විරෝධී කාර්යයක් සඳහා ;

(iii) නීති විරෝධීව දරුකමට හදාගැනීම සඳහා

යම් පරිශ්‍රයක තබාගෙන ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති අවස්ථාවක, ඒ ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඇ) නීති විරෝධි දරුකමට හදා ගැනීම සිදු වන්නේ යයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ආරෝග්‍යශාලාවකට හෝ මාතෘ නිවාසයකට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඈ) ඒ ආයතනය ආරෝග්‍යශාලාව හෝ මාතෘ නිවාසය විසින් පවත්වා ගෙනයනු ලබන යම් පොත්පත්, ලේඛන හෝ වාර්තා පරීක්ෂා කොට, එයින් උධෘත හෝ පිටපත් ලබාගත හැකි ය ;

(ඉ) එවැනි යම් පරිශ්‍රයක සිදු කෙරෙන කටයුතු විමසා දැනගැනීමේ කාර්යය සඳහා සහ ළමයින්ට අදාළ යම් නීතියක් උල්ලංඝනය කිරීමක් ඒ පරිශ්‍රය තුළ සිදුවන්නේ ද යන වග දැන ගැනීම සඳහා, ඒ පරිශ්‍රයෙහි සිටින කවර හෝ තැනැත්තකුගෙන් ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් බලයලත් නිලධරයා වෙත පවරා ඇති යම් බලයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීමේ දී ඊට බාධා කරන හෝ ප්‍රතිරෝධය පාන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම, යටත් වන්නේ ය.

*භාණ්ඩ තහනමට ගැනීමේ බලය.*

**35.** (1) ළමයින් පිළිබඳ වූ යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කර ඇති බව හෝ සිදු කෙරෙමින් පවතින බව විශ්වාස කිරීමට යම් බලයලත් නිලධරයකුට හේතු ඇත්නම්, ඒ නිලධරයා විසින්-

(අ) යම් වරදක් සිදුකර ඇතැයි කියනු ලබන්නේ යම් භාණ්ඩයක් උපයෝගී කරගෙන ද නැතහොත් යම් භාණ්ඩයක් හා සම්බන්ධව ද නැතහොත් වරද සිදු කිරීමට අදාළව යොදාගෙන ඇත්තේ යම් භාණ්ඩයක් ද, ඒ භාණ්ඩය, අවශ්‍ය විය හැකි කාලයකට තහනමට ගෙන රඳවා තබා ගත හැකි ය.

(ආ) එවැනි යම් වරදක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමේ දී ඔහුගේ මතය අනුව සාක්ෂියක් සංයුක්ත විය හැකි යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් හෝ යම් යාන්ත්‍රික හෝ විද්‍යුත් උපක්‍රමයක් තහනමට ගෙන රඳවා තබාගත හැකි ය.

(2) යම් බලයලත් නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩය, ඒ පිළිබඳව සුදුස්සක් කරනු ලබන තෙක්, අධිකාරියේ භාරය සහ පාලනය යටතේ තබා ගනු ලැබිය යුතු ය.

*බලයලත් නිලධරයන් සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

**36.** 33 වන වගන්තිය යටතේ පත් කරන ලද සියලු බලයලත් නිලධරයන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*වැරදි.*

**37.** (1) (අ) මේ පනත යටතේ කරනු ලැබ ඇති යම් නියමයක් අනුව යම් වාර වාර්තාවක් හෝ තොරතුරු සැපයීම පැහැර හරින ;

(ආ) තමන් විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක හෝ තොරතුරක, දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ;

(ඇ) අධිකාරියේ සාමාජිකයකුව, නිලධරයකුව හෝ සේවකයකුව සිටිමින් හෝ මූල මණ්ඩලයේ සාමාජිකයකුව සිටිමින්, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමේ දී හෝ කර්තව්‍ය

ඉටු කිරීමේ දී ඒ හා සම්බන්ධව තමන් විසින් ලබාගන්නා ලද සහ ළමා අපචාරයක් සම්බන්ධයෙන් පැවැත්වෙන අපරාධ විමර්ශනයකට සම්බන්ධ තැනැත්තන්ගේ හෝ ළමයින්ගේ අනන්‍යතාව හෙළිදරව් වන යම් කාරණයක් අනාවරණය වීමේ ප්‍රතිඵලය ඇති යම් තොරතුරක් ඒ තොරතුරු හෙළිදරව් කිරීමට මේ පනතින් බලය දී ඇති යම් කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා වෙනත් තැනැත්තකුට හෙළිදරව් කරන ;

(ඈ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන

සෑම තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධාන මගින් යම් වරදක් සම්බන්ධයෙන් ප්‍රකාශිතව විධිවිධාන සලසා නොමැති, මේ පනත යටතේ වූ යම් වරදක් කරන සෑම තැනැත්තෙක් ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(3) මේ පනත යටතේ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම හා නිලධරයකු ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම ඒ වරදට

වරදකරු වන ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා තිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු විසින් හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) ළමයින්ට අදාළ නීති යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා මූල මණ්ඩලයේ නිලධරයකු හෝ අධිකාරිය විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**38.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**39.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**40.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සභාපතිවරයා" යන්නෙන්, 8 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙක් අදහස් වේ ;

"ළමා අපචාර" යන්නෙන් —

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ 288ආ 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්තිවල කවර හෝ විධිවිධානයක් ;

(ආ) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ කවර හෝ විධිවිධානයක් ;

(ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ කවර හෝ විධිවිධානයක් ; නැතහොත්

(ඈ) අධ්‍යාපන ආඥාපනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධිවිධානයක්

උල්ලංඝනය කිරීමක් වන්නා වූ ද, ළමයකුට අදාළව සිදු කරනු ලබන්නා වූ ද, යම් ක්‍රියාවක් නොකර හැරීමක් අදහස් වන අතර, ඊට ළමයාගේ ජීවිතයට අන්තරායක් සිදු වීමට ඉඩ ඇති හෝ ඒ ළමයාට ශාරීරික වශයෙන් හෝ ඔහුගේ හැඟීම්වලට හානි සිදු වීමට ඉඩ ඇති පරිදි ළමයකු සන්නද්ධ ගැටුමකට සම්බන්ධ කර ගැනීම එයට ඇතුළත් වේ.

"නියෝජ්‍ය සභාපතිවරයා" යන්නෙන්, 8 වන වගන්තිය යටතේ පත් කරන ලද, අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා අදහස්වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, හෝ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන, බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

# 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 ජූනි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ජූනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 23.00 යි. නැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2005 ජුනි මස 13 වන දින]

එල්. ඩී.— ඕ. 3/2005.

**2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතින් හානියට පත් තැනැත්තන් සහ දේපළ සම්බන්ධයෙන් විශේෂ නෛතික විධිවිධාන සැදීමට හැකිවීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ තැනැත්තන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත සහ දේපළවලට ඉමහත් අලාභ සිදු කරමින් 2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් හානියට පත් තැනැත්තන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් පිළිබඳව සහතික වීම සහ එවැනි ආරක්ෂාවක් ලබාදීම රජයේ ජාතික ප්‍රතිපත්තිය වන හෙයින් ද : පූර්විකාව.

සුනාමි විපතින් හානියට පත් තැනැත්තන්ට දැනට බලපවත්නා නීති යටතේ සලකනු ලබන ඇතැම් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ ඇතැම් ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වී ඇති හෙයින් සහ දැනට බලපවත්නා නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් ඇතැම් අවහිරතාවන්ට සහ අවාසි සහගත තත්ත්වයන්ට මුහුණ දී ඇති හෙයින් ද :

සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රමාණවත් දෙමාපිය රැකවරණයක් නොලැබෙන ළමයින් සහ යෞවනයන් විශාල පිරිසක් සිටින බැවින් සහ ඔවුන්ට විකල්ප රැකවරණ සහ ආරක්ෂාව ලබාදීමට වගබලා ගැනීම අවශ්‍ය වන හෙයින් ද :

සුනාමි විපතින් හානියට පත් තැනැත්තන්ට දැනට බලපවත්නා නෛතික අවහිරතාවලින් සහ දැනට පවත්නා නෛතික අවහිරතා ජයගැනීමට හැකිවනු පිණිස සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ රැකගැනීම සහතිකවීම පිණිස ද විශේෂ නෛතික විධිවිධාන සැදීමේ කඩිනම් අවශ්‍යතාවයක් දැනට ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2-P L. 000227 – 4,500 (2005/04)

## I වන කොටස

### මරණ සහතික නිකුත් කිරීම

*2004 දෙසැම්බර් මස 26 වන දින වන විට ඇතැම් ප්‍රදේශවල පදිංචිව සිටි තැනැත්තන් අතුරුදහන් වී ඇති අවස්ථාවල දී.*

**2.** සාක්ෂි ආඥාපනතේ 108 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2004 දෙසැම්බර් මස 26 වන දින වන විට මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ප්‍රදේශයක පදිංචිව සිටි යම් තැනැත්තකු හෝ එම දිනයේ දී එම ප්‍රදේශයේ සිටි බවට හෝ එම ප්‍රදේශය හරහා ගමන් කරමින් සිටි බවට දැනගැනීමට ලැබී ඇති යම් තැනැත්තකු, එම තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහු පිළිබඳව සාමාන්‍යයෙන් දැනගැනීමට ලැබෙන තැනැත්තන්ට එදින සිට මාස හයක් තුළ ඔහු සොයා ගැනීමට නොහැකිව සිටින අවස්ථාවක සහ ඔහු පිළිබඳව දැන ගැනීමට නොහැකිව සිටින අවස්ථාවක සහ ඔහුගේ අතුරුදහන්වීම, සුනාමි විපත නිසා සිදු වූ බවට සැලකිය හැකි අවස්ථාවක, ඔහු ජීවත්ව සිටින බවට ඔප්පු කිරීමේ භාරය එය සහතික කරන තැනැත්තා මත පැවරේ.

*2 වන වගන්තියේ සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් මරණ සහතික ලබාගැනීමේ කාර්ය පටිපාටිය.*

**3**. (1) 2 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා එම තැනැත්තාගේ ළඟම ඥාතියා විසින් හෝ එවැනි ළඟම ඥාතියකු ජීවත්ව නොසිටින අවස්ථාවක, එම තැනැත්තා පිළිබඳව දන්නා වෙනත් යම් තැනැත්තකු විසින්, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඉල්ලුම් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් 2004 දෙසැම්බර් මස 26 වන දින සිට මාස හයක් ඉකුත්වීමෙන් පසුව කවර හෝ අවස්ථාවක දී මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුකූලව කළ යුතු අතර, එම ඉල්ලීම එසේ අතුරුදහන්ව සිටින තැනැත්තා පදිංචිව සිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ග්‍රාම නිලධාරී වෙත එවැනි ඉල්ලීමක් ලැබුණු වහාම ඔහු විසින් තම කාර්යාලයේ දැන්වීමක් ප්‍රදර්ශනය කරමින්, ඉල්ලා ඇති මරණ සහතිකය නිකුත් කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා එම දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දැනුම් දිය යුතු ය. විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව අවසන් වීමේ දී සහ ඔහු විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් සහ එම ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර පොලිස් ස්ථානාධිපතිවරයාගේ වාර්තාව ලබාගැනීමෙන් පසු, ඔහු විසින් එම ඉල්ලීම සහතික කර, එහි සඳහන් සිද්ධිමය කරුණුවල නිරවද්‍යතාව පිළිබඳ සිය වාර්තාව ද සමග එය තම ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එවැනි සෑම ඉල්ලීමක්ම පිටසන් කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඒවා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව යථා පරිදි සත්‍යායනය කරන ලද සහ පිටසන් කරන ලද ඉල්ලීමක් ලැබීමේ දී (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයකු විසින් එම ඉදිරිපත් කරන ලද ලේඛන සම්බන්ධයෙන් සෑහීමට පත් වීමෙන් පසු, ඔහු විසින් පවත්වාගෙන යනු ලබන මරණ පිළිබඳ නාම ලේඛනයේ එම ඉල්ලීමේ සඳහන් තොරතුරු ලියාපදිංචි කරන ලෙස සහ එම තැනැත්තා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරන ලෙස අදාළ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් කළ යුතු අතර, එම අදාළ රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම එම තොරතුරු එම නාම ලේඛනයේ සටහන් කොට, එම නාම ලේඛනයේ උචිත ස්ථානයෙහි අත්සන් තැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද නියමය අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ දෙවන පිටපතට අමුණනු ලැබිය යුතු අතර, එම දෙවන පිටපත සහ නියමය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ භාරයේ තැබීම පිණිස ඔහුගේ කාර්යාලය වෙත යැවීම සඳහා, රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

3 වන වගන්තිය යටතේ මරණ සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු ජීවත්ව සිටින බවට තොරතුරු ලැබෙන අවස්ථාවක දී.

**4.** (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව යම් මරණයක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, සහ ඉන්පසු කවර හෝ අවස්ථාවක දී මරණය ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා ජීවත්ව සිටින බවට යම් තැනැත්තකුට දැනගැනීමට ලැබෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් වහාම එම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාලවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) එවැනි තොරතුරක් ලැබුණු විට රෙජිස්ට්‍රාර්ජනරාල්වරයා විසින් එම තොරතුර අදාළ පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර, එම තොරතුරු තමා වෙත ලැබුණු දින සිට සති හතරක් ඇතුළත ඔහු විසින් එම තොරතුරේ සත්‍යතාව පිළිබඳ විමර්ශනය කර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු පසු සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු මරණය ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා ජීවත්ව සිටින බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් වාර්තාව නිවැරදි කිරීම සඳහා අවස්ථානුගත කරුණුවලට උචිත පරිදි (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කිරීම හෝ නියමයක් කිරීම හෝ විධානයක් දීම කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක් එය ආරම්භ කර එක් මාසයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු අතර, එම පරීක්ෂණයේ කාර්ය සඳහා, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට අදාළව ඔහු විසින් එම පනත යටතේ ක්‍රියාත්මක කළ හැකි සියලු බලතල, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

වැරදි.

5. (අ) 3 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන ;

(ආ) 3 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව මරණය ලියාපදිංචි කරනු ලැබ ඇති යම් තැනැත්තකු ජීවත්ව සිටින බවට දැන ගැනීමට ලැබී, එම තොරතුර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම පැහැර හරින ; හෝ

(ඇ) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද මරණ සහතිකයක නම සඳහන් තැනැත්තකු ජීවත්ව සිටින බව දැන දැනම හෝ එසේ ජීවත්ව සිටින බවට විශ්වාස කිරීමට හේතු ඇතිව, එම සහතිකය වංක ලෙස හෝ වංචනික ලෙස ප්‍රයෝජනයට ගන්නා,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකට පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ මේ කොටසෙහි –

"අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" "අදාළ රෙජිස්ට්‍රාර්වරයා" සහ "දිස්ත්‍රික්" යන යෙදුම්වලට (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ ඒවාට ලබා දී ඇති අර්ථයම ඇත්තේ ය;

"දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ ; සහ

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වන අතර, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ද ඊට ඇතුළත් වේ.

II වන කොටස

**ළමයින් සහ යෞවනයන්ගේ භාරකාරත්වය**

7. 2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් – *පනතේ විධිවිධාන අදාළ කර ගැනීම.*

(අ) දෙමාපියන් අහිමි වූ සෑම ළමයකුටම සහ යෞවනයකුටම ;

(ආ) දෙමාපිය දෙදෙනාගෙන් එක්කෙනකු අහිමි වූ සහ ජීවත්ව සිටින මවට හෝ පියාට රැකබලා ගැනීමට හැකියාවක් නොමැති සෑම ළමයකුටම ; සහ

(ඇ) දෙමාපිය දෙදෙනාගෙන් එක්කෙනකු අහිමි වූ සහ රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය එහෙත් ඒ රැකවරණය සහ ආරක්ෂාව සැපයීමට ජීවත්ව සිටින මව හෝ පියාට හැකියාවක් නොමැති සෑම යෞවනයකුටම,

මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ වන්නේ ය.

8. (1) 11 වන වගන්තිය යටතේ, අනාථයකු බවට පත් වූ සෑම ළමයකුටම සහ මේ පනතේ කැපකරු මාපිය රැකවරණය යටතේ තැබීමට මනාප සෑම ළමයකු සහ යෞවනයකුටම අදාළ තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක පනත යටතේ පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය. *අධිකාරිය විසින් රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු බව.*

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයේ නිවැරදි තොරතුරු අන්තර්ගතව තිබෙන බවට සහතික වීමේ කාර්ය සඳහා, එම රෙජිස්ටරයේ තොරතුරු වාර්තාගත කර ඇති ළමයින් සහ යෞවනයන් පිළිබඳව අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණයක් පැවැත්වීම අධිකාරිය විසින් කරනු ලැබිය යුතු ය.

වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වීම.

**9**. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ දී මේ පනතේ 7 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් ළමයකුගේ භාරකාරත්වය ඇති සෑම තැනැත්තකුම, එම තැනැත්තා –

(අ) ළමයාගේ දෙමාපියන් වන්නේ නම් මිස ; හෝ

(ආ) 2004 දෙසැම්බර් මස 26 වන දිනට පසු යම් නීතියක් යටතේ ළමයාගේ භාරකාරත්වය ප්‍රදානය කරනු ලැබ ඇත්නම් මිස, හෝ ළමයාගේ රැකවරණය භාර දී ඇත්නම් මිස,

එම තැනැත්තා විසින් වහාම සහ කවර ආකාරයෙන් හෝ මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින සිට එක් මාසයක් ඇතුළත, එම ළමයාගේ වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වීමේ කාර්ය සඳහා, මේ පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව ඉල්ලීමක් (මෙහි මින්මතු "කොමසාරිස්වරයා" ලෙස හඳුන්වනු ලබන) පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලීමක් භාර ගෙන, එය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමේ බලය, අවශ්‍ය අවස්ථාවන්හි දී කොමසාරිස්වරයා විසින් ළමයා දැනට පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත සාධාරණ හේතුවක් නොමැතිව, ලියාපදිංචිවීම පැහැර හරින, (1) වන උපවගන්තියේ සඳහන් ළමයකුගේ භාරය ඇති සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී අවුරුදු දෙකකට නොඅඩු කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට වූ බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි ලියාපදිංචි වීම පැහැර හරින තැනැත්තකුගේ භාරයේ සිටින ළමයකු, එම ළමයාගේ උපරිම සුභසිද්ධිය උදෙසා මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන ආඥාවක් මත එම ළමයා කොමසාරිස්වරයා විසින් වහාම එම තැනැත්තාගේ භාරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම වර්තමාන භාරකරුවන්ට අදාළව ලබාගත හැකි සියලු තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු අතර තොරතුරුවල පිටපතක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන සුනාමි විපතින් හානියට පත් ළමයින්ට රැකවරණය ලබාදෙන සෑම ආයතනයක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

වර්තමාන භාරකරුගේ කාර්යභාරය.

**10**. (1) සෑම වර්තමාන භාරකරුවකු යම් ළමයකුගේ වර්තමාන භාරකරුවකු ලෙස සිටින තාක් කල්, ඔහු හෝ ඇයගේ රැකවරණයේ සිටින ළමයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් ඇතුළු සියලුම රැකවරණ සහ ආරක්ෂාව ලබාදීම ඔහු හෝ ඇයගේ කාර්ය විය යුතු ය.

(2) වර්තමාන භාරකරුවකු වශයෙන් සිටින යම් පුද්ගලයකුගේ රැකවරණයේ සිටින ළමයකු හට කැපකරු මාපියකු වීමට එම පුද්ගලයා කැමති වන්නේ නම්, ඒ කාර්යය සඳහා මේ පනතේ 13 වන වගන්තිය යටතේ ඉල්ලීමක්, එම පුද්ගලයා ළමයාගේ වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වී මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

කැපකරු මාපිය රැකවරණයට මනාප බව අධිකාරියට දැනුම් දීම.

11. (1) 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ළමයකු කැපකරු මාපිය රැකවරණය යටතේ තැබීමට මනාප, එම ළමයාගේ මාපියකු විසින් මෙම පනත ක්‍රියාත්මක වී මාස හයක් ඇතුළත ඒ පිළිබඳව අධිකාරියට දැනුම් දීම ඔහුගේ හෝ ඇයගේ කාර්යය විය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණය යටතට පත්වීමට මනාප වන්නා වූ 7 වන වගන්තියේ (අ) හෝ (ඇ) ඡේදයේ සඳහන් යෞවනයකු විසින් මෙම පනත ක්‍රියාත්මක වී මාස හයක් ඇතුළත, ඒ පිළිබඳව අධිකාරියට දැනුම් දිය හැකි ය.

අධිකාරිය භාරකරු විය යුතු බව.

12. (1) මාපියන් විසින් කැපකරු මාපිය රැකවරණ යටතේ තැබූ සෑම ළමයකුම සහ අනාථ දරුවකු බවට පත්ව ඇති සෑම ළමයකුම, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී යම් තැනැත්තකුගේ භාරකාරත්වය යටතේ එම ළමයා සිටිය ද, නැතහොත් එසේ නොසිටිය ද අධිකරණයේ පරම භාරකාරත්වයට යටත්ව, අධිකාරිය එවැනි සෑම ළමයකුගේ ම භාරකරු වන්නේ ය.

(2) කවර හෝ හේතුවක් නිසා කැපකරු මාපිය රැකවරණය යටතේ නොසිටින සෑම ළමයකුටම හෝ කැපකරු මාපිය රැකවරණය ලැබීම නැවතී ඇති සෑම ළමයකුටම, අධ්‍යාපනය ලබාදීම ඇතුළු ප්‍රමාණවත් රැකවරණය, භාරකාරත්වය සහ ආරක්ෂාව සලසන බවට ද, එම ළමයාට විඳීමට සිදු වූ චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන ඔහුට අවශ්‍ය වන යම් විශේෂ රැකවරණයක් ලබාදෙන බවට ද සහතික වීම, අධිකාරියේ කාර්යය විය යුතු අතර, එම ළමයාට සුදුසු කැපකරු මාපියකු සොයා දීමට අධිකාරිය සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

කැපකරු මාපියකු වීම සඳහා ඉල්ලීම.

13. (1) මේ පනතේ 7 වන වගන්තියේ සඳහන් ළමයකුගේ හෝ යෞවනයකුගේ කැපකරු මාපියකු වීමට කැමති වන්නා වූ ද, ඒ ළමයාගේ වර්තමාන භාරකරු වශයෙන් සිටින පුද්ගලයා ඇතුළුව යම් තැනැත්තකු විසින්, එම තැනැත්තා පදිංචි අධිකරණ බල ප්‍රදේශයේ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණය වෙත කැපකරු මාපිය රැකවරණ නියෝගයක් නිකුත් කිරීම සඳහා, මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආකාරයට, ඉල්ලීමක් කළ යුතු ය. පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් තොරතුරු සමග ඉල්ලීමේ පිටපතක්, අධිකාරිය වෙත යැවිය යුතු ය.

(2) මහේස්ත්‍රාත් අධිකරණය විසින්, මේ පනතේ 15 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ නිර්දේශය ලැබෙන තෙක්, (1) වන උපවගන්තිය යටතේ ලැබුණු කිසිම ඉල්ලීමක් මත නියෝගයක් නොකළ යුතු ය.

අධිකාරිය විසින් ඉල්ලීම කැපකරු මාපිය රැකවරණ අගැයීම් මණ්ඩලය වෙත යොමු කිරීම.

**14.** (1) 13 වන වගන්තිය යටතේ ඉල්ලීමක පිටපතක් ලැබීමේ දී, ඉල්ලුම්කරුට කැපකරු මාපියකු වීමට ඇති යෝග්‍යතාව අගැයීමේ කාර්යය සඳහා, කැපකරු මාපිය නියෝගයක් සඳහා එම ඉල්ලීම ඉදිරිපත් කළ තැනැත්තා පදිංචි පළාතේ (මෙම පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කැපකරු මාපිය රැකවරණ මණ්ඩලය වෙත, එම ඉල්ලීම, අධිකාරියේ සභාපතිවරයා විසින් යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අධිකාරියේ සභාපතිවරයා, හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු ;

(ආ) ශ්‍රී ලංකා ළමා රෝග වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන තැනැත්තකු ;

(ඇ) අදාළ පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු;

(ඈ) අධිකාරිය විසින් නම් කරනු ලබන මනෝ විද්‍යාඥයකු ;

(ඉ) අධිකාරිය විසින් නම් කරනු ලබන මනෝ වෛද්‍යවරයෙක් ;

(ඊ) අදාළ පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු ; සහ

(උ) අදාළ පළාතේ, පළාත්බද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු.

(3) මේ පනතේ මේ කොටස යටතේ මණ්ඩලය වෙත පවරනු ලබන කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වනතාක් කල් මණ්ඩලය කටයුතු කළ යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් විසින් එම සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස තෝරා පත්කරගත යුතු අතර, එම සාමාජිකයන් විසින් මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද තීරණය කරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය.

(5) කැපකරු මාපියකු වීමට යම් ඉල්ලුම්කරුවකුට ඇති යෝග්‍යතාව අගැයීමේ දී ප්‍රධානතම වශයෙන් සැලකිල්ල දැක්විය යුත්තේ ළමයාගේ උපරිම සුභ සිද්ධිය වන අතර, එම කාර්යය සඳහා මණ්ඩලය විසින් මේ පනතේ හයවන උපලේඛනයේ සඳහන් මාර්ගෝපදේශයන් යොදා ගත යුතු ය. මණ්ඩලය විසින් මේ පනතේ හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් තනතුරක් දරන තැනැත්තකුගෙන් පරිසර අධ්‍යයන වාර්තාවක් ලබාගත යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "පරිසර අධ්‍යයන වාර්තාවක්" යන්නෙන් ඉල්ලුම්කරුවන්ගේ මානසික ස්වස්ථය, ඔවුන්ගේ සාමාජීය, ආගමික සහ ආර්ථික පසුබිම පිළිබඳව සහ කැපකරු මව්පියකුවීම සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව පිළිබඳ වාර්තාවක් අදහස් වේ.

15. (1) අධිකාරියේ ඉල්ලීමක් ලැබී සති දෙකක් ඇතුළත මණ්ඩලය විසින්, එම ඉල්ලීම අගැයීමෙන් පසු තම නිර්දේශය අධිකාරියේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධිකාරියේ සභාපතිවරයා විසින් එම නිර්දේශය මේ පනතේ 13 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි ළමයාට හෝ යෞවනයාට ආදාළව ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ මහේස්ත්‍රාත් අධිකරණය වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව.

(2) ඉල්ලුම්කරුගේ වාසියට කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කරනු ලැබුවහොත්, සමීක්ෂණ නිලධරයකු වශයෙන් මේ පනතේ 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය ඉටු කිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තා අධිකාරිය විසින් ධුරයෙන් සහ නමින් හැඳින්වීම, (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් නිර්දේශ ඉදිරිපත් කරන විට දී කළ යුතු ය. අධිකාරිය විසින් සමීක්ෂණ නිලධරයා වශයෙන් තෝරාගනු ලබන තැනැත්තා මේ පනතේ හත්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ධුර දරන තැනැත්තන් අතුරින් තෝරා ගනු ලැබිය යුතු ය.

16. (1) අධිකාරියේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ නිර්දේශ ලැබීමෙන් පසු සහ කැපකරු මාපියකු වීමට ඉල්ලුම්කරුගේ යෝග්‍යතාව පිළිබඳව මණ්ඩලය නිර්දේශ කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ළමයා වයස අවුරුදු දහයට වැඩි නම්, එම ළමයාගේ නැතහොත් යෞවනයාගේ කැමැත්ත ඇතිව, මහේස්ත්‍රාත් කැපකරු මාපිය රැකවරණ ආඥාව.

අධිකරණය විසින්, ඉල්ලීමේ කැපකරු මාපියකු හෝ මාපියන් වශයෙන් නම් කරනු ලැබ ඇති තැනැත්තා හෝ තැනැත්තන්, පත්කරමින් කැපකරු මාපිය රැකරවරණ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය. නිකුත් කරනු ලබන කැපකරු මාපිය රැකවරණ ආඥාව මේ පනතේ අටවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු අතර එය එම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණ ආඥාව නිකුත් කිරීමේ දී 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් හඳුන්වා ඇති තැනැත්තා අධිකරණය විසින් සමීක්ෂණ නිලධරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු අතර, කැපකරු මාපිය රැකවරණ ආඥාව නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා හෝ යෞවනයා සම්බන්ධයෙන් මේ පනතේ 18 වන වගන්තියේ සඳහන් කර්තව්‍ය එම සමීක්ෂණ නිලධරයා විසින් ඉටුකළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කැපකරු මාපිය රැකවරණ ආඥාවක්,–

(අ) ළමයකු සම්බන්ධයෙන් වන විට, එක් අවුරුද්දක කාලයක් ගතවීමට පෙර එම ළමයා වයස අවුරුදු දහඅටට එළඹුන ද, නිකුත් කිරීමේ දින සිට එක් අවුරුදු කාලයක් සඳහා එම ආඥාව වලංගුව පැවතිය යුතු ය ; හෝ

(ආ) යෞවනයකු සම්බන්ධයෙන් වන විට, එම ආඥාව එම යෞවනයා වයස අවුරුදු විසි එකට එළඹෙන තුරු හෝ එම කැපකරු මාපිය රැකවරණ ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් වයසක් එළඹෙන තුරු, වලංගුව පැවතිය යුතු ය.

(4) ළමයකු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන කැපකරු මාපිය රැකවරණ ආඥාවක් එක් අවුරුදු කාලසීමාවක් ඉකුත්වීමට පෙර තත් කාර්ය සඳහා ආඥාව කරන ලද මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ළමයා වයස අවුරුදු විසිඑකට එළඹෙන තුරු, එක් වරකට එක් වර්ෂය බැගින් තවදුරටත් වූ කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කිරීම නොතකා ළමයා වයස අවුරුදු දහඅටට එළඹෙන තුරු අධිකාරිය කැපකරු ළමයකුගේ භාරකරු වශයෙන් දිගටම කටයුතු කළ යුතු ය.

*කැපකරු මාපියකුගේ කාර්ය භාරය.*

17. යම් කැපකරු මාපියකු ළමයකුගේ හෝ යෞවනයකුගේ ස්වභාවික මාපියකු ලෙස සලකා, එම ළමයාට හෝ යෞවනයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් සැලසීම සහ එම ළමයාට හෝ යෞවනයාට සිදු වූ බලවත් චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන ඔහුට අවශ්‍ය විය හැකි යම් විශේෂ රැකවරණයක් ලබාදීම ඇතුළුව එම ළමයාට හෝ යෞවනයාට රැකවරණය සහ ආරක්ෂාව ලබා දීම ද, සියලු පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ වෙනත් සියලු වගකීම් ඉටු කිරීම ද, සෑම කැපකරු මාපියකුගේම කාර්ය භාරය විය යුතු ය.

*කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් ද, එම ළමයා හෝ යෞවනයා සම්බන්ධයෙන් සමීක්ෂණ නිලධරයකුට ඇති කාර්යභාරය.*

18. (1) මේ පනතේ 16 වන වගන්තිය යටතේ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක කැපකරු මාපියන් වෙත පනවනු ලැබ ඇති කාර්ය සහ වගකීම ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමීක්ෂණය කිරීම, සහ මේ පනතේ නවවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව සෑම මාස තුනකට වරක්ම අධිකාරිය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම, එම වගන්තියෙහි (2) වන උපවගන්තිය යටතේ සමීක්ෂණ නිලධරයා ලෙස පත් කරනු ලැබූ තැනැත්තාගේ කාර්ය වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත එවන ලද වාර්තාවේ පිටපත මණ්ඩලය විසින් අගැයීම සහ සලකා බැලීම සඳහා අධිකාරියේ සභාපතිවරයා විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, වාර්තාව අගැයීම පිළිබඳ මණ්ඩලයේ මත ප්‍රකාශය, එම වාර්තාව ලැබී සතියක් ඇතුළත මණ්ඩලය විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

*යම් පරිශ්‍ර ආදියට ඇතුළු වීමට සමීක්ෂණ නිලධරයාට අයිතියක් ඇති බව.*

19. (1) 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තම කාර්ය ඉටුකිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි ළමයා හෝ යෞවනයා තත් කාලයේ පදිංචිව සිටින පරිශ්‍රයකට කවර හෝ අවස්ථාවක දී ඇතුළු වී එය පරීක්ෂා කිරීමට සහ සමීක්ෂණ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීමට, එම නිලධරයාට බලය ඇත්තේ ය.

(2) තම කාර්ය ඉටුකිරීමේ දී, යම් සමීක්ෂණ නිලධරයකුට බාධා කරන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් වන්නේ ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සමීක්ෂණ නිලධරයකුට බාධා කරමින් වරදකරු වූ තැනැත්තා ළමයාගේ හෝ යෞවනයාගේ කැපකරු මාපියන් වන අවස්ථාවක, ඒ උපවගන්තිය මගින් පනවනු ලබන

දණ්ඩනයට අමතරව, එම කැපකරු මාපියන් හට නිකුත් කරන ලද කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය ඇත්තේ ය.

*කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම.*

**20.** (1) මණ්ඩලයේ මත ප්‍රකාශය ලැබීමෙන් අනතුරුව, ලබාදෙන රැකවරණය සහ ආරක්ෂාව ද, කැපකරු මාපියන් වෙත ලබා දී ඇති පාලනය ක්‍රියාත්මක වීම සහ කාර්ය සහ වගකීම් ඉටුකිරීම අදාළ ළමයාගේ හෝ යොවනයාගේ සුභසිද්ධිය පිණිස නොවන බව අධිකාරියේ මතය වන අවස්ථාවක, කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිණිස අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමක් මත එම ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අධිකරණයට හැකි අතර අදාළ ළමයා හෝ යොවනයා එම කැපකරු මාපියන්ගේ භාරයෙන් ඉවත් කොට අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන විකල්ප රැකවරණයක් ලබාදෙන ලෙස පරීක්ෂණ නිලධරයාට විධාන කිරීම ද අධිකරණයට කළ හැකි ය. කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම මේ පනතේ දහ වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය අනුව සිදු කළ යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, එය ප්‍රත්‍යාදිෂ්ට කළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත වෙනත් තැනැත්තකුගෙන් කැපකරු මාපිය රැකවරණය සඳහා ඉල්ලීමක් ලැබීමේ දී එම අධිකරණය විසින් අලුත් කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීම සම්බන්ධයෙන් 13 වන වගන්තියේ සිට 19 වන වගන්තිය දක්වා වූ විධිවිධාන අදාළ විය යුතු ය.

*ළමයකු කැපකරු මාපිය රැකවරණය යටතේ ඇත්නම් මිස, ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදාගැනීම සඳහා ආඥාවක් නිකුත් නොකළ යුතු බව.*

**21.** මේ පනතේ 7 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් ළමයකු, මේ පනතේ 16 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් යටතේ වූ කැපකරු මාපිය රැකවරණයක පළමුවෙන් තබා ඇත්නම් මිස, සහ එසේ තබනතුරු ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත (61 වන අධිකාරය) යටතේ එවැනි ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් කිසිම අධිකරණයක් විසින් භාර නොගත යුතු ය.

*කැපකරු මාපිය රැකවරණ යටතේ සිටින ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම.*

**22.** (1) කැපකරු මාපියකු ඇතුළු යම් තැනැත්තකු ළමයකු දරුකමට හදාගැනීමට කැමතිව සිටින අවස්ථාවක, එම තැනැත්තා විසින් එම ළමයා දැනට පදිංචිව සිටින ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ තත් කාර්ය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර, අධිකරණය විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව, එම දරුකමට හදාගැනීම සඳහා බලය පවරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කිරීමේ දින සිට එක් අවුරුදු කාලයක් ගතවනතුරු, කිසිම දරුකමට හදාගැනීමේ ආඥාවක් බලාත්මක නොවිය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණය මත ළමයකු තබනු ලැබූ දින සිට මාස නවයක කාලයක් ගතවීමෙන් පසු කවර හෝ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ළමයකු, දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) යම් ළමයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම් එකකට වැඩි ප්‍රමාණයක් ඇති අවස්ථාවක, ළමයාගේ සුභසිද්ධිය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන ආඥාවක් ඊට කරනු ලැබිය හැකි ය.

(4) දිසා අධිකරණයක් විසින් ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී එම ළමයා සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවතින කැපකරු මාපිය රැකවරණ ආඥාව අලුත් කර ගැනීම සඳහා වූ ආඥාවක් වහාම නතර වන බවට සලකනු ලැබිය යුතු ය.

**23.** (1) මේ පනතේ මේ කොටස යටතේ වූ දරුකමට හදාගැනීමක් සම්බන්ධයෙන් ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය ; එසේ වුව ද, වයස අවුරුදු දහයට අඩු ළමයකු සම්බන්ධයෙන් වන විට අධිකාරියේ කැමැත්ත නොමැතිව දරුකමට හදා ගැනීමේ කිසිදු ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු බව

(2) ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත්වීමේ දී, දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ අදාළ ළමයාගේ කැපකරු මාපියන් විසින් වන අවස්ථාවක දී, කැපකරු මාපිය රැකවරණ කාලය තුළ දී එම ළමයාට අදාළව සමීක්ෂණ නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

**24.** (1) 22 වන වගන්තිය යටතේ දරුකමට හදාගැනීම සඳහා වූ ආඥාවක් කරනු ලැබ ඇත්තේ, යම් ළමයකු සම්බන්ධයෙන් ද එම ළමයාට උප්පැන්න සහතිකයක් නොමැති අවස්ථාවක, එම ළමයාගේ උපන් දිනය දැනගැනීමට හැකි අවස්ථාව, එම උපන් දිනය අධිකරණය විසින් ඒ ආඥාවේ සඳහන් කළයුතු අතර, එම ළමයාගේ උපන් දිනය නොදන්නා අවස්ථාවක, එම ළමයාගේ අනුමාන උපන් දිනය බවට වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද සහතිකයක සඳහන් දිනය එම ළමයාගේ උපන් දිනය වශයෙන්, අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

උප්පැන්න සහතික නිකුත් කිරීම.

(2) දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් අධිකරණය විසින් ස්වකීය ආඥාව කිරීමෙන් පසු, අදාළ ළමයා සන්තකයෙහි උප්පැන්න සහතිකයක් නොමැති අවස්ථාවක, ළමයා හට උප්පැන්න සහතිකය වහාම නිකුත් කරන ලෙස අධිකරණය විසින් උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත විධාන කළ යුතු ය.

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු බව.

**25**. මේ පනත යටතේ කරනු ලබන දරුකමට හදාගැනීමේ ආඥාවක්, ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා එම ආඥාපනත යටතේ කරන ලද දරුකමට හදාගැනීමේ ආඥාවක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එම ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම ආඥාවට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත නොතකා අධිකාරිය ක්‍රියා කළ යුතු බව.

**26.** 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ එම අධිකාරිය වෙත පවරනු ලැබ ඇති කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට අධිකාරියට බලය ඇත්තේ ය.

අර්ථ නිරූපණය.

**27.** මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පද සම්බන්ධයෙන් අනාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන් (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ ; සහ

"යෞවනයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට එළඹ ඇති එහෙත් වයස අවුරුදු විසිඑකකට අඩු තැනැත්තකු අදහස් වේ.

III වන කොටස

## කාලවරෝධිවීම

**28.** (1) සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකුගේ දේපළවල සන්තකය පවත්වාගෙන යාම වළක්වාලනු ලැබූ විට, 2004 දෙසැම්බර් මස 26 වන දින සිට එක් අවුරුද්දක කාලයකට 2004 දෙසැම්බර් මස 26 වන දිනට පෙර ආරම්භ වූ සුනාමි විපතෙන් හානියට පත් තැනැත්තකුගේ නිශ්චල දේපළවල ප්‍රතිකූල සන්තකයට බාධා වූවක් ලෙස නොසැලකිය යුතු ය.

*ප්‍රතිකූල සන්තකයට බාධාවක් නොවන බවට සැලකිය යුතු බව.*

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ නිශ්චල දේපළවල සන්තකය, 2004 දෙසැම්බර් මස 26 වන දින සිට 2005 දෙසැම්බර් මස 26 වන දින දක්වා වූ කාලය තුළ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් විසින් දරනු ලැබීමේ හේතුව නිසාම පමණක්, (1) වන උපවගන්තියේ සඳහන් එම තැනැත්තාගේ නිශ්චල දේපළෙහි සන්තකයට බාධාවක් ඇති වූවා සේ සලකනු නොලැබිය යුතු ය.

**29.** යම් ලිඛිත නීතියක් මගින් යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක යම් නඩුවක්, අභියාචනයක් හෝ ඉල්ලීමක් පැවරීමට හෝ ගොනු කිරීමට නියම කරනු ලැබ ඇති කාලසීමාව ගණන් බැලීමේ දී හෝ යම් ලිඛිත නීතියක් මගින් නියමිත කාලයක් තුළ යම් ක්‍රියාවක් කළ යුතු බවට නියම කර ඇති අවස්ථාවක, එම නඩුව පැවරීමට හෝ ගොනු කිරීමට නැතහොත් නියමිත කාලයක් තුළ එම විශේෂිත ක්‍රියාව සිදුකිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තා සුනාමි විපතින් හානියට පත් තැනැත්තෙක් නම් සහ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් එම තැනැත්තාට එම පියවර ගැනීමට නොහැකි වූයේ නම්, 2004 දෙසැම්බර් මස 26 වන දිනයෙන් ආරම්භ වී 2005 දෙසැම්බර් මස 26 වන දිනයෙන් අවසන් වන කාලසීමාව අත්හරිනු ලැබිය යුතු ය.

*ඇතැම් නඩු ආදිය පැවරීම සඳහා නියම කරන ලද කාලය ගණන් බැලීමේ දී ඇතැම් කාලසීමාවන් අත්හැරීම.*

IV වන කොටස

## ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ ඇති නඩු

**30.** (1) 2004 දෙසැම්බර් මස 26 වන දින සිට 2005 දෙසැම්බර් මස 26 වන දින දක්වා වූ කාලසීමාව තුළ කවර හෝ අවස්ථාවක 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ සුනාමි විපතින් හානියට පත් ප්‍රදේශයක පිහිටි ඉඩමකට අදාළ තොරතුරු ගොනු කරනු ලැබ, ඉඩමේ සන්තකය හිමිවිය යුත්තේ කවර

*සුනාමි විපතින් හානියට පත් ඉඩම්වල සන්තකය.*

තැනැත්තකුට ද යන්න තීරණය කිරීම සඳහා එම අධිකරණය විසින් විභාගයක් පවත්වනු ලබන අවස්ථාවක, එම පනතේ 68 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2004 දෙසැම්බර් මස 26 වන දින ඉඩමේ සන්තකය දරමින් සිටි තැනැත්තා හෝ එම තැනැත්තා මියගොස් හෝ අතුරුදහන් වී ඇති අවස්ථාවක, එම තැනැත්තා සමග එම ඉඩමේ සන්තකය දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන් එම ඉඩමේ සන්තකය දරමින් සිටි තැනැත්තා හෝ තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු අතර එම ඉඩමේ සන්තකය දැරීමට එම තැනැත්තාට හෝ තැනැත්තන්ට හිමිකම් ඇති බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ඉඩමක සන්තකය දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන්, එම උපවගන්තිය යටතේ එම ඉඩමේ සන්තකය දරමින් සිටි බවට සලකනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් විසින් 2004 දෙසැම්බර් මස 26 වන දිනට පෙර මාස දෙකක කාලයක් ඇතුළත කවර හෝ අවස්ථාවක බලහත්කාරයෙන් සන්තකයෙන් නෙරපනු ලැබ ඇති අවස්ථාවක, එසේ සන්තකයෙන් නෙරපනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට එම ඉඩමේ සන්තකය නැවත ලබාදෙන ලෙස විනිශ්චයකාරවරයා විසින් විධාන කළ යුතු අතර නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක අධිකාරය යටතේ මිස, එම සන්තකයට බාධා කිරීම තහනම් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## පරිශ්‍රවල කුලී නිවැසියන්

*කුලී නිවැසියන්ගේ හෝ බදු හිමියන්ගේ අයිතීන් තහනම් නොකිරීම.*

**31.** යම් තැනැත්තකු 2004 දෙසැම්බර් මස 26 වන දින, සුනාමි විපතින් හානියට පත් පරිශ්‍රවල හෝ ඉඩමක කුලී නිවැසියන්ව හෝ බදුහිමියන්ව සිටිය විට, කුලියේ හෝ බද්දේ විෂය වස්තුව විනාශ වූ පමණින්ම හෝ සිටීමට හෝ සන්තකයට නුසුදුසු වූ පමණින්ම, ඔහුගේ කුලී නිවැසියාව හෝ බදු අයිතිය තහනම් නොවේ.

## VI වන කොටස

### සුනාමි සහනාධාර දේපළ සම්බන්ධයෙන් වූ වැරදි

**32.** සුනාමි සහනාධාර වශයෙන් අදහස් කරන ලද මුදල් ඇතුළු යම් චංචල දේපළකට අදාළව දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව, සාපරාධී වංචනය, සාපරාධී විශ්වාස භංගය කඩකිරීම, සොරකම, ප්‍රාසද්ග්‍රහණය, කොල්ලකෑම, වංචා කිරීම සහ සොරකම් කරන ලද දේපළ තබාගැනීම යන වැරදි සිදු කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී එම තැනැත්තා එසේ වරදකරු කරනු ලැබීමේ දී දණ්ඩ නීති සංග්‍රහය යටතේ එම වරද සඳහා පනවනු ලැබිය හැකි දඬුවම මෙන් දෙගුණයකට සමාන දඬුවමකට ඔහු යටත් විය යුතු ය.

සුනාමි සහනාධාර දේපළවලට අදාළව සිදු කරනු ලබන දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ ඇතැම් වැරදි සඳහා දණ්ඩන.

**33.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පළමුවන උපලේඛනය [2 වන වගන්තිය]

පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, එනම් :—

1. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ, තිඹිරිගස්යාය, දෙහිවල, මොරටුව සහ රත්මලාන.
2. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීගමුව සහ වත්තල.
3. කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ පානදුර, කළුතර සහ බේරුවල.
4. ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෙන්තොට, බලපිටිය, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාලු කඩවත් සතර සහ හබරාදූව.
5. මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැලිගම, මාතර කඩවත් සතර, දෙවිනුවර සහ දික්වැල්ල.
6. හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමය, හම්බන්තොට, අම්බලන්තොට සහ තංගල්ල.
7. යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ උතුරු දූපත (කයිට්ස්), කරවෙඩ්ඩි, පේදුරු තුඩුව, වාඩමාරච්චි, කරෙයිනගර්, මරුතන්කනි, තෙලිප්පලෙයි, සහ වෙල්ලිප්පෝ... 

9. කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කයේ කන්ඩවලෙයි සහ පූනක්කාරි.

10. මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ මැද කෝරළේ පත්තුව, වෙන්කලාඩි, වාලච්චිනෙයි, කලවන්චිකුඩි, එරාවූර් නගරය, උතුරු මන්මුනෙයි, වකාරන්, කාත්තන්කුඩි, අරියම්පති, කිරාන්, වෙල්ලවෙලි, පදිපලෙයි, වව්නාතිව් සහ ඔට්ටමාවඩි.

11. අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ කල්මුනේ, සයින්තමරාතු, කාරතිව්, නින්තවූර්, අඩලාච්චනෙයි, අක්කරයි පත්තු, අලයාඩිවෙම්බු, තිරුක්කෝවිල්, පොතුවිල් සහ ලාහුගල.

12. ත්‍රිකුණාමල පරිපාලන දිස්ත්‍රික්කයේ කුච්චවේලි, ත්‍රිකුණාමල නගරය සහ කඩවත්, තම්පලාගමුව, කින්යා, මුත්තූර්, සේරුවිල, වෙරුගල්/එච්චිලම්පත්ති.

13. පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව.

දෙවන උපලේඛනය [3 (2) වන වගන්තිය]

ග්‍රාම නිලධාරී වෙත,

අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම :—
2. ස්ත්‍රීපුරුෂ භාවය :—
3. ජාතිය :—
4. වයස :—
5. මියගිය දිනය :—
6. අවසන්වරට පදිංචි ස්ථානයේ ලිපිනය :—
7. ස්ථිර වාසස්ථානයේ ලිපිනය :—
8. තිලය හෝ රැකියාව :—
9. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :—
10. ඉල්ලුම්කරුගේ පදිංචි ස්ථානය සහ දුරකථන අංකය :—
11. ඉල්ලුම්කරුගේ වෘත්තිය/රැකියාව :—
12. ඉල්ලුම්කරුගේ සේවාස්ථානය සහ දුරකථන අංකය :—
13. ඉල්ලුම්කරු, අතුරුදහන් වූ තැනැත්තාට ඇති සම්බන්ධය :—

....................පදිංචි....................වන මා විසින්..................(අතුරුදහන් වූ තැනැත්තාගේ නම) යන අය මාසහයකට වඩා වැඩි කාලයක සිට අතුරුදහන්ව ඇති බව සහ එකී..............යන අය සුනාමි විපත හේතුවෙන් මියගොස් ඇති බවට සැබැවින්ම විශ්වාස කරන බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

එම නිසා මා විසින් එකී මරණය, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අතර එකී මරණය පිළිබඳව මරණ සහතිකය මා වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

දිනය : ඉල්ලුම්කරුගේ අත්සන

තුන්වන උපලේඛනය [9 (1) වන වගන්තිය]

පරිවාස හා ළමා ආරක්ෂක කොමසාරිස් වෙත.

**ළමයකුගේ වර්තමාන භාරකරු වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉල්ලීම**

ඉල්ලුම්කරුගේ විස්තර

1. නම :—
2. ලිපිනය :—
3. උපන් දිනය :—
4. ස්ත්‍රී පුරුෂ භාවය :—
5. හැඳුනුම්පත් අංකය :—
6. ආගම :—
7. වෛවාහක තත්වය :—
8. විවාහක නම් කලත්‍රයාගේ නම :—
9. වෘත්තිය/රැකියාව :—
10. ඉල්ලුම්කරුට ළමයාගේ ඥාති සම්බන්ධයක් ඇති නම්, එම සම්බන්ධතාවය :—
11. ළමයා ඉල්ලුම්කරුගේ භාරයට ගත් දිනය :—
12. ඉල්ලුම්කරුට ළමයා හමු වූ ස්ථානය සහ හමු වූ ආකාරය :—
13. ළමයාගේ මාපියකු/මාපියන් ජීවත් සිටිද් නැද්ද යන්න ඔබ දන්නේ ද?:—
14. ළමයාගේ මාපියකු/භාරකරුවකු සොයා ගැනීමට ඔබ උත්සාහ කර ඇද්ද ?:—
15. ඔබ විවාහක නම්, වර්තමාන භාරකරු වශයෙන් ළමයා ඔබ යටතේ රඳවා ගැනීම සඳහා ඔබගේ කලත්‍රයා ඔබ සමග එකඟ ද?:—

එසේ එකඟ නම් කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් ඉදිරිපත් කරන්න.

ළමයාගේ විස්තර

1. නම :—
2. ස්ත්‍රී පුරුෂ භාවය :—
3. උපන් දිනය (දන්නේ නම්) :—
4. ලිපිනය (දන්නේ නම්) :—
5. දෙමාපියන්ගේ නම් (දන්නේ නම්) :—
6. ළමයාගේ මාපියකු/මාපියන් ජීවත්ව සිටින බව ඔබ දන්නේ ද? :—

ඉහත තොරතුරු මාගේ උපරිම දැනීමේ ආකාරයට සත්‍ය සහ නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :

20 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

තතරවන උපලේඛනය [13(1) වන වගන්තිය]

### කැපකරු මාපිය රැකවරණ නියෝගයක් නිකුත් කිරීම සඳහා ඉල්ලීම

මහේස්ත්‍රාත් අධිකරණය වෙත

මෙහි පහත අත්සන් කරනු ලබන...............................හි පදිංචි.....................වන මම/අපි පහත සඳහන් ලෙස ප්‍රකාශ කරමි—

1. 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ 16 වන වගන්තිය යටතේ ළමයකුගේ/යෞවනයකුගේ ..................... (ළමයාගේ/යෞවනයාගේ නම) කැපකරු මාපියකු/කෝ මාපියන් වශයෙන් මම/අපි පත්වීමට කැමැත්තෙන් සිටින බවත් ; හෝ

2. එම පනත යටතේ කැපකරු මාපියකු වීමට මම/අපි විසින් වෙනත් යම් ඉල්ලීමක් කර නොමැති බවත් ; සහ හෝ..............................................................මම/අපි විසින් එම පනත යටතේ කැපකරු මාපියකු ලෙස පත්වීමට ඉල්ලීමක් කර ඇති බවත් සහ එම ඉල්ලීම..............................................................................මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින බවත් ; සහ/හෝ.......................................වන දින....................................මහේස්ත්‍රාත් අධිකරණය විසින් කරන ලද කැපකරු මාපිය ආඥාව මගින්..........................................මම/අපි (ළමයාගේ/යෞවනයාගේ) කැපකරු මාපිය ලෙස පත් කර ඇති බවත් ; සහ/හෝ...................ඉහත සඳහන් පනත යටතේ.........................................දිස්ත්‍රික් උසාවිය මගින්/ඉදිරියේ දරුකමට හදා ගැනීමේ ආඥාවක් කර ඇති බවත්/විභාග වෙමින් පවතින බවත්,

3. ළමයකුගේ/යෞවනයකුගේ කැපකරු මාපිය රැකවරණය ප්‍රදානය කරනු ලැබුවහොත්, මම/අපි පහත සඳහන් කරුණුවලට එකඟ වෙමි/එකඟ වෙමු.

(අ) ළමයා/යෞවනයා සම්බන්ධයෙන්, මම/අපි ඔහුගේ/ඇයගේ දෙමාපියන් මෙන් ඔහුට/ඇයට අධ්‍යාපනය ඇතුළුව රැකවරණය සහ ආරක්ෂාව සැපයීම, වගකීම ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ ඉටු කිරීමට

(ආ) පනත යටතේ සමීක්ෂණ නිලධරයාගේ කාර්ය ඉටුකිරීම සඳහා අපගේ නිවසට හෝ ළමයා/යෞවනයා පදිංචිව සිටින වෙනත් ස්ථානයකට පැමිණීමට ඔහුට අවසර දීමට

(ඇ) මානසික වශයෙන් කම්පනයකට පත්ව සිටින ළමයාගේ/යෞවනයාගේ රැකවරණය පිළිබඳව ලබාදෙන යම් පුහුණුවකට සහභාගි වීමට

(ඈ) කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රතිසංහිෂ්ට කරනු ලැබුවහොත්, ළමයාගේ/යෞවනයාගේ භාරකාරත්වය සමීක්ෂණ නිලධරයාට භාරදීමට.

සාක්ෂි වශයෙන් මෙම ඉල්ලීම 2005...................... මස .................. වන දින මම/අපි විසින් අත්සන් කරන ලදී.

| | |
|---|---|
| ඉල්ලුම්කරුගේ නම :— | ඉල්ලුම්කරුගේ අත්සන |
| කලත්‍රයාගේ නම :— | කලත්‍රයාගේ අත්සන |
| දිනය :— | දිනය :— |

පස්වන උපලේඛනය [13 (1) වන වගන්තිය]

13 වන වගන්තිය යටතේ තොරතුරු

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙතට**

ඉල්ලුම්කරුට කැපකරු මාපියකු වීමේ යෝග්‍යතාව අගැයීමට 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ, පහත සඳහන් තොරතුරු මෙසේ ඉදිරිපත් කරනු ලැබේ :—

**ඉල්ලුම්කරු සම්බන්ධ තොරතුරු**

1. නම :— මහතා/මහත්මිය/මෙනවිය

2. ලිපිනය :—

3. උපන් දිනය අවුරුද්ද/මාසය/දිනය :—

4. ඉල්ලුම් කරන දිනට වයස :—

5. ස්ත්‍රී/පුරුෂ භාවය පි/ගැ :—

6. ආගම :—

7. ජා. හැ. අංකය :—

8. වෛවාහක තත්ත්වය විවාහක/අවිවාහක දික්කසාද බව :—

9. (අ) දැනට කරනු ලබන රැකියාව සහ මාසික වැටුප :—

   (ආ) ඔබ කොපමණ කාලයක සිට මෙම රැකියාවේ යෙදී සිටින්නේ ද ? :—

   (ඇ) කලින් රැකියාවක් කළේ නම් එම රැකියාව :—

**කලත්‍රයා පිළිබඳ විස්තර**

10. කලත්‍රයාගේ නම :—

11. විවාහ වූ දිනය :— අවු/මා/දි

12. කලත්‍රයාගේ උපන් දිනය :— අවු/මා/දි

13. දැනට කරන රැකියාව සහ මාසික වැටුප:—

14. ළමයින් සිටී නම් ඔවුන්ගේ නම් සහ වයස :—

වර්තමාන භාරකරු ලියාපදිංචි කිරීම

15. මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබගේ කලත්‍රයාගේ කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ ද ? ඔව්/නැත
(කරුණාකර කැමැත්ත පළකිරීමේ ලිපිය අමුණන්න)

16. ඔබ දැනට සුනාමි විපත බලපෑ ළමයකු භාරයේ තබාගෙන සිටින්නේ ද?:— ඔව්/නැත

17 පිළිතුර "ඔව්" වේ නම්, ඔබ දැනටමත් ළමයාගේ වර්තමාන භාරකරුවකු වශයෙන් ලියාපදිංචි වී සිටින්නේ ද ? ඔව්/නැත

18. පිළිතුර "ඔව්" වේ නම් ලියාපදිංචි වූ දිනය සහ පළාත සහ ලියාපදිංචි අංකය :—

19. ඔබ වර්තමාන භාරකරුවකු නම්, දැනට ඔබගේ භාරයේ සිටින ළමයාගේ කැපකරු මාපියකු වශයෙන් ඉල්ලුම් කිරීමට ඔබ කැමැත්තේ ද? :— ඔව්/නැත

ළමයා/යෞවනයා සම්බන්ධ තොරතුරු

20. ඔබ කැපකරු මාපියකු වශයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නා වූ ළමයා/යෞවනයා හඳුනාගෙන සිටින්නේ ද ? ඔව්/නැත

21. (1) පිළිතුර "ඔව්" වේ නම්

(අ) ළමයාගේ/යෞවනයාගේ නම :—

(ආ) වර්තමාන ලිපිනය :—

(ඇ) වයස දන්නේ නම් වයස :—

(ඈ) ස්ත්‍රී/පුරුෂ භාවය :—

(ඉ) ඔබ දන්නා ආකාරයට ළමයාට/යෞවනයාට සහෝදර සහෝදරියන් සිටින්නේ ද ? :—

(ඊ) එසේ සිටී නම්, ඔබ කැපකරු මාපියකු වශයෙන් එම සහෝදර සහෝදරියන් ද ඔබගේ රැකවරණය යටතට ගැනීමට කැමැත්තේ ද ? :—

(උ) ඔබගේ දැනුම අනුව ළමයාගේ/යෞවනයාගේ මාපියකු ජීවතුන් අතර සිටී ද? :—

(ඌ) පිළිතුර "ඔව්" නම් එම මාපියාගේ ලිපිනය සඳහන් කරන්න :—

(එ) එම මාපියා මෙම ඉල්ලීමට කැමැත්ත පළ කරන්නේ ද ? :—

(ඒ) ළමයා/යෞවනයා ඔබ කොපමණ කලක සිට හඳුනන්නේ ද? :—

(ඔ) ළමයා/යෞවනයා ඔබ හඳුනාගත්තේ කෙසේ ද ?

(ඕ) ළමයාට/යෞවනයාට ඔබගේ නෑදෑකමක් තිබේ ද?

(ක) සුනාමි විපත සිදුවීමට පෙර ඔබ ළමයා/යෞවනයා හඳුනන්නේ ද?

(ග) සුනාමි විපත සිදුවීමට පෙර ඔබ ළමයාගේ/යෞවනයාගේ දෙමාපියන් හඳුනන්නේ ද? :—

(ච) ළමයාගේ මාපියකු/මාපියන් ජීවතුන් අතර සිටින බව ඔබ දන්නේ ද ?

(ජ) එසේ නම්, ඔවුන් පදිංචිව සිටි ස්ථානය සඳහන් කරන්න :—

(ii) පිළිතුර "නැත" යන්න නම් පහත සඳහන් කරුණු සඳහන් කරන්න :—

(අ) ඔබ, ළමයකු හෝ යෞවනයකු ඇති දැඩි කිරීමට කැමැත්තේ ද? ළමයකු/යෞවනයකු

(ආ) ඔබ කැමති වයස කුමක් වන්නේ ද ?

(ඇ) ඔබ කැමති ස්ත්‍රී/පුරුෂ භාවය :— ස්ත්‍රී/පුරුෂ

22. ඔබ යෞවනයකු ඇතිදැඩි කිරීමට කැමැත්තේ නම්, ඔබට කවර කාලයක් සඳහා සැපකරු මාපිය රැකවරණ ආඥාව ක්‍රියාත්මක වීම අවශ්‍ය ද ? :— අවුරුදු එකයි/යෞවනයා වයස අවුරුදු..........එළඹෙන තුරු.

23. ඔබ හෝ ඔබේ කලත්‍රයා ඊළඟ වර්ෂයේ දී විදේශ රැකියාවක් සඳහා පිටරට යාමට අපේක්ෂා කරන්නේ ද ? :— ඔව්/නැත

24. ඔබ යම් අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇත්තේ ද? :— ඔව්/නැත පිළිතුර "ඔව්" වේ නම්, වරද සහ ලැබුණ දඬුවම් සඳහන් කරන්න.

25. ඔබ යම් අධිකරණයක් ඉදිරිපිට දී චෝදනා ලැබ සිටින්නේ ද? :— පිළිතුර "ඔව්" වේ නම්, වරද සඳහන් කරන්න

26. ආරවුලක් නිරවුල් කර ගැනීම සඳහා ඔබ සමථ මණ්ඩලය වෙත ගොස් ඇත්තේ ද?:— පිළිතුර "ඔව්" නම්, ආරවුලේ ස්වභාවය සඳහන් කරන්න.

:
දිනය: ........................................ ඉල්ලුම්කරුගේ අත්සන

හයවන උපලේඛනය [14(5) වන වගන්තිය]

### හැපකරු මාපියකු වීම සඳහා ඉල්ලුම්කරුවකුගේ යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්

1. හැකිතාක් දුරට ළමයා—

(අ) ළමයා නොදන්නා තැනැත්තන්ට වඩා, ව්‍යාප්ත පවුලක් හෝ ළමයා හඳුනන තැනැත්තන් සමග ;

(ආ) ස්ථානය වෙනස් කිරීම අවම කර, ළමයාට පුරුදු පරිසරය හෝ ජනසමාජය තුළ ;

(ඇ) ළමයාගේ පාරම්පරික අයිතිවාසිකම්වලට ළඟා සමීප, ළමයාගේ ජනවාර්ගික සහ ආගමික ජන කොට්ඨාසයට අයත් හැපකරු මාපියන් සමග ;

(ඈ) ළමයාගේම සංස්කෘතික සහ භාෂා පසුබිමක් ඇති හැපකරු මාපියන් සමග ;

(ඉ) සම සහෝදර සහෝදරියන් සමග,

සිටිය යුතු ය.

2. යුවලක් සඳහා ප්‍රමුඛත්වය දිය යුතු ය. කෙසේ වුවද, මෙහි දක්වා ඇති අන් සියලුම මාර්ගෝපදේශවලට නිසි පරිදි සැලකිල්ලක් ලබා දීමෙන් පසු ළමයාගේ සුභසිද්ධිය උදෙසා වන්නේ නම්, එක් මාපියකු වුවද සලකා බැලිය යුතු ය.

3. හැපකරු මාපියකු සහ ළමයා අතර වයස් පරතරය අවුරුදු 25 සිට 45 දක්වා විය යුතු ය.

4. යුවලක් අවුරුදු තුනකට වඩා වැඩි කාලයක් සඳහා නීත්‍යානුකූලව විවාහ වී සිටිය යුතු ය.

5. පහත දැක්වෙන තැනැත්තන් හැපකරු මාපියන් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(අ) ළමයා නිසි පරිදි හදාවඩා ගැනීමට බාධකයක් වන මත්පැන්වලට ඇබ්බැහිව සිටීමේ, මත්ද්‍රව්‍ය අනිසි ලෙස පාවිච්චි කිරීමේ,ශාරීරික, මානසික හෝ චිත්තවේගාත්මක දුර්වලතාවකින් පෙළීමේ ඉතිහාසයක් සහිත තැනැත්තන් ;

(ආ) හිංසනයට පාත්‍රවීමේ ඉතිහාසයක් ඇති හෝ ළමා කාලයේ දී ළමාරක්ෂක සේවා ලාභියකුව සිටි තැනැත්තන් ;

(ඇ) යම් වරදකට වරදකරුවී ඇති තැනැත්තන් හෝ පොලිස් වාර්තාවක් ඇති තැනැත්තන් ;

(ඈ) රැකියාව සඳහා හෝ වෙනත් හේතුවක් නිසා දීර්ඝ කාලයක් පිටරට යාමට අදහස් කරන තැනැත්තන්.

6. කැපකරු මාපිය පවුල, ඉල්ලුම්කාර දෙමාපියන්ගෙන් සාර්ථකව දෙමාපිය කටයුතු ඉටුකිරීමේ හැකියාව සහ වෛවාහික සමගිය ප්‍රදර්ශනය වන සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය රහිත ස්ථාවර පවුලක් විය යුතු ය.

7. මෙහි දක්වා ඇති වෙනත් මාර්ගෝපදේශ නිසි පරිදි සැලකිල්ලට ගැනීමෙන් පසු ළමයාගේ සුබසිද්ධිය උදෙසා රඳවා තබන්නේ නම් මිස, මැතක දී ළමයකු මියගිය පවුලක් සැලකිල්ලට නොගත යුතු ය.

8. කැපකරු මව්පියන් —

(අ) විපත්ත කම්පනයට පත්වී ඇති ළමයකු හෝ යෞවනයකු සඳහා රැකවරණයදී ම සම්බන්ධයෙන් පුහුණුවක් ලැබීමට කැමති විය යුතු ය;

(ආ) සෞඛ්‍යය, ආරක්ෂක වගකීම් සැලසීම පිළිබඳ පුහුණුවක් ලැබීමට කැමති හා හැකියාව ඇති අය විය යුතු ය;

(ඇ) අගැයීමේ සහ සමීක්ෂණය කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රශ්න කරනු ලැබීමට හෝ පැමිණීමට ඉඩදීමට එකඟ විය යුතු ය.

9. අදාළ නිවස —

(අ) එම නිවසේ පදිංචි පවුලේ සියලුම සාමාජිකයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතු ය ;

(ආ) ළමයාගේ වයසට ගැලපෙන පරිදි මනා පවිත්‍රතාව, සෞඛ්‍ය සම්පන්න බව සහ ආරක්ෂාව සහිතව හොඳ ප්‍රමිතියකින් පවත්වාගෙන යා යුතු ය.

10. කැපකරු මාපියන් විසින් පහත සඳහන් දේ සැපයීමේ හැකියාවක් තිබිය යුතු ය.

(අ) ප්‍රමාණවත් ප්‍රාථමික සහ නිවාරණ සෞඛ්‍ය රැකවරණය;

(ආ) ළමයාගේ හෝ යෞවනයාගේ ශාරීරික, මානසික, විපත්ත සහ සමාජ සංවර්ධනය සඳහා අවශ්‍ය සෞඛ්‍යය රැකවරණ අවශ්‍යතා සැපයීම ;

(ඇ) ළමයාගේ හෝ යෞවනයාගේ සම්පූර්ණ වර්ධනය සඳහා අවශ්‍ය පෝෂණදායක ආහාර සැපයීම.

11. ළමයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් සලසනු ලබන බව සහතික වීමට කැපකරු මාපියන් හට හැකි විය යුතු ය.

12. ළමයාගේ යහ සාධනය සඳහා සාධාරණ ලෙස ප්‍රයෝගික නොවන්නේ නම් මිස, හෝ ඊට අනුකූල නොවන්නේ නම් මිස හෝ ව්‍යාප්ත පවුල සහ එම පවුලේ මිතුරන් සමග සම්බන්ධතා පවත්වා ගෙන යාමට සහ ප්‍රවර්ධනය කිරීමට, ළමයාට හෝ යෞවනයාට අවස්ථාව ලබාදීම සඳහා කැපකරු මව්පියන් කැමැත්තෙන් සිටිය යුතු ය.

13. ළමයාගේ සිතුම් පැතුම්වලට ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතු ය ;

14. මාපිය රැකවරණ කාලසීමාවෙන් අනතුරුව, ඉල්ලුම්කරු ළමයා දරුකමට හදා ගැනීමට දක්වන කැමැත්ත සැලකිල්ලට ගත යුතු ය.

ඉහත මාර්ගෝපදේශ අදාළ කර ගැනීමේ දී මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණ සහ විමර්ශන පවත්වනු ලැබිය හැකි ය.

හත්වන උපලේඛනය [15 (2) වන වගන්තිය]

**සමීක්ෂණ නිලධරයා තෝරාගත යුත්තේ කවර ධුර දරන තැනැත්තන් අතරින් ද යන වග**

පරිවාස නිලධරයන්

ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ නිලධරයන්

විදුහල්පතිවරුන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක කමිටුවල සමායෝජකයන්

අටවන උපලේඛනය [16(1) වගන්තිය]

........................................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය

නඩු අංක :

කැපකරු මාපිය රැකවරණ ආඥාව සහ කොන්දේසි

(කැපකරු මව්පිය/මව්පියන්ගේ නම)

(ලිපිනය)

1. මේ ආඥාවේ දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා ඔබ................................(ළමයාගේ/යෞවනයාගේ නම) ගේ කැපකරු මාපිය/මාපියන් ලෙස මෙයින් පත්කරනු ලැබේ. මේ ආඥාවේ දින සිට එකී................................(ළමයාගේ/යෞවනයාගේ නම) වයස අවුරුදු................................ට එළඹෙන දිනය වන................................දිනය දක්වා, එම යෞවනයාගේ කැපකරු මාපිය/මාපියන් ලෙස මෙයින් පත් කරනු ලැබේ.

හෝ

ඔබ.........................................(ළමයාගේ/යෞවනයාගේ නම) ගේ කැපකරු මාපිය/මාපියන් ලෙස එක් අවුරුද්දක් සඳහා පත්කරමින්...............................දින දී කරන ලද කැපකරු රැකවරණ ආඥාව..........................දින සිට තවදුරටත් එක් අවුරුද්දක් සඳහා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

2 මෙම පත්වීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබේ :—

(අ) ඔබ ළමයාගේ/යෞවනයාගේ සැබෑ දෙමාපියන් මෙන් එම ළමයාට/යෞවනයාට අධ්‍යාපනය සැලසීම, සහ ඔහුට සිදුවූ බලවත් චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන අවශ්‍ය විය හැකි විශේෂ රැකවරණ ඇතුළු රැකවරණ සහ ආරක්ෂාව සලසන බවටත් සියලු පාලන කටයුතු ක්‍රියාත්මක කරන බවටත් සියලු වගකීම් ඉටු කරනු ලබන බවට ; සහ

(ආ) ඔබ විසින් සපයනු ලබන කැපකරු මව්පිය රැකවරණය පිළිබඳ වාර්තා කිරීම සඳහා සමීක්ෂණ නිලධරයාට අවශ්‍ය වන සියලු සහාය සහ සහයෝගය ඔබ විසින් ලබා දෙන බවට සහ එම කාර්ය සඳහා දවසේ කවර හෝ අවස්ථාවක දී ළමයා / යෞවනයා නැවතී සිටින පරිශ්‍රයට ඇතුළුවීම හා තත්කාර්ය සඳහා අවශ්‍ය පරිදි යම් කැනැත්තකු හෝ යම් ස්ථානයක් පරීක්ෂා කිරීමට බලයලත් නිලධරයාට අවසර දෙන බවට.

3. ඉහත සඳහන් කොන්දේසි කිසිවක් කඩකළහොත් කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

4. (අ) මෙම ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළහොත් ;

(ආ) මෙම ආඥාව අවසාන වුවහොත් ;

(ඇ) මෙම ආඥාව නතර කළහොත්.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නම් කරනු ලබන නිලධරයකුට ළමයා/යෞවනයා භාර දීමට ඔබට නියම කරනු ලැබේ.

5.................................සමීක්ෂණ නිලධරයා ලෙස මෙයින් පත් කරනු ලැබේ.

මහේස්ත්‍රාත්වරයාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :

නව වන උපලේඛනය [18(1) වන වගන්තිය]

### කැපකරු මාපිය රැකවරණ වාර්තාව

පළාත : වාර්තාව අදාළ වන කාලය :

කැපකරු මාපිය රැකවරණ ආඥාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ආඥාව කළ දිනය | | | | ආඥාව අවසන් වන දිනය | | | |

පාර්ශ්වයන්ගේ නම්:

කැපකරු මාපියාගේ/මාපියන්ගේ නම :

කැපකරු ළමයාගේ/යොවනයාගේ නම :

ලිපිනය :

(1) පහත සඳහන් දෑ පිළිබඳ ප්‍රකාශය

(අ) යෝග්‍ය මාපියාගේ/මාපියන්ගේ සහ පවුලේ ලක්ෂණ :

(ආ) නිවස පිහිටි පරිසරයේ ස්වභාවය :

(ඇ) සෞඛ්‍ය රැකවරණය :

(ඈ) අපචාරවලින් සහ නොසලකා හැරීමෙන් ආරක්ෂිත බව

(ඉ) අධ්‍යාපනික පහසුකම් :

(ඊ) කුසලතා සංවර්ධනය :

(උ) ළමයාගේ අයිතිවාසිකම් සුරැකීම :

(ඌ) ව්‍යාප්ත පවුල සහ මිත්‍රයන් සමග ආශ්‍රයන් පවත්වාගෙන යාම :

(එ) කැපකරු ළමයකු/යොවනයකු ගේ විශේෂ විස්තර/සෝදිසි කිරීම් :

(2) ළමයකුගේ උපරිම සුභ සිද්ධිය සඳහා කටයුතු කර තිබේද :

සමීක්ෂණ නිලධරයාගේ නම සමීක්ෂණ නිලධරයාගේ අත්සන

දිනය :

**2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත** 29

දහවන උපලේඛනය [20 (1) වන වගන්තිය]

කැපකරු රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම

පළාත :

(කැපකරු මා පිය/මා පියන්ගේ නම) :

(ලිපිනය:)

.........................................(කැපකරු ළමයාගේ/යෞවනයාගේ) ගේ, කැපකරු මාපිය/මාපියන් ලෙස ඔබව පත් කරමින්.............................(ආඥාව කළ දිනය සඳහන් කරන්න.) දින කරන ලද කැපකරු ආඥාව වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

ඔබේ භාරකාරත්වයෙන් ඔහු/ඇය ඉවත්කර ගැනීමට බලය දී ඇති ................................(බලයලත් සමීක්ෂණ නිලධරයාගේ නම) යන අයට නොපමාව එකී ළමයාගේ/යෞවනයාගේ භාරකාරත්වය පවරන ලෙසට මෙයින් නියම කරනු ලැබේ.

දිනය : මහේස්ත්‍රාත්වරයාගේ අත්සන සහ මුද්‍රාව.

# 2005 අංක 34 දරන
# ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා
# වැළැක්වීමේ පනත

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ **2005** ඔක්තෝබර් මස **03** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු.12.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.75 යි.

## 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2005 ඔක්තෝබර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 8/2002.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්තේ, සිදු කරනුයේ හෝ සිදු කිරීමට ඉඩ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද (මෙහි මින්මතු "පීඩාවට පත් තැනැත්තා" යනුවෙන් හඳුන්වනු ලබන) ඒ තැනැත්තා විසින් ඒ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව වැළැක්වීම සඳහා ආරක්ෂා කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. පීඩාවට පත් තැනැත්තකු විසින් ඉල්ලීමක් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් –

(අ) පීඩාවට පත් තැනැත්තකු විසින් ;

(ආ) පීඩාවට පත් තැනැත්තා ළමයකු වන අවස්ථාවක, ඒ ළමයා වෙනුවෙන් –

(i) ළමයාගේ දෙමව්පියන්ගෙන් එක් අයකු විසින් හෝ ළමයාගේ භාරකරුවකු විසින් ;

(ii) ළමයා පදිංචිව සිටින ස්ථානයේ පදිංචි තැනැත්තකු විසින් ;

(iii) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ලිඛිතව බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ; හෝ

(ඇ) පීඩාවට පත් තැනැත්තකු වෙනුවෙන් පොලිස් නිලධරයකු විසින්,

ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිටපත් දෙකකින් යුක්තව මෙහි II වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර පීඩාවට පත් තැනැත්තා හෝ අදාළ තැනැත්තා

තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් පදිංචිව සිටින්නේ නැතහොත් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව සිදු කරනු ලැබ ඇත්තේ, සිදු කරනුයේ හෝ සිදු කිරීමට ඉඩ ඇත්තේ හෝ සිදුවූයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක, අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ අධිකරණය වෙත ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ඉහත සඳහන් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දැනුමක් ඇති යම් තැනැත්තකුගේ දිවුරුම් ප්‍රකාශ ආධාරකයක් ලෙස ඉල්ලුම් පත්‍රයට අමුණනු ලැබිය හැකි ය.

ඉල්ලීම සලකා බැලීම.

**3**. මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විටක අධිකරණය විසින් වහාම ඒ ඉල්ලීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

අතුරු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය.

**4.** (1) ඉල්ලීම සහ දිවුරුම් ප්‍රකාශ ඇත්නම් එම දිවුරුම් ප්‍රකාශ සලකා බැලීමෙන් පසු අධිකරණය විසින් –

(අ) ඉල්ලීම පිළිබඳ විභාගය අවසන් වනතුරු (මෙහි මින් මතු "අතුරු ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අතුරු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම අවශ්‍ය බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන අධිකරණය විසින් වහාම අතුරු ආඥාවක් නිකුත් කළ යුතු අතර, එම ඉල්ලීමේ දින සිට දින දහහතරකට නොවැඩි දිනයක දී එම ඉල්ලීම පිළිබඳ විභාගයක් පැවැත්වීම සඳහා ආඥාවක් කළ යුතු ය ; හෝ

(ආ) අතුරු ආඥාවක් කිරීමට අවශ්‍ය නොවන බව අවස්ථානුගත කරුණු අනුව අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ඉල්ලීමේ දින සිට දින දහහතරකට නොවැඩි දිනයක දී එම ඉල්ලීම පිළිබඳ විභාගයක් පැවැත්වීම සඳහා ආඥාවක් කළ යුතු ය :

එසේ වුව ද, එවැනි අතුරු ආඥාවක් නිකුත් කිරීමට පෙර අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකුගෙන් දිවුරුම මත සාක්ෂි විභාග කළ යුතු ය.

(2) අතුරු ආඥාවක් නිකුත් කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවීම වැළැක්වීම සඳහා වූ හදිසි අවශ්‍යතාව සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතික කිරීමේ අවශ්‍යතාව අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් පසු, අධිකරණය විසින් වගඋත්තරකරු වෙත දැන්වීමක් නිකුත් කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, එම දැන්වීමේ සඳහන් දිනයක දී ඔහුට එරෙහිව ආරක්ෂක ආඥාවක් නිකුත් නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද අතුරු ආඥාව ද, (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ කරනු ලබන ආඥාව ද (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීම සමග වගඋත්තරකරු වෙත භාර දිය යුතු අතර එම ලේඛන පිස්කල් මගින් හෝ වෙනත් බලයලත් නිලධරයකු මගින් භාරදීම නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ ද, කළ නොහැකි නම්, එම ලේඛන ඔහුගේ සාමාන්‍ය වාසස්ථානයෙහි ප්‍රකට ව පෙනෙන ස්ථානයක අලවනු ලැබුවහොත් එම ලේඛන වගඋත්තරකරු වෙත භාර දෙනු ලැබුවා වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

5. (1) අතුරු ආඥාවක් - අතුරු ආරක්ෂක ආඥාව.

(අ) මගින් ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම විභාග වෙමින් පවතින අවස්ථාවක වගඋත්තරකරු විසින් යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීමට කටයුතු සැලැස්වීම වළක්වනු ලැබිය යුතු ය ;

(ආ) යම් සිද්ධියක අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන සහ යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වැළැක්වීම සඳහා යම් තහනමක් හෝ කොන්දේසියක් අවශ්‍ය බවට අවස්ථාවෝචිත පරිදි පීඩාවට පත් තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් නැතහොත් වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකු විසින් දිවුරුම මත දෙන ලද සාක්ෂි මත අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඕ) දක්වා වූ අනු ඡේදවල සඳහන් වෙනත් යම් තහනමක් හෝ කොන්දේසියක් අන්තර්ගත විය හැකි ය.

(2) අතුරු ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක-

(අ) පාර්ශ්වයන්ගේ යහපත පිණිස වන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, පාර්ශ්වයන්ට උපදේශනය කරන ලෙස සමාජ සේවකයකුට හෝ පවුල් උපදේශකවරයකුට නියම කරනු ලැබිය හැකි අතර එම උපදේශන සැසිවාරවලට සහභාගි වන ලෙස අදාළ පාර්ශ්වයන්ට නියම කරනු ලැබිය හැකි ය.

4 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

(ආ) පීඩාවට පත් තැනැත්තා ආරක්ෂා කිරීම සහ එම තැනැත්තාට වහාම ආරක්ෂාව සැපයීම සාධාරණ ලෙස අවශ්‍ය වී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ආඥාව ක්‍රියාත්මක වන්නේ ද යන්න නියාමනය කරන ලෙස සහ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර ඉල්ලීම විභාග කිරීම සඳහා නියමිත දිනයක දී අධිකරණය වෙත වාර්තාව ඉදිරිපත් කරන ලෙස සමාජ සේවකයකුට, පවුල් උපදේශකවරයකුට, පරිවාස නිලධරයකුට, පවුල් සෞඛ්‍ය සේවකයකුට හෝ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධරයකුට නියම කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින් ආරක්ෂක ආඥාවක් නිකුත් කරන තුරු හෝ අතුරු ආඥාව ඉවත් කරන තුරු එම අතුරු ආඥාව බලාත්මකව තිබිය යුතු ය.

වගඋත්තරකරු අධිකරණයට පැමිණෙන අවස්ථාවක ආරක්ෂක ආඥාව නිකුත් කිරීම.

**6.** (1) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, නිකුත් කරන ලද දැන්වීමක නිශ්චිතව දැක්වෙන දිනයක දී වගඋත්තරකරු අධිකරණයේ පෙනී සිටින අවස්ථාවක, අධිකරණය විසින් ඉල්ලීම පිළිබඳව විභාග කළ යුතු අතර, කලින් ලබාගත් යම් සාක්ෂියක් සමඟ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි නඩු වාර්තාවේ කොටසක් විය යුතු දිවුරුම් ප්‍රකාශ හෝ වාචික සාක්ෂි මාර්ගයෙන් වූ වැඩිදුර සාක්ෂි මත ඉල්ලීම පිළිබඳව ද සලකා බැලිය යුතු ය.

(2) වගඋත්තරකරු නෛතික නියෝජිතයකු මගින් පෙනී නොසිටින අවස්ථාවක දී, අධිකරණය විසින් සිය කැමැත්තෙන්ම හෝ පීඩාවට පත් තැනැත්තාගේ ඉල්ලීම මත,

(අ) ඒ පීඩාවට පත් තැනැත්තා ද ඇතුළුව සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාගය වගඋත්තරකරු විසින් නොකළ යුතු බවට ;

(ආ) ප්‍රශ්න වගඋත්තරකරු විසින් අධිකරණයට ප්‍රකාශ කිරීමට සහ එමගින් අධිකරණය විසින් ඒ ප්‍රශ්න නිවැරදිව පීඩාවට පත් තැනැත්තාගෙන් හෝ සාක්ෂිකරුගෙන් විමසීමට හැකිවීම සඳහා

ආඥා කළ හැකි ය.

(3) විභාගයෙන් පසු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමට අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ දී වගඋත්තරකරු අධිකරණයට පැමිණ සහ ප්‍රචණ්ඩ ක්‍රියාව හෝ ක්‍රියා පිළි නොගන්නා නමුත් ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමට විරුද්ධ නොවන අවස්ථාවක, අධිකරණය විසින් 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කළ යුතු ය.

වගඋත්තරකරු අධිකරණයට නොපැමිණි විට ආරක්ෂක ආඥාව නිකුත් කිරීම.

7. (1) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන දිනයේ දී වගඋත්තරකරු අධිකරණයට නොපැමිණෙන අවස්ථාවක සහ වගඋත්තරකරු වෙත දැන්වීම භාර දී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් කලින් ලබාගත් සාක්ෂි සහ අධිකරණය විසින් විධාන කළ හැකි නඩු වාර්තාවේ කොටසක් විය යුතු දිවුරුම් ප්‍රකාශවල හෝ වාචික සාක්ෂි මාර්ගයෙන් වූ වැඩිදුර සාක්ෂි මත ඉල්ලීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

(2) අධිකරණය විසින් එය ඉදිරියේ ඇති සාක්ෂි සලකා බැලීමෙන් පසුව ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම අවශ්‍ය බවට සෑහීමට පත්වන අවස්ථාවක, 8 වන වගන්තියේ විධිවිධාන සැලැකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු.

8. ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම කළ යුතු ද හෝ නොකළ යුතු ද යන්න පිළිබඳව තීරණය කිරීමේ දී, යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවීම වැළැක්වීමේ අවශ්‍යතාව සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතිකවීමේ අවශ්‍යතාව අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

ආරක්ෂක ආඥාව වගඋත්තරකරු වෙත භාර දිය යුතු බව.

9. ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමේ දී –

(අ) ඒ ආඥාව වගඋත්තරකරු වෙත භාරදීමට ; සහ

(ආ) ඒ ආඥාවේ සහතික පිටපත් –

(i) පීඩාවට පත් තැනැත්තා වෙත භාර දීමට ;

(ii) පීඩාවට පත් තැනැත්තා ඉල්ලුම්කරු නොවන අවස්ථාවක, ඉල්ලුම්කරු වෙත භාරදීමට ;

(iii) වගඋත්තරකරු සහ පීඩාවට පත් තැනැත්තා පදිංචිව සිටින්නේ යම් පොලිස් ස්ථානයක බල ප්‍රදේශය තුළ ද ඒ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත භාරදීමට,

අධිකරණය විසින් වහාම කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

ආරක්ෂක ආඥාව.

10. (1) ආරක්ෂක ආඥාවක් –

(අ) මගින් යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුකිරීමෙන් හෝ සිදුකිරීමට සැලැස්වීමෙන් වගඋත්තරකරු වළක්වනු ලැබිය යුතු ය ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහ යහපත සහතිකවීම සඳහා එසේ කිරීම අවශ්‍ය බවට සිද්ධියේ අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන සහ අවස්ථාවෝචිත පරිදි, පීඩාවට පත් තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකු විසින් දිවුරුම මත දෙන ලද සාක්ෂි මත අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඕ) දක්වා වූ අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තහනමක් හෝ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ පරිපූරක ආඥාවක් එහි අන්තර්ගතව තිබිය හැකි ය.

(2) ආරක්ෂක ආඥාවක් එම ආඥාවෙහි සඳහන් කර ඇති පරිදි මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා බලාත්මකව තිබිය යුතු ය.

අතුරු ආඥාවක හෝ ආරක්ෂක ආඥාවක තිබිය හැකි තහනම් කිරීම්.

11. (1) අධිකරණය විසින්, අතුරු ආඥාවක් හෝ ආරක්ෂක ආඥාවක් මගින් වගඋත්තරකරු –

(අ) පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු හවුලේ වාසය කරන යම් වාසස්ථානයකට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ –

(i) වාසස්ථානයට,

(ii) සේවා ස්ථානයට,

(iii) පාසලට,

ඇතුළුවීම ;

(ඇ) පීඩාවට පත් තැනැත්තා තාවකාලිකව නැවතී සිටින යම් ස්ථානයකට ඇතුළුවීම ;

(ඈ) පීඩාවට පත් තැනැත්තා විසින් සාමාන්‍යයෙන් වාසය කරන හෝ වාසය කර ඇති හවුල් වාසස්ථානයකට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ එය තුළ රැඳී සිටීම වැළැක් වීම ;

(ඉ) හවුලේ වාසය කරන නිවසක පදිංචිව සිටීමෙන් ;

(ඊ) පීඩාවට පත් තැනැත්තාගේ යම් ළමයකු සමඟ සම්බන්ධතා පැවැත්වීම ඒ ළමයාගේ යහපත සඳහා බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන කොන්දේසි සපුරාදීමේ දී හැර පීඩාවට පත් තැනැත්තාගේ ළමයා සමඟ සම්බන්ධතා පැවැත්වීම ;

(උ) පීඩාවට පත් තැනැත්තා හවුලේ භුක්ති විඳින සම්පත් ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ ඒ සම්පත්වලට ප්‍රවේශවීම වැළැක්වීම;

(ඌ) කවර හෝ යම් ආකාරයකින් පීඩාවට පත් තැනැත්තා සමග සම්බන්ධ වන හෝ සම්බන්ධතාවක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම ;

(එ) පීඩාවට පත් තැනැත්තාට සහාය වන ඥාතිවරයකු, මිතුරකු සමාජ සේවකයකු හෝ වෛද්‍ය නිලධරයකු වන වෙනත් යම් තැනැත්තකුට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීමෙන් ;

(ඒ) හිරිහැරයක් සිදුවන පරිදි පීඩාවට පත් තැනැත්තා පසු පස ගමන් කිරීම ;

(ඔ) අධිකරණයේ මතය අනුව වගඋත්තරකරුගෙන් ආරක්ෂාව අවශ්‍ය වන පීඩාවට පත් තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ආරක්ෂාවට, සෞඛ්‍යයට හෝ යහපතට හානිදායක වන්නා වූ ද, අධිකරණය විසින් ආරක්ෂක ආඥාවේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි වූ ද වෙනත් ක්‍රියා කලාපයක නියැලීම ;

(ඕ) පීඩාවට පත් තැනැත්තා අසරණ තත්වයට පත් කරන පරිදි වෛවාහික නිවස විකිණීම, පැවරීම, අන්සතු කිරීම හෝ බරක් පැටවෙන ආකාරයට කටයුතු කිරීම,

තහනම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තහනමක් පැනවීමේ දී –

(අ) පීඩාවට පත් තැනැත්තාගේ හෝ පීඩාවට පත් තැනැත්තාගේ ළමයින්ගේ (සිටිනම්) සහ වගඋත්තරකරුට ළමයින් ඇත්නම් ඒ ළමයින්ගේ නැවතීමේ පහසුකම් සඳහා අවශ්‍යතාව ;

(ආ) ආඥාව කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වගඋත්තරකරුට හෝ වෙනත් යම් තැනැත්තකුට සිදුවිය හැකි යම් දුෂ්කරතාවයක්,

පිළිබඳව අධිකරණය සැලකිල්ලට ගත යුතු ය.

**12.** (1) ආරක්ෂක ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව, සෞඛ්‍ය හෝ සුභසාධනය ආරක්ෂා කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම සාධාරණ ලෙස අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් – පරිපූරක ආඥාව.

(අ) වගඋත්තරකරුගේ සන්තකයේ තිබිය හැකි යම් ආයුධ පොලීසිය විසින් අත්අඩංගුවට ගත යුතු බවට ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ සහ ඔහුට ළමයින් ඇත්නම් එම ළමයින් ගේ පෞද්ගලික දේපළ එකතු කර ගැනීමට සහායවීම පිණිස පීඩාවට පත් තැනැත්තා සමඟ යම් ස්ථානයකට යා යුතු බවට පොලිසියට නියෝග කිරීමට ;

(ඇ) තිබිය හැකි පරිදි විධානාත්මක උපදේශන සැසිවාර මනෝවිද්‍යාත්මක සායන හෝ වෙනත් ආකාරයක පුනරුත්ථාපන ප්‍රතිකර්මවලට සහභාගිවන ලෙසට වගඋත්තරකරුට සහ පීඩාවට පත් තැනැත්තාට ;

(ඈ) පීඩාවට පත් තැනැත්තා ඉල්ලා සිටින්නේ නම් ඔහුට හෝ ඇයට තාවකාලිකව නවාතැන් පහසුකම් සැපයිය හැකි අතර, අවශ්‍ය වන්නේ නම් එසේ නැවතී සිටින ස්ථානයේ පිහිටීම සහ වෙනත් විස්තර රහසිගතව තබා ගත යුතු බවට ;

(ඉ) සමාජ සේවකයකු, පවුල් උපදේශකයකු, පරිවාස නිලධරයකු හෝ පවුල් සෞඛ්‍ය සේවකයකු විසින් පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු අතර ඇති ආරක්ෂක ආඥාවක් නිරීක්ෂණය කළ යුතු බවට සහ සෑම මාස තුනකටම වරක් ඊට අදාළ වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවට ;

(ඊ) යම් තැනැත්තකුට ආධාර කිරීම සඳහා වගඋත්තරකරුට කාර්ය භාරයක් ඇති අවස්ථාවක, වගඋත්තරකරු විසින් එම තැනැත්තාට හදිසි මුදල් ආධාර ලබා දිය යුතු බවට ;

(උ) 11 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් පීඩාවට පත් තැනැත්තා නැවතී සිටින ස්ථානයට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම වගඋත්තරකරුට තහනම් කරනු ලැබ ඇති වුව ද එය නොතකා, එම ආඥාව ක්‍රියාත්මක වන කාලය තුළ දී පීඩාවට පත් පාර්ශ්වය නැවතී සිටින යම් ස්ථානයක එම පාර්ශ්වයට දිගටම නැවතී සිටීමට හැකිවීම පිණිස අවශ්‍ය වන අවස්ථාවෝචිත පරිදි, ගෙවීම් කිරීම සහ පහසුකම් සැලසීම නැතහොත් ගෙවීම් කිරීම හෝ පහසුකම් සැලසීම වගඋත්තරකරු විසින් සිදු කළ යුතු බවට,

ආඥා කරනු ලැබිය හැකිය.

(2) නිසි පරීක්ෂණයකින් පසුව සහ පීඩාවට පත් තැනැත්තාගේ සහ වගඋත්තරකරුගේ මූල්‍ය අවශ්‍යතා සහ මූල්‍ය සම්පත් සැලකිල්ලට ගැනීමෙන් පසුව පමණක් (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද යටතේ වූ ආඥාවක් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද එවැනි ආඥාවකින් 1999 අංක 37 දරන නඩත්තු පනත යටතේ යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ නියම කරන ලද යම් ගෙවීමක් සිදු කිරීමට වගඋත්තරකරු අපොහොසත් වීමේ දී අධිකරණය විසින් ගෙවීමට නියම කළ මුදල් හෝ එහි යම් කොටසක් පීඩාවට පත් තැනැත්තාට කෙළින්ම ගෙවන ලෙස අධිකරණය විසින් වගඋත්තරකරුගේ සේවායෝජකයකුට නියම කරනු ලැබිය හැකි ය.

13. අධිකරණය විසින්, නඩු කටයුතුවල පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව, වරදකරුවීම ඔප්පුවීමක් නොමැතිව හෝ වරදකරු බවට පිළිගැනීමක් නොමැතිව, මේ පනත යටතේ යම් ආඥාවක් කරනු ලැබිය හැකි අතර, එම ආඥාව, වරද පිළිගැනීමේ හෝ වරදකරු බවට ඔප්පුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලැබ ඇති ආඥාවක් ලෙස තේරුම් නොගත යුතු ය.

පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව කරනු ලබන ආඥා.

14. පීඩාවට පත් තැනැත්තා හෝ වගඋත්තරකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත ආරක්ෂක ආඥාවක් වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම, විවර්තනය කිරීම, දීර්ඝ කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවශ්‍යවන අවස්ථානුගත කරුණුවල වෙනසක් සිදු වී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, එම ආරක්ෂක ආඥාව වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම, විවර්තනය කිරීම, දීර්ඝ කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය :

ආරක්ෂක ආඥාවක් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

එසේ වුව ද, පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු යන දෙදෙනාටම සවන් දීමකින් තොරව එවැනි වෙනස් කිරීමක් සුළු වශයෙන් වෙනස් කිරීමක්, විවර්තනය කිරීමක්, දීර්ඝ කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත් එම ඉල්ලීම කරනු ලබන්නේ නිදහස් ලෙස සහ ස්වේච්ඡාවෙන් බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, අධිකරණය විසින් පීඩාවට පත් තැනැත්තාගේ ඒ ඉල්ලීමට අවසර නොදිය යුතු ය.

වගඋත්තරකරු සහ සාක්ෂි කරුවන් පැමිණ සිටීම.

**15.** වගඋත්තරකරු සහ සාක්ෂිදීම සඳහා ඉල්ලුම්කරු විසින් ඉල්ලීම කරනු ලබන යම් තැනැත්තකු ද පැමිණ සිටිය යුතු බවට සහ මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යම් ලේඛනයක් ඉදිරිපත් කළ යුතු බවට බල කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ V වන සහ VI වන පරිච්ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

කලත්‍රයා පිළිගත් සාක්ෂිකරුවකු වන බව.

**16.** මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී එක් කලත්‍රයකු, අනෙක් කලත්‍රයාට එරෙහිව පිළිගත් සාක්ෂිකරුවකු විය යුතු ය.

අභියාචන කිරීමේ අයිතිය.

**17.** 6 වන වගන්තිය හෝ 7 වන වගන්තිය හෝ යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම ආඥාව අපරාධ නඩුවක දී හෝ කරුණක දී මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද අවසාන ආඥාවක් වූවාක් මෙන් සලකා, ඒ හා සමාන ආකාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාත් බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තියේ සිට 330 වන වගන්තිය දක්වා වූ වගන්ති (ඒ වගන්ති දෙකම ඇතුළුව) සහ 357 වන සහ 358 වන වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ අභියාචනයට අදාළ වන්නේ ය :

එසේ වුව ද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 323 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 6 වන හෝ 7 වන වගන්තිය යටතේ වූ එම ආඥාව, වාර්තා කළයුතු මනා හේතුන් මත පළාත් බද මහාධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරනු ලබන්නේ නම් මිස, එම අභියාචනය ඉදිරිපත් කිරීමේ හේතුව නිසා නතර කරනු නොලැබිය යුතු ය :

එසේ ම තවදුරටත්, මහේස්ත්‍රාත්වරයා විසින් පළාත් බද මහාධිකරණය වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමේ දී ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා තම ආඥාවේ පිටපතක් තමා වෙත රඳවාගත යුතු ය.

ආඥා ක්‍රියාවේ යෙදවීම.

**18.** අවස්ථාවෝචිත පරිදි අතුරු ආඥාවක් හෝ ආරක්ෂක ආඥාවක් යම් වගඋත්තරකරුවකුට එරෙහිව නිකුත් කරනු ලැබ, ඔහු ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, එම වගඋත්තරකරු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**19.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අන්තර්ගතව කුමක් සඳහන් වුව ද, චෝදනා කෙටුම්පත් කිරීමේ දී අධිකරණය විසින්, යෝග්‍ය යයි සලකනු ලබන කාර්ය පටිපාටියක් අනුගමනය කළ යුතු ය.

චෝදනා කෙටුම්පත් කිරීමේ දී අධිකරණය විසින් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු බව.

**20.** (අ) මේ පනත යටතේ වූ, ඉල්ලීමක ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුගේ අනන්‍යතාවය දැනගත හැකි පරිදි එම ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුගේ නම හෝ වෙනත් කාරණයක් ; හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ නඩු තීන්දුවක් හැර, මේ පනත යටතේ යම් අධිකරණයක පවතින නීති කෘත්‍යයකට අදාළව යම් කාරණයක් මුද්‍රණය කරන හෝ ප්‍රකාශයට පත් කරන යම් තැනැත්තකුට,

අවුරුදු දෙකක් දක්වා වූ කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී යම් කාරණයක් මුද්‍රණය කරන හෝ ප්‍රකාශයට පත් කරන තැනැත්තන්ට දඬුවම් කළ යුතු බව.

**21.** පීඩාවට පත් තැනැත්තාට වෙනම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැවරීමට ඇති අයිතිවාසිකමක් අහිමි කරන ලෙස මේ පනතේ සඳහන් කිසිවක් තේරුම් නොගත යුතු ය.

වෙනත් නඩු පැවරීම වළක්වා නොමැති බව.

**22.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ –

අර්ථ නිරූපණය.

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු අදහස් වේ ;

"ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව" යන්නෙන්-

පීඩාවට පත් තැනැත්තා සහ අදාළ තැනැත්තා අතර ඇති පෞද්ගලික ස්වභාවයේ සම්බන්ධතාවයෙන් පැන නගින්නා වූ ද නිවසේ පරිසරය තුළ දී හෝ පිටත දී අදාළ තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ ඇති කරන ලද සහ,

(අ) I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක් ;

(ආ) යම් උද්වේගශීලී බැන වැදීමක්,

අදහස් වේ ;

"උද්වේගශීලී බැන වැදීම" යන්නෙන්, පීඩාවට පත් තැනැත්තකු කෙරෙහි යොමු කරන ලද බරපතල ස්වභාවයේ අවමන් කිරීමේ හෝ අපහාස කිරීමේ ක්‍රියා කලාපයක ස්වරූපයකින් යුක්ත වන්නා වූ ද, ඒ පීඩාවට පත් තැනැත්තාට බරපතල ක්ෂණික පීඩාවක් ඇති කිරීමේ බලපෑම ඇත්තා වූ ද ක්‍රියාවක් අදහස් වේ ;

"හවුලේ බුක්ති විඳින සම්පත්" යන්නෙන්, පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු සිරිතක් වශයෙන් භාවිත කළ හෝ ඔවුන්ට ප්‍රවේශය තිබුන නිශ්චල හෝ චංචල දේපළ අදහස් වේ ;

පීඩාවට පත් තැනැත්තාට අදාළව "අදාළ තැනැත්තා" යන්නෙන් –

පීඩාවට පත් තැනැක්තාගේ –

(අ) (i) කලත්‍රයා ;

(ii) වෙන්වීමකට පෙර සිටි කලත්‍රයා ;

(iii) සහවාසයේ යෙදෙන සහකරු ;

(ආ) පීඩාවට පත් තැනැත්තකුගේ කලත්‍රයාගේ, කලින් සිටින කලත්‍රයාගේ හෝ සහවාසයේ යෙදෙන තැනැත්තාගේ-

(i) පියා, මව, සීයා, ආච්චි, බාප්පා, සුළුමව ;

(ii) පුතා, දුව, මුනුබුරා, මිනිබිරිය, සුළුපුතා, සුළු දියණිය ;

(iii) සහෝදරයා, සහෝදරිය, අර්ධ සහෝදරයා, අර්ධ සහෝදරිය, සුළු සහෝදරයා, සුළු සහෝදරිය ;

(iv) දෙමාපියන්ගේ සහෝදර සහෝදරියන් ;

(v) සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා ;

(vi) දෙමාපියන්ගේ සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා,

අදහස් වේ;

2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත 13

“වගඋත්තරකරු” යන්නෙන්, ආරක්ෂක ආඥාවක් හෝ අතුරු ආඥාවක් සම්බන්ධයෙන් වන විට, එම ආඥාව අපේක්ෂා කරනු ලබන්නේ හෝ කරනු ලබන්නේ යම් අදාළ තැනැත්තකුට එරෙහිව ද එම අදාළ තැනැත්තා අදහස් වේ.

I වන උපලේඛනය 22 වන වගන්තිය

1. දණ්ඩ නීති සංග්‍රහයේ XVI වන පරිච්ඡේදයේ අන්තර්ගත සියලු වැරදි.
2. දණ්ඩ නීති සංග්‍රහයේ බලෙන් ලබා ගැනීම. 372 වන වගන්තිය.
3. දණ්ඩ නීති සංග්‍රහයේ සාපරාධී බිය ගැන්වීම. 483 වන වගන්තිය.
4. ඉහත සඳහන් වැරදිවලින් යම් වරදක් සිදු කිරීමට තැත් කිරීම.

II වන උපලේඛනය 2 (3) වගන්තිය.

ඉල්ලීම

......................මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

.......................................................පදිංචි ඒ. බී. (පීඩාවට පත් තැනැත්තාගේ නම, විස්තරය සහ ලිපිනය, සහ ඔහු යම් නියෝජිත කක්ෂයකින් නඩු පවරන්නේ නම් ඒ කක්ෂය සඳහන් කරන්න. උදාහරණ: අභාප්තියට පත් තැනැත්තා ඔහුගේ භාරකරු හෝ සහාය මිතුරකු මගින් පෙනී සිටින බාලවයස්කරුවකු හෝ සිහිවිකල් තැනැත්තකු වන්නේ නම් මෙසේ කියන්න. "බාලවයස්කරු ඔහුගේ සහාය මිත්‍රයා වන.................හි සී. ඩී. මාර්ගයෙන්") (පීඩාවට පත් තැනැත්තා).

එරෙහිව

.............................................වයි ඉසෙඩ් (අදාළ තැනැත්තාගේ නම, විස්තරය සහ ලිපිනය)...........................................වන අදාල තැනැත්තා 20.............මස.........දින දී ය.

(ස්වකීය ලියාපදිංචි නීතිඥ ඊ. එෆ්. මගින් පෙනී සිටින) ඉහත නම් සඳහන් පීඩාවට පත් තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ පැමිණිල්ලේ මෙසේ සඳහන් වේ :—

(මෙහි නඩුව පැවරීමට හේතු වන කරුණු සඳහන් කරන්න.)

එමනිසා 20.....මස ...........දින සිට බලපවත්වන පරිදි වගඋත්තරකරුට එරෙහිව ආරක්ෂක ආඥාවක් පනවන ලෙස පීඩාවට පත් තැනැත්තා (හෝ පීඩාවට පත් තැනැත්තන්) ගරු අධිකරණයෙන් අයැද සිටී.

.......................................

අත්සන

පීඩාවට පත් තැනැත්තා.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

# 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වැනි දින]

එල්. ඩී. – ඕ. 18/97.

**ළමයකු දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා ගැනීමෙන් තොරව අධිකරණය විසින් සාක්ෂි ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ සාක්ෂි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

I වන කොටස

**2.** (1) සාක්ෂි ආඥාපනතින් නියමිත පරිදි ළමයකු යම් නඩු කටයුත්තක දී සාක්ෂි දීමට සමත් බවට එහෙත් දිවුරුමක හෝ ප්‍රතිඥාවක ස්වභාවය තේරුම් ගැනීමට අසමත් බවට අධිකරණයක් සෑහීමට පත් වූ අවස්ථාවක, දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා ගැනීමකින් තොරව, ඒ ළමයාගෙන් අධිකරණය විසින් සාක්ෂි ගනු ලැබිය හැකි අතර ඒ නඩු කටයුතුවල දී ඒ ළමයා විසින් දිවුරීමෙන් හෝ ප්‍රතිඥා දීමෙන් තොරව දෙන ලද සාක්ෂියක්, එය දිවුරුම හෝ ප්‍රතිඥා පිට නොදීමේ හේතුව නිසාම පමණක් අනාවේශ්‍ය නොවන ලෙස සැලකිය යුතු ය; තවද ඒ සාක්ෂිය දෙන ලද්දේ යම් නඩු කටයුත්තක දී ද ඒ නඩු කටයුතු ඒ සාක්ෂිය දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට දී නොතිබීමේ හේතුව නිසාම පමණක් බලරහිත කරනු නොලැබිය යුතු ය. (දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා ගැනීමෙන් තොරව ළමයකු විසින් සාක්ෂි දිය හැකි බව.)

(2) දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා දීමෙන් තොරව ළමයකුට (1) වන උපවගන්තිය යටතේ සාක්ෂි දීමට ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, ඔහුගේ සාක්ෂිය අදාළ වන සියලු කරුණු සම්බන්ධයෙන් සත්‍යය ප්‍රකාශ කිරීමට, ඒ ළමයා බැඳී සිටිය යුතු අතර, ඒ බව අධිකරණය විසින් ඒ ළමයාට පැහැදිලි කර දිය යුතු ය.

II වන කොටස

**3.** (මෙහි මින් මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාක්ෂි ආඥාපනතේ 38 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :– (14 වන අධිකාරයට 38අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)

2—H 1060 — 9,900 (98/11)

"වයස සම්බන්ධයෙන් වෛද්‍ය වෘත්තිකයකුගේ සහතිකයක ඇතුළත් ප්‍රකාශ අදාළ වන අවස්ථා.

38අ. (1) යම් තැනැත්තකුගේ වයස සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැනීමට අධිකරණයට නියමිතව ඇති අවස්ථාවක, ඒ තැනැත්තාගේ සම්භාවි වයස සම්බන්ධයෙන් වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද බවට උද්දේශිත සහතිකයක අන්තර්ගත ප්‍රකාශයක් අදාළ වන්නේ ය,

(2) මේ වගන්තියේ "වෛද්‍ය වෘත්තිකයකු" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 163අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 163අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

"ළමයකු සමග පවත්වන සම්මුඛ සාකච්ඡාවක විඩියෝගත වාර්තාවක් සාක්ෂි වශයෙන් දිය හැකි බව.

163අ. (1) ළමා අපචාර හා සම්බන්ධ වරදක් පිළිබඳ යම් නඩු කටයුත්තක දී-

(අ) වැඩිහිටියකු සහ ඒ නඩු කටයුත්තේ වූදිතයා නොවන (මේ වගන්තියේ මින් මතු "ළමා සාක්ෂිකරු" යනුවෙන් සඳහන් කරන ලබන) ළමයකු අතර පැවැත්වෙන; සහ,

(ආ) ඒ නඩු කටයුත්තේ විවාදාභිමුඛ යම් කරුණකට අදාළ

මූලික සම්මුඛ සාකච්ඡාවක විඩියෝ පටිගත කිරීමක්, වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුණ ද අධිකරණයේ අවසරය ඇතිව එය (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් බැහැර කරනු ලැබ නොමැති තාක් දුරට, සාක්ෂි වශයෙන් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් නඩු කටයුත්තක දී, විඩියෝ පටිගත කිරීමක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ විටක,-

(අ) ඒ නඩු කටයුත්තේ දී හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඒ ළමා සාක්ෂිකරු කැඳවාගත නොහැකි යයි අධිකරණයට පෙනී යන්නේ නම් මිස; හෝ

(ආ) ඒ වීඩියෝ පටිගත කිරීම කරන ලද අවස්ථාගත කරුණු හෙළිදරව් කිරීමට නියම කරන යම් අධිකරණ රීති, අධිකරණය සෑහීමට පත්වන පරිදි පිළිපැද නොමැති නම් මිස

ඒ උපවගන්තිය යටතේ අධිකරණය විසින් අවසරය දෙනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වීඩියෝ පටිගත කිරීමක් සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක –

(අ) ඒ වීඩියෝ පටිගත කිරීම සාක්ෂියේ දී ඉදිරිපත් කළ පාර්ශ්වකරු විසින්, ළමා සාක්ෂිකරු කැඳවනු ලැබිය යුතු ය;

(ආ) අධිකරණයේ මතය අනුව ඒ ළමයාගේ පටිගත කළ සාක්ෂියේ දී දක්වා ඇත්තේ යම් සලකා බලා ඇති යම් කරුණක් පිළිබඳව මූලික සාක්ෂි වශයෙන් ඒ ළමයාගෙන් ප්‍රශ්න නොකළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ, වීඩියෝ පටිගත කිරීමක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ වීඩියෝ පටිගත කිරීමෙන් හෙළිදරව් වන ඒ ළමා සාක්ෂිකරු විසින් කරන ලද යම් ප්‍රකාශයක්, ඒ ළමා සාක්ෂිකරු විසින් සාක්ෂියේ දී සෘජුව ම කරන ලද්දක් සේ ඒ අනුව සලකනු ලැබිය යුතු අතර, ඔහුගේ සෘජු වාචික සාක්ෂියක් ආවේශ්‍ය වන්නේ යම් සිද්ධියක් සම්බන්ධයෙන් ද ඒ සිද්ධිය සම්බන්ධයෙන් ඒ යම් ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය වන්නේ ය.

(5) ළමා සාක්ෂිකරු විසින් කලින් කරන ලද හා වීඩියෝ පටිගත කිරීමෙන් හෙළිදරව් වන යම් ප්‍රකාශයක්, අධිකරණය ඉදිරියෙහි ඔහුගේ සෘජු වාචික සාක්ෂියේ දී ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් ප්‍රතිවාචනය කළහොත්, ඒ කලින් කරන ලද ප්‍රකාශය ස්වාධීන ප්‍රභවයකින් වන සාක්ෂි මගින් වැදගත් කරුණු සම්බන්ධයෙන් තහවුරු වන්නේ නම්, ඒ වීඩියෝ පටිගත කිරීමෙන් හෙළිදරව් වන පරිදි වූ කලින් ප්‍රකාශය අනුව කටයුතු කිරීම ආරක්ෂා සහිත බව හා සාධාරණ බව නඩුවේ සියලු අවස්ථාගත කරුණු අනුව, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා සලකන්නේ නම්, ඒ විනිශ්චයකාරවරයා විසින් එසේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා –

(අ) "ළමා අපචාර හා සම්බන්ධ වරදක්"යන්නෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්ති යටතේ වරදක්, ළමයකු සම්බන්ධයෙන් කරනු ලැබූ විට, ඒ වරද ඉන් අදහස් වේ ;

(ආ) "ළමයා" යන්නෙන්, මූලික සම්මුඛ සාකච්ඡාව විඩියෝ පටිගත කරන ලද අවස්ථාවේ දී වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙක් ඉන් අදහස් වේ ;

(ඇ) "විඩියෝ පටිගත කිරීම" යන්නෙන්, චලනය වන ප්‍රතිරූපයක් කවර හෝ අකාරයකින් නිපදවිය හැකි කවර හෝ මාධ්‍යයක පටිගත කිරීමක් අදහස් වන අතර, ඒ හා සමග වූ, ශබ්ද පට එයට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*ඔබ සිතන්නේ මාස හයක් ඉදිරියට නම්,*

මා ඔබට යෝජනා කරන්නේ

**වී වැපිරීමටය.**

*ඔබ සිතන්නේ අවුරුදු විස්සක් ඉදිරියට නම්,*

මා ඔබට යෝජනා කරන්නේ

**ගසක් සිටුවීමටය.**

*ඔබ සිතන්නේ සදාකාලයට නම්,*

මා ඔබට යෝජනා කරන්නේ

**දරුවන් ගැන සිතන්නටය.**

- *චීන කියමනකි* -

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

# සටහන

## ආකෘති පත්‍රය 01

## ජනපවුර ග්‍රාම නිලධාරී වසම පදනම් කරගත් 2019 වර්ෂය සඳහා ළමා ආරක්ෂක වැඩසටහන් යෝජනාවලිය

- දිස්ත්‍රික්කය - ..............................
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..............................
- ග්‍රාම සේවා වසම - ....................   වසම් අංකය - ...........

| | | |
|---|---|---|
| 1 | අපේ අරමුණු හා තේරුම් ගැනීම අනුව අපේ ග්‍රාමසේවා වසම තුළ ළමයින්ගේ ආරක්ෂාව කඩවීමට බලපානු ඇතැයි ඔබ සිතන ප්‍රධානතම හා සමීපතම ගැටලුව වන්නේ? | |
| 2 | අප විසින් එසේ සිතන ලද ගැටලුව අවම කරගැනීම සඳහා යෝජනා කරන වැඩසටහන වන්නේ? | |
| 3 | එම වැඩසටහන අප ක්‍රියාත්මක කරන්නේ කාටද? | |

## ආකෘති පත්‍රය 01

4 වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ කොහේද?

5 වැඩසටහන ක්‍රියාත්මක කරන කාලය කුමක්ද?

6 වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙතැයි ඔබ සිතන මුදල දළ වශයෙන් කොපමණද?

| | නම | අත්සන | දුරකථන අංකය | සමිතියේ හෝ ආයතනයේ නම |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

# ආකෘති පත්‍රය 02

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජනපවුර ජාතික වැඩසටහන**

**ඇගයීම් පත්‍රිකාව**

- **දිස්ත්‍රික්කය - ..........................................**
- **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..........................................**
- **ග්‍රාම සේවා වසම - ........................ වසම් අංකය - ...........**
- **දිනය - ..........................................**
- **නම (කැමතිනම් පමණක් සඳහන් කරන්න.) -**

  **......................................................**

ඔබගේ පිළිතුරට ✓ (හරි) ලකුණ යොදන්න.

1. මෙම වැඩසටහනේ දේශන සහ වීඩියෝ දර්ශන

| ඉතා හොඳයි | හොඳයි | අදහසක් නැත | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| | | | | |

2. මෙම වැඩසටහනේ ආහාර සහ සංග්‍රහ කටයුතු

| ඉතා හොඳයි | හොඳයි | අදහසක් නැත | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| | | | | |

# ආකෘති පත්‍රය 03

3. මෙම වැඩසටහන පැවැත්වූ ස්ථානය

| ඉතා හොඳයි | හොඳයි | අදහසක් නැත | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| | | | | |

4. වැඩසටහනේ ශාලා පහසුකම්, ශබ්ද විකාශන සහ අනෙකුත් පහසුකම්

| ඉතා හොඳයි | හොඳයි | අදහසක් නැත | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| | | | | |

5. ජනපවුර වැඩසටහන පිළිබඳ ඔබගේ පෞද්ගලික අදහස

| ඉතා හොඳයි | හොඳයි | අදහසක් නැත | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| | | | | |

# ආකෘති පත්‍රය 02

**වැඩසටහන වඩාත් සාර්ථකව කිරීම වෙනුවෙන් ඔබ ඉදිරිපත් කරන අදහස් හා යෝජනා**

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

# ළමා අපයෝජනයක්ද කතා කරන්න අපට

## දරුවන් පිළිබඳ ඕනෑම පැමිණිල්ලක්
## දින 365ම පැය 24 තුළ
## නොමිලේ ක්‍රියාත්මක
## ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය
## 1929ට දැනුම් දෙන්න

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
අංක 330, තලවතුගොඩ පාර,
මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
දුරකතන - 011 2778911-2-3-4
ෆැක්ස් - 011 2778915
විද්‍යුත් තැපැල් - ncpa@childprotection.gov.lk
නිල වෙබ් අඩවිය - www.childprotection.gov.lk
තොරතුරු වෙබ් අඩවිය - www.youthink.lk